# වාර්ෂික වාර්තාව

# 2017

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තැපැල් ලිපිනය:
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
574, ගාලු පාර,
කොළඹ 03,
ශ්‍රී ලංකාව.

දුරකථන:
+94-11-2587814
+94-11-2582121

ෆැක්ස්:
+94-11-2589132
+94-11-2587341

විද්‍යුත් තැපෑල:
teaboard@pureceylontea.com

වෙබ් අඩවිය:
www.pureceylontea.com

# පටුන


දැක්ම සහ මෙහෙවර ——— 04

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින් ——— 05

විගණන කමිටුවේ සාමාජිකයින් සහ නිරීක්ෂකයින් ——— 06

ප්‍රවර්ධන සහ අලෙවි කමිටුවේ සාමාජිකයින් ——— 07

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය ——— 08

සභාපතිගේ පණිවුඩය ——— 09

මූලික සංසන්දනාත්මක දර්ශක ——— 12

සංස්ථාපිත පසුබිම ——— 13

කර්මාන්ත පැතිකඩ ——— 15

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් එක් අංශ විසින් ඉටුකරන ලද කාර්යයන්

තේ කොමසාරිස් අංශය ——— 37

තේ අපනයන අංශය ——— 48

තේ ප්‍රචාරණ අංශය ——— 50

තේ රස පිරික්සීමේ ඒකකය ——— 70

විශ්ලේෂණ රසායනාගාරය ——— 72

පරිපාලන අංශය ——— 75

අභ්‍යන්තර විගණන අංශය ——— 76

තොරතුරු තාක්ෂණ අංශය ——— 76

මූල්‍ය සමාලෝචනය ——— 77

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල ——— 96

විගණකාධිපතිගේ වාර්තාව ——— 99

# දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය තේ
"වඩාත් ආකර්ශනීය පානය" බවට පත්කිරීම.

# මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මගින් රටට ලැබෙන විදේශ විනිමය ඉපයීම් වැඩිකරගැනීම සහ එමගින් වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සුරක්ෂිත කිරීම.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින්

| | |
|---|---|
| **සභාපති** | **ලූසිල් විජේවර්ධන මහතා** |
| **මණ්ඩලයේ ලේකම්** | **එස්. ඒ. සිරිවර්ධන මහතා** |
| **මණ්ඩලයේ සාමාජිකයින්:** | |
| **සාමාජික** | අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>**එන්. ඒ. යූ. කේ. එස්. මිහිඳුකුලසූරිය මහතා** (2017 පෙබරවාරි දක්වා)<br>**ඩබ්. එම්. ඩී. ටී. වික්‍රමසිංහ මහත්මිය** (2017 මාර්තු සිට දෙසැම්බර් දක්වා) |
| **සාමාජික** | අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව<br>**ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා** |
| **සාමාජික** | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, නියෝජනය<br>**ආර්. එස්. කේ. දුල්වලගේ මහතා** |
| **සාමාජික** | සභාපති, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>**ඩී. එම්. විජේරත්න මහතා** |
| **සාමාජික** | කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය<br>**දීපාල් ජයමාන්න මහතා** (2017 ජනවාරි)<br>**සමන්ත දොඩන්වල මහතා** (2017 පෙබරවාරි සිට මාර්තු දක්වා)<br>**ඉශාන් ප්‍රනාන්දු** (2017 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා) |
| **සාමාජික** | සභාපති, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය<br>**ඇන්ස්ලම් පෙරේරා මහතා** |
| **සාමාජික** | සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය<br>**ජයන්ත කරුණාරත්න මහතා** |
| **සාමාජික** | සභාපති, ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය<br>**නෙවිල් රත්නායක මහතා** |
| **සාමාජික** | සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය<br>**සුනිල් පොහොලියද්ද මහතා** |
| **සාමාජික** | සභාපති, ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය නියෝජනය<br>**අනිල් අල්විස් මහතා** (2017 ජනවාරි සිට සැප්තැම්බර්)<br>**හරීත් රණසිංහ** (2017 ඔක්තෝම්බර් සිට දෙසැම්බර්) |
| **සාමාජික** | වැවිලි කර්මාන්ත ඇමතිතුමා විසින් නම් කරන ලද සාමාජිකයන්<br>**ඩී. බී. ගමගේ මහත්මිය**<br>**බී. ඩබ්. හැරිසන් සිල්වා මහතා** |
| **නිරීක්ෂක** | **ආචාර්ය එම්. එම්. ජේ. පී. ගවරම්මන මහතා**<br>**නිරාජ් ඩී. මෙල් මහතා**<br>**එච්. ඩී. හේමරත්න මහතා**<br>**අනිල් පෙරේරා මහතා**<br>**අජිත් එන්. සිල්වා මහතා** |

# විගණන කමිටුවේ සාමාජිකයන් සහ නිරීක්ෂකයන්

**ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා** - **සභාපති**
අධ්‍යක්ෂ ජනරාල්
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

**එන්. ඒ. යූ. කේ. එස්. මිහිඳුකුලසූරිය මහතා** - **සාමාජික**
අතිරේක ලේකම්, (සංවර්ධන)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
(2017 ජනවාරි දක්වා)

**ඩබ්. එම්. ඩී. ටී. වික්‍රමසිංහ මහත්මිය.** - **සාමාජික**
අතිරේක ලේකම්, (සංවර්ධන)
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
(2017 මැයි සිට)

**අනිල් අල්විස් මහතා** - **සාමාජික**
සභාපති
ශ්‍රී ලංකා තේ කර්මාන්ත ශාලා හිමියන්ගේ සංගමය
(2017 මැයි දක්වා)

**හරිත් රුවන් රණසිංහ මහතා** - **සාමාජික**
සභාපති
ශ්‍රී ලංකා තේ කර්මාන්ත ශාලා හිමියන්ගේ සංගමය
(2017 දෙසැම්බර් සිට)

**එච්. ඩී. හේමරත්න මහතා** - **නිරීක්ෂක**
උපදේශක
කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය

**එස්. ඩී. කටුවාවල මහත්මිය** - **නිරීක්ෂක**
විගණන අධිකාරි
විගණකාධිපති දෙපාර්තමේන්තුව

**එස්. ඒ. සිරිවර්ධන මහතා** - **කැඳවුම්කරු**
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# ප්‍රවර්ධන සහ අලෙවි කමිටුවේ සාමාජිකයන්

**ලංකා තේ ප්‍රවර්ධන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට මගපෙන්වීම සඳහා පත්කළ උප කමිටුවකි.**

**රොහාන් පෙතියාගොඩ මහතා**
සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**එස්. ඒ. සිරිවර්ධන මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ප්‍රමිලා ශ්‍රීකාන්තා මහත්මිය**
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ආචාර්ය එම්. එම්. ජේ. පී. ගවරම්මන මහතා**
සභාපති,තේ පර්යේෂණ මණ්ඩලය

**එස්. එන්. අයි. විජේරත්න මහත්මිය**
වාණිජ අධ්‍යක්ෂ ජනරාල්, වාණිජ දෙපාර්තමේන්තුව

**පෞද්ගලික අංශය**

**රොහාන් ප්‍රනාන්දු මහතා**
නියෝජනය, තේ අපනයනකරුවන්ගේ සංගමය

**ජයන්ත කරුණාරත්න මහතා**
සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය

**මුෆාඩල් ජෆර්ජි මහතා**
නියෝජනය, තේ අපනයනකරුවන්ගේ සංගමය

**අවි ද සිල්වා මහතා**
නියෝජනය, තේ අපනයනකරුවන්ගේ සංගමය

**අනිල් කුක් මහතා**
සභාපති, ඒසියා සියක කොමඩිටීස් (පෞද්) සමාගම

**මලින් ගුණතිලක මහතා**
මහ ලේකම්, ලංකා වැවිලි කරුවන්ගේ සංගමය

**පසිඳු පීරිස්**
නියෝජනය, ශ්‍රී ලංකා තේ කර්මාන්ත ශාලා හිමියන්ගේ සංගමය

**නෙවිල් රත්නායක මහතා**
සභාපති, ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය

**ටයාබ් අක්බරාලි මහතා**
අධ්‍යක්ෂ, අක්බාර් බ්‍රදර්ස්

**මලික් ප්‍රනාන්දු මහතා**
අධ්‍යක්ෂ - මෙහෙයුම්
එම්. ජේ. එෆ්. ගෲප්

**ආචාර්ය ගාමිණී අබේවික්‍රම මහතා**
කළමනාකරණ අධ්‍යක්ෂ, බැසිලර් ටී

**විශ් ගෝවින්දසාමි මහතා**
කළමනාකරණ අධ්‍යක්ෂ,
සන්ශයින් හෝල්ඩින්ස් පෞද්ගලික සමාගම

**චමින්ද ජයවර්ධන මහතා**
කළමනාකරණ අධ්‍යක්ෂ,
ලුම්බිණී තේ කර්මාන්ත ශාලා (පෞද්) සමාගම

**බිරේන්ද්‍ර පෙරේරා මහතා**
අධ්‍යක්ෂ,
යුරෝ - ස්කෑන් අපනයන පෞද්ගලික සමාගම

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | **එස්. ඒ. සිරිවර්ධන මහතා** |
| තේ කොමසාරිස් | **ඊ. ඒ. ජේ. කේ. එදිරිසිංහ මහතා** |
| අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) | **ප්‍රමිලා ශ්‍රීකාන්තා මහත්මිය** |
| අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) | **ආචාර්ය එම්. ඒ. එන්. ජයතිලක මහතා** |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) | **එස්. අයි. සී. පෙරේරා මහතා** |
| ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක | **එච්. ඩී. කේ. ජයසිංහ මහතා** |
| ගණකාධිකාරි | **ඩබ්. රාජකරුණා මහත්මිය** |

# සභාපතිතුමාගේ පණිවුඩය

2017 වසර සඳහා වන සමාලෝචනය මා පිළිගන්වනු ලබන්නේ සතුටිනි.



පෙරවදන

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ගැන සලකා බැලීමේදී 2017 වර්ෂය සුවිශේෂී වේ. ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ 150 වසර සමරමින් දේශිය සහ විදේශිය වශයෙන් විවිධ උත්සව අවස්ථා පවත්වන ලදී. ජාතික තේ සම්මාන ප්‍රදානය, තේ සමුළු, රටවල් 32 කදී තේ සාද ආදිය පැවැත්වීම ඉන් ප්‍රධාන අවස්ථා කිහිපයකි. තේ කර්මාන්තයට සම්බන්ධ පාර්ශව කරුවන් හා ඔවුන් ගේ පවුල්වල සාමාජිකයන් සම්මාන උළෙලේදී ඇගයීමට ලක් කරන ලදී.

අපනයන ආදායම, නිෂ්පාදනය, වෙන්දේසි මිල ගණන්, තේ අපනයන මිල ගණන් පසුගිය වසර දෙක හා සැසඳීමේදී සමාලෝචනයට භාජනය වන්නා වූ වසරෙහි ඉහළ මට්ටමක පැවතුනි. නිෂ්පාදන වර්ධනය 5% පමණ විය. අපනයන ආදායම ඇ. ඩො. බිලියන 1.53 ක් වූ අතර එය පසුගිය වසරට වඩා 20% ක වැඩිවීමකි. තේ කර්මාන්තයේ ඇතැම් ප්‍රධාන දර්ශකයන් සතුටු දායක තත්වයට පත්ව තිබුණි. වසර පුරා පැවති යහපත් කෘෂි දේශගුණික තත්වයන් එයට හේතු වූ බව සඳහන් කළ හැකිය. තහනමට ලක් වූ ග්ලයිෆොසේට් හා ග්ලුෆොසිනේට් ඇමෝනියම් වෙනුවට විකල්ප වල්නාශක නොතිබීම සහ අසතුටුදායක පොහොර ප්‍රතිපත්තිය 2016 වසරේදී තේ කර්මාන්තයේ වර්ධනයට අහිතකර බලපෑම් සිදුකර ඇත. මෙකී බලපෑම් සඳහා විසඳුම් නිසි කලට යෙදීමට හැකි වූයේ නම් වඩා හොඳ ප්‍රතිපල ලබා ගැනීමට හැකියාව තිබුණි.

එමෙන්ම වෙළඳපොළ කොටස් නඩත්තු කිරීම, තේවල ගුණාත්මක බව සහ තරඟකාරී වෙන්දේසි මිල ගණන් ආදියද විමසුමට බඳුන්වන වසර තුළදී තේ කර්මාන්තයට මුහුණපෑමට සිදුවූ අභියෝගවලින් සමහරකි.

තේ කර්මාන්තය ආරක්ෂාකර ගැනීමටත් ලංකා තේ ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කරලීමටත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට දැඩි වෙහෙසක් දැරීමට සිදුවිය. රුසියාවට අපනයනය කළ තේ බහාලුවකින් හමු වූ ශ්‍රී ලංකාවේ නොමැති කප්රා නම් කුරුමිණියා පිළිබඳ ගැටළුව රුසියාවේ සිටින තානාපතිවරයාගේ සහ වෙනත් සහායක කණ්ඩායම්වල මැදිහත්වීම ඇතිව නිරාකරණය කරගැනීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයට හැකිවිය.

**තේ නිෂ්පාදනය**

2017 වසරේ ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය කි. ග්‍රෑම් මිලියන 307.71 කි. පෙර වසරේ නිෂ්පාදනය කළ ප්‍රමාණය හා සැසඳීමෙදී කි. ග්‍රෑම් මිලියන 15.14 ක හෝ 5.18% ක සුළු වර්ධනයකි. කිලෝ ග්‍රෑම් මිලියන 197.42 ක් නිෂ්පාදනය කරමින් ඒ සඳහා වැඩි වශයෙන්ම දායක වී ඇත්තේ පහත රට තේ කර්මාන්තයයි. උඩරට නිෂ්පාදිත තේ ප්‍රමාණය කි. ග්‍රෑ. මිලියන 64.64 සහ මැද රට නිෂ්පාදනය කි. ග්‍රෑ. මිලියන 45.65 ක් වශයෙන් වේ.

2016 වසරේ කි.ග්‍රෑ.මිලියන 2.37 ක් වූ හරිත තේ නිෂ්පාදනය 2017 වසරේ දී කි.ග්‍රෑ. මිලියන 2.66 දක්වා 12% කින් වැඩිවිය. සී. ටී. සී. තේ නිෂ්පාදනය 2016 වසරේදී කි.ග්‍රෑ. මිලියන 18.32 ක් වූ අතර 2017 වසරේදී කි.ග්‍රෑ. මිලියන 21.80 ක් දක්වා වැඩිවිය. එය 18.99% ක වැඩිවීමකි.

නිෂ්පාදකයන් අතර කුඩා තේ වතුහිමියන් ප්‍රධාන වූ අතර ජාතික නිෂ්පාදනයට ඔවුන්ගේ දායකත්වය 76% ක් විය.

## කොළඹ තේ වෙන්දේසිය හා නැ.තෙ.නො. මිල ( FOB PRICES)

2016 වසරේ කොළඹ තේ වෙන්දේසිය ඔස්සේ විකුණන ලද ප්‍රමාණය හා සසඳා බලන කල, 2017 වසරේදී විකුණු ප්‍රමාණය 6.66% කින් වැඩිවී ඇත. ප්‍රමාණය අනුව උඩරට, මැද රට සහ පහත රට යන උන්නතාංශ තුනෙහිම මෙලෙසින් වැඩිවී ඇත.

2017 වසරේදී කිලෝ ග්‍රෑමයක් සඳහා සමස්ත වෙන්දේසි සාමාන්‍ය මිල රුපියල් 617.17 ක් විය. 2016 වසරේ දී එය කිලෝ ග්‍රෑමයක් සඳහා 466.4 ක් විය. ඒ අනුව පසුගිය වසර හා සැසඳීමේදී 32% වැඩිවීමකි.

කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයක් සඳහා ඇ.එ.ජ. ඩොලර් 4.07 ක් විය. එය සෙසු වෙන්දේසිවල පැවති මිලට වඩා මෙන්ම පසුගිය වසරේ ලබාගත් මිල වූ ඇ.එ.ජ. ඩොලර් 3.23 ට වඩා විශාල වැඩිවීමකි. 2016 වසරේ පැවති කිලෝ ග්‍රෑමයක් සඳහා සාමාන්‍ය අපනයන මිල (නැ.තෙ.නො.) රුපියල් 639.88 සිට 2017 වසරේ දී රුපියල් 807.44 දක්වා 26.2% කින් වැඩිවී ඇත.

## තේ අපනයනය

2016 වසරේදී පැවති ශ්‍රී ලංකා තේ අපනයන ප්‍රමාණය කි.ග්‍රෑ. මිලියන 288.7 ක සිට 2017 වසරේ අපනයන ප්‍රමාණය වූ කි.ග්‍රෑ. මිලියන 289.00 දක්වා 0.07% ක වැඩිවීමක් වාර්තා වේ. 2017 වසරේ තේ මළු ලෙස අපනයනය කළ ප්‍රමාණය කි.ග්‍රෑ. මිලියන 23.5 ක් විය. 2016 වසරේදී එය කි.ග්‍රෑ. මිලියන 24.8 විය. ඒ අනුව කි.ග්‍රෑ. මිලියන 1.3 ක (5.4%) අඩුවීමක් වාර්තා වේ. එමෙන්ම තේ ඇසුරුම් (කි.ග්‍රෑ. 1- කි.ග්‍රෑ 3), (කි.ග්‍රෑ. 3- කි.ග්‍රෑ. 5), (කි.ග්‍රෑ. 5- කි.ග්‍රෑ.10) වශයෙන් පසුබැසීමක් වාර්තා වේ. වෙනත් ප්‍රවර්ගවල වැඩිවීමක් දක්නට ලැබේ.

2016 වසරේ වාර්තා වූ අපනයන ආදායම රුපියල් බිලියන 185 ක් වූ අතර 2017 වසරේ දී රුපියල් බිලියන 233.30 ක් දක්වා වැඩිවිය. වසර තුළදී ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව 4.7% කින් රුපියල අව ප්‍රමාණ වුවද ආදායම රුපියල් බිලියන 48.6 ක හෝ 26.28% ක වැඩිවීම සැලකිය යුතු තත්වයකි.

ලංකා තේ වැඩි වශයෙන් මිලදී ගෙන, එනම් කි.ග්‍රෑ. මිලියන 37.81 ආනයනය කරමින් තුර්කිය ඉදිරියෙන් පසුවෙයි. කි.ග්‍රෑ. මිලියන 35.03 සහ 33.37 ලෙස ආනයනය කරමින් ඉරාකය සහ රුසියාව පිළිවෙලින් ඒ පසුපසින් වේ.

## තේ නැවත වගාව සහ තේ කම්හල් නවීකරණය

සහනාධාර ලබාදුන් නමුදු තේ නැවත වගාව සහ තේ කම්හල් නවීකරණය පිළිබඳ සංවර්ධන කටයුතු කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් නොකරයි. නිෂ්පාදනය අඩුවීම කරනකොටගෙන මූල්‍යමය පහසුකම් ලබාදෙන්නා වූ පාර්ශවයන්ට එසේ ප්‍රාග්ධන වියදම් ලබාදීම අසීරු විය. තේ කර්මාන්තයේ තිරසාරබව පවත්වාගෙන යාමේදී, තේ නැවත වගාකිරීමේ ක්‍රියාවලියේ අනපේක්ෂිත ප්‍රමාදයන් බලපාන අතර එම තත්වය මගහරවා කැපීපෙනෙන නිෂ්පාදන වර්ධනයක් අත්පත් කරගැනීමට නම් දිරිගැන්වීම් ලබාදිය යුතුයි. නිෂ්පාදනයෙන් 2/3 කට වඩා ප්‍රමාණයක් ලැබෙන්නේ කුඩා තේ වතුහිමියන්ගෙන් වන අතර තේ නැවත වගාකිරීම සඳහා දිරිගැන්වීම හා සුදුසු යාන්ත්‍රණයක් නොවීම දැඩි ලෙස අවධානයට යොමුවිය යුතු කරුණකි. හෙක්ටයාර් එකක් නැවත වගාකිරීම සඳහා යන වියදම රුපියල් මිලියන 1.5 ක් පමණ වේ. එය ලාභදායි ආයෝජනයකි. 2.5% තේ වතු නැවත වගාව සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 6 ක් පමණ අවශ්‍ය වන අතර එම ඉලක්කය ළඟා කරගත හැකි වේ.

**ගෝලීය වශයෙන් තේ ප්‍රචාරණය**

විමසුමට බඳුන්වන වසර තුළදී සිලෝන් ටී නාමය වෙළඳ පොළ රාජ්‍යයන්වල තවදුරටත් තහවුරුකිරීම සඳහා ගෝලීය තේ ප්‍රචාරණ ව්‍යාපාරය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම්කිරීම තුළින් කැපීපෙනෙන වර්ධනයක් ඇතිකරගැනීමට තේ මණ්ඩලයට හැකිවිය. ඵලදායි මාධ්‍ය ප්‍රචාරනයක් හරහා පරිභෝජකයන් වෙත ලඟාවීමට වඩා ප්‍රධාන ප්‍රචාරණ කටයුතු වූයේ වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන කෙරෙහි අවධානය යොමුකිරීමයි. බොහෝ ඉහතදී සැලසුම්කර තිබෙන එවැනි ප්‍රචාරණ කටයුතු තුළින් 2017 වසරේදී ලබාගෙන ඇත්තේ සුළු වර්ධනයකි. වසර අවසානය වන විට මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සැලසුම් කිරීම සඳහා සුදුසු වෙළඳ ප්‍රචාරණ ආයතනයක් තෝරාගැනීමේ කටයුතු අවසන්කර තිබුණි. 2018 සැප්තැම්බර් මස වන විට ගෝලීය වෙළඳ ප්‍රචාරණ ව්‍යාපාරය ආරම්භ කිරීමට බලාපොරොත්තුවේ.

**ශ්‍රී ලංකා තේ කර්මාන්තය ස්ථාවර කිරීම**

ශ්‍රී ලංකාව සුපිරි ගුණාත්මක තේ නිපදවන්නෙක් ලෙස ගෝලීය තේ කර්මාන්තය තුළ රැඳී සිටියි. නමුත් ගෝලීය වශයෙන් එහි තරඟකාරි ස්ථානය ක්‍රමයෙන් සෝදාපාළුවට ලක්වෙමින් පවති. ලංකා තේවල අද්විතීය බව, පිරිසිදුබව සහ නිෂ්පාදන ආචාරධර්ම කෙරෙහි බුද්ධිමත් පරිභෝජකයන්ගේ අවධානය යොමුකිරීම තුළින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මෙම ගැටළුව විසඳීමට කටයුතු කර ඇත.

කළු තේ අපනයනය කරන රටවල් අතර (ප්‍රමාණාත්මකව) ශ්‍රී ලංකාව දෙවන ස්ථානයේ පසුවෙයි. ශුද්ධ වටිනාකම අතින් බලන කල තේ කර්මාන්තය රටේ ඉහළම අපනයන ආදායම උපයන මාර්ගය වී ඇත. මෙම ජයග්‍රාහි තත්වයට හේතු කාරක වු තවත් සාධකයක් වූයේ අපනයනයේදී තේවලට අගය එකතුවීම යි. අගය එකතුකිරීම පිළිබඳව පාරිභෝගික රටවල් ආකර්ශනීය දිරිගැන්වීම් ලබාදෙන නිසා වැඩි අවධානයක් ඒ සදහා යොමු වී ඇත.

**අභියෝග**

ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ අනාගත තිරසාරබව රඳාපවතින්නේ අමු තේ දළු සහ නිමි තේවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම, අස්වැන්න වැඩිකරගැනීම, ශ්‍රී ලංකාවේ තේවල කීර්තිමත් බව වැඩිකර ගැනීම, නිෂ්පාදන වියදම ඉහළ යාම පාලනය කරගැනීම සහ දේශගුණික විපර්යාසවලට මුහුණ දීම සඳහා ඵලදායි විසඳුමක් යොදාගැනීම ආදිය මතයි. විශේෂයෙන් අවසානයට සඳහන් කළ අභියෝගය ජයගැනීම සඳහා බාධාවක් වී ඇත්තේ පර්යේෂණ සම්බන්ධව ආයෝජනය ඉතාමත් පහළ මට්ටමක පැවතීමයි. ක්‍රියාපටිපාටිවලට අනුකූලව කටයුතු කිරීමේදී යම් යම් දුෂ්කරතාවයන් මතුවුවද ඉලක්කගත හා සීඝ්‍ර විපර්යාසයන්ට සරිලන පරිදි ඵලදායි ගෝලීය ප්‍රචාරණ ව්‍යාපාරයක් කිරීමේ මණ්ඩලය සතු හැකියාව අපගේ ඉලක්කගත වෙළඳපොළවල් සහ ඩිජිටල් මාධ්‍ය තුළ දක්නට ලැබේ.

**ස්තුතිකිරීම**

2017 වසරේදී ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ප්‍රගතිය වෙනුවෙන් දායක වූ හිටපු සභාපති, ආචාර්ය රොහාන් පෙතියාගොඩ මහතාගේ, අධ්‍යක්‍ෂක මණ්ඩලයේ, ශ්‍රී ලංකා තේ මණ්ඩල කණ්ඩායමේ උත්සාහය සහ ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමාගේ ද නියෝජ්‍ය ඇමති තුමාගේද අමාත්‍යාංශ ලේකම් තුමාගේද මගපෙන්වීම අගයකොට සලකමි.

හිටපු සභාපතිතුමාගේ, අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ අගය කළ නොහැකි තරමේ වූ දායකත්වය වෙනුවෙන් ස්තුතිය පුදකරන අතර පැමිණෙන වසරේදී සියළුම පාර්ශ්වකරුවන් සමග සමීපව කටයුතු කිරීමට අපේක්ෂා කරමි.

**ලූසිල් විජේවර්ධන**
**සභාපති**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**

# මූලික සංසන්දනාත්මක දර්ශක

| ප්‍රවර්ගය | ඒකකය | 2015 | 2016 | 2017 | සංසන්දනය 2016 සහ 2017(%) |
|---|---|---|---|---|---|
| තේ නිෂ්පාදනය | | | | | |
| සමස්ත තේ නිෂ්පාදනය | (කි.ග්‍රෑ.මිලි.) | 328.8 | 292.6 | 307.71 | 5.16 |
| උන්නතාංශය අනුව වර්ගීකරණය | | | | | |
| උඩරට | (කි.ග්‍රෑ.මිලි.) | 75.4 | 64.4 | 64.64 | 0.37 |
| මැදරට | | 51 | 44.5 | 45.65 | 2.58 |
| පහතරට | | 202.4 | 183.6 | 197.42 | 7.53 |
| සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය | | | | | |
| සම්ප්‍රදායික තේ (කාබනික, ක්ෂණික, නිස්සාරිත තේ) | (කි.ග්‍රෑ.මිලි.) | 306.4 | 271.9 | 283.25 | 4.17 |
| සී.ටී.සී.තේ | | 19.5 | 18.3 | 21.81 | 19.18 |
| හරිත තේ | | 2.9 | 2.4 | 2.66 | 10.83 |
| තේ අලෙවිය | | | | | |
| තේ අලෙවිය ප්‍රමාණාත්මකව | (කි.ග්‍රෑ.මිලි.) | 306 | 276.3 | 294.69 | 6.66 |
| උඩරට | | 67.1 | 55.8 | 47.03 | (15.72) |
| මැදරට | | 48.1 | 43.9 | 191.03 | 335.15 |
| පහතරට | | 190.8 | 176.5 | 294.69 | 66.96 |
| තේ අලෙවිය මිල | (රු./කි.ග්‍රෑ.) | 403.8 | 466.4 | 617.17 | 32.33 |
| උඩරට | | 396.3 | 442.7 | 597.81 | 35.04 |
| මැදරට | | 360 | 414.9 | 560.5 | 35.09 |
| පහතරට | | 417.5 | 486.8 | 636.86 | 30.83 |
| තේ අපනයනය | | | | | |
| තේ අපනයනය ප්‍රමාණාත්මකව (ප්‍රති අපනයනය හැර) | (කි.ග්‍රෑ.මිලි.) | 298.9 | 280.9 | 278.2 | (0.96) |
| ප්‍රවර්ග අනුව වර්ගීකරණය | | | | | |
| කළු තේ | (කි.ග්‍රෑ.මිලි.) | 294.4 | 276.4 | 273.7 | (0.99) |
| හරිත තේ | | 2.4 | 2.4 | 2.4 | 0.10 |
| ක්ෂණික තේ | | 2.1 | 2 | 2.1 | 5.99 |
| තේ අපනයනය වටිනාකම අනුව (ප්‍රති අපනයනය හැර) | (රු. බිලි.) | 174.3 | 176.2 | 222.4 | 26.21 |
| සමස්ත තේ අපනයනය (ප්‍රමාණාත්මකව) | (කි.ග්‍රෑ.මිලි.) | 306.9 | 288.8 | 289.0 | 0.06 |
| සමස්ත තේ අපනයනය - වටිනාකම අනුව (ප්‍රති අපනයනය සමග) | (රු. බිලි.) | 182 | 184.8 | 233.3 | 26.27 |

# 01 සංස්ථාපිත පසුබිම

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 සහ 2006 අංක 44 දරන පනත් මගින් සංශෝධනය වූ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මගින් 1976 ජනවාරි 01 වැනි දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවනු ලැබීය. මේ පනත යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාව තුළ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීමත් ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ තේ (සිලෝන් ටී) ප්‍රවර්ධනය කිරීමත්ය. තේ මණ්ඩලය ස්ථාපිත කිරීමට පෙර පුද්ගලික අංශය මගින් පවත්වාගෙන ගිය තේ ප්‍රචාරණ මණ්ඩලය විය. 1976 දී පාර්ලිමේන්තුව මගින් තේ ප්‍රචාරණ මණ්ඩලය අහෝසි කර තේ කර්මාන්තයට අදාළ බලතල සහිතව ශ්‍රී ලංකා තේ මණඩලය පිහිටුවනු ලැබීය.

නිෂ්පාදනය, අළුතින් වගා කිරීම, නැවත වගාව, පැරණි වතු පුනරුත්තාපනය, කර්මාන්ත ශාලා පිහිටුවීම සහ ඒවායෙහි මෙහෙයවීම් යනාදි තේ කර්මාන්තයට අදාළ කාර්යයන් නියාමනය කිරීම වගකීම කරගත් අධිකාරිය වන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයි.

විකුණුම් අවස්ථාවේදී තේවල ගුණාත්මක තත්වය අධීක්ෂණය, නැව්ගත කිරීමට පෙර තේවල තත්ත්වය අධීක්ෂණය, තැරැව්කරුවන්ගේ, මිශ්‍රකරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ තේ ගුදම් පරීක්ෂාව සහ සෞඛ්‍යාරක්ෂිත ලෙස තේ මිශ්‍ර කිරීම සහ ගබඩා කිරීම පිළිබඳව උපදේශන සේවා සැපයීම ආදි කාර්යයන් තියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණඩලය කටයුතු කරයි. අමතරව තේ වතු කළමනාකරණයෙහි සහ තේ නිෂ්පාදනයේ සහ අලෙවිකරණයෙහි නියෙලෙන සියළුම ආයතන සහ සංවිධාන නියාමනය, පාලනය සහ මෙහෙයවීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරයි.

ගෝලීය අවශ්‍යතා සපුරාලනු වස් පවත්නා නීති සහ රෙගුලාසි පෙළගැස්වීම සඳහා කර්මාන්ත අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කටයුතු ආරම්භ කිරීමට නියමිතය. නියාමන කාර්යයන්, සංවර්ධන කටයුතු, ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධව පාලනය තේ මණ්ඩලය සතුව පවතී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විශේෂයෙන් ම නිෂ්පාදනය සහ තත්ත්ව සහතිකකරණය, තේ දේශීය වශයෙන් බෙදාහැරීම සහ අපනයනය මෙන්ම විදේශීය ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් වන තම නියාමන කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම සඳහා සහනාධාර ලබාදීම, අධීක්ෂණය කිරීම සහ තේවල තත්ත්ව සහතිකකරණය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සංවර්ධන කාර්යයන්ට ඇතුළත් වේ. ප්‍රවර්ධන කටයුතු වශයෙන්, තේ අලෙවි සහ ප්‍රවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම, තේ සම්බන්ධව සංඛ්‍යා ලේඛන රැස්කිරීම සහ අර්ථකථනය කිරීම පිළිබඳව වගකියනු ලැබේ.

## ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ව්‍යුහය

### 1.1. ප්‍රධාන ලේකම් කාර්යාලය

තේ කර්මාන්තය නියාමනය කිරීම, සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට අදාළ සියලුම කාර්යයන් සහ මණ්ඩලයේ පරිපාලන සහ මූල්‍ය කටයුතු පිළිබඳ සමස්ත අධීක්ෂණය සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලය වගකීම දරයි. පාලන, මූල්‍ය මෙහෙයුම්, නියාමන, ප්‍රවර්ධන, සංවර්ධන, සංඛ්‍යාලේඛන, අභ්‍යන්තර විගණන, ලේකම් කාර්යාලය, තේ රස පිරික්සුම් සහ විශ්ලේෂණ රසායනාගාර, තොරතුරු තාක්ෂණ සහ පුස්තකාල යන විවිධ අංශ මඟින් සහායක සේවාවන් වශයෙන් කළමනාකරණ කාර්යයන් ඉටු කරනු ලැබේ.

### 1.2. පරිපාලන අංශය

මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය, ප්‍රසම්පාදනය සහ ගබඩා, නඩත්තු, යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් වන සමස්ත වගකීම පරිපාලන අංශය විසින් දරනු ලබයි.

### 1.3. මූල්‍ය අංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සමස්ත මූල්‍ය පාලනය සහ කළමනාකරණය පිළිබඳ වගකීම දරනුයේ මූල්‍ය අංශයයි. මණ්ඩලය සඳහා මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම, වාර්ෂික අයවැය, වාර්ෂික මූල්‍ය වාර්තා, මාසික ගිණුම් සහ අතුරු වාර්තා සකස් කිරීම, ඉන්වෙන්ටරි සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා පවත්වාගෙන යාම සහ විගණකාධිපතිවරයා වෙත වාර්ෂිකව ගිණුම් ඉදිරිපත් කිරීම මූල්‍ය අංශයේ අනෙකුත් ප්‍රධාන කාර්යයන් වේ.

## 1.4. තේ කොමසාරිස්වරයාගේ අංශය

තේ වගා කිරීම, නිෂ්පාදනය සහ ගුණාත්මක සංවර්ධනයට අදාළ නියාමන කාර්යයන් හා සම්බන්ධ සියලු කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. මේ සඳහා ප්‍රාදේශීය කාර්යාල හයකින් යුතු ජාලයක් මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

ඊට අමතරව නිමි තේ අපහරණය කිරීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, තේ අපනයනය සහ ආනයනයට අදාළ නියාමන කාර්යයන් හා සම්බන්ධ සියලු කටයුතු සම්බන්ධයෙන් තේ කොමසාරිස්වරයාගේ අංශය යටතේ ක්‍රියාත්මකවන තේ අපනයන අංශය වගකීම් දරනු ලබයි.

## 1.5. තේ ප්‍රවර්ධන අංශය

විදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව ශ්‍රී ලංකා තේ දේශීය වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ සියලු කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. කර්මාන්තයේ ඉල්ලුම පරිදි විටින්විට වෙළඳපොල පිළිබඳ දැනුම ලබාදීම ද මෙම අංශය විසින් සිදුකරනු ලබයි. දේශීය ගැනුම්කරුවන්ට මෙන්ම විදේශිකයන්ට ද ප්‍රයෝජනවත් වන තේ අලෙවිකුටියක් ද මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

තේ රස පරීක්ෂකයන්ගෙන් සැදුම්ත්ලද ස්වාධීන මණ්ඩලයක් මඟින් තේවල අවම ගුණාත්මක තත්ත්වය, සිංහ ලාංඡනය යටතේ නියමිත තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීම මෙන්ම අනෙකුත් තේ ප්‍රභවයන් පිළිබඳ පරීක්ෂා කිරීම හා සම්බන්ධ වගකීම තේ ප්‍රවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන තේ රස පිරික්සුම් ඒකකය විසින් දරනු ලබයි. එමෙන්ම මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදුකිරීම, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සේවාවන්ට අනුයුක්ත තේ ප්‍රවර්ධන කාර්යාලවල සහ වාණිජ කාර්යාලවල සහාය ඇතිව ජාත්‍යන්තර ආහාර පාන වෙළඳපොළවල් සඳහා සහභාගිවීම, සන්නම් නාම ප්‍රවර්ධනය සහ වර්ග ප්‍රවර්ධන වැඩසටහන්වලට සහභාගිවීම මෙම අංශය විසින් සිදුකරනු ලබයි. ජාත්‍යන්තර තේ කවුන්සිල් සහ තේ සංගම් මෙන්ම තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමද මෙම අංශය විසින් සිදුකරනු ලබයි.

## 1.6. විශ්ලේෂණ රසායනාගාරය

තේවල තත්ත්වය පවත්වාගෙන යාම පිණිස උසස් තාක්ෂණික උපකරණ භාවිතකොට තේවල රසායනික, ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සහ පළිබෝධනාශක ශේෂ තත්ත්ව පරාමිතීන් පිළිබඳ පරීක්ෂා කිරීම සහ තත්ත්ව සහතික නිකුත්කිරීම මෙම අංශයේ වගකීම වේ. ඒ අනුව, සෑම ඒකකයක් විසින්ම ගුණාත්මක තත්ත්ව සහතිකකරණ කාරණය සම්බන්ධයෙන් කේවල වශයෙන් සිය දායකත්වය ලබා දෙනු ලබන අතර එමඟින් "ලංකා තේ" නාමය සුරැකීම සඳහා සහාය ලැබෙනු ඇත.

# 02 කර්මාන්ත පැතිකඩ

තේ කර්මාන්තය සම්බන්ධයෙන් බලන කල 2017 වසර කිසියම් ප්‍රගතියක් පෙන්නුම් කලද පසුගිය සාර්ථක වර්ෂයන් හා සැසඳීමේ දී මෙම වසර අඩු ප්‍රගතියක් සහිත වසරක් ලෙස හැඳින්විය හැක. අවාසනාවන්ත ලෙස ශ්‍රී ලංකා තේ කර්මාන්තයට අහිතකර ප්‍රතිපල ගෙනදුන් ස්වභාවික ආපදා මාලාවකට මුහුණ දීමට සිදුවිය. ජනවාරි මස ඇරඹුණු නියඟය මාර්තු සහ අප්‍රේල් මාස දක්වා පැවතුණි. මැයි මස අවසන් වන විට ඇරඹුණු නායයෑම් සහ ගංවතුර තත්වය නිසා මිලියනයකින් අඩකට වඩා ජනතාව පීඩාවට පත්විය. මින් වැඩිම හානියක් ගෙනදුන් දිස්ත්‍රික්ක තේ වගා කරන දිස්ත්‍රික්ක විය. 2017 වසරේ මුළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 307.7 ලෙස වාර්තා වූ අතර 2016 වසරේ වාර්තා වූ කිලෝ ග්‍රෑම් මිලියන 292.6 ට වඩා එය කිලෝ මිලියන 15 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

කෙසේ වෙතත් පසුගිය වසරට වඩා 2017 වසරේදී විකුණුම් මිල ඉහළ අගයක් ලෙස වාර්තා විය. කොළඹ තේ වෙන්දේසියේ විකුණුම් මිල ඉහළ යාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළ අතර එහි අවම සාමාන්‍ය අගය රුපියල් 590.48 ක් සහ උපරිම සාමාන්‍ය අගය රුපියල් 648.30 ක් ලෙස පැවතුණි. 2016 වසර හා සැසඳීමේදී අපනයන තුලින් උපයාගත් ආදායම ඉහළ යාමේ ප්‍රවනතාවයක් (26.28%) මෙම වසරේදී ද දිස්විය.

## 2.1. තේ ඉඩම් ව්‍යාප්තිය

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ සමස්ථ තේ වගා ව්‍යාප්තිය හෙක්ටයාර් 202,540 කි. (යාවකාලක) මෙම තේ වතු එහි කළමනාකාරිත්වයේ ස්වභාවය අනුව පෞද්ගලික අංශය (60%) සහ රාජ්‍ය අංශය (40%) යනුවෙන් බෙදා වෙන් කළ හැකිවේ. තේ වගාව ව්‍යාප්තව ඇත්තේ දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක් තුළයි. ප්‍රධාන වශයෙන් තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්වයන් හේතුකොට ගෙන තෙත් කලාපය තුළ තේ වගාව ව්‍යාප්තව ඇත.

## 2.2. ජාතික තේ නිෂ්පාදනය

වගුව 2.1: සමස්ත තේ නිෂ්පාදනය-භූමියේ උස අනුව-2017

| උන්නතාංශය | නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|
| උඩරට | 64,643,597 |
| මැදරට | 45,654,592 |
| පහතරට | 197,421,616 |
| එකතුව | **307,719,805** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ජාතික තේ නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව කිලෝ මිලියන 15 ක පමණ වැඩිවීමක් සහිතව කිලෝ මිලියන 307.7 ක් ලෙස වාර්තා විය. ප්‍රතිශතයක් වශයෙන් එය 5% ක වර්ධනයකි.

ශ්‍රී ලංකාව මුහුදු මට්ටමේ සිට භූමියේ ඇති විවිධ වූ උස්මට්ටම් අනුව තීරණය වන උන්නතාංශ (elevations) අනුව තේ වගාකරනු ලබයි. ඒ අතුරින් වැඩි ප්‍රමාණයක් නිපදවනු ලබන්නේ පහත රට තේ ය. මුහුදු මට්ටමේ සිට මීටර් 600 දක්වා පරාසය තුළ වූ උස් භූමි මට්ටම් වල වගාකරන මෙම තේ ප්‍රධාන වශයෙන් වැඩි කහට රසකින් හා තද වර්ණයකින් යුතු වේ.

උඩරට තේ මීටර් 1200 කට වැඩි උසකින් යුත් භූමිවල වගාකරන අතර සාමාන්‍යයෙන් ඒවා අද්විතීය රසකින් හා සුවඳකින් යුත් උසස්ම තත්වයේ තේ ලෙස පිළිගැනේ.

ඉහළ ආදායම් මට්ටම් සහ ඉල්ලුම ඉහළ යාම හේතු කොටගෙන මෑත කාලයේ පහත රට තේ නිෂ්පාදනයේ වැඩිවීමක් සිදුවී ඇත. පහත රට තේ නිෂ්පාදනය ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (64%) වඩා වැඩි ප්‍රමාණයකට දායක වී ඇත. උඩ රට සහ මැද රට තේ නිෂ්පාදනයන් පිළිවෙලින් 21% කින් සහ 15% කින් ජාතික තේ නිෂ්පාදනයට දායක වී ඇත.

### 2.2.1. මාසික තේ නිෂ්පාදනය

වසර පුරාම සෑම මාසයකම පහතරට තේ නිෂ්පාදනය මගින් ජාතික තේ නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් ලැබුණි. මෙම වසරේදී ඉහළම මාසික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 32.9 ලෙස අප්‍රේල් මාසය තුළදී වාර්තා වුනු අතර අවමය පෙබරවාරි මාසයේදී කිලෝ ග්‍රෑම් මිලියන 18.6 ලෙස වාර්තා විය. පසුගිය වසරේ සහ මෙම වසරේ අවම මාසික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 18 ඉක්ම විය. කෙසේ වුවද 2017 වසරේ සමුච්චිත තේ නිෂ්පාදනය 2016 වසර හා සැසඳීමේදී 5.16% ක වර්ධනයක් වාර්තා වේ.

ප්‍රස්තාරය 2.1: මාසික තේ නිෂ්පාදනය-භූමියේ උස අනුව




### 2.2.2. කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් කිලෝ ග්‍රෑම් මිලියන 54.7 සහ කිලෝ ග්‍රෑම් මිලියන 46.2 ක් නිෂ්පාදනය කරමින් කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදන ලැයිස්තුවේ ඉහළම ස්ථානයේ රැඳී සිටීමට සමත් වී ඇත. 2016 සමග සැසඳීමේදී අනෙකුත් කෘෂි කලාපවලට වඩා ඌව, මධ්‍යම, පහතරට කලාපවල නිෂ්පාදනය ඉහළ ගොස් ඇති අතර සෙසු කලාපවල පසුබෑමක් වාර්තා වේ. පහත රට සමස්ත නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 183 ක් වන අතර මෙම වසරේ වාර්ෂික වර්ධන අනුපාතය 7.41% ක් ලෙස වාර්තා වේ.

## වගුව 2.2: කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය | ජනවාරි සිට දෙසැම්බර් දක්වා (ප්‍රමාණය - කි.ග්‍රෑ ('000) ) | | | |
|---|---|---|---|---|
| | 2017 (කි.ග්‍රෑ.) | 2016 (කි.ග්‍රෑ.) | වෙනස (කි.ග්‍රෑ.) | % |
| **නුවරඑළිය** | **3,975** | **5,076** | **(1,101)** | **(21.69)** |
| බටහිර | | | | |
| රම්බොඩ | 1,372 | 1,625 | **(253)** | **(15.58)** |
| පුඩලු ඔය | 3,343 | 3,426 | **(84)** | **(2.44)** |
| ආගරපතන | 6,111 | 5,948 | **163** | **2.75** |
| නානුඔය/ ලිඳුල/ තලවකැලේ | 8,027 | 8,295 | **(268)** | **(3.23)** |
| පතන/ කොටගල | 4,380 | 4,513 | **(133)** | **(2.94)** |
| හැටන් /දික්ඔය | 7,134 | 7,004 | **130** | **1.85** |
| බොගවන්තලාව | 5,602 | 5,912 | **(310)** | **(5.25)** |
| ඉහළ කොත්මලේ/ මස්කෙළිය | 5,839 | 5,808 | **31** | **0.53** |
| බටහිර එකතුව | **41,807** | **42,531** | **(724)** | **(1.70)** |
| මැදරට | | | | |
| වටවල/ ගිනිගත්හේන/ නෝටන් බ්‍රිජ් | 1,568 | 1,829 | **(262)** | **(14.30)** |
| පුස්සැල්ලාව/ හේවාහැට | 6,773 | 6,299 | **474** | **7.53** |
| කොත්මලේ | 803 | 841 | **(38)** | **(4.47)** |
| ගම්පොළ/ නාවලපිටිය/ දොළොස්බාගේ | 15,090 | 14,603 | **488** | **3.34** |
| නිලඹෙ/ හන්තාන/ ගලහ | 1,490 | 1,387 | **103** | **7.44** |
| කඩුගන්නාව | 6,736 | 6,776 | **(40)** | **(0.59)** |
| මඩුල්කැලේ/ නකල්ස්/ රන්ගල | 3,681 | 3,940 | **(259)** | **(6.57)** |
| හුන්නස්ගිරිය/ මාතලේ/ යක්දෙස්ස | 980 | 1,257 | **(277)** | **(22.02)** |
| බලංගොඩ/ රක්වාන | 7,984 | 7,369 | **615** | **8.35** |
| මැදරට එකතුව | **45,107** | **44,301** | **806** | **1.82** |
| උඩපුස්සැල්ලාව | | | | |
| උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය | 4,375 | 4,186 | **189** | **4.51** |
| මතුරට | 1,250 | 1,519 | **(269)** | **(17.70)** |
| උඩපුස්සැල්ලාව එකතු | **5,625** | **5,705** | **(80)** | **(1.40)** |
| ඌව | | | | |
| කොස්ලන්ද/ හල්දුමුල්ල | 698 | 747 | **(49)** | **(6.60)** |
| හපුතලේ | 3,508 | 3,424 | **84** | **2.44** |
| බණ්ඩාරවෙල/ පූනගල්ල | 3,505 | 2,823 | **682** | **24.16** |
| මල්වත්ත/ වැලිමඩ | 2,839 | 1,887 | **952** | **50.47** |
| දෙමෝදර/ හාලිඇල්ල/ බදුල්ල | 9,372 | 8,055 | **1,317** | **16.35** |
| ඇල්ල/ නමුනුකුළ | 1,633 | 1,459 | **174** | **11.91** |
| පස්සර/ ලුනුගල | 3,216 | 2,795 | **421** | **15.07** |
| මඩුල්සිම | 2,850 | 2,852 | **(2)** | **(0.07)** |
| ඌව එකතුව | **27,620** | **24,042** | **3,578** | **14.88** |
| පහතරට | | | | |
| දෙනියාය | 15,547 | 13,498 | **2,049** | **15.18** |
| ගාල්ල | 46,222 | 43,396 | **2,826** | **6.51** |
| කළුතර | 21,928 | 19,926 | **2,003** | **10.05** |
| කෑගල්ල | 5,331 | 4,895 | **436** | **8.90** |
| කැලණිවැලි | 7,574 | 7,176 | **398** | **5.54** |
| මහනුවර/ මාතලේ/ කුරුණෑගල | 4,941 | 5,238 | **(297)** | **(5.66)** |
| මාතර | 15,905 | 13,894 | **2,011** | **14.47** |
| මොරවක | 6,464 | 6,260 | **204** | **3.25** |
| රත්නපුර | 54,674 | 51,958 | **2,716** | **5.23** |
| බලන්ගොඩ | 5,001 | 4,677 | **324** | **6.93** |
| මුළු පහතරට | **183,587** | **170,919** | **12,668** | **7.41** |
| එකතුව | **307,720** | **292,574** | **15,146** | 5.16 |

## 2.2.3. තේ නිෂ්පාදනය - දිස්ත්‍රික්ක අනුව

විමසුමට ලක් කෙරෙන වසර තුළදී ඉහළම උඩරට තේ නිෂ්පාදනය නුවර එළිය දිස්ත්‍රික්කයෙන් ද ඉහළම පහත රට තේ නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය.

උඩරට, මධ්‍යම සහ පහතරට යන උන්නතාංශ තුනෙන්ම ඉහළම නිෂ්පාදනය වාර්තා වී ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් වන අතර පහළම නිෂ්පාදනය වාර්තා වී ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්ය.

වගුව 2.3: තේ නිෂ්පාදනය - දිස්ත්‍රික්ක අනුව (කිලෝග්‍රෑම්)

| දිස්ත්‍රික්කය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 15,369,508 | 12,745,281 | - | **28,114,789** |
| කොළඹ | - | - | 784,544 | **784,544** |
| ගාල්ල | - | - | 45,731,635 | **45,731,635** |
| හම්බන්තොට | - | - | 186,320 | **186,320** |
| කළුතර | - | - | 20,405,737 | **20,405,737** |
| මහනුවර | 812,386 | 19,944,989 | 12,778,091 | **33,535,466** |
| කෑගල්ල | 433,754 | - | 8,670,242 | **9,103,996** |
| මාතලේ | | 1,002,778 | 375,540 | **1,378,318** |
| මාතර | - | 249,850 | 38,495,207 | **38,745,057** |
| නුවරඑළිය | 48,020,141 | 9,762,558 | 735,233 | **58,517,931** |
| රත්නපුර | 7,808 | 1,949,138 | 69,259,067 | **71,216,013** |
| එකතුව | **64,643,597** | **45,654,592** | **197,421,616** | **307,719,805** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

## 2.2.4. අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම

තේ කර්මාන්ත ශාලාවක සමස්ත තේ නිෂ්පාදනය ඔවුන්ගේම වතු වලින් හෝ වෙනත් වතුවලින් ලබාගත් දළු මෙන්ම සැපයුම් කරුවන් මගින් මිලදී ගත් තේ දළු මගින් නිපදවූ ඒවා වේ.

2017 වසරේ දී සමස්ත තේ නිෂ්පාදනය සඳහා යොදාගත් අමු තේ දළු ප්‍රමාණයන්, එක් එක් දිස්ත්‍රික්ක වශයෙන් රැස් කිරීමේ ක්‍රම වේදය අනුව පහත සඳහන් වගුව මගින් නිරූපනය කරයි.

වගුව 2.4: දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

| පරිපාලන දිස්ත්‍රික්කය | තම වතුවලින් ලබාගත් දළු | වෙනත් වතුවලින් ලබාගත් දළු | මිලදී ගත් දළු | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 48,834,887 | 30,440,600 | 51,458,280 | **130,733,767** |
| කොළඹ | - | 175,458 | 3,472,671 | **3,648,130** |
| ගාල්ල | 3,542,113 | 1,612,808 | 207,497,180 | **212,652,102** |
| හම්බන්තොට | - | - | 866,388 | **866,388** |
| කළුතර | 2,178,104 | 225,962 | 92,482,609 | **94,886,676** |
| මහනුවර | 19,246,344 | 5,628,632 | 131,064,942 | **155,939,918** |
| කෑගල්ල | 4,055,747 | 1,137,788 | 37,140,048 | **42,333,583** |
| මාතලේ | 894,018 | 83,781 | 5,431,377 | **6,409,176** |
| මාතර | 7,651,369 | 2,064,337 | 170,448,808 | **180,164,514** |
| මොණරාගල | - | - | - | - |
| නුවරඑළිය | 175,903,573 | 40,914,048 | 55,290,760 | **272,108,381** |
| රත්නපුරය | 21,238,071 | 5,438,094 | 304,478,294 | **331,154,459** |
| එකතුව | **283,544,226** | **87,721,508** | **1,059,631,358** | **1,430,897,093** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

## 2.2.5 තේ නිපැයුම් ක්‍රමවේද අනුව නිෂ්පාදන විශ්ලේෂණය කිරීම

### 2.2.5.1. කළු තේ සහ හරිත තේ නිෂ්පාදනය

2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය 4.19% (කි.ග්‍රෑ 11,378,536) කින් වැඩිවීමක් වාර්තා වන අතර සී.ටී.සී. තේ නිෂ්පාදනයන්ද 18.99% කින් ඉහළ ගොස් ඇත. අදාළ වසර තුළදී සමස්ත කළු තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 14.9 කින් (5.1%) ඉහළ ගොස් ඇත. හරිත තේ නිෂ්පාදනයද කිලෝග්‍රෑම් 287,670ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර එය 12.12% ක වර්ධනයකි.

වගුව 2.5: නිපැයුම් ක්‍රමවේද අනුව තේ නිෂ්පාදනය

| පිරිසැකසුම් ක්‍රමවේදය | 2016 | 2017 | 2016 සහ 2017 සැසඳීම | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය (%) |
| සාම්ප්‍රදායික | 271,873,844 | 283,252,380 | 11,378,536 | 4.19 |
| සී.ටී.සී. | 18,325,660 | 21,805,673 | 3,480,012 | 18.99 |
| හරිත | 2,374,083 | 2,661,753 | 287,670 | 12.12 |
| එකතුව | **292,573,586** | **307,719,805** | **15,146,219** | **5.18** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

### 2.2.5.2. ක්ෂණික තේ සහ කාබනික තේ නිෂ්පාදනය

2016 වසර හා සැසඳීමේ දී ක්ෂණික තේ නිෂ්පාදනයේ වැඩිවීමක් (මෙ.ටො.383) පෙන්නුම් කරන අතර කාබනික තේ නිෂ්පාදනයේ වැඩිවීමක් (මෙ.ටො.137) ද මෙම වසර තුළදී පෙන්නුම් කරයි.

## 2.2.6 තේ නිෂ්පාදන වියදම

ඵලදායිතාවය සහ නිෂ්පාදන වියදම අතර සබඳතාවක් පවතී. නිරන්තරව නිෂ්පාදන වියදම ඉහළයාම වැවිලිකරණ අංශය තුළ කණගාටුදායක සිද්ධියක් බවට පත්ව ඇත. තේ නිෂ්පාදනයේ දී විශාල ප්‍රමාණයක ශ්‍රම අවශ්‍යතාවයක් පවතින බැවින් ශ්‍රම ඵලදායිතාව හා නිෂ්පාදන වියදම අතර විශාල සම්බන්ධතාවයක් පවතී. තේ නිපදවන ප්‍රධාන පෙළේ රටවල් අතර ශ්‍රී ලංකාව නිෂ්පාදන වියදම ඉහළින් පවතින රටකි. ගෝලීය වෙළෙඳපොල තුළ රටේ තරඟකාරීත්වය කෙරෙහි මෙම තත්වය වඩාත් බලපෑමක් වී ඇත.

තේ කිලෝ ග්‍රෑමයක් නිෂ්පාදනය කිරීම සඳහා වන වියදම පසුගිය දශකය තුළදී සීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබේ. මේ සඳහා කම්කරු වියදම් සහ යෙදවුම් මිල ගණන් ඉහළ යාම විශේෂයෙන් බලපෑම් කර තිබුණි. 2016/17 වර්ෂ සඳහා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදිත කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 467.06 වන වාර්ෂික තේ නිෂ්පාදන වියදම 2015/16 හා සැසඳීමේදී 0.02% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

සටහන 2.2: නිමි තේ කිලෝවක් සඳහා සමස්ත වියදම




(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

## 2.3 තේ අලෙවිය

විමසීමට බඳුන් වන වසරේදී විකුනුම් ප්‍රමාණයේ මෙන්ම විකුණුම් මිල ගණන් ඉහළ යාමක් දැකිය හැක. උපරිම සාමාන්‍ය මිල පරාසය කිලෝ ග්‍රෑමයකට රුපියල් 648.30 ක සිට අවම වශයෙන් කිලෝ ග්‍රෑමයකට රුපියල් 590.48 දක්වා වර්ෂය මුළුල්ලේ විචලනය වෙමින් පැවතුනි. වාර්ෂිකව සාමාන්‍ය තේ මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 618.18 ක් විය. 2016 වසරේ රුපියල් 468.62 හා සැසඳීමේදි එය වර්ධනයකි. ප්‍රසිද්ධ වෙන්දේසියේ, පෞද්ගලික සහ සෘජු විකුණුම් මගින් 2016 වසරේදි කිලෝ ග්‍රෑමයකට රුපියල් 468.62 වු සාමාන්‍ය මිල ක් ඇතිව කිලෝ ග්‍රෑම් මිලියන 280.85 ක ප්‍රමාණයක් අලෙවි කෙරුණු අතර 2017 වසරේදි කිලෝ ග්‍රෑමයකට රුපියල් 618.18 ක සාමාන්‍ය මිලක් සහිතව තේ කිලෝ ග්‍රෑම් මිලියන 299.2 ක ප්‍රමාණයක් අලෙවි කර ඇත.

මෙමගින් පැහැදිලි වනුයේ 2016 වසර හා සැසඳීමේදි තේ අලෙවිය ප්‍රමාණය 6.55% කින් ඉහළගොස් ඇති අතර ඒකක මිල 31.91 % කින් ඉහළ ගොස් ඇති බවයි.

### 2.3.1 අලෙවි ක්‍රම

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ශාලාවල නිපදවන තේ අලෙවි කරණ ප්‍රධාන ක්‍රමය වනුයේ ප්‍රසිද්ධ වෙන්දේසියයි. 2017 වසරේදි තේ කිලෝ ග්‍රෑම් මිලියන 294.7 ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියේ අලෙවි කෙරුනි. පෞද්ගලික විකුණුම් ලෙස කිලෝ ග්‍රෑම් මිලියන 2.8 සහ සෘජු විකුණුම් ලෙස කිලෝ ග්‍රෑම් මිලියන 1.7 පමණ අලෙවි කර ඇත.

### 2.3.2 කොළඹ තේ වෙන්දේසිය

කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ලංකා වානිජ මණ්ඩලය මගින් මෙහෙයවන කොළඹ තේ වෙන්දේසිය 2017 වසර තුළදී පවත්වන ලද වෙන්දේසි සංඛ්‍යාව 50 කි. ප්‍රසිද්ධ වෙන්දේසියේදී කිලෝ ග්‍රෑම් මිලි 18.4 (6.68%) ක වැඩිවීමක් වාර්තා වූ අතර වසර තුළදී කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිලෙහි ඉහළ යාමක් දක්නට ලැබේ. එමෙන්ම කිලෝ ග්‍රෑමයකට රුපියල් 466.43 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 617.17 දක්වා වාර්ෂික මිලෙහි වැඩිවීමක් දක්නට ලැබුණි.

### 2.3.3. උන්නතාංශ අනුව තේ අලෙවිය

2.6 වගුව මගින් උන්නතාංශ අනුව තේ අලෙවිය පිළිබඳව විශ්ලේෂණය කෙරේ. පසුගිය වසර හා සැසඳීමේදි උඩරට, මධ්‍යම සහ පහතරට තේ සඳහා වූ ඒකක මිල ගණන් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 වසරේදි ධනාත්මක පිරිවැටුමක් වාර්තා විය.

වගුව 2.6: උන්නතාංශ අනුව තේ අලෙවිය

| | ප්‍රමාණය (කි.ග්‍රෑ. මිලි.) | | | | ඒකක මිල (කි.ග්‍රෑ/ රු.) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| උන්නතාංශය | 2016 | 2017 | වෙනස | % | 2016 | 2017 | වෙනස | % |
| උඩරට | 58.4 | 58.90 | 0.50 | 0.85 | 449.43 | 601.17 | 151.74 | 33.76 |
| මැදරට | 45.5 | 48.96 | 3.46 | 7.60 | 420.79 | 563.48 | 142.69 | 33.91 |
| පහතරට | 177 | 191.38 | 14.38 | 8.12 | 487.24 | 637.41 | 150.17 | 30.82 |
| මුළු විකුණුම් | 280.8 | 299.24 | 18.44 | 6.57 | 468.62 | 618.18 | 149.56 | 31.92 |

මුලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.4 තේ අපනයනය

2017 වසර තුලදී තේ කිලෝ ග්‍රෑම් මිලියන 289.0 ක් අපනයනය කිරීම මගින් (ප්‍රති අපනයනයන් සහිතව) රුපියල් බිලියන 233.3 ක අපනයන ආදායමක් උපයන ලදි. එහිදී තේ කිලෝ ග්‍රෑමයක් සඳහා නැ.තෙ.නො. මිල රුපියල් 807.44 ක් විය. එසේම මෙම වසරේ අපනයන ආදායම රුපියල් බිලියන 200 ඉක්මවා ඇත. ලෝක තේ වෙළෙඳපොළ තුළ අපනයන ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාව තේ අපනය රටවල් අතර තුන්වන ස්ථානයේ පසු වේ. එමෙන්ම ලෝක තේ වෙළෙඳපොළ තුළ අපනයන මගින් උපයාගත් ආදායම අනුව ශ්‍රී ලංකාව දෙවන තැන හිමිකර ගෙන ඇත.

ප්‍රතිවාදී තරඟකරුවන් විසින් කර ඇති දැඩි තරඟකාරිත්වය ශ්‍රී ලංකා තේ කෙරෙහි අයහපත් ලෙස බලපෑම් කර ඇත. මෙම තත්වය වඩාත් තීව්‍ර කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන වියදම අධික වීම සහ තේ අස්වැන්න පහළ මට්ටමක පැවතීම හේතුවී ඇත. ඊට අමතරව ගෝලීය තේ පරිභෝජකයන්ගේ වෙනස් වන රුචිකත්වයන් හමුවේ ශ්‍රී ලංකාව තවදුරටත් සම්ප්‍රදායික තේ (orthodox tea) මත ම රැඳී සිටීම තම වෙළෙඳපොළ කොටස තවතවත් අහිමිවී යාමට හේතු සාධක වේ.

### 2.4.1 තේ වර්ග අනුව අපනයන විශ්ලේෂණය

සාමාන්‍යයෙන් තේ සඳහා පරිභෝජකයන් තුළ ඇති අභිරුචිය දළු වල ප්‍රභවය සහ ගුණාත්මක බව අනුව වෙනස් වේ. උදාහරණයක් වශයෙන් මැදපෙරදිග සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල් (CIS) මූලික වශයෙන් ශ්‍රී ලංකා වේ පහත රට, සම්ප්‍රදායික, කහට රසැති තේ සඳහා ඉල්ලුම් කරයි.

2017 වසරේදී, ප්‍රති අපනයනයන් ද සහිතව කලු තේ, හරිත තේ සහ ක්ෂණික තේ සමස්ත අපනයන ප්‍රමාණය සහ ආදායම ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරන අතර කිලෝග්‍රෑම් මිලියන 0.2 ක ප්‍රමාණාත්මක වෙනසක් සහිතව සමස්ත තේ අපනයනය 0.07% කින් ඉහළ ගොස් ඇත. අපනයන සහ ප්‍රති අපනයන ප්‍රමාණයන් වෙන් වෙන්ව පිළිවෙලින් 1% ක අඩුවීමක් සහ 37% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර ඉපයීම් පිළිවෙලින් 26.18% සහ 28.28% ලෙස වර්ධනය වී ඇත. කෙසේ වෙතත් 2017 වසරේදි සමුච්චිත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1,530.5 ක් විය. 2016 වසරේදි එය ඇමරිකානු ඩොලර් මිලියන 1,269.0 ක් වූ අතර 20.6 % ක වර්ධනයකි.

ප්‍රස්ථාර 2.3 මාසික සමස්ත තේ අපනයනය - ප්‍රමාණය සහ ඒකක මිල



## 2.4.2. වාර්ෂික තේ අපනයන

2017 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා තේ වර්ග අනුව අපනයනය පිළිබඳ විස්තරාත්මක නිරූපනයක් (ප්‍රමාණය, වටිනාකම සහ නැ.තෙ.නො. මිල (FOB) ඇතුළත්ව) පහත සඳහන් වේ.

වගුව 2.7 : වාර්ෂික තේ අපනයනය

| ඇසුරුම | ප්‍රමාණය | වටිනාකම | නැ.තෙ.නො. මිල (FOB) |
|---|---|---|---|
| අපනයන | 278,195,151 | 222,375,844,880 | 799.35 |
| කළු තේ | 273,672,954 | 216,027,268,225 | 789.36 |
| බැග් | 17,807,367 | 24,618,836,580 | 1,382.51 |
| තොග | 123,434,159 | 90,965,987,228 | 736.96 |
| පැකට් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 1,749,617 | 1,381,008,963 | 789.32 |
| පැකට් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 14,289,580 | 10,421,343,542 | 729.30 |
| පැකට් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 84,759,381 | 67,202,126,360 | 792.86 |
| පැකට් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 31,632,851 | 21,437,965,551 | 677.71 |
| හරිත තේ | 2,402,428 | 3,697,102,243 | 1,538.90 |
| බැග් | 716,426 | 1,891,191,677 | 2,639.76 |
| තොග | 906,203 | 655,817,125 | 723.70 |
| පැකට් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 52 | 112,185 | 2,169.92 |
| පැකට් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 5,512 | 9,501,325 | 1,723.88 |
| පැකට් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 740,429 | 1,087,191,327 | 1,468.33 |
| පැකට් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 33,807 | 53,288,604 | 1,576.28 |
| ක්ෂණික තේ | 2,119,769 | 2,651,474,412 | 1,250.83 |
| බැග් | 45 | 24,895 | 547.50 |
| පැකට් (>කි.ග්‍රෑ.3) | 2,117,298 | 2,646,609,756 | 1,249.99 |
| පැකට් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 120 | 284,137 | 2,367.81 |
| පැකට් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 2,305 | 4,555,624 | 1,976.41 |
| ප්‍රති අපනයන | 10,789,117 | 10,962,557,922 | 1,016.08 |
| කළු තේ | 8,166,488 | 6,981,816,342 | 854.94 |
| බැග් | 3,894,009 | 4,052,744,856 | 1,040.76 |
| තොග | 2,195,106 | 1,298,590,115 | 591.58 |
| පැකට් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 96,939 | 72,344,962 | 746.29 |
| පැකට් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 97,044 | 68,127,613 | 702.03 |
| පැකට් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 1,730,563 | 1,374,543,461 | 794.28 |
| පැකට් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 152,827 | 115,465,335 | 755.53 |
| හරිත තේ | 2,621,003 | 3,977,255,346 | 1,517.46 |
| බැග් | 1,057,953 | 2,510,309,864 | 2,372.80 |
| තොග | 158,363 | 100,302,332 | 633.37 |
| පැකට් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 7,931 | 4,997,361 | 630.10 |
| පැකට් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 7,974 | 3,474,805 | 435.76 |
| පැකට් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 1,371,873 | 1,341,087,963 | 977.56 |
| පැකට් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 16,908 | 17,083,022 | 1,010.36 |
| ක්ෂණික තේ | 1,627 | 3,486,233 | 2,143.11 |
| පැකට් (>කි.ග්‍රෑ.3) | 95 | 238,431 | 2,521.48 |
| පැකට් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 1,532 | 3,247,802 | 2,119.75 |
| මුළු එකතුව (අපනයන සහ ප්‍රති අපනයන) | **288,984,268** | **233,338,402,802** | **807.44** |
| පානය සඳහා සැකසූ / (ලීටර) **RTD(Lt)** | **14,390,059** | **1,521,751,077** | **105.75** |
| අපනයන | **278,195,151** | **222,375,844,880** | **799.35** |
| ප්‍රති අපනයන | **10,789,117** | **10,962,557,922** | **1,016.08** |

### 2.4.3. අගය එකතු කළ තේ අපනයන

ගෝලීය පරිභෝජකයන්ගේ තේ කෙරෙහි ඇති කැමැත්ත ඉතාමත් වේගයෙන් අගය එකතු කළ තේ වෙත යොමුවෙමින් පවතී. එවන් අවස්ථාවකදී මෙතෙක් ගෝලීය වෙළෙඳපොළ තුළ තමන්ට හිමි ස්ථානය රැක ගැනීම සඳහා ශ්‍රී ලංකාව මෙම වෙළෙඳපොළ වෙනස්වීම් වලට අනුගත විය යුතුයි. අගය එකතු කළ තේ එනම් කි. ග්‍රෑ. 03 වඩා අඩු ඇසුරුම්, තේ බෑග් සහ ක්ෂණික තේ අපනයනය 2017 වසරේ සමස්ත තේ අපනයනයෙන් 40.16% ක් විය. එමගින් උපයාගත් ආදායම රුපියල් බිලියන 108.2 ක් වූ අතර එය සමස්ත අපනයන ආදායමෙන් 46.37% ක් විය.

අපනයන ස්වරූප නිෂ්පාදන ක්‍රමවේද

වගුව 2.8: අගය එකතු කළ තේ අපනයන - 2017

| අපනයන ස්වරූප | නිෂ්පාදන ක්‍රමවේද | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු.) | නැ.තෙ.නො. (රු/ කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|
| අපනයන | කළු තේ | 104,316,365 | 93,201,971,903 | 893.45 |
| | හරිත තේ | 1,456,907 | 2,978,495,189 | 2,044.40 |
| | ක්ෂණික තේ | 2,119,769 | 2,651,474,412 | 1,250.83 |
| | **උප එකතුව** | **107,893,040** | **98,831,941,504** | **916.02** |
| ප්‍රති අපනයන | කළු තේ | 5,721,511 | 5,499,633,279 | 961.22 |
| | හරිත තේ | 2,437,757 | 3,856,395,187 | 1,581.94 |
| | ක්ෂණික තේ | 1,627 | 3,486,233 | 2,143.11 |
| | **උප එකතුව** | **8,160,895** | **9,359,514,700** | **1,146.87** |
| එකතුව | | **116,053,935** | **108,191,456,204** | **932.25** |

* පානය සඳහා සැකසූ තේ (RTD) අපනයන රහිතව මෙම වගුව සකස් කරන ලද අතර මුළු RTD අපනයන, අගය එකතුකළ අපනයන ලෙස සලකනු ලැබේ.

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

තොග තේ සහ අගය එකතු කළ තේ සඳහා නැව තෙක් නොමිලේ මිල (FOB price) පහත සටහන මඟින් පෙන්නුම් කරයි. අගය එකතු කළ තේ සඳහා නැ.තෙ.නො. මිල තොග තේ මිල ට වඩා ඉහළ අගයක් ගනී. එබැවින් තවදුරටත් අගය එකතු කළ තේ අපනයනය සඳහා වන ප්‍රවර්ධන කටයුතු මගින් තොග තේ අපනයනයට වඩා ශ්‍රී ලංකා ආර්ථිකයට ධනාත්මක බලපෑමක් ඇති කිරීම කළ හැකිය. විමසුමට බඳුන්වන වසර තුළදී අගය එකතු කළ තේ මෙන්ම තොග තේ යන දෙවර්ගය සඳහාම නැව තෙක් නොමිලේ මිලෙහි වර්ධනයක් පෙන්නුම් කරයි.

සටහන 2.4 : අගය එකතු කළ තේ සහ තොග තේ අපනයනය




### 2.4.4. ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල්

අතීතයේ පටන් යුරෝපය සහ එක්සත් රාජධානිය ලංකා තේ සඳහා ප්‍රබල වෙළෙඳපොළක් ව පැවතුනි. 2017 වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනයෙන් 13.09% ක ප්‍රමාණයක් ආනයනය කරමින් තුර්කිය, ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් අතර ප්‍රථම ස්ථානයට පත්විය. 2016 වසර හා සසඳන විට එහි 39.7% ක වර්ධනයක් වාර්තා වේ. 2016 වසරේදී වැඩිම ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කළේ රුසියාව වෙතටයි. ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනයෙන් 11.92% ක ප්‍රමාණයක් රුසියාව විසින් ආනයනය කරන ලදී. 2016 වසරේ රුසියාවේ තත්වය අතික්‍රමණය කරමින් තුර්කිය මෙම වසරේදී පළමු තැනට පත්ව ඇත.

2013 වසර දක්වා ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් අතර පළමු ස්ථානය රැක ගැනීමට රුසියාව සමත් විය. නමුත් තුර්කියේ ලංකා තේ සඳහා ඇති ඉල්ලුම සහ රුසියාවේ දේශපාලන සහ ආර්ථික අස්ථාවරත්වයන් යනාදි කරුණු හේතුකොට ගෙන 2014 වසරේදී ලංකාවේ තේ අපනයන ප්‍රමාණය අනුව දෙවන ස්ථානයට රුසියාව පත්විය. නැවතත් 2015 වසරේදී රුසියාව පළමු ස්ථානයට පත්වූ අතර 2016 වසරේදී ද එම ස්ථානය රැකගැනීමට සමත්විය. නමුත් 2017 වසරේදී තුර්කිය නැවතත් පළමු ස්ථානයට පැමිණියා. ශ්‍රී ලංකාව තේ අපනයනයෙන් උපයන සමස්ත ආදායමට 11.94% ක දායකත්වයක් ලබාදෙමින් තේ අපනයනයෙන් පළමුවැනියට ආදායම් උපයාදෙන ප්‍රධාන රට බවට තුර්කිය පත්ව ඇත.

2017 වසරේදී ඉරාකයට 12.12% ක ප්‍රමාණයකින් තේ අපනයනය කළ අතර එමගින් ඉරාකය ශ්‍රී ලංකාවෙන් දෙවැනියට තේ අපනයනය කරන රට බවට පත්විය. එම ප්‍රමාණය 2016 වසර හා සැසඳීමේදී 7.60% ක වර්ධනයකි. 2017 දී ශ්‍රී ලංකාව තේ අපනයනය කරන ප්‍රධාන රටවල් දහයෙහි නැව තෙක් සාමාන්‍ය මිල සලකා බැලුවහොත් ඉරානය ඉහළම මිලක් වාර්තා කර ඇත. 2017 වසරේදී සිව්වැනි ස්ථානයේ පසුවෙන ඉරානයේ ලංකා තේ වෙළඳපොල කොටස 19.19% කින් පහළ බැස ඇත. ඊට අමතරව 2016 වසරට සාපේක්ෂව ප්‍රධාන රටවල් දහය වෙත කළ සමස්ත අපනයනය 0.76% කින් ඉහළ ගොස් ඇති අතර රුසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, ලිබියාව සහ සිරියාව වෙත තේ අපනයනය 2016 වසරට සාපේක්ෂව අඩුවී ඇත.

වගුව 2.9 : 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනලද ප්‍රධාන රටවල්

| රට | 2017 | | | 2016 | | | වර්ධනය % |
|---|---|---|---|---|---|---|---|
| | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ. | අපනයන කොටස (%) | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ. | අපනයන කොටස (%) | |
| තුර්කිය | 1 | 37,815,700 | 13.09 | 4 | 27,068,973 | 9.37 | 39.70 |
| ඉරාකය | 2 | 35,032,772 | 12.12 | 3 | 32,557,218 | 11.27 | 7.60 |
| රුසියාව | 3 | 33,379,977 | 11.55 | 1 | 34,432,859 | 11.92 | (3.06) |
| ඉරානය | 4 | 27,418,910 | 9.49 | 2 | 33,928,612 | 11.75 | (19.19) |
| එ.අ.එ.රා. | 5 | 15,785,266 | 5.46 | 5 | 18,381,410 | 6.37 | (14.12) |
| අසර්බයිජානය | 6 | 12,271,107 | 4.25 | 8 | 10,556,896 | 3.66 | 16.24 |
| ලිබියාව | 7 | 11,609,461 | 4.02 | 6 | 12,645,055 | 4.38 | (8.19) |
| චීනය | 8 | 9,903,199 | 3.43 | 10 | 7,603,870 | 2.63 | 30.24 |
| ජපානය | 9 | 7,924,043 | 2.74 | 9 | 7,763,607 | 2.69 | 2.07 |
| සිරියාව | 10 | 7,399,616 | 2.56 | 7 | 12,107,279 | 4.19 | (38.88) |
| ප්‍රධාන රටවල් 10 එකතුව | | 198,540,051 | 68.70 | | 197,045,778.20 | 68.24 | 0.76 |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

ශ්‍රී ලංකා තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ තුන්වැනි ස්ථානය රැකගැනීමට රුසියාව සමත් වී ඇති අතර එක්සත් අරාබි එමීර් රාජ්‍ය 5.46% ක වෙළඳපොළ කොටසක් හිමිකර ගෙන පස්වන ස්ථානයේ රැඳී සිටී. කලාපයක් වශයෙන් ගෙන බැලූවිට මැදපෙරදිග ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැනුම්කරුවා වශයෙන් හඳුනාගත හැකි වේ. තෙල් වල මිල ගණන් ඉහළ තලයක පැවතීම මේ සඳහා හේතුවේ. පළමු රටවල් දහය සඳහා ශ්‍රී ලංකාවෙන් 68.70% ක පමණ ප්‍රමාණයක් තේ අපනයනය කර ඇත. කෙසේ වෙතත් ඉරානය, සිරියාව සහ ජපානය යන රටවල් සම්බන්ධයෙන් පමණක් සැලකිය යුතු ඉහළ සාමාන්‍ය නැව තෙක් නොමිලේ මිල ගණන් (FOBs) වාර්තා විය. එමෙන්ම තේ සඳහා ලොව ඉහළම ඉල්ලුම හේතුවෙන් සමස්ත අපනයන ආදායම රුපියල් බිලියන 233 ඉක්මවා ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා තේ තොග වශයෙන් මැදපෙරදිග රටවල් විසින් ඉල්ලුම් කිරීමට පෙළඹී සිටින අතර බෑග් තේ පාරිභෝජනය ඉහල ගොස් ඇත.

වගුව 2.10: ප්‍රධාන තේ අපනයන රටවල් 20 කි. තේ අපනයන ප්‍රමාණයන් සහ ඇසුරුම් පැකේජය අනුව රටවල් ස්ථානගත කිරීම.

| රට | අපනයන ප්‍රමානය (කි.ග්‍රෑ.) | | | | | | | රටවල් අනුව හිමි ස්ථානය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මළු | තොග | ඇසුරුම් (කි.ග්‍රෑ.>3 | ඇසුරුම් (කි.ග්‍රෑ.1-කි.ග්‍රෑ.3) | ඇසුරුම් (කි.ග්‍රෑ.3 -කි.ග්‍රෑ.5) | ඇසුරුම් ග්‍රෑ.4 - කි.ග්‍රෑ.1) | ඇසුරුම් කි.ග්‍රෑ.5 -කි.ග්‍රෑ.10) | මළු | තොග | ඇසුරුම් (කි.ග්‍රෑ.>3 | ඇසුරුම් (කි.ග්‍රෑ.1-කි.ග්‍රෑ.3) | ඇසුරුම් (කි.ග්‍රෑ.3 -කි.ග්‍රෑ.5) | ඇසුරුම් ග්‍රෑ.4 - කි.ග්‍රෑ.1) | ඇසුරුම් කි.ග්‍රෑ.5 -කි.ග්‍රෑ.10) |
| තුර්කිය | 272,784 | 11,804,045 | - | 386,928 | 6,579,505 | 15,926,640 | 2,845,798 | 12 | 4 | - | 3 | 1 | 2 | 4 |
| ඉරාකය | 242,956 | 1,676,190 | - | 538,700 | 1,327,870 | 19,283,619 | 11,963,436 | 13 | 13 | - | 1 | 4 | 1 | 1 |
| රුසියාව | 923,245 | 27,266,733 | - | 1,960 | 7,995 | 5,145,543 | 34,500 | 5 | 1 | - | 8 | 12 | 5 | 12 |
| ඉරානය | 23,663 | 14,773,659 | - | 261,465 | 121,500 | 1,084,359 | 11,154,265 | 19 | 2 | - | 4 | 7 | | 2 |
| එ.අ.එ.රාජ්‍ය | 406,414 | 4,838,732 | - | 103,494 | 1,378,755 | 6,175,511 | 2,882,360 | 9 | 8 | - | 5 | 3 | 4 | 3 |
| අසර්බයිජානය | 6,320 | 11,885,493 | - | - | - | 379,295 | - | 20 | 3 | - | - | - | - | - |
| ලිබියාව | 47,934 | - | - | - | - | 11,510,277 | 51,250 | 18 | - | - | - | - | 3 | 10 |
| චීනය | 308,236 | 8,638,260 | 14,260 | 71,762 | 38,234 | 217,549 | 614,897 | 10 | 5 | 2 | 6 | 9 | - | 5 |
| ජපානය | 694,486 | 7,021,596 | 30 | - | 61,628 | 54,768 | 91,535 | 6 | 6 | 5 | - | 8 | - | 7 |
| සිරියාව | 690,197 | 397,852 | - | - | 4,157,725 | 1,882,092 | 271,750 | 7 | 1 6 | - | - | 2 | - | 6 |
| චිලි | 452,216 | 6,365,714 | - | - | - | 279,034 | - | 8 | 7 | - | - | - | - | - |
| ජර්මනිය | 189,663 | 4,671,880 | 30 | 11,890 | 19 | 1,927,969 | 7,656 | 14 | 9 | 6 | 7 | 16 | 9 | 16 |
| හොංකොං | 70,839 | 3,800,530 | - | 413,611 | 332,133 | 341,825 | 22,544 | 17 | 11 | - | 2 | 5 | - | 13 |
| ඇ.එ.ජ. | 1,169,794 | 1,287,260 | 137,665 | 1,123 | 18,634 | 2,217,568 | 8,064 | 2 | 15 | 1 | 10 | 10 | 7 | 15 |
| ජෝර්දානය | 2,225,869 | 247,551 | - | - | 13,500 | 2,154,823 | 46,000 | 1 | 17 | - | - | 11 | 8 | 11 |
| සෞදි අරාබිය | 938,881 | 1,404,298 | - | - | 134,082 | 1,925,092 | 14,040 | 4 | 14 | - | - | 6 | - | 14 |
| තායිවානය | 123,998 | 4,128,078 | 9,000 | 1,800 | 139 | 50,819 | 3,050 | 16 | 10 | 3 | 9 | 15 | - | 17 |
| ලෙබනන් | 281,535 | 33,353 | - | - | 4,840 | 3,718,179 | 90,500 | 11 | 19 | - | - | 13 | 6 | 8 |
| යුක්රේනය | 159,002 | 3,020,677 | - | - | - | 851,250 | 65,205 | 15 | 12 | - | - | - | - | 9 |
| කුවේට් | 947,227 | 229,637 | 210 | - | 600 | 1,733,380 | 10 | 3 | 18 | 4 | - | 14 | - | 18 |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

### 2.4.4.1 කළු තේ අපනයනය

සමස්ත තේ අපනයෙන් 97.53% (කි.ග්‍රෑ.මි.281.84) ක ප්‍රමාණයක් කළු තේ අපනයනය කර ඇති අතර එමගින් සමස්ත තේ අපනයන ආදායමට 95.57% (රුපියල් බිලියන 223.0) ක ප්‍රමාණයකින් දායක වී ඇත. ශ්‍රී ලංකා කළු තේ අපනයනය කරන සියළුම රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස වෙත අපනයන ප්‍රමාණයෙන් 86.29% ක් සහ අපනයන වටිනාකමෙන් 83.89% ක් නියෝජනය කරයි. 2013 වසර දක්වා ශ්‍රී ලංකා කළු තේ ආනයනයෙන් රුසියාව ප්‍රමුඛස්ථානය ගනු ලබන අතර 2014 දී තුර්කිය පළමු ස්ථානයට පත්විය. එසේම 2015 වසරේදි රුසියාව නැවතත් ශ්‍රී ලාංකිය කළු තේ කි.ග්‍රෑමි 35.74 (11.9%) ආනයනය කරමින් මුල් තැනට පත්විය. 2016 වසරේදි ඉරානය ශ්‍රී ලාංකිය කළු තේ කි.ග්‍රෑමි 33.90 (12%) ක් ආනයනය කරමින් පළමුතැනට පත්විය. අදාළ වසරේදි තුර්කිය 13.41% ප්‍රතිශතයක් ආනයනය කරමින් ශ්‍රී ලංකාවෙන් කළු තේ අපනයනය කරන ප්‍රධාන රටවල් අතුරින් පළමු ස්ථානයට පත්විය.

වගුව 2.11: කළු තේ අපනයනය කරන ප්‍රධාන පෙලේ රටවල් 20 සහ ඒවායේ වෙළඳපොළ කොටස් (ප්‍රති අපනයනය සමග)

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි.) | වටිනාකම (රු. බි.) | නැ.තෙ.තො. FOB රු/කි.ග්‍රෑ | ප්‍රමාණය (%) | වටිනාකම් කොටස (%) | ප්‍රමාණය වර්ධනය (%) ('16 සාපේක්ෂව '17) |
|---|---|---|---|---|---|---|
| තුර්කිය | 37.80 | 27.84 | 736.56 | 13.41 | 12.49 | 39.75 |
| ඉරාකය | 35.01 | 21.01 | 600.26 | 12.42 | 9.42 | 7.67 |
| රුසියාව | 32.74 | 25.74 | 786.08 | 11.62 | 11.54 | (3.08) |
| ඉරානය | 27.38 | 24.31 | 887.82 | 9.72 | 10.90 | (19.21) |
| එ.අ.එ.රා. | 15.31 | 11.20 | 731.45 | 5.43 | 5.02 | (14.09) |
| අසර්බයිජානය | 12.27 | 9.57 | 780.52 | 4.35 | 4.29 | 16.34 |
| ලිබියාව | 10.84 | 7.30 | 673.33 | 3.85 | 3.27 | (14.05) |
| චීනය | 9.82 | 7.33 | 746.01 | 3.48 | 3.28 | 29.99 |
| ජපානය | 7.92 | 6.90 | 871.54 | 2.81 | 3.10 | 2.10 |
| සිරියාව | 7.39 | 6.19 | 837.65 | 2.62 | 2.77 | (38.99) |
| චිලි | 7.04 | 4.78 | 679.18 | 2.50 | 2.15 | 6.55 |
| ජර්මනිය | 6.68 | 5.43 | 813.15 | 2.37 | 2.44 | 0.12 |
| හොංකොං | 4.97 | 3.57 | 719.73 | 1.76 | 1.60 | 7.82 |
| ජෝර්දානය | 4.68 | 4.28 | 915.33 | 1.66 | 1.92 | 17.90 |
| සෞදි අරාබිය | 4.32 | 4.04 | 933.92 | 1.53 | 1.81 | (2.37) |
| ඇ.එ.ජ. | 4.23 | 3.89 | 918.81 | 1.50 | 1.74 | (7.81) |
| තායිවානය | 4.22 | 2.76 | 654.63 | 1.50 | 1.24 | 41.50 |
| ලෙබනනය | 4.11 | 3.71 | 902.78 | 1.46 | 1.67 | 19.12 |
| යුක්රේනය | 3.76 | 3.30 | 878.82 | 1.33 | 1.48 | (18.61) |
| ඕස්ට්‍රේලියාව | 2.70 | 3.90 | 1445.9 | 0.96 | 1.75 | 15.14 |
| **එකතුව** | **243.20** | **187.08** | **769.24** | **86.29** | **83.89** | **1.37** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව)

### 2.4.4.2 හරිත තේ අපනයනය

2017 වසරේදි සමස්ත තේ අපනයන ආදායමට 2.6% (රුපියල් බිලියන 4.9) ක් උපයා දෙමින් සමස්ත තේ අපනයනයෙන් 1.2% (කි.ග්‍රෑමි 3.4) ක ප්‍රමාණයක් හරිත තේ අපනයනය කර ඇත. ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය කරන රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස වෙත 83.16% ක ප්‍රමාණයක් අපනයනය කරයි. ශ්‍රී ලාංකිය හරිත තේ ආනයනය කරන ප්‍රධාන රටවල් විස්ස අතුරින් ලිබියාව සැලකිය යුතු ප්‍රමාණයක් එනම් සමස්ත ප්‍රමාණයෙන් කි.ග්‍රෑමි 0.76 ක් මෙම වසරේදි ආනයනය කර ඇත. ප්‍රධාන රටවල් 20 හරිත තේ ආනයනය කරන ලද සමස්ත ප්‍රමාණය කි.ග්‍රෑමි 4,178 දහසකි.

වගුව 2.12: ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය කරන ලද ප්‍රධාන රටවල් 20

| රට | ප්‍රමාණය ('000 කි.ග්‍රෑ.) | වටිනාකම (රු.මි.) | නැ.තෙ.නො. (රු./කි.ග්‍රෑ)FOB | ප්‍රමාණය (%) | වටිනාකම (%) | ප්‍රමාණාත්මක වර්ධනය ('16 සාපේක්ෂව '17) |
|---|---|---|---|---|---|---|
| ලිබියාව | 766 | 565 | 737.56 | 15.25 | 7.36 | 2,463.71 |
| රුසියාව | 638 | 767 | 1,202.16 | 12.70 | 9.99 | (1.84) |
| එ.අ.එ.රා. | 472 | 355 | 751.47 | 9.40 | 4.63 | (15.35) |
| ඇ.එ.ජ. | 471 | 956 | 2,026.90 | 9.39 | 12.45 | 4.57 |
| යුක්රේනය | 336 | 385 | 1,146.04 | 6.69 | 5.02 | 8.26 |
| නෙදර්ලන්තය (ඕලන්දය) | 227 | 589 | 2,592.26 | 4.53 | 7.68 | 16.92 |
| එක්සත් රාජධානිය | 166 | 347 | 2,091.81 | 3.30 | 4.53 | 101.96 |
| ඕස්ට්‍රේලියාව | 129 | 381 | 2,951.99 | 2.57 | 4.97 | (2.46) |
| ජර්මනිය | 126 | 152 | 1,207.11 | 2.50 | 1.98 | (29.67) |
| ප්‍රංශය | 123 | 257 | 2,081.21 | 2.46 | 3.35 | 17.86 |
| පෝලන්තය | 101 | 182 | 1,798.07 | 2.01 | 2.37 | 31.42 |
| සෞදි අරාබිය | 95 | 148 | 1,566.43 | 1.89 | 1.93 | 9.12 |
| නයිජීරියාව | 92 | 170 | 1,848.26 | 1.83 | 2.21 | (1.80) |
| තායිවානය | 90 | 88 | 986.11 | 1.78 | 1.15 | 3.05 |
| බෙලාරුසය | 76 | 94 | 1,243.61 | 1.50 | 1.22 | 42.35 |
| චීනය | 70 | 154 | 2,203.93 | 1.39 | 2.00 | 39.74 |
| චිලි | 54 | 105 | 1,950.59 | 1.07 | 1.36 | (11.21) |
| නවසීලන්තය | 52 | 128 | 2,458.31 | 1.04 | 1.67 | 20.05 |
| චෙක් රාජ්‍යය | 48 | 132 | 2,749.86 | 0.95 | 1.72 | 0.92 |
| ෆින්ලන්තය | 46 | 62 | 1,353.31 | 0.91 | 0.80 | 144.35 |
| **එකතුව** | **4,178** | **6,017** | **1,440.20** | **83.16** | **78.40** | **26.25** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

### 2.4.4.3 ක්ෂණික තේ අපනයනය

ශ්‍රී ලංකා වේ ක්ෂණික තේ ආනයනය කරන ප්‍රධාන රට වන අයර්ලන්තය කි.ග්‍රෑ.මි. 1.9 (91.5%) ක ප්‍රමාණයක් ආනයනය කරමින් ශ්‍රී ලංකා වේ ක්ෂණික තේ වෙළෙඳපොළ තුළ ප්‍රධාන භූමිකාවක් උසුලයි. ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ අයර්ලන්තයට පසුව පිළිවෙලින් ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය සහ තායිවානය යන රටවල් වේ. මෙම වසරේදී ක්ෂණික තේ අලෙවිය 2016 වසරට සාපේක්ෂව ප්‍රමාණාත්මකව 5.5 % කින් ඉහළ ගොස් ඇති අතර ආදායම ද 8.6% කින් ඉහළ ගොස් ඇත.

### 2.4.4.4 ආර්.ටී.ඩී (පානය සඳහා පිළියෙල කළ) තේ අපනයනය

ශ්‍රී ලංකාවේ බීමට සූදානම් කළ තේ (RTD) සඳහා හොඳ වෙළෙඳපොලක් ගොඩනැගෙමින් තිබේ. 2017 වසරේදී බීමට සූදානම් කළ තේ (RTD) ලීටර් මිලියන 14.4 ක් අපනයනය කිරීම මගින් රුපියල් මිලියන 1,522 ක අපනයන ආදායමක් උපයනු ලැබීය. 2016 වසර හා සැසඳීමේදී බීමට සූදානම් කළ තේ (RTD) අපනයනය 27.4% ක බිඳවැටීමක් දක්නට ලැබේ. රුපියල් මිලියන 1,451 ක ආදායමක් ලබා දෙමින් ඉන්දියාව ලීටර් මිලියන 14.0 ක් ශ්‍රී ලංකාවෙන් ආනයනය කර ඇත. ශ්‍රී ලංකාවේ බීමට සූදානම් කළ තේ (RTD) සඳහා සෙසු ප්‍රධාන ගැනුම් කරුවන් වන්නේ ඕස්ට්‍රේලියාව, කැනඩාව, කටාර්, බහමාස් සහ එක්සත් රාජධානියයි.

## 2.5. ගෝලීය තේ කර්මාන්තයේ පසුබිම

ලොව වඩාත් ජනප්‍රිය එමෙන්ම විශාල වශයෙන් පරිභෝජනය කරන උණුසුම් පාන අතරින් එකක් වන තේ, ශ්‍රී ලංකාවේ අපනයන අතුරින් ප්‍රමුඛ ස්ථානයක් ගනී. එමගින් ජාතික ආර්ථිකයට සහ සමාජ සංවර්ධනයට විශේෂ මෙහෙයක් සිදු කරනුයේ එම කර්මාන්තයේ ආරම්භයේ සිටමය. දිවයිනේ විශාලතම ආයෝජකයන් අතර ද රඳා පවතින මෙම කර්මාන්තය ශ්‍රී ලංකාවේ අපනයන ආදායම් අතර වැදගත් තැනක් හිමිකර ගනී.

ගෝලීය තේ නිෂ්පාදනයෙන් 82% ක ප්‍රමාණයක් නිපදවනු ලබන්නේ ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව, කෙන්යාව සහ ඉන්දුනීසියාව යන ලොව ප්‍රධාන තේ නිපදවන රටවල් පහ විසින්ය. මෙම රටවල් විසින් සිදු කරනු ලබන අපනයනයන් සමස්ත ගෝලීය අපනයනයන්ගෙන් 76% ක් වේ. චීනය ලෝක තේ වගාවේ වැඩි දියුණුව සඳහා හේතු වී ඇති අතර අප්‍රිකා මහද්වීපය විශේෂයෙන්ම කෙන්යාව ද විශාල අස්වැන්නකට හිමිකම් කියයි. වෙනත් තේ නිෂ්පාදකයන් හා සසඳමින් ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාවට හිමි තැන පිළිබඳව සලකා බැලීමේදී 2017 වසරේදී දක්නට ලැබෙන්නේ අපනයනයන් හා නිෂ්පාදන ප්‍රමාණයන් තරමක යහපත් තත්වයක පැවති බවත් එමෙන්ම ඒකක මිල (වෙන්දේසිය) සහ අපනයන ආදායම අනෙකුත් නිෂ්පාදිත රටවල් හා සැසඳීමේදී ඉහළ අගයක් ගත් බවත්ය.

## 2.5.1 ගෝලීය තේ වගාව

2016 වසර අවසන් වන විටදී ලොව තේ වගාව හෙක්ටයාර් මිලියන 04 කට වඩා ප්‍රමාණයක ව්‍යාප්තව ඇතැයි තක්සේරු කර ඇත.

වගුව 2.13: විශාලතම තේ වගාබිම්

| රට | 2010 (හෙක්.) | 2011 (හෙක්.) | 2012 (හෙක්.) | 2013 (හෙක්.) | 2014 (හෙක්.) | 2015 (හෙක්.) | 2016 (හෙක්.) |
|---|---|---|---|---|---|---|---|
| චීනය | 1,970,200 | 2,112,510 | 2,279,940 | 2,468,840 | 2,649,840 | 2,810,000 | 2,920,000 |
| ඉන්දියාව | 560, 609 | 579,350 | 563,980 | 563,980 | 566,660 | 566,660 | 577,480 |
| **ශ්‍රී ලංකාව*** | **188,007** | **187,860** | **187,000** | **187,000** | **187,935** | **188,000** | **202,839** |
| කෙන්යාව | 171,916 | 187,855 | 190,717 | 198,657 | 203,006 | 209,426 | 218,538 |
| වියට්නාමය | 129,000 | 127,000 | 124,027 | 124,000 | 125,000 | 125,000 | 134,000 |
| ඉන්දුනීසියාව | 122,796 | 122,764 | 121,076 | 122,546 | 121,000 | 119,361 | 118,100 |
| මියන්මාරය | 78,400 | 78,500 | 78,500 | 78,700 | 78,700 | 79,000 | 80,000 |
| තුර්කිය | 77,500 | 77,700 | 77,800 | 77,000 | 77,400 | 77,500 | 77,000 |
| බංගලිදේශය | 54,900 | 54,400 | 54,500 | 54,000 | 53,700 | 53,500 | 59,000 |
| ජපානය | 46,800 | 46,200 | 45,900 | 44,800 | 44,800 | 39,300 | 43,100 |

මූලාශ්‍රය ජාත්‍යන්තර තේ කමිටු වාර්ෂික වාර්ථාව - 2017
*ඇස්තමේන්තුගත ප්‍රදේශ

ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්තාවට අනුව වැඩිම තේ වගා ව්‍යාප්තියක් දකින්නට ලැබෙන්නේ චීනයෙනි. (62%) වාර්ෂිකව එහි වගා ව්‍යාප්තියේ සීඝ්‍ර වර්ධනයක් දකින්නට ලැබේ. කෙන්යාව ද 2010 -2016 කාලය තුළදී තේ වගාවේ ඉහළ ව්‍යාප්තියක් කරා ළඟා විය. ලොව සමස්ත තේ වගා ව්‍යාප්තියෙන් 94% ක ප්‍රමාණයකට හිමිකම් කියනුයේ තේ වගාකරන ප්‍රධාන රටවල් 10 යි.

## 2.5.2 ගෝලීය තේ පරිභෝජනය

2014 -2016 වසර තුනක කාල පරිච්ඡෙදය තුළ දී වාර්ෂික තේ පරිභෝජනය සහ ත්‍රෛවාර්ෂික සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය සලකා බැලීමේදී, වාර්ෂික තේ පරිභෝජනය ඉහළින්ම පවතින්නේ චීනයේ ය. එය කි.ග්‍රෑ.මිලියන 1,791.33 ලෙස වාර්තාවී ඇත. නමුත් ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 1.31 ලෙස පහළ අගයක් ගනී. වාර්ෂික තේ පරිභෝජනය කි.ග්‍රෑ.මිලියන 247.33 ක් වන තුර්කිය ඉහළම ඒක පුද්ගල තේ පරිභෝජනය වන කි.ග්‍රෑ. 3.20 ක ප්‍රමාණය වාර්තා කරයි.

වගුව 2.14: රටවල් අනුව තේ පරිභෝජනය

| රට | 2010-12 | | 2011-13 | | 2012-14 | | 2013-15 | | 2014-16 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල |
| ලිබියාව | 13.6 | 2.39 | 13.23 | 2.34 | 15.27 | 2.7 | 13.37 | 2.19 | 14.77 | 2.4 |
| ඇෆ්ගනිස්ථානය | 49.27 | 1.97 | 55.9 | 2.19 | 63.03 | 2.73 | 64.77 | 2.44 | 59.4 | 2.2 |
| තුර්කිය | 240.8 | 3.24 | 242 | 3.22 | 236.81 | 3.18 | 241.67 | 3.14 | 247.33 | 3.2 |
| එක්සත් රාජධානිය | 123.51 | 1.97 | 122.21 | 1.91 | 114.97 | 1.81 | 111.64 | 1.74 | 109.49 | 1.68 |
| මොරොක්කෝව | 56.17 | 1.74 | 56.5 | 1.73 | 55.1 | 1.74 | 58.53 | 1.73 | 63.58 | 1.86 |
| අයර්ලන්ත ජනරජය | 8.51 | 1.9 | 7.44 | 1.62 | 7.18 | 1.56 | 7.39 | 1.6 | 7.70 | 1.66 |
| තායිවානය | 44 | 1.64 | 42.53 | 1.59 | 42.1 | 1.56 | 41.5 | 1.53 | 39.01 | 1.44 |
| කටාර් | 2.53 | 1.46 | 2.67 | 1.45 | 2.73 | 1.61 | 3.08 | 1.81 | 3.34 | 1.51 |
| ශ්‍රී ලංකාව | 27.79 | 1.33 | 27.49 | 1.35 | 27.47 | 1.36 | 27.91 | 1.35 | 28.07 | 1.34 |
| හොංකොං | 9.48 | 1.34 | 9.52 | 1.33 | 9.73 | 1.38 | 10.1 | 1.39 | 10.71 | 1.46 |
| චිලි | 21.4 | 1.24 | 21.13 | 1.21 | 20.87 | 1.22 | 20.96 | 1.18 | 21.11 | 1.17 |
| සිරියාව | 26.5 | 1.25 | 24.13 | 1.14 | 19.03 | 0.96 | 17.92 | 0.86 | 13.10 | 0.78 |
| ඊජිප්තුව | 91.63 | 1.14 | 94.37 | 1.14 | 100.78 | 1.22 | 96.65 | 1.11 | 93.22 | 1.05 |
| ඉරාකය | 40.35 | 1.21 | 37.65 | 1.11 | 34.52 | 1.18 | 33.88 | 0.95 | 35.87 | 0.98 |
| ඉරානය | 74.7 | 0.99 | 82.8 | 1.07 | 79 | 1.05 | 74.27 | 0.95 | 70.93 | 0.90 |
| චීනය | 1279.33 | 0.95 | 1408.67 | 1.04 | 1537 | 1.14 | 1665.33 | 1.22 | 1791.33 | 1.31 |
| ඉන්දියාව | 871.67 | 0.73 | 889.67 | 0.73 | 908 | 0.74 | 927 | 0.75 | 946.67 | 0.78 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS) | 275.29 | 0.99 | 279.84 | 0.96 | 275.75 | 0.94 | 251.67 | 0.88 | 256.73 | 0.90 |
| පාකිස්ථානය | 125.92 | 0.74 | 128.02 | 0.72 | 131.92 | 0.73 | 138.79 | 0.74 | 154.50 | 0.81 |
| ඇ.එ.ජ. | 126.65 | 0.41 | 127.76 | 0.41 | 128.33 | 0.41 | 129.67 | 0.41 | 129.99 | 0.40 |
| ජපානය | 122.29 | 0.96 | 120.23 | 0.94 | 116.93 | 0.91 | 112.63 | 0.89 | 107.41 | 0.84 |
| ඉන්දුනීසියාව | 75 | 0.32 | 84.67 | 0.34 | 84 | 0.34 | 81 | 0.32 | 86.00 | 0.34 |
| බංගලිදේශය | 68.4 | 0.45 | 71.07 | 0.47 | 71.1 | 0.48 | 73.4 | 0.47 | 76.33 | 0.49 |
| පෝලන්තය | 30.95 | 0.8 | 31.95 | 0.83 | 32.51 | 0.85 | 34.27 | 0.89 | 35.30 | 0.93 |
| ජර්මනිය | 26.9 | 0.33 | 28.17 | 0.34 | 29.95 | 0.37 | 30.93 | 0.38 | 32.10 | 0.39 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්ෂික වාර්තාව - 2017
එකතුව : කිලෝ ග්‍රෑම් මිලියන
ඒක පුද්ගල : කිලෝ ග්‍රෑම්

## 2.5.3. ගෝලීය තේ නිෂ්පාදනය

2017 වසරේදී ගෝලීය තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. බිලියන 5.7 දක්වා ළඟාවී ඇත. 2016 වසර හා සැසඳීමේදී 2.2% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2017 වසර සඳහා චීනය, ඉන්දියාව, කෙන්යාව, ශ්‍රී ලංකාව, තුර්කිය, වියට්නාමය සහ ඉන්දුනීසියාව එකතුව සමස්ත ගෝලීය තේ නිෂ්පාදනයෙන් 90% පමණ නිෂ්පාදනය කර ඇත ඉන්දියාව සහ චීනය තවමත් විශාලතම තේ නිෂ්පාදකයන් වන නමුත් ඔවුන් රට තුළදී ම සැලකියයුතු ප්‍රමාණයකින් තේ පරිභෝජනය කරන නිසා ලොව විශාලතම තේ අපනයන කරු බව ට කෙන්යාව පත්ව ඇත. චීනය තේ අපනයනයේ දී දෙවන තැන හිමිකරගෙන ඇති අතර ශ්‍රී ලංකාව තුන් වන ස්ථානයේ පසුවේ.

සිව් වැනි විශාලතම නිෂ්පාදකයා ලෙස තම ස්ථානය රැක ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී ඇති අතර පස් වැනි, සය වැනි සහ සත් වැනි තේ නිෂ්පාදකයන්ගේ නිෂ්පාදනයන් ඉහළ යාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් නොකරන අතර මෑතකදී ශ්‍රී ලංකාවට අභියෝගයක් වන තරමේ නැගී ඒමක් දක්නට නොලැබේ.
කි.ග්‍රෑ. මිලියන 2,550 ක් නිපදවමින් චීනය ඉහළම තැන හිමිකරගෙන සිටින අතර ඉන්දියාව මෙම වසරේදී වාර්ෂික නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන 1,279 ක් නිපදවමින් දෙවැනි ස්ථානයෙහි පසුවෙයි. කෙන්යාව කි.ග්‍රෑ. මිලියන 440ක් නිපදවමින් තුන්වන තැනෙහි පසු වෙයි.

සටහන 2.5: ගෝලීය තේ නිෂ්පාදනය




මූලාශ්‍රය: අතිරේකය, ජාත්‍යන්තර තේ කමිටු 2017 වාර්තාව

## 2.5.4 ගෝලීය තේ අලෙවිය

2017 වසරේ දි කොළඹ තේ වෙන්දේසිය මගින් කි.ග්‍රෑ. 01 ක් සඳහා සාමාන්‍ය මිල ඇ.ඩො. 4.07 සහිතව කි.ග්‍රෑ. මිලියන 296 ක ප්‍රමාණයක් වෙන්දේසි කර ඇත. කෙසේ නමුත් මොම්බාසා වෙන්දේසියේ ද කි.ග්‍රෑ. මිලියන 398 ට වැඩි ප්‍රමාණයක් වෙන්දේසි කර ඇති අතර කල්කටා වෙන්දේසියේදි කි.ග්‍රෑ. මිලියන 168 ක ප්‍රමාණයක් අලෙවි කර ඇත.

වගුව 2.15: ප්‍රධාන තේ වෙන්දේසි දත්ත
(ප්‍රමාණය - කි.ග්‍රෑ. මිලියන,/ සාමාන්‍ය ඒකක මිල ඇ.එ.ඩො./කි.ග්‍රෑ.)

| වෙන්දේසි මධ්‍යස්ථානය | 2014 | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල |
| චිතගොං | 67 | 2.19 | 64 | 2.41 | 72 | 2.55 | 80 | 2.45 |
| කොචින් | 53 | 1.66 | 55 | 1.55 | 47 | 1.74 | 49 | 1.81 |
| **කොළඹ** | **334** | **3.56** | **316** | **2.99** | **277** | **3.22** | **296** | **4.07** |
| ගුවාති | 129 | 2.32 | 145 | 2.16 | 139 | 2.05 | 166 | 2.16 |
| ජකර්තා | 26 | 1.66 | 20 | 1.56 | 27 | 1.62 | - | - |
| කල්කටා | 142 | 2.65 | 143 | 2.47 | 142 | 2.41 | 168 | 2.46 |
| ලිම්බෙ | 9 | 1.43 | 8 | 1.56 | 9 | 1.55 | 9 | 1.84 |
| මොම්බාසා | 390 | 2.03 | 359 | 2.73 | 401 | 2.29 | 398 | 2.81 |

(මූලාශ්‍රය ජාත්‍යන්තර තේ කමිටුවේ වෙබ් අඩවිය)

පසුගිය වසර තුන තුළදී කොළඹ තේ වෙන්දේසිය ඉහළම සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කරන ලදි. 2017 වසරේ දී කි.ග්‍රෑ. 01 ක් සඳහා ඇ.ඩො. 4.00 ඉක්මවූ එකම වෙන්දේසිය වූයේ ද කොළඹ තේ වෙන්දේසියයි.

අදාළ වසර තුළදී මොම්බාසා සහ කල්කටා වෙන්දේසිවල සාමාන්‍ය මිල 2016 වසර හා සැසඳීමේදි ඉහළ අගයක් ගනී. මොම්බාසා දෙවැනි ඉහළ සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කළ අතර කල්කටා වෙන්දේසිය කිලෝ ග්‍රෑමයකට ඇ.ඩො. 2.46 ක් සහිතව තුන්වෙනි තැනට පත්විය.

## 2.5.5 ගෝලීය තේ අපනයනය

සටහන 2.6. ප්‍රධාන තේ අපනයනකරුවන්




මූලාශ්‍රය: අතිරේකය, ජාත්‍යන්තර තේ කමිටු වාර්තාව - 2017
සටහන: ශ්‍රී ලංකා දත්ත - ප්‍රති අපනයනයන් ඇතුළත් නොවේ.

පසුගිය වසර හා සැසඳීමේදි 2017 වසරේ ගෝලීය තේ අපනයනය කි.ග්‍රෑ. මිලියන 19.5 (1.1%) කින් පහළ වැටුනි. මෙම වසරේ දි තේ අපනයනය කරන වෙනත් ප්‍රධාන රටවල් හා සැසඳීමේදි චීනය සහ ඉන්දියාව සිය අපනයන ප්‍රමාණය වැඩි කරගත් අතර එය 8.1% සහ 10.2% ක වර්ධනයකි. විශාලතම තේ අපනයන කරුවන් තිදෙනා වන කෙන්යාව, චීනය සහ ශ්‍රී ලංකාව ගෝලීය තේ අපනයනයෙන් 59% කට වඩා වැඩි කොටසකට දායක වී ඇත.
ප්‍රමුඛ පෙළේ තේ අපනයන කරුවන්ගේ 2016 වසරේ අපනයන ආදායම් පහත වගුව මගින් අනාවරණය කෙරේ. තේ අපනයන මගින් වැඩිම ආදායමක් උපයාගනු ලැබුයේ චීනය බව එමගින් හෙලිවේ. දෙවැනි තැන හිමිවන ශ්‍රී ලංකාවට පිරිසිදු ශ්‍රී ලංකා තේ අපනයනය මගින් එ.ජ.ඩොලර් බිලියන 1.2 කර්මාන්තයක තත්වය තවදුරටත් රැකගැනීමට සමත්විය. ඒ අතර කෙන්යාව තම තේ අපනයනය මගින් තුන්වෙනියට ආදායම් උපයාගැනීමට සමත් වී ඇති බව දක්නට ලැබේ.

වගුව 2.16: ඉහළම අපනයන ආදායම් (2016)

| රට | අපනයන ආදායම (ඇ.ඩො. මිලියන) |
|---|---|
| ශ්‍රී ලංකාව | 1,269.00 |
| කෙන්යාව | 1,189.74 |
| චීනය | 1,484.91 |
| ඉන්දියාව | 634.82 |
| වියට්නාමය | 236.32 |
| ඉන්දුනීසියාව | 113.37 |

(මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශය - 2017)

## 2.6 ශ්‍රී ලංකා තේ පිළිබඳ අපනයන වෙළඳපොල විශ්ලේෂණය

මෑත වසර කීපය හා සංසන්දනය කිරීමේදී අපනයනය කළ අඩුම තේ ප්‍රමාණය වාර්තා වුවද ඉහළම සාමාන්‍ය ඒකක නැ.තෙ.නො. අගය පාදක කරගනිමින් 2017 වසරේදි තුන්වැනියට විශාලතම තේ අපනයන ආදායම වාර්තා කරන ලදි. කිලෝ ග්‍රෑම් මිලියන 278 ක් වූ එම අපනයන ප්‍රමාණය, 2014 වසරේදි වාර්තා වූ කිලෝ ග්‍රෑම් මිලියන 318 ක්වූ අපනයන කළ ඉහළම ප්‍රමාණය අනුව බැලූ කල ඉතාමත් පහළ අගයක් ගනී.
ප්‍රධාන ගැනුම්කරුවකු වන සිරියාවේ පැවතුනු ගැටුම් නීති විරෝධි කණ්ඩායම් සඳහා මග හෙළිකළ අතර නව පාලන කණ්ඩායම් රට පාලනය කරමින් ආදායම් උපයන්නට විය. ලිබියාවේ ද මෙයට සමාන තත්වයක් වේ. ආයුධ සන්නද්ධ කණ්ඩායම් රාජ්‍ය දේපල, යටිතල පහසුකම් සහ ලාභ උපදවන මාර්ග සංවර්ධනය සියතට ගෙන තිබුණි. ඉරාකයේ, හොඳින් ස්ථාපිත වූ ඡායා ආර්ථිකය ඉදිරියට පැවතෙමින් ISIS වැනි කණ්ඩායම්වලට තමන් රැස් කරගත් සම්පත් ආරක්ෂා කරගැනීම සඳහා ශක්තිය ලබාදෙමින් පවතී. එකී වර්ධනයන්, ඔවුන්ගේ රාජ්‍ය බලය නැවත ප්‍රකාශයට පත්කිරීම සඳහා ප්‍රධාන අභියෝගයක් බවට පත්ව ඇති අතර වසර පුරා සාකච්ඡා වෙන රාජ්‍යයේ දේශපාලන ආර්ථිකය පිළිබඳව අවසාන ගැටුම ද විය හැකියි.
එහෙයින් 2017 වසරේදි සිරියාවේ සහ ලිබියාවේ ලංකා තේ අපනයනය පහත වැටීමක් වාර්තා වේ. සමස්ත තේ අපනයනයෙන් 13.6% ක ප්‍රමාණයක් සහිතව, ලංකා තේවල ප්‍රධාන ගැනුම්කරුවා ලෙස තුර්කිය පෙරට පැමිණ ඇත. (ඉතිහාසයේ ප්‍රථම වතාවට) ඉරාකය 12% කට වැඩි කොටසකට හිමිකම් කියමින් දෙවැනි තැනට පත්ව ඇත. 11.8% ක කොටසක් සහිතව රුසියාව තුන්වැනි ස්ථානය රැකගෙන ඇත. ලිබියාව, තුර්කිය, ඉරාකය සහ ජෝර්දානය යන රටවල්වලට ලංකාවෙන් තේ ආනයනය කිරීම සැලකියයුතු ලෙස වැඩිවී ඇත. නමුත් ඔවුන් ආර්ථික පරිහානියකට මග පාදන අභ්‍යන්තර ගැටුම්වලට මුහුණ දුන් බව දක්නට ලැබේ.

## 2.6.1 රුසියාව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS) කලාපය

2016 සහ 2017 වසරවලදී රුසියානු සමූහාණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යය (CIS) කලාපයට ආනයනය කළ සමස්ත තේ ප්‍රමාණයන් පහත වගුව මගින් දිස්වේ. 2017 වසරේදී පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යය (CIS) කලාපයට ශ්‍රී ලංකාව තේ මෙ.ටො. 51,632 ක් අපනයනය කර ඇත. එය 2016 හා සැසඳීමේදී මෙ.ටො. 386ක සුළු අඩුවීමක් පෙන්නුම් කරයි.

2017 වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ප්‍රමාණයෙන් (මෙ.ටො. 278,195) 18.56% ක් පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යය (CIS) කලාපයට ආනයනය කර ඇත.

වගුව 2.17: රුසියාව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය කලාපය ආනයනය කළ සමස්ත තේ ප්‍රමාණය

| රට | 2017 (කි.ග්‍රෑ.) | 2016 (කි.ග්‍රෑ.) | ප්‍රමාණයේ වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය (%) |
|---|---|---|---|---|
| රුසියාව | 32,794,648 | 34,079,116 | (1,284,468) | (3.77) |
| යුක්රේනය | 3,756,570 | 4,634,113 | (877,543) | (18.94) |
| අසර්බයිජානය | 12,270,316 | 10,543,827 | 1,726,489 | 16.37 |
| කසකස්ථානය | 658,678 | 463,810 | 194,868 | 42.01 |
| උස්බෙකිස්ථානය | 603,812 | 510,012 | 93,800 | 18.39 |
| කිර්ගිස්ථානය | 711,076 | 912,068 | (200,992) | (22.04) |
| බෙලරුසියාව | 385,474 | 273,697 | 111,777 | 40.84 |
| මෝල්දෝවා | 82,193 | 130,556 | (48,363) | (37.04) |
| ජෝර්ජියාව | 257,618 | 312,118 | (54,500) | (17.46) |
| ටජිකිස්ථානය | 61,335 | 82,721 | (21,386) | (25.85) |
| ටර්ක්මෙනිස්ථානය | 24,186 | 55,210 | (31,024) | (56.19) |
| ආර්මේනියාව | 26,466 | 20,832 | 5,634 | 27.04 |

### 2.6.1.1 රුසියාව



පරිභෝජනය සඳහා තේ ආනයනය කරන ලොව විශාලතම ආනයනකරු වන රුසියානු සමූහාණ්ඩුව ඇ.ඩො. මිලියන 525 ක වටිනාකමකින් යුතු තේ කි.ග්‍රෑ. මිලියන 170 ක් පමණ වාර්ෂිකව ආනයනය කරනු ලබයි. ප්‍රධාන වශයෙන් කළු තේ පරිභෝජනය කරන රුසියාවේ ඒක පුද්ගල පරිභෝජනය කි.ග්‍රෑ. 1.2 ක් පමණ වේ.

2016 වසරේ මෙ.ටො. 164,485 ක් වශයෙන් වූ තේ ආනයනය 2017 වසරේදී මෙ.ටො. 168,785 ක් ලෙස රුසියානු රේගු තොරතුරු නියෝජිත ආයතනයේ සංඛ්‍යාලේඛන මගින් පෙන්වා දෙයි. ඒ අනුව රුසියාවට තේ ආනයනය ප්‍රමාණාත්මකව 2.61% (මෙ.ටො.4,298) ක වැඩිවීමක් දක්නට ලැබේ. කෙසේ වෙතත් සමස්ත ආනයනය වටිනාකම අනුව ඇ.ඩො. මිලියන 549 සිට ඇ.ඩො. මිලියන 525 දක්වා 4.31% (ඇ.ඩො. මිලියන 23.6) ක පහත වැටීමක් දක්නට ලැබේ.

අපනයනය කරන තේ ප්‍රමාණය අනුව බැලූකල පෙනී යන්නේ ශ්‍රී ලංකා තේ වලට රුසියානු තේ වෙළඳපොළෙහි තිබූ ප්‍රමුඛතාවය පසුගිය අවුරුදු තුන තුළදී බිඳවැටී ඇති බවයි. අපනයනය කළ තේ ප්‍රමාණයෙන් 29% ක වෙළෙඳපොල කොටසක් සහිතව ඉන්දියාව 2017 වසරේදී රුසියාව සඳහා ප්‍රධානතම තේ අපනයනයකරුවා වූ අතර ශ්‍රී ලංකාව 22% ක වෙළඳපොළ කොටසකට හිමිකම් කියමින් දෙවන ස්ථානයට පත්විය. නමුත් වටිනාකම අතින් ලංකාව තවදුරටත් 33% ක කොටසක් සහිතව ප්‍රමුඛ තැනෙහි පසුවේ. රුසියාවට තේ අපනයනයකරන රටවල් අතුරින් ශ්‍රී ලංකාවේ සෙසු තරඟකරුවන් වන්නේ කෙන්යාව, වියට්නාමය, චීනය සහ ඉන්දුනීසියාව යන රටවල් ය.

ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත් කර ඇති සංඛ්‍යාලේඛනවලට අනුව 2016 වසරේදී මෙ.ටො. 34,079 සිට 2017 වසරේදී මෙ.ටො. 32,795 දක්වා රුසියානු සමූහාණ්ඩුව වෙත අපනයනය කළ ලංකා තේ ප්‍රමාණය 3.8% (මෙ.ටො. 1,284) ප්‍රමාණයකින් පහත වැටී ඇත. පෙර ඇසුරුම් තේ ප්‍රමාණය 2016 වසරේදී මෙ.ටො. 6,373 ක් වූ අතර 2017 වසරේදී මෙ.ටො. 5,822 ක් වශයෙන් 8.65% (මෙ.ටො.-551) ආසන්න අනුපාතයකින් පහත වැටී ඇත. එමෙන්ම පසුගිය වසරට සාපේක්ෂව තේ මළු ක්ෂේත්‍රය සහ ඇසුරුම් ක්ෂේත්‍රය ද පිළිවෙලින් මෙ.ටො 393 කින් සහ මෙ.ටො. 158 කින් බිඳවැටීමකට ලක්ව ඇත.

ලංකා තේ වලින් වැඩි ප්‍රමාණයක් රුසියාවට ආනයනය කරනුයේ තොග වශයෙනි. 2017 වසරේදී තොග තේ 82.2% ක ප්‍රමාණයක් ආනයනය කර ඇත. වැඩි වශයෙන් තොග තේ ආනයනය සඳහා හේතු වනුයේ රුසියාවේ තේ ආනයන තීරුබදු ව්‍යුහය අනුව තොග තේ සඳහා තීරුබදු 0% වන අතර පෙර ඇසුරුම් තේ සඳහා තීරුබදු 12.5% වේ. රුසියාවේ දේශීය තේ ඇසුරුම් කර්මාන්තයේ ව්‍යාප්තිය ද සැලකිය යුතු තරමින් තොග තේ ආනයනය වැඩිවීමට හේතුවී ඇත.

සමස්ත තේ අපනයන ආදායම 2016 වසරේ දී රුපියල් මිලියන 20,403 ක් ව තිබූ අතර 2017 වසරේදී එය රුපියල් මිලියන 25,965 ක් දක්වා සැලකිය යුතු තරමින් ඉහළ යෑමක් සිදුවී ඇත. 2016 වසර හා සැසඳීමේදී 2017 වසරේ අපනයන ප්‍රමාණයෙහි බිඳවැටීමක් සිදුවී ඇත. නමුත් තේ වෙළෙඳපොල මිල ගණන් ඉහළ යාම නිසා රුසියාව වෙත තේ අපනයනයෙන් ලද ආදායම 27.2% ක් ලෙස සුළු වශයෙන් ඉහළ යාමක් සිදුවී ඇත.

### 2.6.1.2 යුක්රේනය



ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත් කර ඇති සංඛ්‍යාලේඛනවලට අනුව 2017 වසරේදී යුක්රේනය වෙත අපනයනය කළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය මෙ.ටො. 3,757 කි. එහි වටිනාකම රුපියල් මිලියන 3,348 ක් වේ. යුක්රේනය වෙත අපනයනය කළ තේ ප්‍රමාණයෙන් 77% පමණ තොග වශයෙන් වු අතර 19.4% ක් තේ ඇසුරුම් වශයෙන් සහ 3.6 % පමණ තේ මළු වශයෙන් විය.

2016 වසරේදී වටිනාකම රුපියල් මිලියන 3,203 කින් යුතු තේ මෙ.ටො.4,635 ක ප්‍රමාණයක් යුක්රේනයට අපනයනය කර ඇත. ඒ අනුව 2017 වසරේදී වටිනාකම අනුව 4.5% ක ඉහළ යාමක් සහ ප්‍රමාණය අනුව 19% ක පහළ වැටීමක් වාර්තා වේ.

යුක්රේනය වෙත අපනයනය කළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය පහත වැටීම සඳහා කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළයාම හේතුවී ඇත. එමෙන්ම තේ අපනයන ඉපයීම් ඉහළ යාම සඳහා ද හේතු වී ඇත.

වාර්ෂිකව එක් යුක්රේනියානු වැසියෙකු තේ ග්‍රෑම් 500-600 අතර ප්‍රමාණයක් පරිභෝජනය කරයි. වෙළෙඳපොල තුළ වාර්ෂිකව ටොන් 18-20 දහසක ධාරිතාවයක් පවතී.

යුක්රේනයේ සංඛ්‍යා ලේඛන නියෝජිතායතනයට අනුව 2016 වසරේදී එ.ජ.ඩො. මිලියන 68 ක වටිනාකමක් ඇතිව රටට ආනයනය කළ සමස්ත තේ ප්‍රමාණය මෙ.ටො. 18,311 කි. ශ්‍රී ලංකාව ප්‍රමාණය අනුව 30% ක වෙළඳපොළ කොටසක් ඇතිව යුක්රේන තේ වෙළඳපොලේ ප්‍රමුඛස්ථානයේ පසුවෙන අතර සෙසු ප්‍රධාන සැපයුම්කරුවන් වන ඉන්දියාව, එ.අ.එ. රාජ්‍යය, චීනය, කෙන්යාව සහ වියට්නාමය ආදි රටවල් පසුපසින් ඇත.

### 2.6.1.3 අසර්බයිජානය



අසර්බයිජානයේ වඩාත් ප්‍රචලිත පානය වනුයේ තේ ය. අසර්බයිජානය ලෝකයේ වැඩිම ඒක පුද්ගල තේ පරිභෝජනය වාර්තා වන රටකි. අසර්බයිජානයේ තේ සංස්කෘතිය බොහෝ කාලයක සිට පැවතගෙන එන්නකි. මෙම රටේ ජනයාගේ දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට තේ පත්ව ඇත.

2016 වසරේදී අසර්බයිජානයේ ප්‍රධානම තේ සැපයුම් කරු බවට පත්වෙමින් 90% කට වඩා වු වෙළෙඳපොල කොටසකට හිමිකම් පෑමට ශ්‍රී ලංකාව සමත්විය.

2016 වසරේදී ශ්‍රී ලංකාවෙන් අසර්බයිජානය ට තේ මෙ.ටො. 10,543 ක් අපනයනය කළ අතර 2017 වසරේදී එය මෙ.ටො.12,270 ක් විය. ඒ අනුව 16.37% (මෙ.ටො.1,726) ක වැඩිවීමක් දක්නට ලැබේ.
උපයාගත් ආදායමෙහි ද විශිෂ්ට වර්ධනයක් දකින්නට ලැබේ. 2016 වසරේදී ආදායම වු රුපියල් මිලියන 6,606 සිට රුපියල් මිලියන 9,582 ක් දක්වා වැඩිවීමක් සිදුවී ඇත. කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ඉහළයාම ද මේ සඳහා හේතුවිය.

අසර්බයිජානයේ පවතින දේශීය තේ ඇසුරුම් කර්මාන්තය සඳහා අමු ද්‍රව්‍ය වශයෙන් 96% ක් තරම් වු තේ ප්‍රමාණයක් තොග වශයෙන් ශ්‍රී ලංකාවෙන් අසර්බයිජානය වෙත අපනයනය කරයි.

### 2.6.1.4 කසකස්ථානය



කසකස්තානයේ වඩාත් සම්ප්‍රදායික පානය වන තේ එහි සියළුම වයස් කාණ්ඩවල සහ සියළුම ආදායම් මට්ටම්වල සිටින ජනයා දවස පුරා පරිභෝජනය කරයි.

ඊට අමතරව, සෙම්ප්‍රතිශ්‍යාව සහ බඩේ කැක්කුම වැනි රෝග ගණනාවක සුවතාවය සඳහා උපකාරී වන ස්වභාවික සහ සෞඛ්‍යමය උණුසුම් පානයක් ලෙස කසකස්තානය තුළ තේ වලට පිළිගැනීමක් තිබේ. පාරිභෝගිකයාගේ සෞඛ්‍යමය අවබෝධය ඉහළයාම අලෙවිය වැඩිවීමට හේතුවේ.

කසකස්තානය වෙත ශ්‍රී ලංකා තේ අපනයනය 2017 වසරේදී විශාල ලෙස වැඩි වී ඇත. ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත්කර ඇති සංඛ්‍යාලේඛනවලට අනුව 2016 දී අපනයන ප්‍රමාණය වු මෙ.ටො. 464 ට 2017 වසරේදී තේ මෙ.ටො. 195 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා තේ අපනයනයෙන් උපයාගත් ආදායම ද රුපියල් මිලියන 286 සිට රුපියල් මිලියන 540 දක්වා ඉහළ ගොස් ඇත.

### 2.6.1.5 උස්බෙකිස්ථානය



උස්බෙකිස්තානුවන් අතර තේ පරිභෝජනය සම්බන්ධයෙන් බලවත් විරාගත සම්ප්‍රදායක් පවතී. මිලියන 20 ක් පමණ වු තේ වෙළඳපොළක් ඇත. 95% පමණ වු වෙළඳපොළ කොටසක් සහිතව චීනය ප්‍රධාන සැපයුම් කරුවා වන මෙම උස්බෙකිස්තාන වෙළඳපොළෙහි ප්‍රධාන තැනගෙන ඇත්තේ හරිත තේ වේ.

තේ වගා කිරීමේ සහ නිෂ්පාදනය කිරීමෙහි නියැලෙන්නේ නැති නමුත් උස්බෙකිස්තානය තුළ මද්‍යසාර විරහිත ප්‍රධාන පානය ලෙස තේ ඓතිහාසිකව පැවතේ. මෙම තත්ත්වය පසුගිය දශක දෙක තුළ යම් පමණකින් අඩුවීමක් දක්නට ලැබේ. ඒ සඳහා හේතු වනුයේ දරාගත හැකි මිල ගණන් යටතේ මද්‍යසාර විරහිත වෙනත් විවිධ පාන වර්ග ප්‍රචලිත වීමයි. උස්බෙකිස්තානයට ශ්‍රී ලංකා තේ අපනයනය 2016 වසරේදී මෙ.ටො. 510සිට 2017 දී මෙ.ටො. 604 දක්වා 18% කින් වර්ධනය වීමක් දක්නට ලැබේ.

2017 වසරේදී ශ්‍රී ලංකා තේ උස්බෙකිස්තානයට අපනයනය කිරීමෙන් උපයාගත් ආදායම ද 2016 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 137 කින් වැඩිවී ඇත.

### 2.6.1.6 කිර්ගිස්ථානය



කිර්ගිස්තානය ප්‍රමුඛ පෙළේ කළු තේ පානය කරන රටකි. වෙළෙඳපොල මූලාශ්‍ර පෙන්වා දෙන පරිදි එම රටේ වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 4000 ක් ලෙස ගණන් බලා ඇත. ජනගහනය මිලියන 5.7 ක් වන මෙහි වාර්ෂික ඒක පුද්ගල තේ පරිභෝජනය ග්‍රෑම් 700 පමණ වේ. සමස්ත තේ වෙළෙඳපොළෙන් 90% ක ප්‍රමාණයක් සහිතව කළු තේ වඩාත් ප්‍රචලිතව පවතී.

කිර්ගිස්තානය සඳහා ප්‍රධාන තේ අපනයනකරුවා වන ශ්‍රී ලංකාව 2016 වසරේදී 25% ආසන්න වෙළෙඳපොළ කොටසකට හිමිකම් කියයි.

ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත් කර ඇති සංඛ්‍යාලේඛන වලට අනුව කිර්ගිස්තානය වෙත ඍජු අපනයනය කළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය 2016 වසරේදී මෙ.ටො. 912 ක් වූ අතර 2017 වසරේදී මෙ.ටො. 711 ක් විය. ඒ අනුව 2017 වසරේදී අපනයනය කර ඇති තේ ප්‍රමාණය 22% කින් පහත වැටීමක් සනිටුහන් කරයි.

ආසන්න වශයෙන් 90% ක් ම තේ අපනයනය කර ඇත්තේ තොග ස්වරූපයෙනි. 2017 වසර සඳහා මෙම වෙළඳපොළ වෙත පෙර ඇසුරුම් තේ අපනයනයද 62% බිඳවැටීමක් වාර්තා කරයි. ශ්‍රී ලංකා තේ අපනයනය මගින් උපයාගත් ආදායම ද 2016 වසරේදී රුපියල් මිලියන 555 ක සිට 2017 වසරේදී රුපියල් මිලියන 543 දක්වා සුළු වශයෙන් (රු. මිලියන 12) පහත වැටී මක් සිදු වී ඇත.

### 2.6.1.7 බෙලාරුස්



මිලියන 9.5 ක ජනගහනයක් වසන බෙලාරුස් හි වෙළඳපොළ තොරතුරු අනුව සමස්ත තේ වෙළෙඳපොළ වාර්ෂිකව මෙ.ටො. 5000-7000 අතර ප්‍රමාණයක් වේ. 2017 දී 70% පමණ තේ රුසියානු දේශසීමා හරහා ලැබී තිබේ. බෙලාරුස් හි ජාතික සංඛ්‍යාලේඛන කමිටුවේ තොරතුරුවලට අනුව 2017 වසර තුළදී එ.ජ.ඩො. මිලියන 43 ක වටිනාකමකින් යුතුව එම රටට තේ මෙ.ටො. 5,877 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත.

බෙලාරුස් රාජ්‍යට තේ අපනයනය කිරීමේ මූලිකත්වය හිමිවන්නේ 70% ක තරමේ වෙළෙඳපොළ කොටසකට හිමිකම් කියන රුසියාවටයි. ශ්‍රී ලංකාව ප්‍රධාන අනුපූරක සැපයුම්කරු ලෙස වෙළඳපොළෙන් 8.2% කොටසකට හිමිකම් කියයි. සෙසු අනුපූරක සැපයුම්කරුවන් වන වියට්නාමය, චීනය, පෝලන්තය සහ යුක්රේනය යන රටවල්වලට පිළිවෙලින් 3.87%, 1.26%, 1.23% සහ 1.05% වශයෙන් වෙළෙඳපොළ කොටස් සඳහා හිමිකම් කියයි.

2017 වසරේදී ශ්‍රී ලංකාව රුපියල් මිලියන 474 ක වටිනාකමකින් යුතු මෙ.ටො. 385 ක තේ ප්‍රමාණයක් බෙලාරුස් රාජ්‍යයට අපනයනය කර ඇත. 2016 වසර සමග සැසඳීමේදී බෙලාරුසයට ලංකා තේ අපනයනය වටිනාකම අනුව රුපියල් මිලියන 177 ක සහ ප්‍රමාණාත්මකව මෙ.ටො. 111 ක වැඩිවීමක් 2017 වසරේදී සිදුවී ඇත. බෙලාරුසය වෙත අපනයන කළ සමස්ත ශ්‍රී ලංකා තේ ප්‍රමාණයෙන් 99% ක්ම පෙර ඇසුරුම් ස්වරූපයේ ඒවා වේ.

### 2.6.1.8 මෝල්දෝවා



මෝල්දෝවාවේ පාරිභෝගිකයන් අතර වඩාත් ප්‍රචලිත පානයක් ලෙස තේ හඳුනාගත හැකිවේ. මෝල්දෝවා හි වෙළෙඳපොළ පර්යේෂණ සමාගමට අනුව මෝල්දෝවා ජනගහනයෙන් 68.7% ක් අවම වශයෙන් දිනකට එක්වරක් හෝ තේ පානය කරනු ලබයි. ලොව ඒක පුද්ගල තේ පරිභෝජනය ඉහළින්ම පවතිනුයේ මෝල්දෝවාවෙහි ය. එය වසරකට කි.ග්‍රෑ. 1.40වේ.

මෝල්දෝවාවට ලංකා තේ වසරකට මෙ.ටො. 250-350 පමණ අපනයන කරනු ඇත. කෙසේ වුවත් පසුගිය වසර කිහිපය තුළදී ශ්‍රී ලංකා තේ මෝල්දෝවාවට අපනයනය කිරීම ප්‍රහල ලෙස පහත වැටී තිබේ. ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත්කර ඇති සංඛ්‍යාලේඛනවලට අනුව, 2017 වසරේ දී මෝල්දෝවාවට අපනයනය කළ ලංකා තේ ප්‍රමාණය 2016 වසර හා සැසඳීමේ දී මෙ.ටො. 49 (37%) කින් අඩු වී ඇත. අපනයන ප්‍රමාණය 2016 වසරේ දී මෙ.ටො. 131 ක් ව තිබී 2017 වසර වනවිට මෙ.ටො. 82 දක්වා පහත වැටී ඇත. උපයාගත් ආදායම ද 2016 වසරේ දී රුපියල් මිලියන 136 ක් වූ අතර 2017 වසරේදී රුපියල් මිලියන 105 දක්වා පහත වැටුනි. එය 23% ක පහත වැටීමකි.

### 2.6.2 මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු වෙළෙඳපොළ

මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපය (MENA- වෙත ශ්‍රී ලංකා තේ අපනයනය බෙදීයන ආකාරය

ශ්‍රී ලංකා රේගුවට අනුව 2017 වසර සඳහා මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපයේ (MENA) රටවල් වෙත තොග, ඇසුරුම්, මළු ආදී වශයෙන් ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කර ඇති ආකාරය පහතින් විශ්ලේෂණය කර ඇත.

වගුව 2.18

| රට | තොග | ඇසුරුම් | මළු | වෙනත් | එකතුව (මෙ.ටො) | මුළු අපනයනය % |
|---|---|---|---|---|---|---|
| ඉරානය | 26,028 | 1,334 | 21 | 36 | 27,419 | 9.49 |
| ඉරාකය | 14,967 | 19,810 | 231 | 25 | 35,033 | 12.12 |
| තුර්කිය | 21,228 | 16,307 | 268 | 13 | 37,816 | 13.09 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 8,695 | 6,249 | 369 | 472 | 15,785 | 5.46 |
| සිරියාව | 4,819 | 1,882 | 684 | 15 | 7,400 | 2.56 |
| ලිබියාව | 51 | 10,744 | 48 | 766 | 11,609 | 4.02 |
| කුවේටය | 135 | 1,690 | 585 | 24 | 2,435 | 0.84 |
| ජෝර්දානය | 307 | 2,153 | 2,219 | 8 | 4,688 | 1.62 |
| සෞදි අරාබිය | 1,552 | 1,888 | 882 | 95 | 4,416 | 1.53 |
| ලෙබනනය | 128 | 3,717 | 269 | 15 | 4,128 | 1.43 |
| ඊජිප්තුව | 509 | 780 | 53 | 18 | 1,360 | 0.47 |
| **එකතුව -මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපය** | **78,419** | **66,555** | **5,628** | **1,488** | **152,089** | **52.63** |

ප්‍රති අපනයනයන් ඇතුළත් වේ. වෙනත් යටතේ හරිත තේ ආවරණය කෙරේ.

2017 වසරේ ශ්‍රී ලංකාවෙන් මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපය (MENA) වෙත රටවල් අනුව තේ අපනයන සංඛ්‍යා ලේඛන 2016 වසර සමග සසඳමින් පහතින් ඉදිරිපත් කර ඇත.

වගුව 2.19

| රට | 2016 (මෙ.ටො) | වටිනාකම - (රුපියල් බිලියන) | 2017 (මෙ.ටො) | වටිනාකම - (රුපියල් බිලියන) |
|---|---|---|---|---|
| ඉරානය | 33,598 | 22.2 | 27,039 | 24.0 |
| ඉරාකය | 32,410 | 15 | 34,941 | 21.0 |
| තුර්කිය | 27,060 | 14.4 | 37,809 | 27.9 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 17,830 | 10.3 | 15,226 | 11.1 |
| සිරියාව | 11,963 | 7.8 | 7,276 | 6.1 |
| ලිබියාව | 12,617 | 6.6 | 10,833 | 7.3 |
| කුවේටය | 3,486 | 2.2 | 2,362 | 2.2 |
| ජෝර්දානය | 3,877 | 3.1 | 4,579 | 4.2 |
| සෞදි අරාබිය | 3,989 | 3.1 | 4,129 | 4.0 |
| ලෙබනනය | 3,447 | 2.5 | 4,089 | 3.7 |
| ඊජිප්තුව | 3,048 | 1.6 | 1,358 | 1.0 |
| උප එකතුව | 153,325 | 88.8 | 149,642 | 112.4 |
| මුළු ශ්‍රී ලංකා අපනයන/ වටිනාකම | **280,874** | **176.2** | **278,195** | **222.4** |
| මුළු ශ්‍රී ලංකා අපනයනයන්ගෙන් මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය | **54.59%** | **50.40%** | **53.79%** | **50.54%** |

ඉහත වගුවෙහි තේ ප්‍රති අපනයනයට අදාළ දත්ත ඇතුළත්ව නැත.තවද, ටියුනීසියාව, කටාර්, ඕමානය, බහරේනය, සහ යේමනය වෙත යවන ලද තොග සැලකිය යුතු ප්‍රමාණයක් නොවන නිසා මෙහි දී නොසලකා ඇත.

2017 වසර තුළදී මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපය (MENA) තුළ පැවති ව්‍යාකූලතාවයන් සහ

කැළඹීම් නොසලකා ලෝකයේ සියළු රටවල් වෙත කළ සමස්ත ශ්‍රී ලංකා තේ අපනයනයෙන් 54% ක් පමණ ප්‍රමාණයක් සඳහා මෙම කලාපය දායකත්වය සපයා ඇත.වටිනාකම අතින්ද 50.54% ක දායකත්වයක් වාර්තා වන අතර එය කාර්ය සාධන වටිනාකමක් ඇති ආදර්ශයකි. ප්‍රති අපනයන දත්ත නොසලකා හරින තත්වයකදී 2017 වසර තුළ සියළු රටවල් වෙත යවන ලද තේ මෙ.ටො. 278, 195 ක ප්‍රමාණයෙන් ඉරානය, ඉරාකය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, සිරියාව, ලිබියාව, කුවේටය, ජෝර්දානය, සවුදි අරාබිය, ලෙබනනය සහ ඊජිප්තුව තේ මෙ.ටො. 149,642 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත. එමගින් ප්‍රමාණය අනුව 53.79% ක් ද වටිනාකම අනුව 50.54% ක් ද වශයෙන් දායක වී ඇත.

මෙලෙසින් ශ්‍රී ලංකා තේවල පැවැත්ම සඳහා MENA කලාපයේ වැදගත්කම නැවත වතාවක් තහවුරු කර ඇත.

2016 වසරේදී මෙ.ටො. 33,598 ක් මිලදී ගත් ඉරානය මෙම වසරේදී මෙ.ටො. 27,039 ක් මිලදී ගනිමින් ටොන් 6,559 (19.52%) ක පහත වැටීමක් පෙන්නුම් කරයි. කලාපය තුළ සිව්වැනියට විශාල ආනයනකරු ලෙස හඳුනාගත හැකිවේ. නමුත් 2016 වසර සමග සසඳන විටදී රුපියල් බිලියන 22.2 ට සාපේක්ෂව රුපියල් බිලියන 24 ක් වාර්තා වේ. පසුගිය වසර හා සසඳන විටදී සමස්ත ලංකා තේ අපනයන වටිනාකම රුපියල් බිලියන 1.8 (8%) කින් ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැනුම් කරුවා වන රුසියාවට වඩා ඉරානය දෙවැනි වන්නේ සුළු ප්‍රමාණයකිනි. (ටොන් 500 ක අඩුවක්) එය අවදානම් සහගත තත්වයක් නොවේ.

කෙසේ වුවද දීර්ග කාලීන ණය ඉරානය සමග කරන ව්‍යාපාර සඳහා ප්‍රධාන බලපෑම් කාරණයක් බවට පත්ව ඇත.එමෙන්ම පහසු විධිවිධානයක් ද නොමැත. ඩොලරයකට 38,000 වඩා වූ ඉතාමත්ම පහළ තත්වයකට ඉරාන රියාලය ඇද වැටී තිබේ. ගැනුම් කරුවන් / විකුණුම් කරුවන් අතර කුඩා කැළඹීම් ඇතිවන්නට විය. කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් ක්‍රමයෙන් ඉහළ යාම නිසා ඉරාන වෙළෙඳ පොළ තුළ ලංකා තේ වලට හිමි තැන ක්‍රමයෙන් ඉන්දියානු තේ වලට හිමි වන ප්‍රවනතාවයක් 2016 වසර අවසන් කාර්තුවේ සිට දක්නට ලැබේ.

ඉරාකය ලංකා තේ වල දෙවැනියට විශාලතම ගැනුම්කරුවා වන අතර 2017 වසරේ අවසානය වනවිට මෙ.ටො. 34,941 අපනයනය කර ඇත. 2016 වසරේ එම කාලවකවානුවේදී ම මෙ.ටො.32,410 ක් අපනයනය කර ඇත. ඒ අනුව මෙ.ටොන් 2,531(7.8%) වැඩිවීමක් දක්නට ලැබේ.2017 වසරේදී අපේක්ෂිත ඉහළ තෙල් මිල සහ විශාල බොර තෙල් අලෙවියත් සමග ඉරාකය කොළඹ තේ වෙන්දේසියේ සිය ගම්‍යතාවය පවත්වාගෙන යාමට කටයුතු කළා. 2017 වසරේදී ඉරාකය සඳහා වූ ලංකා තේ සඳහා සාමාන්‍ය නැ.තෙ.නො. මිල කිලෝවකට රුපියල් 600.23 විය.

තුර්කිය තුළ රෝගී වෙළෙඳ වාතාවරණයක් ගොඩනැගීම සඳහා බොහෝ හේතු බලපෑම් කළේය. ඒවා අතර දේශපාලනික පිපිරීම්, දේශසීමාබද නොසන්සුන්තාවයන්, අභ්‍යන්තරික විරෝධතා, අසල්වැසි යුද්ධ වලට සහභාගිවීම, තුර්කි ලිරාව පහත වැටීම සහ සරණාගතයන් රට තුළට ආගමනය වීම වැනි හේතු දක්නට ලැබේ. නමුත් 2017 වසර තුළදී තුර්කිය ලංකා තේ ප්‍රමුඛ ආනයනකරු විය. තුර්කිය 2016 වසරේ දී තේ මෙට්‍රික්ටොන් 27,060 ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර 2017 වසරේ දී මෙට්‍රික්ටොන් 37,809 ක් විය. ඒ අනුව ඔවුන් මිල දී ගනු ලැබූ තේ ප්‍රමාණය 2016 වසරට සාපේක්ෂව මෙට්‍රික්ටොන් 10,749 කින් වැඩි වී ඇත. ප්‍රතිශතයක් වශයෙන් 39.72 කි.

විශේෂයෙන්ම ඉරානය සමඟ සිදුකරනු ලබන වෙළඳාම් කටයුතු වලදී ඇති වූ දුෂ්කරතා කරුණුකොට ගෙන එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි කාර්යභාරයට ද බලපෑම් ඇතිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රති අපනයන වෙළඳ කටයුතු හීනවිය. සංඛ්‍යාලේඛන අනුව 2016 වසරේ එක්සත් අරාබි එමීර් රාජ්‍ය ආනයනය කරනු ලැබූ තේ මෙට්‍රික්ටොන් 17,830 ට සාපේක්ෂව 2017 වසරේ දී ආනයනය කර ඇත්තේ මෙට්‍රික්ටොන් 15,226 ක් පමණි. එය ටොන් 2,604 (14.6%) ක අඩු වීමකි. කෙසේ වුව ද මෙම වසරේදී ද ශ්‍රී ලංකා තේ ආනයනය කරනු ලබන පස්වෙනියට විශාලතම ආනයනකරු ලෙස එක්සත් අරාබි එමීර් රාජ්‍යය පැවතුනි. තව ද රුසියාවට පසුව ශ්‍රී ලංකාවේ හරිත තේ මිලදී ගනුලබන දෙවෙනියට විශාලතම ආනයනකරු වන්නේද එක්සත් අරාබි එමීර් රාජ්‍යය යි. එමෙන්ම ශ්‍රී ලංකාවට තිබෙන්නා වූ පස්වෙනි විශාලතම පෙර ඇසුරුම් තේ වෙළඳ මධ්‍යස්ථානය වන්නේ ද එක්සත් අරාබි එමීර් රාජ්‍යය යි.

සිරියාව සහ ලිබියාව යන රටවල් දෙකම බැරෑරුම් ලෙස අභ්‍යන්තර ගැටුම්වලට මැදිහත්වී ඇත. මෙම රටවල් දෙකම අපගේ තේ සඳහා ඉල්ලුමක් ඇති රටවල් දෙකකි. සිරියාව සහ ලිබියාව යන රටවල් දෙකම ශ්‍රී ලංකාවෙන් ප්‍රමිතියෙන් පහළ තේ (off-takes) මිලදී ගැනීම අඩුකර ඇත. 2016 වසරේ ලිබියාව මෙට්‍රික්ටොන් 12,617 මිලදී ගත් අතර 2017 වසරේ මෙට්‍රික්ටොන් 10,833 ක් මිල දී ගෙන ඇත. එය මෙට්‍රික්ටොන් 1,784 (14.1%) ක අඩුවීමකි. එමෙන්ම 2017 වසරේ දී සිරියාව මෙට්‍රික්ටොන් 7,276 ක් ආනයනය කර ඇති අතර 2016 වසරේ දී මිලදී ගත් ප්‍රමාණය වන මෙට්‍රික්ටොන් 11,963 ට සාපේක්ෂව මෙට්‍රික්ටොන් 4,687 ක අඩුවීමකි.

2017 වසරේ කුවේටය මිලදී ගත් තේ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 2,362 කි. 2016 වසරේ දී මිල දී ගත් තේ ප්‍රමාණය වන මෙට්‍රික්ටොන් 3486 ට සාපේක්ෂව විශාල අඩු වීමක් පෙන්වයි. අඩු වූ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 1,124 (32%) කි. එයට ප්‍රධාන හේතුව වූයේ ඉරානය හා ඉරාකය අතර පැවති දේශසීමා අර්බුදයයි. ජෝර්දානය හා කුවේටය යන රටවල් දෙකම 2017 වසරේ දී තේ මිලදී ගැනීම ඔවුන්ගේ දේශීය පරිභෝජනයට පමණක් සීමාකරන ලදී. ඒ අනුව ජෝර්දානය 2016 දී මිලදී ගත් මෙට්‍රික්ටොන් 3,877 ට සාපේක්ෂව 2017 වසරේ දී මෙට්‍රික්ටොන් 4,579 ක් මිලදී ගෙන ඇත. එනම් මෙට්‍රික්ටොන් 702 ක වැඩි වීමකි.

2012 වසරේ දී ලෙබනනයට අපනයනය කරනු ලැබූ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය කිලෝග්රෑම් මිලියන 2.1 කි. එකී ප්‍රමාණය 2013 වසරේ දී මිලියන 2.8 දක්වා වැඩිවිය. 2014 වසරේ දී එය මිලියන 3.4 දක්වා වැඩිවිය. 2016 වසරේ ද කිලෝ මිලියන 3.4 ක් විය. 2017 දී කිලෝග්රෑම් මිලියන 4.08 දක්වා වැඩිවිය. යම් ප්‍රමාණයක් පොදු දේශසීමාව ඔස්සේ සිරියාවට යවනු ලැබීය.

අප්‍රිකානු සී.ටී.සී තේ (විශේෂයෙන් කෙන්යාවේ) බලපෑමට හසුවූ, තේ මිල පිළිබඳ දැඩි ලෙස සංවේදීව කටයුතු කරන ඊජිප්තු තේ වෙළඳපොළ 2012 වසරේදී ලංකා තේ කිලෝග්රෑම් මිලියන 3.6 ක් මිලදී ගෙන ඇත. 2013 සහ 2014 වසර වල දී පිළිවෙලින් ලංකා තේ කිලෝග්‍රෑම් මිලියන 2 ක් සහ කිලෝග්‍රෑම් මිලියන 2.8 ක් මිලදීගෙන ඇත. නමුත් ප්‍රමිතියෙන් පහළ තේ කිලෝග්‍රෑම් මිලියන 3.0 ක් 2016 වසරේ දී මිලදී ගෙන තිබූ අතර 2017 වසරේ දී එම ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 1.3 ක් දක්වා අඩුවිය. මොම්බාසා තේ වෙන්දේසියේ මිල වැඩි වූ අවස්ථාවලදී එම හිගය පියවාගැනීම සඳහා ශ්‍රී ලංකා හා ඉන්දියා තේ මිලදී ගැනීම සඳහා ඊජිප්තුව යොමු විය. කෙසේ වුවද 2017 වසරේ දී කොළඹ තේ වෙන්දේසියේ ද මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. ලිබියාවට ප්‍රතිඅපනයනය කිරීම සඳහා ද ඊජිප්තුව ලංකා තේ ආනයනය කරයි.




## 2.6.3 ඈත පෙරදිග

### 2.6.3.1 ජපානය



ජපානය නිතරම ලංකා තේ සඳහා වැදගත් වෙළඳපොළක් විය. විශේෂයෙන්ම ඌව සහ දිඹුල වාරයන් වලදී කොළඹ වෙන්දේසියේ දී ජපානය ප්‍රියතම සහායකයෙකු වේ. කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව වාර්ෂිකව කිලෝග්රෑම් මිලියන 7 සිට 11 දක්වා ප්‍රමාණයක් ජපානයට තේ අපනයනය කරයි. ලෝකයේ අතිශය සංකීර්ණ හා තරඟකාරී තේ වෙළඳපොළ ලෙස ජපානය ඔවුන් විසින් ම ස්ථාපිත කරගෙන ඇත. නිෂ්පාදන තත්වය නිෂ්පාදනයේ ආරක්ෂිත බව හා පවිත්‍රතාව, ඇසුරුමෙහි නව ආකාරයන්, තාක්ෂණික ප්‍රගතිය, සැපයුම් ජාලයෙහි විනිවිදබව, පරිසර හිතකාමී බව සාමාජීය වගකීම හා කර්මාන්තයේ තිරසාර සංවර්ධනය අතින් බලන කළ ලෝක වෙළඳපොළෙහි ඉහළම සටානයේ ජපානය වැජඹේ.

ජපානය ශ්‍රී ලංකා තේ සඳහා වන විශාලතම තේ වෙළඳපොළ 10 අතර වේ. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් ජපානයට අපනයනය කරනු ලබන්නේ සම්ප්‍රදායික කළු තේ වන අතර 55% වශයෙන් කළු තේ එහි පෙරමුණ ගනී. 2017 වසරේ දී ශ්‍රී ලංකාවෙන් ජපානයට අපනයනය කළ තේ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 7,820 කි. එහි වටිනාකම ඇ.ඩො මිලියන 44.2 කි.

## 2.6.3.2 චීනය



චීනය තේ සංස්කෘතියක් ඇත්තා වු රටකි. හරිත තේ, ඌලෝං තේ, ජැස්මින් තේ සහ පු අර් තේ (Pu'er) නිෂ්පාදනය කරනු ලබන ලොව විශාලතම නිෂ්පාදකයායි. චීනය විශාල වශයෙන් හරිත තේ නිෂ්පාදනය කරනු ලැබුව ද කළු තේ ද ඔවුන් නිෂ්පාදනය කරනු ලබයි. චීනය ලෝකයේ විශාලතම තේ නිෂ්පාදකයා මෙන්ම පරිභෝජකයා ද වේ. එමෙන් ම ලොව දෙවෙනියට විශාලතම තේ අපනයනකරු ද වේ. එහි අපනයන ප්‍රමාණය 2016 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 328 කි. (ජාත්‍යන්තර තේ කමිටු වාර්තාව, 2017)

2016 වසරේ දී සම්පූර්ණ තේ නිෂ්පාදනය කිලෝග්රෑම් බිලියන 2.35 විය. 2015 හා සසඳන විට 4.5% ක වර්ධනයකි. සමස්ත තේ නිෂ්පාදනයෙන් 66% ක් හරිත තේ වන අතර ඉතිරිය කළු තේ හා අනෙකුත් තේ වර්ග වේ. ලෝක තේ නිෂ්පාදනයෙන් 43% ක් චීනය නිෂ්පාදනය කරන අතර ඉන්දියාව 22.7% ක්, කෙන්යාව 8.7% ක් සහ ශ්‍රී ලංකාව 5.4% ක් වශයෙන් තේ නිෂ්පාදනයේ යෙදේ.

චීනයේ වාර්ෂික තේ පරිභෝජනය කිලෝග්රෑම් මිලියන 1791 ක් වශයෙන් ඇස්තමේන්තු ගත කර ඇත. ඒක පුද්ගල පරිභෝජනය ග්රෑම් 1310 (2016) ක් වේ. 2016 වසරේ දී චීනය තේ මෙට්‍රික්ටොන් 328,692 ක් අපනයනය කරනු ලැබූ අතර කෙන්යාවට පසුව ලොව විශාලතම අපනයනකරුවා විය.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට අනුව 2016 වසරේ දී ශ්‍රී ලංකාවෙන් තේ සෘජු අපනයනය මෙට්‍රික්ටොන් 7,463 ක් විය. එය ආසන්න වශයෙන් ඇ.ඩො මිලියන 30.98 ක වටිනාකමකින් යුතු වේ. එමෙන්ම ඇ.ඩො මිලියන 46.98 ක වටිනාකමකින් යුතු ලංකා තේ මෙට්‍රික්ටොන් 9,472 ක ප්‍රමාණයක් 2017 වසරේ දී චීනයට අපනයනය කර ඇත. එයින් 94% ක් තොග වශයෙන් ද, 2.95% ක් ඇසුරුම් වශයෙන් ද සහ 2.93% ක් තේ මලු වශයෙන් ද විය. 2016 වසර හා සසඳන විට 2016 වසරේදී තායිවානය විසින් මෙට්‍රික්ටොන් 13,018 ක් පමණ තේ නිෂ්පාදනය කර ඇත. එයින් 95% ක් උසස් තත්වයේ හරිත තේ වේ. තායිවානය කැපීපෙනෙන තේ වෙළඳපොළකි. එහි ඒක පුද්ගල පරිභෝජනය කිලෝග්රෑම් 1.44 කි.

## 2.6.3.3 තායිවානය



2016 වසරේ සම්පූර්ණ තායිවාන තේ ආනයනය මෙට්‍රික්ටොන් 26,344 කි. එයින් 67% ක් කළු තේ, ඌලෝං තේ සහ පු අර් තේ (Pu'er) වේ. තායිවානයට තේ අපනයනය කරන ප්‍රධාන රට වන්නේ වියට්නාමය යි. ඔවුන් 57%ක ප්‍රමාණයක් තායිවානයට තේ අපනයනය කරනු ලබයි. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව පිළිවෙලින් 13% ක් සහ 11% ක් වශයෙන් තායිවානයට තේ අපනයනය කරයි. තායිවානයේ වාර්ෂික තේ පරිභෝජනය මිලියන 39.01 ක් පමණ වේ. තායිවානයට වැඩි වශයෙන් ආසියාවෙන් පැමිණෙන සංචාරකයන්ගේ තේ පරිභොජනය හේතුවෙන් ප්‍රමාණය මෙසේ වැඩි වී ඇත. ආසියානුවන් වැඩි වශයෙන් තේ පරිභෝජනය කරයි.

ශ්‍රී ලංකාවේ තේ සඳහා තායිවානය වැදගත් වෙළඳපොළක් වන අතරම එම තත්වය වර්ධනය වීමේ ඉඩකඩ බොහෝ යි. 2016 සිට 2017 දක්වා තායිවානයට අපනයනය කළ ලංකා තේ ප්‍රමාණාත්මකව 34% කින් සැලකිය යුතු වැඩිවීමක් සිදුවී ඇත. 2016 වසරේ දී ලංකා තේ මෙට්‍රික්ටොන් 3,061 අපනයනය කර ඇති අතර 2017 වසරේ දී මෙට්‍රික්ටොන් 4,091 දක්වා වැඩිවී ඇත.

## 2.6.34. ඕස්ට්‍රේලියාව



ඕස්ට්‍රේලියානු තේ පරිභෝජකයන් 2017 වසරේදිද මිල අධික තේ නිෂ්පාදන මිල දී ගැනීමට කටයුතු කර ඇත. පසුගිය වසරවලදී ඉහළ ගොස් තිබූ පළතුරු / ඖෂධීය තේ පරිභෝජනයේ ස්ථාවර වර්ධනයක් මේ තුළින් පිළිබිඹු වේ. තේ පානය කරන්නන් අතරේ කාලයක් තිස්සේ කැමැත්ත වනුයේ කලු තේ සඳහා වන අතර පළතුරු සාරය, ඖෂධීය සාරය / ටීසාන් සහ හරිත තේ වර්ග නිෂ්පාදකයන් සහ සිල්ලර වෙළෙන්ඳන් අතර උත්තේජනයක් ඇති කරමින් තිබේ. නවීන පන්නයේ තේ ව්‍යාපාරයන් ද ඕස්ට්‍රේලියාව තුළ නැගී එන්නට විය. වයස අවුරුදු විස්සෙ හතලිහේ මිනිසුන් විසින් ඇති කරන පෙළඹවීම සහ රැල්ල නිර්මාණාත්මක ස්වරූපයක් ගනී. අවැදගත්ව බලපාන ටී බාර්, මැදියම් රැයේ තේ විසිත්ත කාමර, තේ තේමාව කරගත් සංගීත ප්‍රසංග, තේ පංති සහ තේ රූපවාහිනී ඕස්ට්‍රේලියානු තේ පරිභෝජනයේ නව ප්‍රවනතාවය විදහා දක්වයි.

ශ්‍රී ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට තේ අපනයනය 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී ඉහළ යාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළේය. 2016 / 2017 වසර තුළදී ප්‍රධාන සැපයුම්කරු ලෙස ඉන්දියාව 24% ක ප්‍රමාණයක් සහ ඉන්පසුව ශ්‍රී ලංකාව 20% ක්, ඉන්දුනීසියාව 16% ක් සහ චීනය 18% ක් ලෙස දායක වී ඇත. ඉහළ ගුණයෙන් යුතු තේ සඳහා වැඩිපුර ගෙවීමට ඕස්ට්‍රේලියානුවන් කැමැත්තෙන් සිටී. 2016 වසරේ දී ශ්‍රී ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට අපනයනය කළ තේ මෙට්‍රික් ටොන් 2,371 ක ප්‍රමාණය 2017 වසර වනවිට මෙට්‍රික් ටොන් 2,669 දක්වා සුළු වශයෙන් වැඩිවීමක් වාර්තා වේ. එය 12.5 % ක වර්ධනයකි. ඕස්ට්‍රේලියාවට අපනයනය කළ සමස්තයෙන් 89.5% ක ප්‍රමාණයක් අගය එකතු කළ තේ වන අතර එයින් 69.5% ක් තේ මළු සහ 20% ක් ඇසුරුම් කළ තේ වශයෙන් වාර්තා වේ.

## 2.6.3.5 සිංගප්පූරුව



ශ්‍රී ලංකා රේගුව විසින් නිකුත් කළ සංඛ්‍යාලේඛනවලට අනුව සිංගප්පූරුව වෙත ශ්‍රී ලංකා තේ අපනයනය වසරකට මෙ.ටො. 475 - 625 අතර ප්‍රමාණයක් වේ. 2017 වසරේ දී සිංගප්පූරුව වෙත ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ සම්පූර්ණ තේ ප්‍රමාණය මෙ.ටො. 608 ක් ලෙස වාර්තා වේ. පසුගිය වසරේ සංඛ්‍යාලේඛන අනුව ශ්‍රී ලංකාවෙන් මෙ.ටො. 597 ක් සිංගප්පූරුව වෙත අපනයනය කර ඇත.

ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රධාන තරඟකරුවන් වන්නේ චීනය, ඉන්දුනීසියාව, කෙන්යාව, ඉන්දියාව, ජපානය හා තායිවානය යන රටවල් වේ. චීනය හා ජපානය ප්‍රධාන වශයෙන් සපයනු ලබන්නේ ඌලොං තේ සහ හරිත තේ ය. එබැවින් කළු තේ අපනයනයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන තරඟකරුවන් වන්නේ කෙන්යාව හා ඉන්දියාවයි.

## 2.6.4. උතුරු සහ දකුණු ඇමරිකානු කලාපය

වගුව 2.20: උතුරු සහ දකුණු ඇමරිකානු කලාපය වෙත ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම්

| රට | 2017 ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 2016 ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| චිලි | 7,004,202 | 6,543,574 | 460,628 | 7.04 |
| ඇ.එ.ජ. | 4,037,606 | 4,519,463 | -481,857 | -10.66 |
| කැනඩාව | 587,997 | 416,486 | 171,511 | 41.18 |
| වෙනිසියුලාව | 0 | 44,785 | -44,785 | -100.00 |
| බ්‍රසීලය | 5,926 | 3,488 | 2,438 | 69.90 |
| මෙක්සිකෝව | 15,772 | 18,109 | -2,337 | -12.91 |
| පැනමා | 473 | 194 | 279 | 143.81 |
| ආජන්ටිනාව | 42,080 | 29,120 | 12,960 | 44.51 |
| කොලොම්බියාව | 271 | 508 | -237 | -46.65 |
| **එකතුව** | **11,694,327** | **11,575,727** | **118,600** | **1.02** |

## 2.6.4.1. ඇමරිකා එක්සත් ජනපදය



ඇමරිකා එක්සත් ජනපදයේ තේ වෙළඳපොළ පුළුල් වෙමින් පවතින අතර පසුගිය වසර කිපය තුළ දී ආනයන ප්‍රමාණය 25% කින් වැඩිවී ඇත. කිලෝ ග්‍රෑම් මිලියන 130 ක් පමණ ප්‍රමාණයකට ආසන්නව ඇත. 85% කොටසක් ඇතිව ඇමරිකා එක්සත් ජනපද තේ වෙළඳපොළ තුළ කළු තේ ඉහළින්ම පවතී. අමතරව හරිත තේ 14% ක ප්‍රමාණයක් වන අතර ඉතිරිය ඌලොං තේ සහ සුදු තේ වේ. ඇමරිකා එක්සත් ජනපද තේ වෙළඳපොළ ශ්‍රී ලංකා කළු තේ සඳහා වැදගත් වන අතර ඒ සඳහා ගොඩනැගෙමින් තිබෙන වෙළඳපොළකි.

පසුගිය වසරවලදී ශ්‍රී ලංකාවෙන් ඇමරිකා එක්සත් ජනපදයට කළ අපනයනයන් වාර්ෂිකව කිලෝ ග්‍රෑම් මිලියන 3.7 සිට 4.5 දක්වා ප්‍රමාණයකින් උච්චාවචන විය. එය ඇමරිකා එක්සත් ජනපදය ආනයනය කළ සමස්ත තේ ප්‍රමාණයෙන් 4% කි. 2017 වසර තුළ දී ඇමරිකා එක්සත් ජනපදය වෙත ශ්‍රී ලංකාවෙන් අපනයනයන කළ කිලෝ ග්‍රෑම් 4,037,606 ක ප්‍රමාණය 2016 වසර හා සැසඳීමේදී 10.66% ක පහත වැටීමකි. කාලපරිච්ඡේදය තුළදී අපනයන ආදායම රුපියල් මිලියන 3,844 කින් එනම් 2.59% කින් වැඩිවී ඇත.

2017 වසරේදී 46% ක කොටසකට හිමිකම් කියමින් ආජන්ටිනාව තවදුරටත් ඇමරිකා එක්සත් ජනපදය වෙත තේ සපයන ප්‍රධාන සැපයුම්කරු වේ. අමතරව ඉන්දියාව 12%, චීනය 9%, වියට්නාමය 8%, ශ්‍රී ලංකාව 4% සහ ඉන්දුනීසියාව 3% වශයෙන් වේ.

## 2.6.4.2. කැනඩාව



"Canadian Food Trends to 2020" වාර්තාවට අනුව

2020 වනවිට තේ පරිභෝජනය 40% දක්වා වැඩිවීමක් අපේක්ෂා කරයි. සෞඛ්‍ය හා යහගුණය පිළිබඳ පාරිභෝගික උනන්දුව වැඩිවීමත් සමග තේ පරිභෝජනයෙන් ඇතිවන්නා වූ ප්‍රතිලාභයන් ගැන ද වැඩි අවධානයක් යොමුකර ඇත. 35,749,600 ජනගහනයක් වසන කැනඩාවේ වසරකට තේ කෝප්ප බිලියන 10 කට වඩා ප්‍රමාණයක් පානය කරනු ඇත. වැඩි වශයෙන් පානය කරනු ලබන්නේ කලු තේ වන අතර එය 84% ක ප්‍රමාණයකි.

2016 වසරේදී කැනඩාව මෙ.ටො. 15,759 ක ප්‍රමාණයක් කලු තේ පරිභෝජනය කර ඇත. එම ප්‍රමාණය පහත සඳහන් අයුරින් ආනයනය කර ඇත. එක්සත් රාජධානිය (21%), ඉන්දියාව(18%), ඇ.එ.ජ.(33%), ශ්‍රී ලංකාව (4.8%) සහ චීනය (7.2%). 2017 වසරේ දී ශ්‍රී ලංකාව තේ කි.ග්‍රෑ. 587,997 ක් අපනයනය කර ඇත. 2016 වසර හා සැසඳීමේ දී 41% ක වර්ධනයක් වාර්තා විය. නමුත් 2017 වසරේ දී සාමාන්‍ය නැ.තෙ.නො. (FOB) මිල සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම

2017 වසරේ දී අපනයනයන්ගෙන් 54% ක් ම අගය එකතු කළ තේ වශයෙන් විය.

### 2.6.4.3 චිලි රාජ්‍යය



වාර්ෂිකව මෙ.ටො. 20,000 ඉක්ම වූ තේ ප්‍රමාණයක් ආනයනය කරන චිලි රාජ්‍යය, දකුණු ඇමරිකාවේ විශාලතම තේ වෙළඳපොළ වේ.

ආජන්ටිනාව ප්‍රධාන සැපයුම්කරු ලෙස 49% ක ප්‍රමාණයක් තේ සපයනු ලබයි. 34% ක කොටසක් සපයන ශ්‍රී ලංකාව සහායක සැපයුම්කරු ලෙස හඳුනාගත හැකි වේ. 2017 වසර සඳහා ශ්‍රී ලංකාව තේ සපයා ඇත්තේ කි.ග්‍රෑ. 7, 004, 202 කි. එය 2016 වසරේ දී අපනයනය කළ කි.ග්‍රෑ. 6,543,574 හා සැසඳීමේ දී 7.03% ක වැඩිවීමකි. 2017 වසරේ අපනයන ආදායම රුපියල් මිලියන 4,747 දක්වා හෝ 38.6% ක වැඩිවීමක් වී ඇත.

### 2.6.5. යුරෝපියානු කලාපය

වගුව 2.21: යුරෝපිය කලාපය වෙත ශ්‍රී ලංකා තේ අපනයනය රටවල් අනුව

| රට | 2017- (කි.ග්‍රෑ) | 2016 - (කි.ග්‍රෑ.) | වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| ජර්මනිය | 6,679,980 | 6,525,210 | 154,770 | 2.37 |
| පෝලන්තය | 2,327,422 | 2,173,286 | 154,136 | 7.09 |
| බෙල්ජියම | 2,540,409 | 2,833,547 | -293,138 | -10.35 |
| නෙදර්ලන්තය(ඕලන්දය) | 2,629,019 | 2,570,845 | 58,174 | 2.26 |
| අයර්ලන්තය | 1,944,814 | 1,817,673 | 127,141 | 6.99 |
| ඊශ්‍රායලය | 1,361,177 | 1,378,427 | -17,250 | -1.25 |
| ඉතාලිය | 904,057 | 956,297 | -52,240 | -5.46 |
| පින්ලන්තය | 976,571 | 1,212,724 | -236,153 | -19.47 |
| ප්‍රංශය | 660,883 | 663,088 | -2,205 | -0.33 |
| එක්සත් රාජධානිය | 1,206,515 | 957,050 | 249,465 | 26.07 |

### 2.6.5.1. එක්සත් රාජධානිය



එක්සත් රාජධානියෙහි වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 106,892 ක් පමණ වන අතර ඒක පුද්ගල පරිභෝජනය කි.ග්‍රෑ. 1.65 (ITC 2017) ලෙස වාර්තා වේ. පසුගිය වසර හා සැසඳීමේදී 6.62% ක පහත වැටීමකි. හරිත හා පළතුරු තේ පරිභෝජනය වැඩිවෙමින් පවතී. කළු තේ පරිභෝජනය 95% ක ප්‍රමාණයකින් යුතු වේ. අමතරව කැෆෙන් රහිත සහ අර්ධ වශයෙන් පවතින තේ සඳහා ඉල්ලුම ඉහළ යමින් පවතී. ඖෂධීය, හරිත සහ කැෆෙන් රහිත තේ වර්ග එක්සත් රාජධානියෙහි සුපිරි වෙළඳපොළවල් වල වැඩි වශයෙන් දක්නට ඇත. එමෙන්ම, එක්සත් රාජධානිය පානයට සුදානම් කළ තේ (සහ කෝපි) සඳහා වන යුරෝපා සංගම් ප්‍රධාන වෙළඳපොළ ද වන්නේය. කෙසේ වෙතත් සාමාන්‍ය කළු තේ වලට සාපේක්ෂව මෙකී තේ වර්ග ඉතාමත් සීමිත වන්නා සේම සමස්ත තේ පරිභෝජනයට සුළු බලපෑමක් පමණක් සිදුකරනු ඇත.

එක්සත් රාජධානි වෙළඳපොළට තේ සපයන ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ තේ වගාකරන රටවල් ය. ඒ අනුව 2016 වසරේ දී කෙන්යාව මෙ.ටො. 62,258 (48.6%) සපයමින් ඉදිරියෙන්ම සිටින අතර ඉන්දියාව මෙ.ටො. 26,070 (20.34%) සහ ටැන්සානියාව මෙ.ටො. 3,671(2.86%) වශයෙන් පසුපසින් සිටී.

ශ්‍රී ලංකා රේගු වාර්තා අනුව 2016 වසර තුළ දී ශ්‍රී ලංකාවෙන් සෘජු අපනයනය මෙ.ටො. 957 ක් වන අතර වටිනාකම ආසන්න වශයෙන් රුපියල් මිලියන 1,168 ක් වේ. 2017 වසරේ දී මෙ.ටො. 1,207 ක් ලංකා තේ අපනයනය කර ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 1,629 ක් විය. මෙහිදී තේ තොග වශයෙන් 69.8% ක් ද ඇසුරුම් ලෙස 12.7% සහ තේ මළු,17.4% ක් ලෙස අපනයනය කර ඇත.

### 2.6.5.2. පෝලන්තය



ජනගහනය මිලියන 38 පමණ වන පෝලන්තය යුරෝපය තුළ තුන්වෙනියට විශාලතම තේ පරිභෝජකයා වේ. වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 35,465 ක් ලෙස ගණන් බලා ඇත. ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 0.93 (ITC 2017) ක් වේ. 2016 වසරේ දී තේ මෙ.ටො. 35,465 ක් පෝලන්තයට ආනයනය කර ඇති බව ජාත්‍යන්තර තේ කමිටු (ITC) වේ සංඛ්‍යා ලේඛන වලට අනුව දක්නට ලැබේ. පෝලන්ත වාසීන් කළු තේ පරිභෝජකයන් වන අතර ආනයනික තේ වලින් 87% ක් කළු තේ වන අතර හරිත තේ 13% කි.

පෝලන්ත වෙළඳපොළට තේ සපයන ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ තේ වගාකරන රටවල් ය. ඒ අනුව 2016 වසරේ දී කෙන්යාව මෙ.ටො. 6,928 (19.53%) සපයමින් ඉදිරියෙන්ම සිටින අතර වියට්නාමය මෙ.ටො. 1,414 (4%) ඉන්දියාව මෙ.ටො. 5,839 (16.46%), ඉන්දුනීසියාව මෙ.ටො. 2,254 (6.35%), ජර්මනිය මෙ.ටො. 7,357 (20.74%) සහ චීනය මෙ.ටො. 1,942 (5.47%) සහ ශ්‍රී ලංකාව මෙ.ටො. 1,827 (5.15%) වශයෙන් තේ සපයා ඇත.

ශ්‍රී ලංකා රේගු වාර්තා අනුව 2017 වසර තුළ දී ශ්‍රී ලංකාවෙන් සෘජු අපනයනය මෙ.ටො 2,327 ක් වන අතර එහි වටිනාකම රුපියල් මිලියන 2,489 ක් වේ. 2016 වසරේදී ශ්‍රී ලංකා තේ මෙ.ටො. 2,173 ක් අපනයනය කර ඇත. එහි වටිනාකම රුපියල් මිලියන 1,898 ක් වේ. ඒ අනුව 2016 වසරට වඩා ප්‍රමාණාත්මකව 7.1% ක් සහ වටිනාකම අනුව 31.2% කින් ඉහළ ගොස් ඇති බව දක්නට ලැබේ.

### 2.6.5.3. ජර්මනිය



යුරෝපා සංගමය තුළ දෙවැනියට තේ ආනයනය කරන රට වනුයේ ජර්මනියයි. නමුත් තේ පරිභෝජනය අතින් බැලූකල එක්සත් රාජධානියට සහ පෝලන්තයට පසුපසින් වේ. 2016 වසර තුළ දී ජර්මනිය තේ මෙ.ටො. 57,511 ක් ආනයනය කර ඇති අතර සමස්ත ආනයන ප්‍රමාණයෙන් 43.96% (මෙ.ටො. 25,282) ප්‍රතිඅපනයනය කර ඇත. ඒ අනුව දේශීය පරිභෝජනය සඳහා වූ ආනයන ප්‍රමාණය මෙ.ටො. 32,229 ක් විය.

2012 සිට 2016 දක්වා වසර පහක කාලය තුළ ජර්මනිය වෙත සමස්ත තේ ආනයනය මෙ.ටො. 1,526 ක එනම් 2.7% ක වැඩිවීමක් වාර්තා වේ. 2012 වසරේ දි මෙ.ටො. 55,985 ක් වූ අතර 2016 වසරේදි 57,511 ක් ආනයනය කර ඇත. මෙ.ටො.12,439 (22%) ක් චීනය විසින් තේ සපයනු ලබයි. ඉන්පසුව ඉන්දියාව (19%), ශ්‍රී ලංකාව (13%), නෙදර්ලන්තය (8%) සහ ඉන්දුනීසියාව (7%) වශයෙන් තේ සපයනු ලබයි. ජර්මනි තේ ආනයනයේදි වැඩි ප්‍රමාණයක් චීනයෙන් ලබාගන්නා හරිත තේ වේ. (සමස්ත ආනයනයෙන් 75% කට වඩා) කළු තේ සපයන්නන් අතරේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ප්‍රමුඛස්ථානයේ පසුවේ.

ජර්මනිය වෙත සම්ප්‍රදායික (orthodox tea) කළු තේ සඳහා වන ප්‍රධාන සැපයුම්කරුවා වුයේ ශ්‍රී ලංකාවයි. තම තේ වැඩි ප්‍රමාණයක් තොග වශයෙන් අපනයනය කරන ශ්‍රී ලංකාව අගය එකතු කළ තේ 30.14 % ප්‍රමාණයක් අපනයනය කරයි. 2017 වසරේ දි ශ්‍රී ලංකාව ජර්මනිය වෙත මෙ.ටො. 6,680 ක් අපනයනය කර ඇති අතර ලංකා තේ සඳහා වන 12 වැනියට විශාල ආනයන කරු වනුයේ ජර්මනියයි. පසුගිය වසර තුළ අපනයනය කළ මෙ.ටො. 6,525 හා සැසඳීමේදි මෙ.ටො. 155 (2.37%) ක ඉහළයෑමක් වාර්තා වේ.

### 2.6.5.4. ප්‍රංශය



ප්‍රංශ ජාතිකයන් වැඩි වශයෙන් කෝපි පානය කරන්නන් වේ. 20 වැනි සියවසේ අවසානය වනතුරු උණුසුම් පානයන් අතර තේරීම වුයේ කෝපි ය. පසුගිය වසර කීපයක සිට උණුසුම් පාන පරිභෝජනයේ වෙනසක් සිදුවෙමින් තිබේ. මිනිසුන් වැඩි වශයෙන් තේ වෙත අවධානය යොමු කරමින් තිබේ. 21 වැනි සියවස ආරම්භයේ සිට කෝපි සඳහා වන සෞඛ්‍යමය ආදේශකයක් ලෙස තේ පිළිගැනිමට ලක්වේ. තවදුරටත්, ප්‍රංශ ජාතිකයන් තේ රසවත් නිෂ්පාදනයක් ලෙස සලකන්නට නැඹුරුවී ඇති අතර විශේෂඥ තේ සාප්පු වල සාර්ථකත්වය පිළිබඳ පැහැදිලි කරන වෘත්තියවේදින්ගෙන් උපදෙස් බලාපොරොත්තු වෙමින් සිටි. ප්‍රංශය තුළ තේ පානයට නැඹුරු කරගත හැකි පිරිස ඉතාමත් ඉහළයි, තේ පානය කරණ අයගෙන් තුනෙන් දෙකක් පමණ, පරිභෝජනය වර්ධනය වෙමින් පවති.

වසරකට තේ ටොන් 15,000 පමණ ආනයනය කරන ප්‍රංශය ලොව 30 වැනි පාරිභෝගික රට වේ. වැඩි වශයෙන් පරිභෝජනය වනුයේ තේ මළු ය. පරිභෝජකයන් ප්‍රධාන වශයෙන් වාසය කරන්නේ ඊල් ද ෆ්‍රාන්ස් (Ile de France) ප්‍රදේශයේ සහ බටහිර ප්‍රදේශවල යි. වෙළඳ මණ්ඩලයට අනුව කළු තේ, හරිත තේ වලට වඩා දෙවරක් පරිභෝජනය කරයි. නමුත් එහි විකාශනය එතරම් වැදගත් නොවේ. වඩාත් ජනප්‍රිය තේ බණ්ඩයන් වන්නේ ඩාජිලින් හෝ ලංකා තේ වැනි සංචාරයට උනන්දු කරන ඒවා වේ.

2015 වසරේ දී තේ මෙ.ටො. 19,070 ක් ආනයනය කර ඇති නමුත් 2016 වසරේදි එය මෙ.ටො. 16,738 දක්වා 12% කින් පහත වැටී ඇත. (ITC Figures) 36% ක වෙළඳපොළ කොටසක් ඇතිව චීනය ප්‍රධාන තේ සැපයුම්කරුවා වන අතර ජර්මනිය (13%), බෙල්ජියම (10%) සහ ශ්‍රී ලංකාව (6%) යන රටවල් ද තේ සැපයුම්කරුවන් වේ. ප්‍රංශය ආනයනය කරන තේ වලින් 27% ක ප්‍රමාණයක් ප්‍රතිඅපනයනය කරන අතර ඉතිරිය දේශියව පරිභෝජනය කරනු ලබයි.

සමස්ත තේ ආනයනයෙන් 49.55% ලෙස කළු තේ මෙ.ටො. 8,295 ක ප්‍රමාණයක් ද හරිත තේ 50.45% ලෙස මෙ.ටො. 8,443 ක ප්‍රමාණයක් ද ආනයනය කරනු ලබයි.

ශ්‍රී ලංකා රේගු වාර්තාවලට අනුව 2017 වසරේ දි ශ්‍රී ලංකාව මෙ.ටො. 661 ක ප්‍රමාණයක් අපනයනය කර ඇත. 2016 වසරේ දී මෙ.ටො. 663 ක් අපනයනය කර ඇත. නමුත් ප්‍රංශ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය ඉහළයි. බෙල්ජියමෙන්, එක්සත් රාජධානියෙන් සහ ජර්මනියෙන් පැමිණෙන තේ වල සැලකිය යුතු ප්‍රමාණයක් ලංකා තේ අඩංගු වීම එයට හේතුවයි.

## 2.6.6. දකුණු ආසියා කලාපය

වගුව 2.22: දකුණු ආසියා කලාපයට ලංකා තේ අපනයනය රටවල් අනුව

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) 2016 | 2017 | වෙනස | වර්ධනය% |
|---|---|---|---|---|
| ඉන්දියාව | 1,081,718 | 279,951 | -801,767 | -74.12 |
| පාකිස්තානය | 956,242 | 128,902 | -827,340 | -86.52 |
| බංගලාදේශය | 0 | 1,315 | 1,315 | 0.00 |
| මාලදිවයින | 194,184 | 192,079 | -2,105 | -1.08 |
| ඇෆ්ගනිස්ථානය | 278 | 0 | -278 | -100.00 |
| නේපාලය | 2,693 | 2,763 | 70 | 2.60 |
| **එකතුව** | 2,235,115 | 605,010 | -1,630,105 | -72.93 |

2017 වසර තුළදී දකුණු ආසියා කලාපයේ රටවල් ශ්‍රී ලංකා තේ කි.ග්‍රෑ. මිලියන 0.6 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත. 2016 වසරේ ආනයනය කළ කි.ග්‍රෑ. මිලියන 2.2 ප්‍රමාණය හා සැසඳීමේදී සැලකිය යුතු බිඳවැටීමකි.

ඉන්දියාව වාර්ෂිකව තේ කිලෝ ග්‍රෑම් මිලියන 1,000 ක් පමණ ප්‍රමාණයක් පරිභෝජනය කරනු ලබයි. වර්ධන ප්‍රතිශතය 10 කට අඩු අනුපාතයක පවතී. ඉන්දියාවේ තේ පරිභෝජනය විශේෂ කාලයකට සීමා වී නැත. ඉන්දියානුවන් උණුසුම නොසලකා හරිමින් දවසේ ඕනෑම වේලාවකදී "චායි" (තේ) පානය කරනු ලබයි. 2013 -2014 කාලය තුළදී කි.ග්‍රෑ. මිලියන 911 කට වැඩි ප්‍රමාණයක් දේශියව පරිභෝජනය කරමින් ඉන්දියාව ලොව විශාලම චායි පරිභෝජකයා වේ. කෙසේ වුවත් එහි ඒක පුද්ගල පරිභෝජනය ග්‍රෑම් 800 පමණි.

# 03 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් එක් අංශ මගින් ඉටුකරනු ලබන කාර්යයන්

## 3.1 තේ කොමසාරිස්වරයාගේ අංශය

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ ප්‍රතිපාදන යටතේ පත් කර ඇති තේ කොමසාරිස් වරයාගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන තේ කොමසාරිස් අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ අතුරින් එකකි. තේ කොමසාරිස් අංශය විසින් 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත අනුව තේ කර්මාන්තයේ සංවර්ධන, නිෂ්පාදන, අපනයන හා නියාමන කාර්යයන් සම්බන්ධයෙන් වන සියලු කටයුතු පාලනය කරයි.

●ගාල්ල, මාතර, රත්නපුර, ගම්පොල / හැටන්, බණ්ඩාරවෙල සහ බදුරලිය යන ප්‍රදේශ වල පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 06 ට තේ කොමසාරිස් වරයාගේ අංශයේ කාර්යයන් විමධ්‍යගත කර ඇත. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් වරයාගේ අංශය තේ කර්මාන්තයේ චිරස්ථිතිය සඳහා පහත සඳහන් කටයුතුවල නිරත වේ.

- තේ නිෂ්පාදකයන් සහ කර්මාන්ත ශාලා ලියාපදිංචිය/බලපත්‍ර ලබාදීම සහ බලපත්‍ර අලුත් කිරීම
- තේ දළු වෙළෙන්ඳන් ලියාපදිංචිය සහ අධීක්ෂණය
- කසළ තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සහ වෙළෙන්ඳන් ලියාපදිංචිය සහ අධීක්ෂණය
- තේ දළු වල තත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කර්මාන්ත ශාලා නවීකරණය සහ නැවත වගාව සඳහා සහනාධාර ලබාදීම
- කර්මාන්ත ශාලා සහ වෙළෙන්ඳන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීම අධීක්ෂණය කිරීම“
- යහපත් නිෂ්පාදන ක්‍රම පිළිබඳව විශේෂ අධීක්ෂණය (GMP)
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඒකාබද්ධව නිෂ්පාදන තත්ව සහතික වැඩසටහන් පවත්වාගෙන යාම
- තේ නිෂ්පාදනයට අදාළ සංඛ්‍යා දත්ත ඒකරාශි කිරීම සහ අදාළ ආයතන වෙත ලබාදීම
- තේ ක්ෂේත්‍රයේ අයථා ක්‍රියා පිළිබඳව විශේෂ විමර්ශනයන් කිරීම

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වගන්තිය යටතේ සාදන ලද තේ කොමසාරිස් වරයා වෙත පවරන නියෝග පහතින් සඳහන් වේ.

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩල (නිමි තේ පිරිසැකසුම සහ ශ්වස්ථතා ප්‍රමිති) නියෝගය 1986.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩල (නැවත වගාව සහ කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර ක්‍රමය)

### 3.1.1. ප්‍රධාන ජයග්‍රහණ

- කොමසාරිස් අංශය තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කටයුතු තවදුරටත් කරගෙන යනු ලැබිය.

- ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට වසර 150 ක් පිරීම නිමිත්තෙන් අධ්‍යාපන ප්‍රදර්ශන මාලාවක් සහ කර්මාන්තයේ නිරත පාර්ශවකරුවන් ඇගයීම සඳහා ජාතික තේ සම්මාන උළෙල පැවැත්වීම.

- ගංවතුරෙන් හානියට පත් වූ තේ කර්මාන්ත ශාලාවල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වන්දි වශයෙන් රුපියල් මිලියන 106.3 ක මුදලක් ප්‍රධානය කිරීම.

- ප්‍රාදේශීය වැවිලි සමාගම් 21 ක් සඳහා කම්කරු ආපදා ණය ප්‍රධානය කිරීම.

- තේ නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ හෙක්ටයාර් 176.29 සඳහා රුපියල් මිලියන 32.53 ක සහනාධාර ලබාදුන් අතර එමගින් 35 දෙනෙකු ප්‍රතිලාභ ලැබිය.

- තේ කර්මාන්ත ශාලා නවීකරණ වැඩසටහන යටතේ කර්මාන්ත ශාලා 57 ක් සඳහා රුපියල් මිලියන 34.79 ක් ප්‍රදානය කර ඇත.

කර්මාන්තයේ නිරත පාර්ශව කරුවන්ගේ සේවය ඇගයීම සඳහා ජාතික තේ සම්මාන උළෙළ පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට වසර 150 ක් වීම සැමරීම සඳහා ඔවුන්ට සම්මාන පිරිනැමීම.

මෙම උළෙලේදී ජාතික මට්ටමේ සම්මාන 154 ක් සහ ප්‍රාදේශීය මට්ටමේ සම්මාන 49 ක් ප්‍රදානය කරන ලදි. ඒ අනුව පහත සඳහන් පාර්ශ්වකරුවන් සම්මානයෙන් පිදුම් ලැබිය.

- හොඳම තේ දළු නෙලන්නා
- හොඳම තේ වතු හිමියා
- හොඳම තේ දළු වෙළෙන්ඳා
- හොඳම තේ නිෂ්පාදකයා
- තේ රජු සහ රැජිණ
- හොඳම තේ නැටුම් කණ්ඩායම
- හොඳම තේ අපනයනකරු
- හොඳම කුඩා තේ වතු හිමියන්ගේ සමිතිය
- හොඳම තේ රස බලන්නා
- හොඳම තේ ඡායාරූප ශිල්පියා

**සම්මාන ලාභීන්ගේ ලැයිස්තුව**

1. **හොඳම තේ තොග අපනයනකරු 2016**

**කුඩා පරිමාණ**

1. එන්රිච් ටී ඇන්ඩ් ෆුඩ් එක්ස්පෝට්ස් පුද්ගලික සමාගම
2. ටී. ඩී. කේ. ට්‍රෙිඩ් ලින්ක්ස් පුද්ගලික සමාගම
3. ප්‍රිමියර් නැචුරල් ටීස් පුද්ගලික සමාගම

**මධ්‍යම පරිමාණ**

1. යූ. කේ. බෙවරේජස් පුද්ගලික සමාගම
2. එස්. එස්. ටී. ක්ලෙයාර් ටීස් පුද්ගලික සමාගම
3. සිලොන් ටී ප්ලාන්ටේෂන් එක්ස්පෝට්ස් පුද්ගලික සමාගම

**මහා පරිමාණ**

1. අක්බාර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම
2. එම්පයර් ටීස් පුද්ගලික සමාගම
3. යුනිවර්ල්ඩ් ටීස් පුද්ගලික සමාගම

**2. හොඳම අගය එකතු කළ තේ අපනයනකරු 2016**

**මහා පරිමාණ**

1. අක්බාර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම
2. අන්වරලි ඇන්ඩ් සන්ස් පුද්ගලික සමාගම
3. ජැෆර්ජි බ්‍රදර්ස්

**මධ්‍යම පරිමාණ**

1. බොගවන්තලාව ටී මාර්කටින් පුද්ගලික සමාගම
2. බැසිල’ර් ටී පුද්ගලික සමාගම
3. ටී ට්‍රෙන්ඩ්ස් එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම

**කුඩා පරිමාණ**

1. ඇමර්සන් ට්‍රේඩින් පුද්ගලික සමාගම
2. සන් ටී පුද්ගලික සමාගම
3. ජේ. වී. ගෝකල් සිලොන් පුද්ගලික සමාගම

**3. ඉහළම විදේශීය විනිමය ඉපැයුම්කරු 2016**

**තොග තේ ප්‍රවර්ගය.**

1. අක්බාර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම
2. එම්පයර් ටීස් පුද්ගලික සමාගම
3. යුනිවර්ල්ඩ් ටීස් පුද්ගලික සමාගම

**අගය එකතු කළ තේ ප්‍රවර්ගය**

1. අක්බාර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම
2. එම්.ජේ.එෆ්. එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම
3. ජැෆර්ජි බ්‍රදර්ස්

**4. තොග තේ සඳහා ඉහළම නැ.තෙ.නො (FOB) මිල ඉපැයුම්කරු**

**මහාපරිමාණ**

1. කොමර්ෂල් එක්ස්පෝර්ට්ස් කොම්පැණි
2. අක්බාර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම
3. ඉම්පීරියල් ටීස් පුද්ගලික සමාගම

**මධ්‍යම පරිමාණ**

1. මිලේනියම් ටීස් පුද්ගලික සමාගම
2. යුනයිටඩ් ටීස් පුද්ගලික සමාගම
3. යූ.කේ. බෙවරේජස් පුද්ගලික සමාගම

**කුඩා පරිමාණ**

1. යුරෝ ස්කෑන් එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම
2. මිල්ෆර්ඩ් එක්ස්පෝර්ට්ස් සිලෝන් පුද්ගලික සමාගම
3. බයෝ ෆුඩ්ස් පුද්ගලික සමාගම

**5. අගය එකතු කළ තේ සඳහා ඉහළම නැ.තෙ.නො. (FOB) මිල ඉපැයුම්කරු 2016**

**කුඩා පරිමාණ**

1. ඇමර්සන් ට්‍රේඩින් පුද්ගලික සමාගම
2. යුරෝ ස්කෑන් එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම
3. මැල්ට්‍රාස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම

**මධ්‍යම පරිමාණ**

1. බැසිල'ර් ටී එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම
2. ද ටී ඇන්ඩ් හර්බ් කම්පැනි පුද්ගලික සමාගම
3. යු.කේ. බෙවරේජස් පුද්ගලික සමාගම

**මහා පරිමාණ**

1. ටී ටැන්ග් පුද්ගලික සමාගම
2. එම්.ජේ.එෆ්. එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම
3. මැබ්රොක් ටීස් පුද්ගලික සමාගම

**6. ඉහළම තේ වෙළඳපොල ආවරණය 2016**

1. අක්බාර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම
2. එම්. ජේ. එෆ්. එක්ස්පෝර්ට්ස් පුද්ගලික සමාගම
3. ඉම්පීරියල් ටීස් පුද්ගලික සමාගම

**7. හොඳම තේ අපනයනකරු 2016**

අක්බාර් බ්‍රදර්ස් පුද්ගලික සමාගම

**8. හොඳම තේ දළු නෙලන්නා 2016 - සමාගම් ක්ෂේත්‍රයේ**

1. එම්. සිවාසමි මහත්මිය - හැටන්
2. පී. ඉන්ද්‍රානි මහත්මිය - මාතර
3. කේ. ඩී. විජයකලා මහත්මිය - මාතර

**කුඩාවතු ක්ෂේත්‍රයේ**

1. ඉන්ද්‍රානි මහත්මිය -බදුරලිය
2. මොක්කු ලෙච්චමි මහත්මිය - රත්නපුරය
3. කේ.එම්. අජිත් ගුණවර්ධන මහත්මිය - හැටන්

**9. හොඳම තේ රස බලන්නා 2016**

**තේ කර්මාන්ත ශාලා ප්‍රවර්ගය**

1. ඊ. එස්. බී. ඒ. එගොඩවෙල මහතා - සමර්සෙට් ස්ටේට්
2. ඩී. එච්. එස්. කේ. පලිහවඩන මහතා - හැඩිගල්ල තේ කර්මාන්ත ශාලාව
3. එම්. ඒ. චමින්ද ජයරත්න මහතා - දම්පහල තේ පුද්ගලික සමාගම

**තේ තැරැව්කරු / අපනයනකරු ප්‍රවර්ගය.**

1. අයි.ඩී.එච්. සුනිමල් පෙරේරා මහතා - ඩෙල්මේජ් ෆෝර්සයිත් ඇන්ඩ් පුද්ගලික සමාගම
2. කේ. ආර්. එම්. උදිත මුතුරුවන් මහතා - වටවල ප්ලාන්ටේෂන්
3. ඇන්ඩෲ ෂෝන් සැමුවෙල් මහතා- ජෝන් කීල්ස්.

**10. හොඳම තේ වත්ත, අක්කර 10-50**

**ජාතික මට්ටමේ ජයග්‍රාහකයා**

1. කැටපොළ ස්ටේට්
2. කුරුඳුවත්ත ස්ටේට්
3. ඇඳුරාගල ස්ටේට්, රෑකඩහේන ස්ටේට්

**ප්‍රාදේශීය මට්ටමේ ජයග්‍රාහකයෝ**

1. රෑකඩහේන, දෙනියාය බී ස්ටේට් -ගාල්ල
   කුරුඳුවත්ත ස්ටේට් - මාතර
   කැටපොළ ස්ටේට් -මතුගම
2. කිරිමැටිය වත්ත ස්ටේට් -ගාල්ල
   මහේන්ද්‍ර ස්ටේට් - මාතර
   ඇඳුරාගල ස්ටේට් - මතුගම
3. බන්දුන්කන්ද වත්ත ස්ටේට් - ගාල්ල
   දන්ලන්දවත්ත ස්ටේට් - මාතර
   හැඩිගල්ල ස්ටේට් - මතුගම

**11. හොඳම තේ දළු වෙළෙන්දා**

**මහා පරිමාණ**

1. GM10419- කුඩා කාබනික ගොවියන්ගේ සංවිධානය - ගම්පොළ
2. MT 1365 - රයිගම් කුඩා තේ වතු සංවර්ධන සමිතිය ඉංගිරිය, B2710 - ඒ.පී. අබේසේකර මහතා - වැලිමඩ
3. H 2933 B 2594 - ඩී. එම්. වැලිකල මහතා - ගිනිගත්හේන

**මධ්‍යම පරිමාණ**

1. Mt2139 - සුසන්ත රාජකරුණා මහතා - ඉංගිරිය
2. R3901- නන්දසේන මිණිපුර මහතා - කලවාන
3. B2594- ඊ. ඩී. ගුණදාස මහතා - බණ්ඩාරවෙල

### කුඩා පරිමාණ

1. GI4511 මීපාවල කුඩා තේ වතු සංවර්ධන සමිතිය - ගාල්ල
2. M3736 තනිපිට කුඩා තේ වතු සංවර්ධන සමිතිය - දෙනියාය
3. B2850 පී. ගාමිණී ලයනල් මහතා - හාලි ඇල

### 12 හොඳම තේ කර්මාන්ත ශාලාව

### ජාතික මට්ටමේ ජයග්‍රාහකයෝ

### මහා පරිමාණ

1. MF 1172 නිව් විතාන කන්ද ටී ෆැක්ට්‍රි - රත්නපුර
2. MF1542අඬාරදෙනිය ටී ෆැක්ට්‍රි - දෙනියාය
2. MF1217ගල්පඩිතැන්න ටී ෆැක්ට්‍රි - රත්නපුර
3. MF1558අරුණ ටී ෆැක්ට්‍රි -මතුගම

### මධ්‍යම පරිමාණ

1. MF0692 වෝල්ට්‍රිම් ටී ෆැක්ට්‍රි - ලිඳුල
2. BF0138 පෝතොටුව ටී ෆැක්ට්‍රි -කොටපොළ
3. MF1441 ෆෝල්කන් ටී ෆැක්ට්‍රි - රත්නපුර
3. Mf1264 අවිස්සාවේල්ල ටී ෆැක්ට්‍රි - අවිස්සාවේල්ල
3. Mf1501 සිහාරා ටී ෆැක්ට්‍රි - තවලම

### කුඩා පරිමාණ

1. MF1337 ලුම්බිනි ටී ෆැක්ට්‍රි -දෙනියාය
2. MF0083 රිල්හේනටී ෆැක්ට්‍රි -පැල්මඩුල්ල
2. Mf1410 ගුණවර්ධන ටී ෆැක්ට්‍රි - අකුරැස්ස
3. MF1437 දෙල්ලව ටී ෆැක්ට්‍රි -දෙල්ලව
3. MF1502 නිල්ගිරි ටී ෆැක්ට්‍රි - කොටපොළ
3. MF1398 අතුකෝරල ටී ෆැක්ට්‍රි - පිටිගල

### හරිත තේ

1. MF0586 නිව්බර්ග් ග්‍රීන් ටී ෆැක්ට්‍රි - ඇල්ල

### විශේෂිත තේ (Speciality)

1. MF0049 ඉදල්ගස්හින්න ටී ෆැක්ට්‍රි - ඉදල්ගස්හින්න
2 MF1541 ඇවොන්ලි හිල් ටී ෆැක්ට්‍රි - බණ්ඩාරවෙල
3 MF1517 නිල්මිණිවත්ත ටී ෆැක්ට්‍රි - මිල්ලව
3. MF1041 ගලබොඩ ටී ෆැක්ට්‍රි - අකුරැස්ස

### ප්‍රාදේශිය මට්ටමින් ජයගත් ජයග්‍රහකයෝ

### මහා පරිමාණ

| | පළමු ස්ථානය | දෙවන ස්ථානය | තුන්වැනි ස්ථානය |
|---|---|---|---|
| මාතර | MF1542 අඬාරදෙනිය ටී ෆැක්ට්‍රි | | |
| රත්නපුර | MF1172 නිව් විතාන කන්ද ටී ෆැක්ට්‍රි | MF1217 ගල්පඩිතැන්න ටී ෆැක්ට්‍රි | MF0181 සිසිලියන් ටී ෆැක්ට්‍රි |
| බදුරලිය | MF1558 අරුණ ටී ෆැක්ට්‍රි | MF1342 එවර්ග්‍රීන් ටී ෆැක්ට්‍රි | MF1465 බ්‍රොම්බිල් ටී ෆැක්ට්‍රි |
| ගාල්ල | MF1350 බටුවන්ගල ටී ෆැක්ට්‍රි | | |
| හැටන් | MF0835 හරන්ගල්ල ටී ෆැක්ට්‍රි | | |

### මධ්‍යම පරිමාණ

| | පළමු ස්ථානය | දෙවන ස්ථානය | තුන්වැනි ස්ථානය |
|---|---|---|---|
| මාතර | **BF0138** පොතොටුව ටී ෆැක්ට්‍රි | **BF0188** කළුබෝවිටියාන ටී ෆැක්ට්‍රි | |
| බදුරලිය | **MF1455** තුන්ඩෝල ටී ෆැක්ට්‍රි | **MF1544** හැඬිගල්ල ටී ෆැක්ට්‍රි | |
| ගාල්ල | **MF1501** සිහාරා ටී ෆැක්ට්‍රි | **MF1333** හිඟුල්ගොඩ ටී ෆැක්ට්‍රි | **MF1314** නෙළුව මැදගම ටී ෆැක්ට්‍රි |
| රත්නපුර | **MF1441** ෆැල්කන් ටී ෆැක්ට්‍රි | **MF1264** අවිස්සාවේල්ල ටී ෆැක්ට්‍රි<br>**MF1392** හිදෙල්ලන ටී ෆැක්ට්‍රි | |
| හැටන් | **MF0692** වොල්ට්‍රිම් ටී ෆැක්ට්‍රි | | |
| ගම්පොළ | **MF0697** නායපාන ටී ෆැක්ට්‍රි | | |
| බණ්ඩාරවෙල | **MF0381** සදර්න් ටී ෆැක්ට්‍රි | **MF0269** දඹේතැන්න ටී ෆැක්ට්‍රි | |

### කුඩා පරිමාණ

| | පළමු ස්ථානය | දෙවන ස්ථානය | තුන්වැනි ස්ථානය |
|---|---|---|---|
| මාතර | **MF1337** ලුම්බිනි ටී ෆැක්ට්‍රි | **MF1410** ගුණවර්ධන ටී ෆැක්ට්‍රි | **MF1502** නිල්ගිරි ටී ෆැක්ට්‍රි |
| බදුරලිය | **MF1398** අතුකෝරල ටී ෆැක්ට්‍රි | **MF 1530** කුමුදු ටී ෆැක්ට්‍රි | **MF1252** විල්හේන ටී ෆැක්ට්‍රි |
| ගාල්ල | **MF1437** දෙල්ලව ටී ෆැක්ට්‍රි | **MF0954** මොරගල්ල ටී ෆැක්ට්‍රි<br>**MF1389** කරගොඩ ටී ෆැක්ට්‍රි | |
| රත්නපුර | **MF0083** රිල්හේන ටී ෆැක්ට්‍රි | **MF0103** ඕපාත ටී ෆැක්ට්‍රි | **MF1387** ඒ.සී.යු. ටී ෆැක්ට්‍රි |
| හැටන් | **MF0772** හොලිරූඩ් ටී ෆැක්ට්‍රි | **MF0457** පේද්‍රෘ ටී ෆැක්ට්‍රි | **MF0569** ඩෙස්ෆෝඩ් ටී ෆැක්ට්‍රි |
| ගම්පොළ | **MF0608 Craighead** ටී ෆැක්ට්‍රි | **Mf0616** දාට්‍රි ටී ෆැක්ට්‍රි | |
| බණ්ඩාරවෙල | **MF0598** ෂෝලෑන්ඩ්ස් ටී ෆැක්ට්‍රි | | |

ඡායාරූපය : 3.1




ඡායාරූපය : 3.2



ඡායාරූපය : 3.3



ඡායාරූපය : 3.4



ඡායාරූපය : 3.5



ඡායාරූපය : 3.6



ඡායාරූපය : 3.9




ඡායාරූපය : 3.10



ඡායාරූපය : 3.11



ඡායාරූපය : 3.12



ඡායාරූපය : 3.13




ඡායාරූපය : 3.6



ඡායාරූපය : 3.15



ඡායාරූපය : 3.16



### 3.1.2 තේ නිෂ්පාදකයන් සහ කර්මාන්තශාලා ලියාපදිංචිය

1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව තේ කොමසාරිස්ගේ අංශය තේ නිෂ්පාදකයන් සහ තේ කර්මාන්ත ශාලාවලට අදාළ කරුණු වලින් සමන්විත ලේඛනයක් නඩත්තු කරනු ලබයි.

පනතට අනුව නිෂ්පාදකයකු ලෙස ලියාපදිංචි වීමට කිසියම් අයෙකු හිමිකම් ලබන්නේ ද යන වග තීරණය කිරීමට කොමසාරිස් අංශයට බලය තිබේ. සෑම නිෂ්පාදකයෙකුම තේ නිෂ්පාදනය සඳහා මෙන්ම කොළඹ වෙන්දේසිය ඔස්සේ තේ විකිණීම සඳහා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි විය යුතුයි.

ගුණාත්මක තත්වයේ තේ නිෂ්පාදනයට සුදුසු වන පරිදි තම ගොඩනැගිලි, උපකරණ සහ මෙහෙයුම් ක්‍රම පවතින්නේ ද යනවග සහතික කරලීම සඳහා මෙන්ම කර්මාන්ත ශාලාව විසින් නිපදවන තේ වල ගුණාත්මක බව අධීක්ෂණය කිරීම, කසල තේ බැහැර කිරීම පාලනය කිරීම සහ සාධාරණ මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසා දීම සඳහා සියලුම තේ නිෂ්පාදන කර්මාන්ත ශාලා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි වීම අවශ්‍ය වේ.

භූමියේ උස ප්‍රමාණය අනුව සහ මිල දී ගන්නා දළු නිෂ්පාදනය අනුව තේ කර්මාන්ත ශාලා වර්ගකිරීම පහත 3.1 වගුව මගින් දිස්වේ.

වගුව 3.1 මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය

| තත්ත්වය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| 1. තම තේ දළු වලට පමණක් සීමාවූ | 62 | 15 | 06 | **83** |
| 2. තම තේ දළු සහ මිලදීගත් තේ දළු:- | | | | |
| (අ) තම තේ දළු මුළු නිෂ්පාදනයෙන් 50% කට වඩා අඩු | 14 | 36 | 107 | **157** |
| ආ) තම තේ දළු මුළු නිෂ්පාදනයෙන් 50% කට වඩා වැඩි | 69 | 37 | 14 | **120** |
| 3. මිලදීගත් තේ දළු පමණක් | 10 | 33 | 266 | **309** |
| 4. ක්‍රියාත්මක වන ලියාපදිංචි තේ කර්මාන්තශාලා | 170 | 130 | 423 | **723** |
| 5. ක්‍රියාත්මක නොවන ලියාපදිංචි තේ කර්මාන්තශාලා | 29 | 73 | 86 | **188** |
| 6. මුළු ලියාපදිංචි තේ කර්මාන්තශාලා සංඛ්‍යාව | 199 | 203 | 509 | **911** |

ප්‍රස්ථාර 3.1 තේ කර්මාන්තශාලා වර්ගීකරණය




ප්‍රස්ථාර 3.2 ලියාපදිංචි තේ කර්මාන්තශාලා මුළු ගණන




### 3.1.3 මිලදී ගන්නා තේ දළු සඳහා සාධාරණ මිල ගණන් ගෙවීම

තේ පාලන පනතේ විධිවිධාන වලට අනුව, මිලදී ගන්නා තේ දළු යොදාගනිමින් තේ නිෂ්පාදනය කරන කර්මාන්තශාලා, තේ කොමසාරිස් විසින් නිර්දේශිත මිල ගණන් මත පදනම්ව එම මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවීම් කළ යුතු වේ. මෙහිදී එම කර්මාන්ත ශාලාවල නිෂ්පාදනය කරන තේ වල නියමිත මිල පිළිබඳව සැලකිලිමත් වෙමින් කටයුතු කළ යුතුයි. කර්මාන්ත ශාලා මගින් අමු තේ දළු වෙළෙන්ඳන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීමේදී එක් එක් කර්මාන්තශාලා වල මාසික ශුද්ධ විකුණුම් සාමාන්‍යය මත පදනම් ව තීරණය කරනු ලබයි.

නිමි තේ වලින් උපයන මුදල දළු සැපයුම්කරුවන් සහ කර්මාන්ත ශාලා අතර 68: 32 අනුපාතයට අනුව බෙදිය යුතුයි. කර්මාන්තශාලා විකුණුම් සාමාන්‍ය මිල, භූමි පිහිටීම අනුව මාසික සාමාන්‍ය මිල ඉක්මවන්නේ නම් එම වර්ධනය වූ ආදායම 50:50 අනුපාතයට අනුව දෙපාර්ශවය අතර බෙදනු ලබයි. නිමි තේ වලට අමු දළු වලින් 21.5% ක නිපැයුම් අනුපාතයක් මත පදනම් ව මිල සූත්‍රය ගොඩ නගනු ඇත.

### 3.1.3.1 පැහැරහරිනු ලැබූ ගෙවීම්

විමසුමට බඳුන් වන වසර (2017) තුළදී දෙසැම්බර් 31 දින වන විට තේ දළු වෙළෙන්ඳන් සඳහා ගෙවීම් පැහැරහරිනු ලැබූ ප්‍රමාණය රුපියල් මිලියන 271 ක් ලෙස ගණන් බලා ඇත. 2017 වසර තුළදී අප විසින් දළු සැපයුම්කරුවන්ට රුපියල් මිලියන 53 ක මුදලක් අයකර දෙනු ලැබීය.

එමෙන්ම ගෙවීම් පැහැර හරින්නන්ගේ ලියාපදිංචිය අත්හිටුවීම මගින් පැහැර හැරෙන මුදල තවදුරටත් එකතු විම වළක්වාලනු ලැබීය. අමු තේ දළු සඳහා සාධාරණ මිල ගණන් ගෙවීම පැහැර හරින කර්මාන්ත ශාලාවක් වේ නම්, ඒ සඳහා අවවාද කරන අතර තවදුරටත් පැහැරහැරි ගෙවීම් ලබා නොදෙන්නේ නම් එම කර්මාන්තශාලාවේ ලියාපදිංචිය අත්හිටවනු ලැබේ. එවැනි කර්මාන්තශාලා වල නැවත ලියාපදිංචිය සලකා බලනු ලබන්නේ සියලුම පැහැර හැරුනු ගෙවීම් පියවීමෙන් පසුව පමණි.

3.2 වගුව : පැහැර හරිනු ලැබූ ගෙවීම් පිළිබඳ විස්තර

| කලාප | 2017.01.01දිනට එකතුව (මුදල) | 2017 වසර තුළදී එකතුවූ ප්‍රමාණය (මුදල) | පියවාගත් සහ ගෙවූ ගණනන | 2017.12.31 දිනට කුඩා තේ වතු හිමියන්ට ගෙවිය යුතු ශේෂය | වසා දැමුණු කර්මාන්ත ශාලාවලින් ගෙවිය යුතු මුදල | ක්‍රියාත්මක වන කර්මාන්ත ශාලාවලින් ගෙවිය යුතු මුදල |
|---|---|---|---|---|---|---|
| රත්නපුර | 116783376.8 | 22206515.90 | 21214943.87 | 117774948.8 | 57038281.62 | 60736667.46 |
| මාතර | 16559464.66 | 19584710.86 | - | 36144175.52 | 2532641.60 | 33611533.92 |
| ගම්පොළ | 6989306.77 | 41197801.02 | 1844319.92 | 46342787.87 | 31330302.85 | 15012485.02 |
| ගාල්ල | 21339132.76 | 5638134.29 | 868187.51 | 26109079.54 | 20863615.13 | 5245464.43 |
| බදුරලිය | 34203869.16 | 12677203.63 | 10750757.25 | 36130315.54 | 29030301.45 | 7100014.09 |
| හැටන් | 5446144.07 | 4310510.20 | 661012.41 | 9095641.86 | 4595247.26 | 4500394.60 |
| බණ්ඩාරවෙල | 17851858.09 | - | 17823741.43 | 28116.66 | - | 28116.66 |
| එකතුව | **219173152.30** | **105614875.90** | **53162962.39** | **271625065.80** | **145390389.90** | **126234676.10** |

### 3.1.4. තේ දළුවල තත්ත්ව පාලනය

ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙහෙයුම් ක්‍රියාවලිය ආදියෙහි යෝග්‍ය තත්ත්වයන් වල පැවතිම නිමි තේ වල උසස් තත්ත්වය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වේ. උසස් තත්ත්වයේ නිමි තේ නිෂ්පාදනය සඳහා ඉහළින් සඳහන් තත්ත්වයන් හේතු නොවන්නේ නම් එවැනි කර්මාන්තශාලා ලියාපදිංචිය අත්හිටුවීමට මෙන්ම අවලංගු කිරීමට 1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව තේ කොමසාරිස් වරයාට බලය ඇත.

දළු මිල දී ගෙන තේ නිපදවන විටදී තේ දළුවල තත්ත්ව පාලනය ඉතාමත් වැදගත් වේ. උසස් තත්වයේ තේ දළු යොදාගනිමින් තේ නිපදවන්නේ නම් නිමි තේවල තත්ත්වය උසස් වන අතර කුඩා තේ වතු හිමියන් සහ තේ නිෂ්පාදකයන් යන දෙපාර්ශ්වයටම ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකිය.

අමු තේ දළුවල තත්ත්වය හා අදාළව ගැසට් නිවේදනයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් 2010 දෙසැම්බර් 14 වැනි දින නිකුත් කර ඇත.

#### 3.1.4.1 ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම්

තේ නිෂ්පාදනයේ ගුණාත්මක බව අධීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා තේ පාලන පනත මගින් තේ කොමසාරිස් අංශයට බලය ලබා දෙනු ඇත. ඒ අනුව නිමි තේවල සහ තේ දළු වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති නිර්මාණය කර පවත්වාගෙන යනු ලබයි.

- අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය එක්ව පවත්වාගෙන යන තත්ත්ව සහතිකය
- ආ) තේ දළු වල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා "B Leaf 60" වැඩසටහන
- ඇ) උත්සව සමයේ වැඩිවන අස්වැන්න කළමනාකරණය කිරීමේ වැඩසටහන
- ඈ) අඩු ශුද්ධ විකුණුම් සාමාන්‍ය (Low NSA) උපායමාර්ගය.
- ඉ) තත්ත්ව අධීක්ෂණ ක්‍රම (කාර්ය කණ්ඩායම් මෙහෙයුම - TTO)
- ඊ) කර්මාන්තශාලා නවීකරණ සහනාධාර ක්‍රමය.
- උ) තේ නැවත වගා සහනාධාර ක්‍රමය
- ඌ) කර්මාන්තශාලා පාදක තේ සංවර්ධන වැඩසටහන්
- එ) තේ කර්මාන්තශාලා සහ තේ ගබඩා වල යහපත් පිළිවෙත් ස්ථාපිතකිරීම.
- ඒ) තේ දළු වෙළෙන්දන් පුහුණුකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම. (NIPM මගින්)

### අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන තත්ත්ව සහතිකය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව තේ කර්මාන්තශාලාවල නිෂ්පාදන ක්‍රියාවලිය සහ අවසන් නිෂ්පාදනය එනම් කළු තේ සහතික කරණය සඳහා තේ කර්මාන්ත ශාලා සඳහා නිෂ්පාදන සහතික කරන ක්‍රමයක් ක්‍රියාත්මක කරයි.

භාවිත නීතිමය අවශ්‍යතාවයන් සමග අදාළ ප්‍රමිති තුළ නිශ්චිත කර ඇති පරිදි, සැකසුම් පාලන සහ නිෂ්පාදන පරීක්ෂණ පිළිබඳ අමතර අවශ්‍යතා සමග බැඳුනු ගුණාත්මක කළමනාකරණ පද්ධතියක අත්‍යවශ්‍ය මූලිකාංග ඒකරාශි කරගනිමින් මෙම සහතික කරණ ක්‍රමය ක්‍රියාත්මක වේ.

පාරිභෝගිකයාට කළු තේවල ගුණාත්මක බව සඳහා තුන්වන පාර්ශවීය සහතිකකරණයක් ලබා දීම සඳහා අපක්ෂපාතිව, විෂමතාවයකින් තොරව සහ විනිවිද භාවයකින් යුක්තව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන සහ ශ්‍රී ලංකා තේ මණ්ඩල නිෂ්පාදන සහතික කරණ ක්‍රමය ක්‍රියාත්මක වේ.

### ආ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා "B Leaf 60"වැඩසටහන

දළුවල පශ්චාත් අස්වනු හානිය අවම කරගනිමින් හා දළු නෙලීමේ ගුණාත්මක බව වර්ධනය කරගනිමින්, අමු දළුවල ගුණාත්මක බව වැඩිකිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

මෙම ව්‍යාපෘතියේ විශාල ප්‍රගතියක් ක්ෂේත්‍රයේදී දැකිය හැකි වෙයි.

මෙහි අරමුණු ලඟා කරගනු වස් පහත උපායමාර්ග අනුගමනය කරනු ලැබේ.

1. පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

2. දළු පරිහරණය පිළිබඳ නියෝග පැනවීම.

3. පශ්චාත් අස්වනු හානිය වැළැක්වීමේ ක්‍රම සඳහා මූල්‍යමය සහයෝගය ලබාදීම.

4. පශ්චාත් අස්වනු හානිය අවම කිරීම සඳහා සහනාධාර ලබාදීම.

## ඇ) උත්සව සමයේ අස්වනු හානිය වැළැක්වීම සඳහා වැඩසටහන

උත්සව සමයේදී දීර්ඝ කාලයක් තේ කර්මාන්තශාලා වසා තැබීමෙන් සිදුවන අස්වනු හානිය අවම කරගැනීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2005 වසරේ සිට ක්‍රියාත්මක වන අතර ඒ යටතේ නොයෙකුත් වැඩසටහන් හඳුන්වා දෙමින් අස්වනු හානිය මුළුමනින්ම පාහේ පාලනය කිරීමට තේ කොමසාරිස් අංශයට හැකි වී ඇත.

## ඈ) අඩු ශුද්ධ විකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය (Low NSA Strategy)

ශුද්ධ විකුණුම් සාමාන්‍යය මිල අනුව පහළින්ම සිටින තේ කර්මාන්ත ශාලා සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ තේ දළුවල ප්‍රමිතිය සහ තේ නිෂ්පාදනයේ ප්‍රමිතිය වැඩිකිරීම මඟින් එවැනි කර්මාන්තශාලා වල ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිල ඉහළට ගැනීමයි.

## ඉ) ගුණාත්මක බව අධීක්ෂණ ක්‍රමය (කාර්ය කණ්ඩායම් මෙහෙයුම)

2017 වසර තුළදී තේ කොමසාරිස් අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා හදිසි පිරික්සීම් 165 වාරයක් සිදු කර ඇත.

වගුව 3.3: කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

| කලාපය | පරීක්ෂණ ගණන |
|---|---|
| බණ්ඩාරවෙල | 13 |
| ගම්පොල / හැටන් | 70 |
| රත්නපුර | 11 |
| මාතර | 52 |
| ගාල්ල | 06 |
| මතුගම | 13 |
| එකතුව | **165** |

වගුව 3.4: සහනාධාර ගෙවීම්

| කලාපය | නැවත වගා සහනාධාර ක්‍රමය | | | කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර ක්‍රමය | | |
|---|---|---|---|---|---|---|
| | අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල | ව්‍යාප්තිය (හෙක්.) | අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ කර්මාන්තශාලා සංඛ්‍යාව | ගෙවූ මුදල |
| බණ්ඩාරවෙල | 58 | 818750.00 | 4.47 | 11 | - | - |
| ගම්පොළ/හැටන් | 137 | 25867059.00 | 132.30 | 17 | 09 | 6227891.65 |
| රත්නපුර | 61 | - | - | 27 | 13 | 9238019.58 |
| මාතර | 06 | 3005934.00 | 16.3378 | 13 | 12 | 5392858.19 |
| ගාල්ල | 05 | 1732727.00 | 14.11 | 18 | 18 | 11067633.68 |
| බදුරලිය | 03 | 1107800.00 | 9.08 | 02 | 05 | 2868333.33 |
| එකතුව | **270** | **32,532,270.00** | **176.2978** | **88** | **57** | **34,794,736.43** |

## ඊ) කර්මාන්තශාලා නවීකරණය කිරීම සහ තේ නැවත වගාකිරීම සඳහා සහනාධාර ලබාදීම

දේශීය අරමුදල් යටතේ රාජ්‍ය භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අයවැය මඟින් තේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මුදල් වෙන්කර ඇත. මෙම වෙන්කළ මුදල් වසර තුළ දී කර්මාන්තශාලා නවීකරණය සහ තේ නැවත වගා සහනාධාර ක්‍රමය සඳහා උපයෝගී කරගනු ලැබිය.

2017 වසර සඳහා කර්මාන්තශාලා නවීකරණය සහ තේ නැවත වගාව පිණිස සමාගම් හා පුද්ගලික අංශයට අරමුදල් සපයා ඇත.

2017 වසරේදී කර්මාන්තශාලා නවීකරණය සහ තේ නැවත වගා සහනාධාර ක්‍රමය සඳහා ගෙවීම් කර ඇති ආකාරය ඉහත වගුව මඟින් පෙන්වා දේ.

## උ) කර්මාන්තශාලා පාදක තේ සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එක්ව කුඩා තේ වතු ක්ෂේත්‍රයේ සහ කර්මාන්තශාලාවල ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව මෙම කර්මාන්තශාලා පාදක තේ සංවර්ධන වැඩසටහන සැලසුම් කර ඇත.

කුඩා තේ වතු ක්ෂේත්‍රයේ ඵලදායිතාවය සහ අමු තේ දළු භාවිතය මෙහෙයවීම පිළිබඳ අධීක්ෂණය සඳහා ව්‍යාප්ති නිලධාරියෙකු (ක්ෂේත්‍ර සම්බන්ධීකාරකයකු) මෙම වැඩසටහන යටතේ පත් කිරීමට තීරණය කර ඇත.

## ඖ) තේ කර්මාන්තශාලාවල යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMPs) ස්ථාපිත කිරීම

මෙම වැඩසටහන යටතේ තේ කර්මාන්ත ශාලා 484 ක් ඇගයීමට ලක් කෙරුනු අතර එම කම්හල්වල තේ නිෂ්පාදන ක්‍රියාවලිය උසස් තත්ත්වයකට ගෙන ඒමට පියවර ගනු ලැබිය.

වගුව 3.5: ප්‍රාදේශිය වශයෙන් යහපත් නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව

| කලාපය | යහපත් නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව |
|---|---|
| බණ්ඩාරවෙල | 38 |
| ගම්පොල / හැටන් | 140 |
| රත්නපුර | 38 |
| මාතර | 95 |
| ගාල්ල | 107 |
| මතුගම | 66 |
| **එකතුව** | **484** |

## එ) තේ දළු වෙළඳ බලපත්‍ර ලබාදීම

තේ පාලන පනතට අනුව සියලුම තේ දළු වෙළෙන්ඳන් තේ කොමසාරිස් අංශයෙන් වාර්ෂිකව බලපත්‍ර ලබාගත යුතු වේ. තේ කොමසාරිස් අංශය මගින් සෑම ලියාපදිංචි තේ දළු වෙළෙන්දෙක්ම අධීක්ෂණය කරනු ලබයි. පහත 3.6 වගුව මගින් ප්‍රාදේශිය වශයෙන් තේ දළු වෙළෙන්දන්ගේ ව්‍යාප්තිය පෙන්නුම් කෙරේ.

වගුව 3.6: 2017 වසර තුළදි තේ දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බලපත්‍ර ගණන

| ස.තේ.කො. කලාප | 2017.01.01 දින වන විට බලපත්‍රලාභින් ගණන | බලපත්‍ර අලුත් කිරීම් | අලුතින් බලපත්‍ර නිකුත් කිරීම් | 2017.01.31 දින වන විට දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බලපත්‍ර ගණන |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 170 | 160 | 10 | 170 |
| ගම්පොල / හැටන් | 280 | 248 | 35 | 283 |
| මාතර | 322 | 291 | 14 | 305 |
| ගාල්ල | 320 | 300 | 13 | 313 |
| රත්නපුර | 537 | 486 | 51 | 537 |
| මතුගම | 223 | 205 | 28 | 233 |
| **එකතුව** | **1861** | **1690** | **151** | **1841** |

වගුව 3.8: ජාත්‍යන්තර සහතිකකරණය

| කලාපය | HACCP | වෙනත් ජාත්‍යන්තර සහතිකකරණය |
|---|---|---|
| බණ්ඩාරවෙල | 10 | 23 |
| ගම්පොළ / හැටන් | 35 | 53 |
| රත්නපුර | 07 | 23 |
| මාතර | 06 | 18 |
| ගාල්ල | 08 | 10 |
| මතුගම | 06 | 12 |

## ඒ) කසල තේ පිරිසැකසුම් කිරීම

කසල තේ පිරිසැකසීම යනු, විනාශ නොකළ කසල තේ වලින් භාවිතා කළ හැකි තේ වෙන් කර ගැනීමේ ක්‍රියාවලියයි. කසල තේ පිරිසැකසීමේ මධ්‍යස්ථාන වලට බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන 2009 වසරේ සිට ක්‍රියාත්මක වේ. 2017 වසර තුළදී ප්‍රාදේශිය වශයෙන් නිකුත් කළ සමස්ත බලපත්‍ර සංඛ්‍යාව පහත සඳහන් 3.7 වගුව මගින් පෙන්නුම් කෙරේ.

වගුව 3.7 : 2017 වර්ෂයේදී කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත්කිරීම

| කලාපය | 2017.01.01 දින වන විට ලියාපදිංචි පිරිසැකසුම් කරුවන් | වසරතුළදී අළුත්කිරීම් | වසරතුළදී අළුත්නිකුත්කිරීම් | 2017.12.31 දින වනවිට පිරිසැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | 2017.12.31 වනවිට නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 01 | 01 | - | 01 | 1338 |
| ගම්පොල / හැටන් | 240 | 238 | 24 | 262 | 4171 |
| මාතර | 06 | 04 | 00 | 04 | 445 |
| ගාල්ල | 30 | 29 | 02 | 31 | 690 |
| රත්නපුර | 04 | 05 | 02 | 07 | 888 |
| මතුගම | 05 | 05 | 00 | 05 | 176 |
| **එකතුව** | **286** | **282** | **28** | **310** | **7708** |

## 3.2 තේ අපනයන අංශය

1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනතේ බලතල හා කාර්යයන් මෙන්ම 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත ට අනුව පනවන ලද නියෝග තේ අපනයන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. තේ අපනයන අංශය තේ අපනයනකරුවන්, තේ ඇසුරුම් කරුවන්, තේ ගුදම්, තේ ආනයනකරුවන් සහ තේ ඇසුරුම් වර්ග ලියාපදිංචිය මෙන්ම තේ සමුද්ධරණය, තේවල අවම ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය, තේ අපනයනය පිළිබඳ අධිකාරිත්වය දැරීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛන සම්පාදනය සහ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය අධීක්ෂණය යන කාර්යයන්වලට අදාළව කටයුතු කරයි.

ඊට අමතරව පහත සඳහන් ප්‍රධාන මෙහෙයුම් 2017 වසරේදී ද තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය.

- **ඉරාන අපනයන සඳහා යහපත් නිෂ්පාදන ක්‍රමවේද සහතිකකරණය**

ඉරානයට අපනයනය කිරීමට සුදානම් කළ තේ තොග ගබඩා කර ඇති ගුදම්වල තත්ත්වය තක්සේරු කිරීම සඳහා 2017 වසරේදී විශේෂ මෙහෙයුමක් සිදු කරනු ලැබීය. තේ මිශ්‍ර කිරීමේ ක්‍රියාවලිය, ඇසුරුම් කිරීම සහ ගබඩා කිරීමේ කටයුතු තක්සේරු කිරීම මගින් මෙන්ම දේශීය සහ ජාත්‍යන්තර තේ ප්‍රමිති වල මගපෙන්වීම යටතේ සිදුකරන සංවේදී විශ්ලේෂණයන් හා විද්‍යාත්මක පරීක්ෂණයන් යොදාගනිමින් අවසන් නිෂ්පාදනයන් ඇගයීම මගින් මෙම ගුදම්වල යහපත් නිෂ්පාදන ක්‍රමවේද තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මෙම සහතිකකරණය ආරම්භ කරනු ලැබීය.

- **ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශයේ දින 7 පැය 24 මෙහෙයුම් සහ ශ්‍රී ලංකා රේගු අපනයන පහසුකම් මධ්‍යස්ථානයේ දී තේ තොග පිළිබඳව සිදුකරන ඒකාබද්ධ විමර්ශනය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අපනයන අංශය තේ අපනයනයන් සඳහා වන බාධා ඉවත් කිරීමේ අරමුණින් සතියේ දින 7 ම පැය 24 පුරා විවෘතව තබා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කරමින් මේ වන විට සෑම දිනකම රාත්‍රී 10.00 දක්වා විවෘතව තැබීමට කටයුතු කර ඇත. මෙමඟින් තේ අපනයනකරුවන්ට තම රේගු නිර්යාත ප්‍රකාශන (Cusdec) ඉදිරිපත් කිරීමත් ප්‍රමාදයකින් තොරව ඒවාට ප්‍රතිචාර ලබාගැනීමටත් පහසුකම් සැපයීම සිදුවේ.

තවදුරටත්, ශ්‍රී ලංකා රේගුවේ සහයෝගය ඇතිව අංක 478 /3C, කේ. සිරිල් සී පෙරේරා මාවත, කොළඹ 13 හි පිහිටි අපනයන පහසුකම් මධ්‍යස්ථානයේ දී තේ වල තත්වය සහතික කිරීම සඳහා වඩාත් විනිවිදභාවයකින් යුතුව, රේගු සීමා ක්‍රියාපටිපාටීන්ට සහ අපනයන නැව් භාණ්ඩ නිශ්කාශනය සඳහා බාධා ඇති නොකර, අපනයනයට සුදානම් තේ තොග පිළිබඳ ඒකාබද්ධ පරීක්ෂාව සඳහා විශේෂ විමර්ශන සහ වාණිජ පහසුකම් ඒකකයේ මෙහෙයුම් කටයුතු කරගෙන යනු ලබයි.

### 3.2.1. ලියාපදිංචි කිරීම

අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගුදම් සහ ආනයන කරුවන් ලියාපදිංචිය හා ලියාපදිංචිය අලුත් කිරීමතේ අපනයන අංශයේ ප්‍රධාන කාර්යභාරයන් අතුරින් එකකි.

ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි වී තිබීම එමෙන්ම තේ ගබඩාකිරීම, මිශ්‍ර කිරීම හා ඇසුරුම් සඳහා ලියාපදිංචි ගබඩාවක් (ගුදමක්) තිබීම, තේ රස බැලීමේ පහසුකම් සහිතව සුදුසුකම් ලත් තේ රස බලන්නෙකු සිටීම සහ අවම වශයෙන් රුපියල් මිලියනයක ප්‍රාග්ධනයක් (ආයෝජනය කළ) තිබීම තේ අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා අයදුම්කිරීමට සුදුසුකම් වේ.

1986 ජනවාරි 28 දින අංක 386/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කළ 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීමේ) නියෝගය පරිදි දේශීය පරිභෝජනය සඳහා හෝ වෙනත් යම් ආකාරයක තේ ඇසුරුම් ව්‍යාපාර වල යෙදෙන ඕනෑම පුද්ගලයෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ. මෙම සෑම ලියාපදිංචියක්ම වසරක කාලයකට සීමා වේ. ලියාපදිංචිය වාර්ෂිකව දීර්ඝ කර ගත යුතු වේ.

1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනත යටතේ තේ අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වී ඇති ඕනෑම අයෙකු තේ ආනයනකරුවකු ලෙස ලියාපදිංචි වීමට ද සුදුසු කම් ලබයි.

වගුව 3.9: අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගුදම්, තැරැව්කරුවන් සහ ආනයනකරුවන් ලියාපදිංචිය

| ලියාපදිංචි කිරීම් | 2017.01.01. දිනට | 2017 වසර තුළ දී (නව ලියාපදිංචි කිරීම්) | 2017.12.31 දිනට සමස්ත සංඛ්‍යාව |
|---|---|---|---|
| අපනයනකරුවන් | 325 | 41 | 366 |
| ඇසුරුම්කරුවන් | 584 | 115 | 699 |
| ගුදම් | 212 | 27 | 239 |
| ආනයනකරුවන් | 111 | 13 | 124 |
| නිෂ්පාදන තැරැව්කරුවන් | 8 | - | 8 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2003 මාර්තු මස 20 වන දින අංක 1280/8 දරණ අති විශේෂ රජයේ ගැසට් පත්‍රය මගින් පළ කළ නියෝග සහ 1986 සැප්තැම්බර් මස 10 වන දින අංක 418/11 දරණ අති විශේෂ රජයේ ගැසට් පත්‍රය මගින් පළ කළ නියෝග මගින් සංශෝධිත 1984 දෙසැම්බර් මස 05 වන දින අංක 326/17 දරණ අති විශේෂ රජයේ ගැසට් පත්‍රය මගින් පළ කළ 1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ගබඩා කිරීමේ) නියෝගය පරිදි එක් අවස්තාවක දී කිලෝ ග්‍රෑම් 1000 ට වැඩි ඕනෑම ප්‍රමාණයක් තේ ගබඩා කිරීම සඳහා භාවිතා කළ හැකි එමෙන්ම තේ ගබඩා කිරීම සඳහා සුදුසු යැයි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සෑහිමකට පත්වෙන ගබඩාවලට, ඉහත සඳහන් නියෝග වල සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය හැකිය.

ශ්‍රී ලංකා තේ සමඟ කලවම් කළ විදේශීය සම්භවයක් සහිත තේ අඩංගු සිල්ලර බහාලුම් 1981 ශ්‍රී ලංකා තේ මණ්ඩල (ආනයන සහ අපනයන) නියෝග යටතේ අපනයනය කරනු ලබයි. එම බහාලුම් / ඇසුරුම් වල "A Blend of Ceylon and other origin Teas packed in Sri Lanka" (ශ්‍රී ලංකා වේ අසුරන ලද ලංකා සහ විදේශීය සම්භවයක් සහිත තේ මිශ්‍රනයකි.) යනුවෙන් හෝ "Other Origin Teas packed in Sri Lanka"( ශ්‍රී ලංකා වේ අසුරන ලද විදේශීය සම්භවයක් සහිත තේ) යන පාඨ පමණක් යෙදිය යුතුයි. සියලුම බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතුයි. සියලුම ලියාපදිංචි තේ අපනයනකරුවන් අපනයනය සඳහා අවසරය ලබාගැනීම පිණිස අවශ්‍ය වෙනත් ලේඛන සමඟ රේගු නිර්යාත ප්‍රකාශන (CUSDEC) තේ අපනයන අංශය වෙත ඉදිරිපත් කළ යුත්තේ ASYCUDA ක්‍රමය ඔස්සේය. අපනයනයට සූදානම් කළ තේ තොග අපනයනය හා අදාළ ප්‍රමිතීන්වලට යෝග්‍ය වේ දැයි සැක හැර දැනගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් පිරිසක් එම තේ පරීක්ෂාවට බඳුන් කරයි.

### 3.2.2. තේ ආනයනය කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කිලෝ ග්‍රෑම් 8,096,078.07 ක ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා ආනයන බලපත්‍ර 669 ක් නිකුත් කර ඇත. නමුත් විමසුමට බඳුන්වන කාලපරාසය තුළදී තේ කිලෝග්‍රෑම් 7,679,588.00 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත.

වගුව 3.10:

| රට | වර්ගය | ආනයනික ප්‍රමාණය (කි.ග්‍රෑ.) | මි.ර.නැ.(CIF) අගය (රු.) | අගය රුපියල් |
|---|---|---|---|---|
| | | | | |
| චීනය | හරිත තේ | 1,794,798.50 | 353.09 | 633,728,198.75 |
| | විශේෂ තේ | 690,102.50 | 519.85 | 358,751,184.93 |
| | සුදු තේ | 10,684.00 | 482.05 | 5,150,262.12 |
| | සිටීසී | 36,448.00 | 352.93 | 12,863,650.00 |
| | කැෆේන් ඉවත් කළ තේ | 1,500.00 | 1,813.59 | 2,720,385.00 |
| | උප එකතුව | **2,533,533.00** | **399.92** | **1,013,213,680.80** |
| | | | | |
| ඉන්දියාව | සිටීසී | 3,078,566.00 | 287.71 | 885,733,235.50 |
| | විශේෂ කළු තේ | 856,781.00 | 499.07 | 427,594,517.40 |
| | හරිත තේ | 25,940.00 | 424.48 | 11,010,902.00 |
| | කැෆේන් ඉවත් කළ තේ | 12,410.00 | 860.83 | 10,682,916.00 |
| | සුදු තේ | 750.00 | 430.61 | 322,958.00 |
| | උප එකතුව | **3,974,447.00** | **335.98** | **1,335,344,528.90** |
| | | | | |
| ජපානය | හරිත තේ | 9,866.00 | 2,294.78 | 22,640,321.00 |
| | විශේෂ තේ | 460.00 | 4,423.03 | 2,034,592.00 |
| | උප එකතුව | **10,326.00** | **2,389.59** | **24,674,913.00** |
| | | | | |
| | | | | |
| කෙන්යාව | සිටීසී | 914,950.70 | 417.54 | 382,025,542.10 |
| | කැෆේන් ඉවත් කළ තේ | 3,000.00 | 1,296.02 | 3,888,060.00 |
| | උප එකතුව | **917,950.70** | **420.41** | **385,913,602.10** |
| | | | | |
| ජර්මනිය | හරිත තේ | 7,499.00 | 742.68 | 5,569,347.20 |
| | විශේෂ තේ | 925.00 | 2,643.82 | 2,445,536.60 |
| | කැෆේන් ඉවත් කළ තේ | 993.00 | 816.20 | 810,487.00 |
| | උප එකතුව | **9,417.00** | **937.17** | **8,825,370.80** |
| | | | | |
| | විශේෂ තේ | 314.00 | 5,389.35 | 1,692,257.15 |
| | උප එකතුව | **314.00** | **5,389.35** | **1,692,257.15** |
| | | | | |
| මියන්මාරය | හරිත තේ | 4,880.00 | - | - |
| | සිටීසී | 650.00 | 565.36 | 367,484.00 |
| | උප එකතුව | **5,530.00** | **66.45** | **367,484.00** |
| | | | | |
| ඇ.එ.ජ. | විශේෂ තේ | 24,025.00 | 4,864.15 | 116,861,285.20 |
| | උප එකතුව | **24,025.00** | **4,864.15** | **116,861,285.20** |
| | | | | |
| ඉන්දුනීසියාව | සිටීසී | 54,353.00 | 334.74 | 18,194,181.00 |
| | උප එකතුව | **54,353.00** | **334.74** | **18,194,181.00** |
| | | | | |
| වියට්නාමය | හරිත තේ | 106,200.00 | 315.65 | 33,521,851.00 |
| | සිටීසී | 25,300.00 | 312.62 | 7,909,286.00 |
| | උප එකතුව | **131,500.00** | **315.07** | **41,431,137.00** |
| | | | | |
| ටැන්සානියාව | සිටීසී | 938.28 | 5,586.00 | 5,241,232.08 |
| | උප එකතුව | **938.28** | **5,586.00** | **5,241,232.08** |
| | | | | |
| රුවන්ඩාව | සිටීසී | 3,977.00 | - | - |
| | උප එකතුව | **3,977.00** | - | - |
| | | | | |
| එක්සත් රාජධානිය | කැෆේන් ඉවත් කළ තේ | 8,280.00 | 845.92 | 7,004,256.00 |
| | විශේෂ තේ | 4,997.00 | 973.79 | 4,866,029.00 |
| | උප එකතුව | **13,277.00** | **894.05** | **11,870,285.00** |
| | | | | |
| | මුළු එකතුව | **7,679,587.98** | **385.91** | **2,963,629,957.03** |

### 3.2.3. නිම් තේ සඳහා ISO 3720 අවම ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාම

නිම් තේ, අනුමත වර්ග යටතේ පවති ද යන වගත්, ISO ප්‍රමිතියට අනුකූල වන්නේ ද යන වගත්, මෙන්ම කිසියම් හෝ අපවිත්‍ර විමකින් තොර වූ තේ ද යන වගත්, නිර්ණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සියලුම තේ නියැදි සහ තේ කර්මාන්තශාලා මගින් ගෙන එන, ආනයනය කර මෙරටට ගොඩබාන ලද, අපනයනය සඳහා සූදානම් කළ තේවල නියැදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත් කරන ලද තේ රස බලන්නන්ගේ විශේෂඥ මණ්ඩලය විසින් පරීක්ෂාවට ලක් කරයි. මෙමගින් අවසරය ලබන්නේ අපනයනය සඳහා සුදුසු නිම් තේ පමණයි.

වගුව 3.11 එක් එක් නියැදි පරීක්ෂණ මට්ටම්වලදී අනාවරණය වූ තත්ත්ව ඌනතා සංඛ්‍යාව - 2017

| නියැදි කරන ආකාරය | නියැදි සංඛ්‍යාව | ISO මට්ටමට වඩා පහළ බව සහ අපවිත්‍ර බව අනාවරණය වූ ගණන |
|---|---|---|
| අපනයන අංශය මගින් ගන්නා ලද පූර්ව වෙන්දේසි නියැදි | 6664 | } 1969 |
| පූර්ව වෙන්දේසි ඉවත් කර ගැනීම් (By the panel) | 1969 | |
| වෙන්දේසියට පසු | 6649 | 23 |

### 3.2.4. පරිභෝජනය සඳහා සුදුසු නොවන තේ විනාශ කිරීම

වෙන්දේසියට පෙර, නැව්ගත කිරීමට පෙර සහ විශේෂ විමර්ශන වලදී මිනිස් පරිභෝජනයට සුදුසු නොවන බවට හඳුනා ගන්නා නිම් තේ, අපනයන අංශයේ අධීක්ෂණය යටතේ විනාශ කරනු ලබයි. 2017 වසර තුළ දී මෙම අංශය මගින් ඉහත සඳහන් අවස්ථාවන්හි දී හඳුනාගත් මිනිස් පරිභෝජනයට නුසුදුසු වන නිම් තේ කිලෝ ග්‍රෑම් 90, 327.00 ක් විනාශකර ඇත.

### 3.2.5. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම අනුව ශ්‍රී ලංකාව තේ සඳහා වන තීරුබදු අනුපාත සලාකය (TRQ) ප්‍රයෝජනයට ගනී. කෙසේ නමුත් 2017 වසරේ දී සැලකිය යුතු ප්‍රමාණයකින් මෙම තීරුබදු අනුපාත සලාකය (TRQ) ප්‍රයෝජනයට ගෙන ඇති බවක් දක්නට නොලැබේ.

වගුව 3.12: නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු අනුපාත සලාකය භාවිතය (2017)

| නිදහස් වෙළඳ ගිවිසුම | වාර්ෂික සලාකය (කි.ග්‍රෑ.) | මුළු අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|---|
| ඉන්දු - ලංකා | 15,000,000.00 | 128,440.28 |
| පකිස්තාන් - ලංකා | 10,000,000.00 | 15,853.04 |

### 3.2.6. තේ ආපසු ගෙන්වා ගැනීම

පිටත් කර හැරි තේ තොගයක් විදේශීය ගැනුම්කරු විසින් බාර නොගන්නේ නම් දේශීය අපනයනකරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ඇතිව එම තේ තොගය ආපසු ගෙන්වා ගත යුතු වේ. මෙම තේ තොගය අපනයනය කිරීම හෝ නැවත භාවිතය සඳහා අවසර ලබා දෙන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නැවත පරීක්ෂාවට බඳුන් කිරීමෙන් පසුවයි.

## 3.3. තේ ප්‍රචාරණ අංශය

### 3.3.1. අංශය විසින් නිරතවන මූලික කාර්යයන්

පහත සඳහන් කාර්යයන් ඔස්සේ දේශීයව සහ විදේශීය තේ වෙළඳපොළවල් වල ලංකා තේ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රචාරණ අංශයේ වගකීම වේ.

1. ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රචාරණය
2. තේ වර්ගීය ප්‍රවර්ධනය
3. ජාත්‍යන්තර ආහාර සහ පාන වර්ග වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.
4. සියලුම ප්‍රධාන තේ පරිභෝජන රටවල් පිළිබඳව උපායමාර්ගික වෙළඳපොළ පැතිකඩ සම්පාදනය සහ බෙදාහැරීම.
5. තේ ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහයෝගය දැක්වීම
6. තරඟකරුවන්ගේ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීම
7. සිංහ ලාංඡනය ලියාපදිංචිය සහ අධීක්ෂණය
8. භූගෝලීයමය සලකුණු ලෙස ලංකා තේ නාමය සහ සෙසු ප්‍රාදේශීය තේ නාමයන් / ලාංඡන ආරාක්ෂා කිරීම
9. ඕසෝන් හිතකර පිරිසිදු ලංකා තේ ලාංඡනය ලියාපදිංචිය සහ පෞද්ගලික අංශයේ ඇසුරුම්කරුවන් හට බලය පැවරීම
10. දේශීයව තේ ප්‍රචාරණය කිරීම

### 3.3.2. විදේශ තේ ප්‍රචාරණ කාර්යාල සහ වෙළඳපොල ආවරණය

එක්සත් අරාබි එමීර් රාජ්‍යය, රුසියාව සහ චීනයේ තේ ප්‍රචාරන ඒකක එම රටවල් වල තානාපති සේවාවන් හා අනුබද්ධව පිහිටුවා ඇත. ඒ අනුව එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි පිහිටි කාර්යාලය මගින් මැද පෙරදිග / ගල්ෆ් / උතුරු අප්‍රිකා යන කලාපයන් ආවරණය කරන අතර මොස්කව් වල තිබෙන කාර්යාලය මගින් රුසියානු සමූහාණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යය (CIS) කලාපයේ ජනරජයන් වල තේ ප්‍රචාරණ කටයුතු මෙහෙයවනු ලබයි. නැගී එන වෙළඳපොළක් වන චීනයේ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය සඳහාත්, එමෙන්ම ශ්‍රී ලංකාවට හිමි වෙළඳපොළ කොටස තවදුරටත් වර්ධනය කරගැනීම සඳහාත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නියෝජිත කාර්යාලයක් බීජිං හි ස්ථාපිත කර ඇත. ඊට අමතරව සෙසු විදේශීය වෙළඳපොළවල් වල ප්‍රචාරන කටයුතු කොළඹ පිහිටි තේ ප්‍රචාරන අංශය මගින් ඒ ඒ රටවල්වල විදේශීය තානාපති සේවාවන් වල සහයෝගය ඇතිව කරගෙන යනු ලබයි.

### 3.3.3. වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ජාත්‍යන්තර වෙළඳ සල්පිල්වලට සහභාගී වන ශ්‍රී ලංකා තේ අපනයන සමාගම්වලට පහසුකම් සපයමින් තෝරාගත් වෙළඳපොළවල් තුළ සන්නාමයක් ලෙස 'Ceylon Tea' නාමය සහ සහභාගී වන සමාගම්වල වෙළඳ සන්නාමයන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරයි. ඒ අනුව වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වන සියලුම වෙළඳ සන්නාමයන් සඳහා 50% සහනාධාරයක් සපයනු ලැබේ. ඒ අනුව 2017 වර්ෂයේදී, මෙම ව්‍යාපෘති මගින් තේ අපනයනකරුවන් 154 දෙනෙකුට ප්‍රතිලාභ අත් වූ අතර වෙළඳ ප්‍රදර්ශන 34 සඳහා සහභාගී වන ලදී.

**2017 වසරේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත සඳහන් වෙළඳ සල්පිල් වලට සහභාගි විය.**

| | | |
|---|---|---|
| Prodexpo, Moscow | රුසියාව | පෙබ. 6 - 10 |
| Gulfood, Dubai | එ අ එ | පෙබ. 26 - මාර්තු 2 |
| Foodex, Tokyo | ජපානය | මාර්තු 7 - 10 |
| IFE London | එ.රාජධානිය | මාර්තු 19 - 22 |
| World Food Uzbekitan, Tashkent | උස්බෙකිස්ථානය | මාර්තු 29 - 31 |
| Cairo International Trade fair | ඊජිප්තුව | මාර්තු 13 - 27 |
| SIAL Canada, Toronto | කැනඩාව | මැයි 2 - 4 |
| World Food Warsaw | පෝලන්තය | අප්‍රේ. 11 - 13 |
| APAS 2017, São Paulo, Brazil | බ්‍රසීලය | මැයි 2 - 5 |
| SIAL China, Shanghai | චීනය | මැයි 18 - 20 |
| World Tea Expo, Las Vegas | ඇ එ ජ | ජුනි 13 - 15 |
| HOFEX | හොංකොං | මැයි 8 - 11 |
| Food West Africa, Lagos | නයිජීරියා | මැයි 17 - 19 |
| World Food Azerbaijan, Baku | අසර්බයිජාන් | මැයි 25 - 27 |
| Seoul Food, Seoul | කොරියාව | මැයි 16 - 19 |
| Saitex, Johannesburg | දකුණු අප්‍රිකාව | ජුනි 19 - 21 |
| Food Taipei, Taipei | තායිවානය | ජුනි 21 - 24 |
| Summer Fancy Food, New York | ඇ එ ජ | ජුනි 22 - 25 |
| Malaysia International Food & Beverage Trade Fair | මැලේසියාව | අගෝස්තු 9 - 11 |
| Int. Tea Fair, Hong Kong | හොංකොං | අගෝස්තු 17 - 19 |
| World Food, Istanbul | තුර්කිය | සැප්තැ. 7 - 10 |
| Fine Food, Sydney | ඕස්ට්‍රේලියා | සැප්තැ. 11 - 14 |
| World Food, Moscow | රුසියාව | සැප්තැ. 11 - 14 |
| Anuga, Cologne | ජර්මනිය | ඔක්තෝ. 7 - 11 |
| Saudi HORECA, Riyadh | ස. අරාබිය | නොවැ. 27 - 29 |
| Xiaman Tea Fair, Xiaman | චීනය | ඔක්තෝ. 12 - 16 |
| World Food, Kiev | යුක්රේනය | ඔක්තෝ. 25 - 27 |
| FHC Shanghai, Shanghai | චීනය | නොවැ. 14 - 16 |
| World Food, Almathy | කසකස්ථානය | නොවැ. 1 - 2 |
| World of Tea, Teheran | ඉරානය | ඔක්තෝ. 23 - 25 |
| World Tea & Coffee Expo, Mumbai | ඉන්දියාව | නොවැ. 16-18 |
| Foodex Saudi,Jeddah | ස. අරාබිය | නොවැ. 20 - 23 |
| Agrofood & Plastprintpack | ඝානාව | දෙසැ. 5-7 |
| Organic & Natural Expo 2017 | ඩුබායි | දෙසැ. 11 - 13 |

ඡායාරූප 3.16 & 3.17: Prodexpo, මොස්කව් - රුසියාව (6 - 10 පෙබරවාරි)





ඡායාරූපය 3.18 & 3.19: Foodex - ටෝකියෝ - ජපානය (මාර්තු 7 - 10)






ඡායාරූපය 3.20 & 3.21: IFE London - එක්සත් රාජධානිය (19 - 22 මාර්තු)






### එක්සත් රාජධානියේ දී ලංකා තේ 150 සංවත්සරය සැමරුම

එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාගේ නිර්දේශය මත පදනම්ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලංකා තේ 150 සංවත්සරය සැමරීම සඳහා එක්සත් රාජධානිය තුළ ලංකා තේ ප්‍රචාරණ වැඩසටහන් තුනක් සංවිධානය කර තිබුණි. ඒ අතුරින් ප්‍රචාරණ වැඩසටහන් දෙකක් එඩින්බර්ග් වලදී පැවැත්වූ අතර අනෙක් වැඩසටහන ඩන්ස්ටබල් වලදී පවත්වනු ලැබීය.

ලංකා තේ 150 සංවත්සරය සැමරීමේ වැඩසටහන් එඩින්බර්ග් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාරික පාසැල් සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වුණි.

- ලංකා තේ ගෝලීයකරණ සැසිය සහ තේ ආදර්ශනයක් වොල්ඩෝෆ් ඇස්ටෝරියා - එඩින්බර්ග් හිදී පැවැත්වීය.
- ඩන්ස්ටබල් ලංකා තේ ප්‍රචාරන වැඩසටහන

ඡායාරූපය 3.22



ඡායාරූපය 3.23



ඡායාරූපය 3.24 & 3.25: SIAL කැනඩා, ටොරොන්ටෝ – කැනඩා (මැයි 2-4 )






ඡායාරූපය 3.26 & 3.27: World Food Warsaw - පෝලන්තය (අප්‍රේ. 11 - 13 )






**ජායාරූපය 3.28 & 3.29: APAS 2017, São Paulo - බ්‍රසීලය (2-5 මැයි)**





**ජායාරූපය 3.30 & 3.31: World Tea Expo, ලාස් වෙගාස් - ඇ.එ.ජ. (13-15 ජුනි)**






**ජායාරූපය 3.32 & 3.33: HOFEX - හොංකොං (8 - 11 මැයි)**





ඡායාරූපය 3.34 & 3.35: Food West Africa, ලාගෝස් - නයිජීරියාව (17 - 19 මැයි)





ඡායාරූපය 3.36 & 3.37: World Food Azerbaijan, බකු - අසර්බයිජාන් (25-27 මැයි)







ඡායාරූපය 3.38: Seoul Food, Seoul - කොරියාව (16-19 මැයි)



ඡායාරූපය 3.39 & 3.40: SAITEX, ජොහැන්ස්බර්ග් - දකුණු අප්‍රිකාව (19 - 21 ජූනි)





ඡායාරූපය 3.41 & 3.42: Summer Fancy Food, නිව්යෝර්ක් - ඇ.එ.ජ. (22 - 25 ජූනි)






ඡායාරූපය 3.43 & 3.44: Malaysia International Food & Beverage Trade Fair - මලයාසියාව (9 - 11 අගෝස්තු)







ඡායාරූපය 3.45: World Food, ස්තාන්බුල් - තුර්කිය (7 - 10 සැප්තැම්බර්)



## ඕස්ට්‍රේලියාවේ ලංකා තේ 150 සංවත්සරය සැමරුම

කැන්බරාහි පිහිටි ඕස්ට්‍රේලියාවේ මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග එක්ව ලංකා තේ 150 සංවත්සරය සැමරීම සඳහා කැන්බරාහි පාර්ලිමේන්තු මන්දිරයේ දී වැඩසටහනක් සංවිධානය කළා. එහිදී පාර්ලිමේන්තු මන්දිරයේ සාමාජිකයන්, සෙනෙට් සභිකයන්, ඔස්ට්‍රේලියානු නිළධාරීන්, තේ කර්මාන්තයේ විශේෂඥයින්, හෝටල්කරුවන් සහ වෙනත් ආරාධිතයන් ට ශ්‍රී ලාංකික ස්වභාවික රසකාරක සහ රසකැවිලි මෙන්ම ශ්‍රී ලාංකාවෙ ජනප්‍රිය රස වර්ග වන ඉඟුරු, දෙහි, කුරුඳු සහ මී පැණි ආදිය සමග ශ්‍රී ලංකාවේ තේ වැවෙන කලාප හතේ තේ වර්ග රසවිඳීමට අවස්ථාව උදාවිය. මෙම වැඩසටහනේදි කලාප හතේ තේ වර්ග ප්‍රදර්ශනයට තැබීය.

ඡායාරූපය **3.46 & 3.47:** **Fine Food,** සිඩ්නි - ඕස්ට්‍රේලියාව **(11 - 14** සැප්තැම්බර්**)**







ඡායාරූපය **3.48 & 3.49:** **World Food,** මොස්කව් - රුසියාව **(11 - 14** සැප්තැම්බර්**)**






### ලංකා තේ පුණ්‍ය වෙන්දේසිය - එන්ශි (Enshi) (චීනය)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය කොළඹ තේ වෙළෙන්ඳන්ගේ සංගමය සහ බීජින් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව චීනයේ ආහාර වර්ග දේශීය නිශ්පාදන සහ සතුන් ආශ්‍රිත නිශ්පාදන පිළිබඳ වෙළඳ මණ්ඩලය (CCCFNA) සමඟ අත්වැල් බැඳගනිමින් ලංකා තේ පුණ්‍ය වෙන්දේසිය 6 වැනි වරටත් චීනයේ හුබෙයි (Hubei) පළාතේ එන්ශි නගරයේ 2017 සැප්තැම්පර් 26 වැනි දින පැවැත්වීය. මෙම පුණ්‍ය වෙන්දේසිය සංවිධානය කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ, අලෙවියෙන් උපයාගන්නා සියළුම මුදල් තේ වගාකරන ප්‍රදේශවල ක්‍රියාත්මක වන තෝරාගත් සමාජ සේවා කටයුතුවලට යෙදවීමයි. විශේෂයෙන්ම වතුකම්කරුවන්ගේ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා යොදාගනී.

ඡායාරූපය **3.50** ඡායාරූපය **3.51** ඡායාරූපය **3.52**







ඡායාරූපය **3.53 & 3.54: Anuga, Cologne -** ජර්මනිය (7-11 ඔක්තෝම්බර්)






ඡායාරූපය **3.56: Saudi HORECA,** රියාද් - සෞදි අරාබිය (27 - 29 නොවැම්බර්)



ඡායාරූපය 3.57 & 3.58: Xiaman Tea Fair, ෂියාමන් - චීනය (12 -16 ඔක්තෝම්බර්)





ඡායාරූපය 3.59 & 3.60: World Food Ukraine (25 -27 ඔක්තෝම්බර්)






ඡායාරූපය 3.61 & 3.62: World of Tea, ටෙහෙරාන් - ඉරානය (23 - 25 ඔක්තෝම්බර්)




ඡායාරූපය 3.63 & 3.64: FHC China 2017 - ෂැංහයි (14 - 16 නොවැම්බර්)





**ඡායාරූපය 3.65 & 3.66: World Food, Almathy - කසකස්තානය (1 - 2 නොවැම්බර්)**






**ඡායාරූපය 3.67 & 3.68: World Tea & Coffee Expo, මුම්බායි - ඉන්දියාව (16 - 18 නොවැම්බර්)**





**ඡායාරූපය 3.69: Foodex Saudi, ජෙදා - සෞදි අරාබිය (20 - 23 නොවැම්බර්)**




**ඡායාරූපය 3.70: Agrofood & Plastprintpack - ඝානාව (5 - 7 දෙසැම්බර්)**



### 3.3.4. ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන

### මාධ්‍ය මිල දී ගැනීම

ගෝලීය වශයෙන් ලංකා තේ මාධ්‍ය ප්‍රචාරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන ආයතනයක් තෝරාගැනීම පිණිස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ටෙන්ඩර් සැකසීමක් සිදුකරන ලදි. ඒ අනුව සුදුසු උපදේශන සමාගමක් තෝරාගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන උපදේශන කමිටුවක් පත් කරනු ලැබීය. මෙම අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන උපදේශන කමිටුව මගින් වසර තුනක කාලයක් සඳහා රටවල් 12 ක ලංකා තේ ප්‍රචාරණ සඳහා මාධ්‍ය සැලසුම්කරණය, උපලේඛනය කිරීම සහ මිලදී ගැනීම පිණිස උපදේශන සේවාවන් තෝරාගැනීමට 2017 මැයි මස 21 වැනි දින අදාළ ටෙන්ඩර කැඳවීම සිදුකරන ලදි. සමාගම් පහක් එයට ප්‍රතිචාර දක්වා තිබූ අතර ටෙන්ඩර් කැඳවීම කළ දැන්වීමේ සඳහන් මූලික නිර්නායක මත පදනම්ව ලංසු ඉදිරිපත් කරන්නට සුදුසුකම් ලබා ඇත්තේ සමාගම් තුනකි. ඒ අනුව 2017.07.21 දින සිට 2017.08.14 දින දක්වා යෝජනා සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන ලදි. ලංසු ඇගයීමට අනුව ලංකා තේ ගෝලීය ප්‍රචාරණය සඳහා මාධ්‍ය සැලසුම් කරණය, උපලේඛනය කිරීම සහ මිලදී ගැනීම පිණිස උපදේශන සේවාවන් සඳහා ඩෙන්ට්සු ග්‍රාන්ට් පුද්ගලික සමාගම (Dentsu Grant (Pvt Ltd) තේරීපත් විය.

### නිර්මාණාත්මක කාර්ය භාරය

හඳුනාගත් කලාප හතක් (07) තුළ සන්නාම ප්‍රවර්ධනය සඳහා විශාල පාරිභෝගික පිරිසක් ආවරණය කෙරෙන මහාපරිමානයේ ජනසංනිවේදන ක්‍රම භාවිතයෙන් සිදුකෙරෙන වෙළඳ දැන්වීම් (ATL) සහ කුඩා පාරිභෝගික කණ්ඩායම් හෝ ඒක පුද්ගල පාරිභෝගිකයන් ඉලක්ක කරගත් වෙළඳ දැන්වීම් (BTL) මෙන්ම සමාජ මාධ්‍ය භාවිතය සඳහා නිර්මාණ කරණය සඳහා ෆීනික්ස් ඕ ඇන්ඩ් එම් පුද්ගලික සමාගමට පැවරුනි. ෆීනික්ස් සමාගම විසින් 2017 වර්ෂය තුළදී වෙබ් අඩවි, මුද්‍රිත මාධ්‍ය දැන්වීම් හා ඒක පුද්ගල මාධ්‍ය ප්‍රචාරණ දැන්වීම් පත්‍රිකා නිර්මාණය කර ඇත. එමෙන්ම මාධ්‍ය මිලදී ගැනීමේ කටයුතු ප්‍රමාද වීම හේතු කොට ගෙන ෆීනික්ස් සමාගම සමඟ වූ ගිවිසුම අමාත්‍ය මණ්ඩලය මගින් 2016 නොවැම්බර් 6 වැනි දින සිට 2018 නොවැම්බර් 05 දින දක්වා දීර්ඝ කර ඇත. මාධ්‍ය මිලදී ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදවීම එයට හේතු විය.

### මහජන සම්බන්ධතා (PR) - ප්‍රවර්ධන වැඩසටහන

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව, තේ මණ්ඩලය විසින් මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම්වල යෙදුනි.

ටී හවුස් ටයිම් ප්‍රකාශකයින්ගේ සංචාරය සහ විශේෂාංග ලිපි පළකිරීම මගින් ලංකා තේ පිළිබඳ විශේෂ ප්‍රචාරණය ඇමරිකා එක්සත් ජනපදය තුළ සිදු කිරීම.

ලංකා තේ පිළිබඳ ගෝලීය ප්‍රචාරණයේ එක් අංගයක් වශයෙන් ඇ. එ. ජනපදයේ ටී හවුස් ටයිම් සඟරාවේ මාධ්‍යවේදීන් දෙදෙනෙකුට තේ කර්මාන්තයේ පාර්ශ්වකරුවන් මුණගැසීම, තේ වගාකරන ප්‍රදේශවල සංචාරය කිරීම, තේ නිෂ්පාදන ක්‍රියාවලිය දැකබලාගැනීම සහ ලංකා තේ පිළිබඳ වෙනත් සියළුම අංගයන් පිළිබඳව දැනුවත් වීම සඳහා ජනවාරි මස ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කර ඇත. ශ්‍රී ලංකාවේ දී ලබාගත් අත්දැකීම් අනුව ඔවුන් ලංකා තේ පිළිබඳ විශේෂාංග ලිපි කිහිපයක් සහ කතුවැකි පළකර ඇත. 2017 වසරේ දී ටී හවුස් ටයිම් සඟරාවේ සෑම කලාපයකම ලංකා තේ පිළිබඳ සම්පූර්ණ පිටුවක් පුරා වූ වෙළඳ දැන්වීම් පළකර ඇත.

එමෙන්ම ලංකා තේ ගැන ලියවුණු බ්ලොග් සහ ලිපි ගණනාවක් සමාජ මාධ්‍ය සහ වෙනත් මාධ්‍යයන් ඔස්සේ පළකිරීමද සිදු වී ඇත.

### රටවල් නමයක ජනමාධ්‍ය වේදීන්ගේ පැමිණීම මඟින් ලංකා තේ පිළිබඳ විශේෂ ප්‍රචාරණය

2017 වසරේ ජනමාධ්‍යවේදීන් ගෙන්වා ගැනීමේ වැඩසටහන යටතේ, අගෝස්තු මස පැවැත්වූ ලංකා තේ 150 සංවත්සරය සැමරුම අතරතුරදී රුසියාව, එ.අ.ජ., කැනඩාව, සවුදි අරාබිය, තුර්කිය, කුවේටය, ඉරානය, චීනය සහ එක්සත් රාජධානිය රටවල්වලින් ජනමාධ්‍ය වේදීන් 14 දෙනෙකු ලංකාවට පැමිණීම සිදුවිය. මෙම කණ්ඩායම තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් මුණගැසීම, තේ වගාකරන ප්‍රදේශවල සංචාරය කිරීම, තේ නිෂ්පාදන ක්‍රියාවලිය දැකබලා ගැනීම සහ ලංකා තේ පිළිබඳ වෙනත් සියලුම අංගයන් පිළිබඳව දැනුවත් වීම සඳහා සහභාගි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පුවත්පත් සහ සඟරා ලිපි මුද්‍රිත හා විද්‍යුත් ස්වභාවයෙන් මෙන්ම සමාජ මාධ්‍ය ඔස්සේ ද විශාල වශයෙන් පළවිය.

3.13 වගුව

| දිනය | නම | රට | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 2017 ජනවාරි 22 සිට 31 දක්වා | ජී.ගස්ටෙලු මහත්මිය<br>ලින්ඩා විලානෝ මහත්මිය | ඇ. එ. ජ. | • ලංකා තේ පිළිබඳ බ්ලොග් 20 ට වැඩි ප්‍රමාණයක් ප්‍රකාශයට පත්කිරීම.<br>• ලංකා තේ පිළිබඳ සම්පූර්ණ පිටුවක් පුරා වූ වෙළඳ දැන්වීම් සහ ලිපි 05 කට වඩා ප්‍රමාණයක් ටී හවුස් ටයිම් සඟරාවේ පළකිරීම.<br>• සමාජ මාධ්‍ය ජාල ගණනාවක් උත්පතනය(uploads) කිරීම ආදිය.(FB, Instagram, twitter, YouTube and etc)<br>• අනුපූරක පදනමින් යුතුව ඇ. එ. ජනපදය තුළ ලංකා තේ පිළිබඳ ප්‍රචාරන කටයුතු ගණනාවක් මෙහෙයවීම |





වගුව 3.14

| දිනය | නම | රට | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 2017 පෙබරවාරි 13-19 දක්වා | නීල් මැක්රිච් මහතා සහ සරා මහත්මිය | සිංගප්පූරුව | • සිංගප්පූරුවේ ටී ඇන්ඩ් කොෆී ට්‍රේඩ් ජර්නල් සඟරාවෙහි ලංකා තේ පිළිබඳ ලිපි පළකිරීම |
| 2017 අගෝස්තු 6 – 14 දක්වා | ටෝනි ගෙබලි මහතා | ඇ.එ.ජ. | • ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන ක්‍රමවේද, ශ්‍රී ලංකාවේ තේ සංස්කෘතිය, ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ අනාගතය පිළිබඳව ලිපියක් පළකිරීම. |
| | ජුලියා ස්මිර්නෝව මහත්මිය - විශේෂ | රුසියාව | • මාර්ග ගත පුවත්පතක් වන Komsomolskaya Pravda හි ශ්‍රී ලංකාව සහ ලංකා තේ පිළිබඳ පළමු ලිපිය පහත සඳහන් වෙබ් ලිපිනය ඔස්සේ පළවිය. https://kp.ru/daily/26743/3771847/ <br>• 2017 ඔක්තෝබර් මස 15 දින ශ්‍රී ලංකාව සහ ලංකා තේ පිළිබඳ විනාඩි 10 ක රේඩියෝ වැඩසටහනක් http://kp.ru/radio/26744.5/3772573/ ඔස්සේ විකාශනය විය. |
| | එලේනා වෙලිච්ක කෝමහන් මහත්මිය | රුසියාව | • ලිපි දෙකක්, " ජාතියක් ගොඩ නැගූ කර්මාන්තය ලංකා තේ වසර 150"(The Trade that made the Nation150 years of Ceylon Tea) පිටු හතරක ලිපිය කොෆී ඇන්ඩ් ටී සඟරාවෙහි 4 වැනි කලාපයේ රුසියන් බසින් පළවූ අතර කොෆී ඇන්ඩ් ටී ඉන්ටර්නැෂනල් මැගසිනයේ දෙවන කලාපයේ ඉංග්‍රීසි බසින් පළවිය. |
| | | | • විද්‍යුත් සංස්කරනයක් තිබෙන අතර මුද්‍රිත පිටපත් ලබාගෙන ඇත. |
| | ඉස්කන්දර් අක්චුරින් මහත්මා | රුසියාව | • පිටු දෙකක සඟරා ලිපියක් පළකළා. |
| | මාන් අල්ගඩියා මහතා | සවුදි අරාබිය | • පැමිණීමට පෙර - රියාද් හි ග්ලෝබල් වී පාර්ටි යෙහි 2017 .07 06 දින පිටු කාලක (1/4) ලිපියක්. <br>• පැමිණීමට පසු - 2017.10.03 දින සම්පූර්ණ පිටුවක ලිපියක්. |
| | හසීම් සෙජින් කිලික් මහතා | | • ශ්‍රී ලංකාවේ තේ සංස්කෘතිය පිළිබඳව සහ ශ්‍රී ලංකාව පිළිබඳව පොදු ප්‍රචාරණයක් ලිපියක් Hurriyet Gazetesi පුවත්පතෙහි පළවිය. |
| | ඉබ්‍රාහීම් ෆල්ෆහි මහතා | ඉරානය | • "Ceylon tea: A journey to the land of green magic" යනුවෙන් ලිපියක් 2017 අගෝස්තු මස 23 වැනි දින ටෙහෙරාන් ටයිම්ස් පළ කළා. |
| | ජුඇන්යුන් සුන් මහතා | චීනය | • 2017 අගෝස්තු 09 දින ලංකා තේ වසර 150 ක ඉතිහාසය සැමරීම පිළිබඳව " Sri Lanka celebrates its 150 years History of Ceylon Tea, with the Premier be Present" යනුවෙන් ලිපියක් පළකළා. <br>• 2017 වසරේ අගෝස්තු මස 08,10,11,12 සහ 13 යන දිනයන් හි ලිපි 05 ක් පළකර ඇත. |
| | ශියාවෝ ශේපෙයි මහතා | චීනය | • China Economy වෙබ් අඩවියෙහි, සැමරුම පිළිබඳ ලිපි 03 ක් සහ ඡායාරූප කට්ටල 3 ක් පළකර ඇත. |
| | ඩන් බෝල්ටන් මහතා | ඇ.එ.ජ. / කැනඩාව | • World Tea News හි 2017 වසරේ අගෝස්තු මස 15 වැනි දින "Sri Lanka celebrates the Future of Tea" සහ "A new Mandate for Sri Lanka's Tea Industry" වශයෙන් ලිපි පළකර ඇත. <br>• 2017 වසරේ අගෝස්තු මහ 29 වැනි දින "Sri Lanka is Primed to Supply Premium Iced Tea" යනුවෙන් ලිපියක් World Tea News හි පළකර ඇත. |
| | රියේවන් පේරාඩ් මහතා. | කුවේටය | • පිටු දෙකක "Sri Lanka celebrates One Big Tea Party" පිළිබඳව ලිපි දෙකක් පළකර ඇත. |

ඡායාරූපය 3.73



ඡායාරූපය 3.74



ඡායාරූපය 3.75




වගුව 3.15

| දිනය | නම | රට | ප්‍රතිලාභ |
|---|---|---|---|
| 2017 දෙසැම්බර් 17 - 24 දක්වා | NTV රූපවාහිනී සමූහය | රුසියාව | ලංකා තේ සහ ශ්‍රී ලංකාව පිළිබඳව විනාඩි 42 ක වාර්තා වැඩසටහනක් |

රුසියානු NTV කණ්ඩායම ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා ලංකා තේ ප්‍රචාරනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියා.

ඡායාරූපය 3.76



**ඕස්ට්‍රේලියාවේ නෝර්ත් සිඩ්නි හාබර් වීව් හෝටලයේ ව්‍යාපාරික ජාල ප්‍රාතරාශය හමුව, 2017 සැප්තැම්බර් 12**

සිඩ්නි කොන්සල් ජෙනරාල්වරයාගේ කාර්යාලය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග එක්ව ව්‍යාපාරික ජාල ප්‍රාතරාශය හමුවක් නෝර්ත් සිඩ්නි හාබර් වීව් හෝටලයේ දි පැවැත්වීය. මෙම හමුව සංවිධානය කිරීම මගින් බලාපොරොත්තු වූයේ ඕස්ට්‍රේලියාවේ මාධ්‍ය ආයතන, පුද්ගල සම්බන්ධතා සමාගම්, සංචාරක සහ ප්‍රකාශන සමාගම් වෙත ලංකා තේ ප්‍රචාරය කිරීමයි.

**ශ්‍රී ලංකා ෆුඩ් ඇන්ඩ් කල්චර් ෆෙස්ටිවල් 2017" - තම්බලන් පාර්ක්, ඩාර්ලින් හාබර්, 2017 නොවැම්බර් 25 සහ 26**

සිඩ්නි නගරයේ පිහිටි කොන්සල් ජෙනරාල්වරයාගේ කාර්යාලය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග එක්ව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් සිඩ්නි නගරයේ තම්බලන් පාර්ක් හිදි 2017 නොවැම්බර් 25 සහ 26 දෙදින පෙ.ව. 10.00 සිට ප.ව. 05.00 දක්වා පැවැත්වීය.

මෙය සංවිධානය කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ විවේක කාලය සහ නිවාඩු ගත කිරීම සඳහා ශ්‍රී ලංකාව වඩාත් සතුටුදායක ගමනාන්තයක් බව ඕස්ට්‍රේලියානු සංචාරක ප්‍රජාව අතර දැනුවත් බවක් ඇති කිරීමයි. මෙහිදී ඉලක්කගත කණ්ඩායම වූයේ ව්‍යාපාරික ප්‍රජාව, වෘත්තිකයන්, මාධ්‍ය, සංචාර මෙහෙයවන්නන් සහ පොදු පරිභෝජකයින් වේ. කොන්සල් ජෙනරාල්වරයාගේ කාර්යාලය මෙම ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහනේ දි සහභාගිවන්නන් සඳහා නොමිලයේ තේ පැන් සංග්‍රහ කිරීමටත් ලංකා තේ ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කරන ලදි.

ඡායාරූපය 3.77



**වෙළඳපොළ තොරතුරු සහ පර්යේෂණ**

රුසියාවේ තේ පරිභෝජනය සම්බන්ධව පවතින ප්‍රේරක සහ බාධක පිළිබඳව ගුණාත්මක මූලික පර්යේෂණක් සිදු කරන ලදි. (ලංකා තේ භාවිතය, පුරුදු, හැඟීම පිළිබඳව ගුණාත්මක වෙළඳපොළ පර්යේෂණ - මොස්කව් සහ එකටරින්බර්ග්) මෙම වෙළඳපොළ සමීක්ෂණය මගින් ලබාගත් තොරතුරු රුසියාවේ ලංකා තේ වෙළඳපොළ උපායමාර්ගික සංවර්ධනය සහ ලංකා තේ ගෝලීය ප්‍රචාරණය සඳහා භාවිතා කළ හැකි වේ.

## 3.3.5 ඒක ජාතිය ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය

ඒක ජාතිය ශ්‍රී ලංකා තේ (Ceylon Tea ) ප්‍රවර්ධනය යනු විදේශීය සම්භවයන් ඇති තේ සමඟ තරඟකාරීව ශ්‍රී ලංකා තේ (Ceylon Tea) ප්‍රවර්ධනය කිරීමයි. විදේශයන්හි පිහිටුවා තිබෙන ශ්‍රී ලංකා තේ ප්‍රචාරණ ඒකක සහ තානාපති සේවාවන්හි ක්‍රියාත්මක වානිජ අංශ මඟින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විදේශීය වෙළඳපොළවල් තුළ ලංකා තේ සඳහා ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන්, එළිමහන් ප්‍රචාරණයන්, තේ පැන් සංග්‍රහ, තේ සම්බන්ධ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මෙන්ම වෙනත් පොදු මහජන ක්‍රියාකාරකම් ආදිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරන ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් අතුරින් ප්‍රධාන වේ.

### 3.3.6 වර්ගීය තේ ප්‍රවර්ධනය

වෙනත් පාන වර්ග සමග තරඟකාරීව තේ ප්‍රවර්ධනය කිරීම මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් සිදු වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම, ඇ.එ.ජ. තේ සංගමය, ජාත්‍යන්තර තේ කමිටුව-එක්සත් රාජධානිය සහ ජපාන තේ සංගමය යනාදියෙහි සාමාජිකත්වය දරයි. මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය කාර්යයන් පවත්වාගෙන යාමේ වගකීම මෙම ආයතන විසින් ඉටුකරනු ලබයි. වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකර ඇත්තේ තේ සහ සෞඛ්‍ය යන සංකල්පය කෙරෙහිය. පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන් සහ ප්‍රජා ක්‍රියාකාරකම් ඔස්සේ මෙම සංකල්පය ව්‍යාප්ත කරනු ලබයි. තෝරාගත් රටවල් වල ඉහතින් සඳහන් කළ ආකාරයේ වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතු සඳහා තේ සංගම් ආදියෙහි ප්‍රචාරණ වියදම් වලට 2017 වසරේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ද දායක වී ඇත.

**තේ සංගම් සහ තේ සංවිධාන සමග කළ වැඩසටහන්**

**වාර්ෂික ඒකපුද්ගල තේ සුදුව ( 2017 නොවැම්බර් 15 සිට 2018 ජනවාරි 31)**

ඇ. එ. ජනපදයේ තේ සංගමයේ සභාපතිවරයාගේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අනුපූරක පදනමෙන් යුතුව ලංකා තේ ප්‍රචාරක ද්‍රව්‍ය මාධ්‍ය සමාජ සත්කාර සහ පෞද්ගලික වෙබ් අඩවිකරුවන් වෙත යවනු ලැබිය.

**ලංකා තේ තානාපතිවරු සමග කළ වැඩසටහන්**

2017 වසරේදී ඇ.එ.ජ. සහ කැනඩාවේ ලංකා තේ සඳහා තානාපති ලෙස කටයුතු කළ ඩේවිඩ් ද කැන්ඩියා මහතා විසින් ඇමරිකාවේදී මෙහෙයවූ ලංකා තේ සංසඳ සහ රස බැලීමේ වැඩසටහන් ගණනාවක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කරගෙන යනු ලැබිය.

**3.78 ඡායාරූපය : ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම් (FAO / IGG on Tea) අන්තර් සැසිය, කොළඹ, 2017 අගෝස්තු 12 - 13.**



### 3.3.7 Ceylon Tea නාමය, භූගෝලීය දර්ශක යටතේ කලාපීය නාම සහ ලාංඡන ලියාපදිංචිය

'Ceylon Tea' නාමය සහ අනෙකුත් කෘෂි දේශගුණික කලාපීය තේ වර්ග හත (නුවරඑළිය, උඩපුස්සැල්ලාව, දිඹුල, ඌව, නුවර, සබරගමුව සහ රුහුණ) භූගෝලීය දර්ශකයන් ලෙස සුරැකීමට ලෝක වෙළඳ සංවිධානයේ TRIPS ගිවිසුමට අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් අවශ්‍ය නීති සහ රෙගුලාසි සම්පාදනය කර ඇත.

මෙමඟින් විශේෂයෙන්ම විදේශීය කොන්ත්‍රාත් ඇසුරුම්කරුවන් විසින් 'Ceylon Tea' නාමය සහ අනෙකුත් කලාපීය තේ නාම අවභාවිතා කිරීම වැළැක්වීමට සහාය වීම පමණක් නොව භූගෝලීය දර්ශකයන් යටතේ අලෙවි කෙරෙන ලංකා තේ සඳහා අගයක් සහ විශිෂ්ටත්වයක් එකතු කිරීම ද සිදුකෙරේ.

### 3.3.8 වෙළඳ සලකුණ ආරක්ෂා කිරීම

**සිංහ ලාංඡනය වෙළඳ සලකුණ ලියාපදිංචි කිරීම (712)**

'Ceylon Tea' සිංහ ලාංඡනය වෙළඳ සලකුණෙහි නෛතික හිමිකරුවා වනුයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල්වල 'Ceylon Tea' සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම / යාවත්කාලීන කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රචාරන අංශය මගින් කරගෙන යනු ලබයි. 2017 වසර වන විට මෙම ලාංඡනය රටවල් 98 ක ලියාපදිංචි කර ඇත. සිංහ ලාංඡනය භාවිතා කිරීමේ අධිකාරිය ප්‍රදානය කර ඇත්තේ 100% ක් ම ශ්‍රී ලංකා තේ අඩංගු, ISO 3720 ප්‍රමිතියට අනුකූල, එක් එක් වෙළඳපොළවල් වල අවම ප්‍රමිතියට වඩා ඉහළින් වූ අගය එකතු කළ තේ නිෂ්පාදන (තේ මළු සහ ඇසුරුම්) සන්නාමයන් සඳහා පමණි. එමෙන්ම ඒවා ශ්‍රී ලංකාවේ පෙර ඇසුරුම් කරන ලද තේ විය යුතුයි. විමසුමට බඳුන්වන වසර තුළදී ඕස්ට්‍රේලියාව, ෆුජි දිවයින තුළ සිංහ ලාංඡන ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කර ඇත.

### 3.3.9. සන්නම ප්‍රවර්ධනය 2015 / 2016

සිංහ ලාංඡනය සහිත සිලෝන් ටී සන්නම ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය සහාය ලබාගැනීමේ යෝජනා ක්‍රමය 2015 වසරේදී අනුමත වූ ජාතික අයවැය යෝජනා මත පදනම්ව ක්‍රියාත්මක විය. ඒ අනුව තෝරාගත් පෞද්ගලික සමාගම් කිහිපයක් සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය අතර 2015/2016 වසර සඳහා සන්නම ප්‍රවර්ධන සහනාධාර යෝජනා ක්‍රමය සඳහා ඇති කරගත් ගිවිසුමට අනුව වෙළඳ සන්නාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක විය. නමුත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදී හඳුනා ගන්නා ලද අවශ්‍යතාවයන් මත මෙම ව්‍යාපෘතිය 2017 ජුනි 30 වන තෙක්ම දීර්ඝ කරන ලදි. ඒ අනුව රුපියල් මිලියන 177.32 ක මුදලක් පෞද්ගලික ක්ෂේත්‍රයට ප්‍රතිපූර්ණය කර ඇති අතර එමඟින් වෙළඳපොළවල් 11 යටතේ සමාගම් 10 ක් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ හිමි කරගන්නා ලදි.

### 3.3.10 ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචි කිරීම

ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහතිකකරණ සලකුණක් ලෙස ලංකාව තුළ ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචි කර ඇත. මොන්ට්‍රියල් ගිවිසුමට (Montreal Protocol) අනුව නිරෝධායනීය නොවන හා පූර්ව නැව්ගත කිරීමේ අභිමතාර්ථයන් සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය ක්‍රම නතර කිරීම සඳහා ශ්‍රී ලංකාව ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව තේ වගාවන් සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතයෙන් තොරව පරිසර හිතකාමී තාක්ෂණයන් වලට අනුගත වෙමින් තේ ක්ෂේත්‍රයට සම්බන්ධව කළ ව්‍යාපෘතිය 2002 වසරේදී සාර්ථකව අවසන් කෙරුණි. මේ වෙනුවෙන් 2007 වසරේදී ශ්‍රී ලංකාව Montreal Protocol Implementers සම්මානය දිනාගන්නා ලදී. එමෙන්ම ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය කරන ලොව පළමු තේ නිෂ්පාදනය කරන රට බවට ශ්‍රී ලංකාව පත්විය. තවමත් මෙම ගෞරවය හිමි එකම තේ නිෂ්පාදිත රට වනුයේ ශ්‍රී ලංකාවයි. මෙම 2017 වසර තුළ දී අපනයනකරුවන් අට දෙනෙකු විසින් සන්නම් නාමයන් 11 ක් සඳහා ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය යෙදීම සඳහා අවැසි බලය හිමිකරගනු ලැබිය.

### 3.3.11 'Ceylon Tea' වසර 150 සැමරීම

කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය සමග එක්ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය මෙම සංවත්සරය සැමරීම සඳහා 2017 වසර පුරාම සැමරුම් උත්සව ගණනාවක් සංවිධානය කරනු ලැබිය.

මෙම සැමරුම්වල ආරම්භය ලෙස 2017 වසරේ ජනවාරි මස 19 වැනි දින ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දි ජේම්ස් ටේලර්ගේ උඩුකය ප්‍රතිමාවක් විවෘත කෙරුනි.

ජායාරූපය 3.79 ජායාරූපය 3.80 ජායාරූපය 3.81





- මෙම 150 සංවත්සරය අනුස්මරණය කිරීම සඳහා 2017 ජුලි 12 දින රුපියල් 10 ක වටිනාකම ඇති කාසියක් නිකුත් කර ඇත.

ලංකා තේ සඳහා වසර 150 සැමරීම සහ එමගින් ශ්‍රී ලංකාවේ කලක් තිස්සේ අපනයන අරමුණු කරගත් වැදගත් වෙළඳ ද්‍රව්‍යක් ලෙස ජාතික ආර්ථිකයට කර ඇති දායකත්වය සිහිගැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල් 10 ක අගය ඇති මුහුණතක් සහිත අනුස්මරණ කාසියක් නිකුත් කර ඇත.

ජායාරූපය 3.82 ජායාරූපය 3.83




ජායාරූපය 3.84



### 2017 ජුලි 13 දින පළමු දින කවරය සහ මුද්දර මාලාවක් නිකුත්කිරීම

ක්‍රියාත්මක වෙමින් පවතින ලංකා තේ 150 වසර සැතපුම් කණුව සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මුද්දර කාර්යාංශය කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහාය ඇතිව එකක් රුපියල් 35 බැගින් වන තැපැල් මුද්දර දෙකක් සහ පළමු දින කවරයක් නිකුත් කරනු ලැබිය.

ජායාරූපය 3.85 ජායාරූපය 3.86






ජායාරූපය 3.87



- දේශීය ප්‍රජාව වෙත කරන සමාජ සත්කාරයක් ලෙස ශ්‍රී ලංකාවේ තේ නිපදවන පළාත් හත ආවරණය කරමින් අධ්‍යාපනික ප්‍රදර්ශන මාලාවක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. එය ශ්‍රී ලංකාවට තේ කර්මාන්තයේ ඇති අදාළත්වය සහ වැදගත්කම පිළිබඳව අවබෝධයක් ලබාදීමේ සහ මෙම කර්මාන්තයෙහි පවතින රැකියා අවස්ථා සහ මෙම ඓතිහාසික සිදුවීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහා කළ උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් හඳුනාගත හැකිය. මේ යටතේ නුවරඑළිය, පිළිමතලාව, බදුල්ල, යටියන්තොට, නෙලුව, කොත්මලේ ප්‍රදේශවල අධ්‍යාපනික ප්‍රදර්ශන මාලාව පැවැත්වුණි.

**ජායාරූපය 3.88** **ජායාරූපය 3.89**





**ජායාරූපය 3.90**



- ශ්‍රී ලංකාවේ පැරණිම බිස්කට් නිෂ්පාදකයා වන මැලිබන් බිස්කට් නිෂ්පාදකයින් විසින් සැකසූ බිස්කට් සමඟ කදිම ලංකා තේ පිළිගන්වමින් ජුලි 06 වැනි දින ලොවපුරා එක් එක් කාල කලාපවලදී ප.ව. 5.00 ට ලංකාවේ රාජ්‍ය දූත කාර්යාල අද්විතීය ලංකා තේ සඳහා ගෝලීය තේ සාදයක් පැවැත්විය.

**ජායාරූපය 3.91** **ජායාරූපය 3.92**





**ජායාරූපය 3.93**



2017 ජුලි මස 20 දින සුභසාධක තේ වෙන්දේසියක් පැවැත්විය. මෙමඟින් උපයාගන්නා මුළු මුදල වැවිලි ක්ෂේත්‍රයේ කම්කරු ජනයාගේ ප්‍රයෝජනය වෙනුවෙන් සුභසාධන වැඩසටහන් සඳහා යොදවනු ලබයි.

**ජායාරූපය 3.94** **ජායාරූපය 3.95**






**ජායාරූපය 3.96**



2017 ජුලි 20 වැනි දින ලංකා තේ වසර 150 ක ඉතිහාසය පිළිබඳ අනුස්මරණ ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කෙරුණි.

**ජායාරූපය 3.97** **ජායාරූපය 3.98**






**ජායාරූපය 3.99**



- ජාත්‍යන්තර කොළඹ තේ සමුළුව 2017 වසරේ අගෝස්තු 9 දින සිට 11 දින දක්වා පැවැත්විය. මේ සඳහා ආසන්න වශයෙන් විදේශීය නියෝජිතයන් 300 දෙනෙක් පමණ සහභාගි වූ අතර සුවිශේෂී පිරිසක් දේශීය වශයෙන් සහභාගි විය. විදේශීය සහ දේශීය වශයෙන් ගෝලීය තේ කර්මාන්තයේ සහ ජාත්‍යන්තර ව්‍යාපාරික ලෝකයේ විද්වතුන් උණුසුම් සාකච්ඡාවන් සඳහා හඬ අවදි කරමින්, විවිධ වූ අදහස් හුවමාරුවකට මඟ පාදමින් අදාළ ශික්ෂණයන්හි සිය ප්‍රවීනතාවය සහ පළපුරුද්ද ඇතිව මෙම සමුළුව හමුවේ සිය ශාස්ත්‍රීය ඉදිරිපත් කිරීම් ගෙනහැරපෑවේය. ලොව තේ නිපදවන සහ පරිභෝජනය කරන දෙවර්ගයේම රටවල් වලින් පැමිණි බොහෝ පිරිසකගේ ආකර්ශනය දිනාගත් ජාත්‍යන්තර තලයේ වූ වෙනත් උත්සව ද කොළඹ තේ සමුළුවට සමගාමීව කොළඹ දී පැවැත්වුණි.

ඡායාරූපය 3.100




ඡායාරූපය 3.101



- 150 වන ලංකා තේ සැමරුමට සමගාමීව 2017 අගෝස්තු 12 සහ 13 දෙදින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම් (FAO / IGG on Tea) අන්තර් සැසිය පැවැත්විය.

- පොල්, රබර් සහ තේ කර්මාන්තයේ නිරත අපනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සේවා සපයන්නන් බලගැන්වීමේ අරමුණින් ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවාවන් ප්‍රදර්ශනය සඳහා පොල්, රබර් සහ තේ පිළිබඳ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2017 අගෝස්තු 11 - 13 දිනවලදී පැවැත්වුනි.

ඡායාරූපය 3.102



ඡායාරූපය 3.103



ඡායාරූපය 3.104



- තේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන සම්මන්ත්‍රණ සැසිය, තේ නවීකරණය නමින් වූ සම්මන්ත්‍රණයක් බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ මිහිලක මැදුර හිදී 2017 අගෝස්තු 11 දින පැවැත්විය. 275 කට අධික ශ්‍රාවක පිරිස තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් සහ විශ්ව විද්‍යාල සිසුන්ගේ සහභාගිත්වයක් මේ සඳහා විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති ආචාර්ය රොහාන් පෙතියාගොඩගේ මැදිහත්වීම ඇතිව ජාත්‍යන්තර දේශකයන් තිදෙනෙකුගෙන් සමන්විත ආරාධිත දේශකයන් අටදෙනෙකු මෙයට සහභාගි විය.

ඡායාරූපය 3.105



ඡායාරූපය 3.106



- ලංකා තේ සහ තේ සංස්කෘතියේ අනන්‍යතාවය සංචාරකයන් සහ ශ්‍රී ලාංකිකයන් අතර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 2017 අගොස්තු මස 12 වැනි දින විදි වැඩසටහන්, තේ වෙළඳකුටි, ආහාර වෙළඳකුටි සහ තේ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධ ප්‍රසංගයන් ඇතුළත් විනෝදාස්වාදයන් ද සමගින් තේ උත්සවය පැවැත්විය.

ඡායාරූපය 3.107



ඡායාරූපය 3.108



**ජාතික තේ සම්මාන උළෙල 2017**

2017 වසරේ සිදුවුණු දීර්ඝ සැමරුම් දාමයක අවසාන වැඩසටහන වූයේ ජාතික තේ සම්මාන උළෙලයි. ලංකා තේ වල 150 වසර අනුස්මරණය කිරීම සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මහතාගේ මූලිකත්වයෙන් නෙළුම් පොකුණ ජාතික රංග ශාලාවේ දී මෙම උළෙල පැවැත්වුණි.

ඡායාරූපය 3.109



ඡායාරූපය 3.110




මෙම උත්සවය මගින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය උත්සහ ගන්නා ලද්දේ තේ කර්මාන්තය ඔසවා තැබීම සඳහා කටයුතු කළ සියලුම පාර්ශවකරුවන්ගේ දායකත්වයන් සහ කැපකිරීම් ඇගයීමට ලක් කිරීමයි. හුදෙක් කාර්ය සාදනයන් පමණක් පදනම් කරගන්නා අතර විවිධ පාර්ශ්වකාර ආයතනවල උපදේශයන් ලබා ගනිමින් ජයග්‍රාහකයින් තෝරාගන්නා ක්‍රමවේදයක් ඔස්සේ මෙම ජාතික තේ සම්මාන උළෙල සැලසුම් කර තිබුණි.

**පහත සඳහන් අංශයන් ඔස්සේ සම්මාන ප්‍රධානය කෙරුණි.**

හොඳම තේ දළු වෙළන්දා, හොඳම තේ ඉඩම, හොඳම තේ කර්මාන්ත ශාලාව, හොඳම ඡායාරූප ශිල්පියා, තේ රජු සහ රැජිණ, හොඳම තේ අපනයනකරු, හොඳම තේ රස බලන්නා, හොඳම තේ නැටුම, හොඳම කුඩා තේ වතු හිමියන්ගේ සමිතිය සඳහා සම්මාන සහ යාවජීව සම්මාන හයක් තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා දායක වූ මිනිසුන් උදෙසා ලබාදීම මේ යටතේ සිදුවිය.

**ඡායාරූපය 3.111** **ඡායාරූපය 3.112**





**ඡායාරූපය 3.113**




### 3.3.12 ප්‍රචාරණ/ තොරතුරු ප්‍රකාශන

මෙම වසර තුළ දී පහත සඳහන් ප්‍රචාරණ/ තොරතුරු ප්‍රකාශන නිකුත් කෙරුණි.

අ. ද්විමාසික පුවත් හසුන
ආ. ත්‍රෛයිමාසික තේ අලෙවි සමාලෝචනය - 2017

### 3.3.13 දේශියව සිදු කෙරෙන තේ ප්‍රචාරණය

මෙම වසර තුළදී පහත සඳහන් වෙළඳ ප්‍රදර්ශන/ උත්සව අවස්ථා සඳහා සහභාගී වෙමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මාධ්‍ය වැඩසටහන්, එළිමහන් වෙළඳ දැන්වීම්, තේ පැන් සංග්‍රහ, ශ්‍රී ලංකා තේ මණ්ඩල ඇසුරුම් තේ පැකට් අලෙවිය සහ ප්‍රචාරණමය ද්‍රව්‍ය බෙදාහැරීම වැනි ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල නිරත විය.

**සංචරණයේ රන් පා සටහන 2017 - කැලණිය විශ්වවිද්‍යාලය**

2017 නොවැම්බර් මස 27 වැනි දින කැලණිය විශ්වවිද්‍යාලයේ පැවැත්වූ ඉහත සඳහන් සංචරණයේ රන් පා සටහන අධ්‍යාපනික ප්‍රදර්ශනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහභාගී වෙමින් ලංකා තේ ප්‍රවර්ධනය කිරීමේ හා එම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන්නන් හට ලංකා තේ පිළිබඳව දැනුම ලබා දීමට කටයුතු කළේ. මෙම ප්‍රදර්ශනය අවස්ථාවේදී එයට සහභාගිවන්නන් සඳහා තේ පැන් සංග්‍රහ පැවැත්වීම සහ තේ රස බැලීමේ සැසි කිහිපයක් පැවැත්වීම සිදු විය. එමෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන කණ්ඩායම විසින් නිවසේ දී රසවත් ගුණවත් තේ කෝප්පයක් සාදා ගැනීම සහ දේශිය වෙළඳපොළෙන් උසස් තත්වයේ තේ මිලදී ගන්නේ කෙසේද යන්න පිළිබඳ මෙන්ම තේ පරිභෝජනයෙන් ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභ පිළිබඳව සහභාගී වන්නන් සඳහා අවබෝධයක් ලබා දීමට කටයුතු කරන ලදි.

**ඡායාරූපය 3.114** **ඡායාරූපය 3.115**




**ක්‍රිස්මස් ෆෙස්ට් 2017**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමග එක්වෙමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය නත්තල සැමරීම සඳහා ආකේඩ් පරිශ්‍රයේ දී ප්‍රමුඛ පෙළේ සංචාරක වැඩසටහනක් 2017 වසරේ දෙසැම්බර් මස 20 - 22 දිනවල දී සංවිධානය කර තිබුණි.

මෙම ප්‍රදර්ශනය පැවැත්වෙන කාලපරිච්ඡේදය අතරතුර දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යමින් ලංකා තේ ප්‍රවර්ධනය කටයුතුවල නිරතවුණි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන කණ්ඩායම විසින් ලංකා තේ ප්‍රවර්ධනය කරමින් තේ සාම්පල් නොමිලයේ බෙදාහරිමින් නිවසේ දී රසවත් ගුණවත් තේ කෝප්පයක් සාදා ගැනීම සහ දේශිය වෙළඳපොළෙන් උසස් තත්වයේ තේ මිලදී ගන්නේ කෙසේද යන්න පිළිබඳව සහභාගී වන්නන් හට අවබෝධයක් ලබා දීමට කටයුතු කරන ලදි. ගරු සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් අමරතුංග මහතා ප්‍රදර්ශනය අතරතුර දී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කුටියට පැමිණියේය.

**ඡායාරූපය 3.116** **ඡායාරූපය 3.117**





**කොළඹ ජාත්‍යන්තර වෙළඳ සැණකෙළිය 2017 (ඔක්තෝබර් 20-22)**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය කොළඹ ජාත්‍යන්තර වෙළඳ සැණකෙළිය 2017 ඔක්තෝබර් 20 - 22 දිනවලදී කොළඹ ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ දී සංවිධානය කර තිබුණි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ද මෙම සැණකෙළියට සහභාගී වෙමින් වෙළඳ කුටියක් සහ තොරතුරු කවුළුවක් පවත්වාගෙන යනු ලැබිය.

**ඡායාරූපය 3.118** **ඡායාරූපය 3.119**




**නැවුම් තේ මංගල්‍යය - ගැටඹරු විහාරය පදනම් කරගනිමින් දකුණු කලාපය (2017 මැයි 11)**

පෞද්ගලික අංශයේ ද සහාය ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය 15,000 දහසක ගේ පමණ සහභාගිත්වය ඇතිව 2017 මැයි 11 දින දකුණු පළාතේ ගැටඹරු විහාරයේ දී නැවුම් තේ මංගල්‍යය පැවැත්විය. මෙම අවස්ථාවට සහභාගි වුවන් සඳහා තේ පැන් සංග්‍රහය පැවැත්වූ අතර තේ අළෙවි කවුළුවක් ද විවෘත කෙරුණි.

**ඡායාරූපය 3.120** **ඡායාරූපය 3.121**





කොළඹ හිල්ටන් හෝටලයේ දී පැවැත්වූ ICAN සමුළුව - 2017 දෙසැම්බර් 04 - 08

2017 වසර සඳහා 10 වැනි - ICAO ගුවන් සේවා කතිකාව (ICAO Air Service Negotiation -ICAN) 2017 දෙසැම්බර් 04 - 08 දිනයන්වලදී කොළඹ හිල්ටන් හෝටලයේ පැවත්විය. මෙම ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) ප්‍රධාන ජාත්‍යන්තර සමුළුවක් වේ. කලින් අවස්ථාවලදී මේ සඳහා සත්කාරකත්වය දක්වා ඇත්තේ බහමාස්, ජැමෙයිකා, අන්ටාලියා, බාලි සහ ඩර්බන් යනාදි ප්‍රධාන සංචාරක ස්ථාන මගිනි. රටවල් 72 කින් පැමිණි විදේශීය නියෝජිතයන් 500 වඩා ප්‍රමාණයක් මෙම සමුළුව නියෝජනය කළේය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ එක්ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය මෙයට සහභාගි විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2017 පැවැත්වූ මෙම ICAN සමුළුවේ දී අළෙවි කුටියක් සමග තොරතුරු කවුළුවක් මෙහෙවිය.

**ඡායාරූපය 3.122** **ඡායාරූපය 3.123**





**කොළඹ ආරක්ෂක සම්මන්ත්‍රණය 2017**

ශ්‍රී ලංකා යුධ හමුදාවේ වාර්ෂික ආරක්ෂක සම්මන්ත්‍රණය 'Colombo Defence Seminar - 2017' කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යනතර සම්මන්ත්‍රණ ශාලාවේදී 2017 අගෝස්තු 28 සිට 29 දක්වා පැවැත්විය. මෙම සම්මන්ත්‍රණය ජාත්‍යන්තර තලයේ ප්‍රදර්ශනයක් සමග පැවතුණි. මෙම ප්‍රදර්ශනය විදේශ සහ දේශිය ආරක්ෂක කර්මාන්තය රටවල් 50 කට වඩා වූ ජාත්‍යනතර නියෝජිතයන් පිරිසකගේ අවධානය ලබා ගැනීම සඳහා අවස්ථාවක් උදාවිය.

සම්මන්ත්‍රණ හා මෙම ප්‍රදර්ශනය විදේශීය හා දේශිය හවුල්කරුවන් සඳහා සිය නිෂ්පාදන සහ සේවාවන් ප්‍රවර්ධනය කරන්නට මහඟු අවස්ථාවක් විය. අමතරව ලංකා තේ විදේශීය අමුත්තන් අතර ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා තේ මණ්ඩලය තොරතුරු කවුළුවක් සහ තේ පැන් සංග්‍රහය පැවැත්විය.

**ඡායාරූපය 3.124** **ඡායාරූපය 3.125**





### 3.3.14 විදේශීය නියෝජිතයන්

2017 වර්ෂය තුළ දී චීනය, සිංගප්පූරුව, රුසියාව, ඇ.එ.ජ., දකුණු කොරියාව, එක්සත් රාජධානිය සහ තුර්කිය යනාදි රටවල්වලින් පැමිනි නියෝජිතයන් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහසුකම් සපයමින් සත්කාරය ලබාදුන් අතර වෙළඳ සංවිධානය කරමින් මෙම නියෝජිතයන්ට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ පාර්ශවකරුවන් මුණගැසීම සඳහා අවස්ථාව උදාකර දුන්නේය. මෙම වෙළඳ හමුවල අරමුණු වූයේ එකිනෙකා අතර අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ උදාකර දෙන වෙළඳ සබඳතා ගොඩනැගීම, අදහස් හුවමාරුව සහ දැනුම බෙදා හදා ගැනීමයි.

**මෙම වර්ෂය තුළදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත සඳහන් රැස්වීම සඳහා සහභාගි වී ඇත.**

- 2017 ඔක්තෝබර් 24 සිට 26 දක්වා කොළඹ පැවති ශ්‍රී ලංකාව සහ රුසියාව අතර වෙළඳ, ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ ජාත්‍යන්තර කොමිසම 2 වැනි සැසිය
- ලංකා තේ ප්‍රවර්ධනය පිළිබඳ තේ වෙළඳ නියෝජිතයන් ඉරානයට යැම / වර්ල්ඩ් ඔෆ් ටී 2017 සඳහා සහභාගි වීම සහ වෙළඳුන් හා රජයේ බලධාරීන් අතර ද්විපාර්ශවික වෙළඳ හමු - 2017 ඔක්තෝබර් 22 - 27 දක්වා
- රුසියාව වෙත අමාත්‍ය තේ දූත කණ්ඩායම
- 2017 නොවැම්බර් 11 - 12 දෙදින ඔස්ට්‍රේලියාවේ කැන්බෙරා හිදි ඔස්ට්‍රේලියානු තේ සංස්කෘතිය නමින් වූ සම්මන්ත්‍රණය

ඔස්ට්‍රේලියාවේ කැන්බෙරාවල සිටින මහ කොමසාරිස් 2017 නොවැම්බර් 11 - 12 දෙදින කැන්බෙරා නගරයේ තේ සම්මන්ත්‍රණයක් සංවිධානය කර තිබුණි. තේ පිළිබඳ විශේෂඥ ඩේවිඩ් ලයන්ස් මහතා මෙම සම්මන්ත්‍රණය මෙහෙයවීම සිදුකළ අතර මේ සඳහා ආරාධිත හා සහභාගි වූ අය සඳහා ලංකා තේ ත්‍යාග පාර්සල් ප්‍රදානය කරන ලදි.

- 2017 සැප්තැම්බර් 25 - 30 දක්වා පැවැත්වූ චීනයේ හුබෙයි (Hubei) පළාතේ එන්ශි (Enshi) නගරයේ 7 වැනි ජාත්‍යන්තර තේ සම්මන්ත්‍රණය

"The Belt and Road Deliver Tea and Health" තේමාව යටතේ මෙම සම්මන්ත්‍රණය ආරම්භ විය. මෙහි අරමුණ වූයේ තේ කර්මාන්තය, ප්‍රමුඛ පෙළේ වෙළඳපොළවල්, ව්‍යාපාර ප්‍රවර්ධනය, සංස්කෘතික සංවිධානය සහ චීනය හා ජාත්‍යන්තර තේ කර්මාන්තය අතර සහයෝගිතාවය පිළිබඳව යාවත්කාලීන වූ තොරතුරු සහ නව ප්‍රවණතා ගැන අවබෝධයක් ලබා ගැනීමට ජාත්‍යන්තරව තේ ක්ෂේත්‍රයේ නියැලි මිනිසුන්ට අවස්ථාව උදාකර දීමයි.

ඡායාරූපය 3.126




ඡායාරූපය 3.127



### 3.3.15 තේ අලෙවි සැල

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පරිශ්‍රයේ පිහිටුවා තිබෙන තේ අලෙවිසැල මගින් තේ මණ්ඩල තේ ඇසුරුම කාණ්ඩය සහ පුද්ගලික තේ සමාගම් 28 කින් තෝරාගත් තේ නිෂ්පාදන අලෙවිකරනු ලබයි. 2017 වසරේ දී තේ අලෙවිසැල මගින් විකිණීමෙන් රුපියල් මිලියන 101.9 ක ආදායමක් උපයා ඇත. පසුගිය වසර සමග සැසඳීමේ දී තේ අලෙවිය 3.3% කින් වර්ධනය වී ඇත. තේ මණ්ඩල තේ ඇසුරුම් කාණ්ඩය අලෙවිය මගින් රුපියල් මිලියන 22.08 ක ආදායමක් උපයා ඇති අතර පුද්ගලික අංශයේ තේ නිෂ්පාදන වලින් රුපියල් මිලියන 79.8 ක් උපයා ඇත.

### 3.3.16 ප්‍රවර්ධන අරමුණ ඇතිව තේ බෙදා හැරීම

"Ceylon Tea" නාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය තිළිණ වශයෙන් රුපියල් මිලියන 6.14 වටිනාකමකින් යුතු තේ බෙදාහරිනු ලැබිය.

I. තුටු පඬුරු / තිළිණ වශයෙන් විදේශීය ශ්‍රී ලංකා තානාපති කාර්යාල 51කට තේ ලබාදීම
ii. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලදී තේ පැන් සංග්‍රහ පැවැත්වීම සහ තේ බෙදාහැරීම
iii. ප්‍රභූන්ට / නිලධාරීන්ට ප්‍රවර්ධන වශයෙන් තේ පිරිනැමීම

### 3.4 තේ රස පිරික්සීමේ ඒකකය

### 3.4.1 ප්‍රධාන කාර්යය / අරමුණ

ISO 3720 සහ ISO 11287 ප්‍රමිතිවලට අනුව අවම තත්ත්වය පවත්වාගෙන යාම / අධීක්ෂණය කිරීම, පාරිභෝගික ඇසුරුම් සඳහා සන්නම් නාම සහිත තේ නිෂ්පාදනවලට සිංහ ලාංඡන සහතිකය නිකුත් කිරීම, පෞද්ගලික හා සෘජු විකුණුම් සහ ඉදිරි කොන්ත්‍රාත් අධීක්ෂණය කිරීම සහ අපරානුමත කිරීම මෙම අංශය මගින් සිදු වේ.

### 3.4.2 තේ රස පිරික්සුම්කරුවන්ගේ විශේෂඥ මඬුල්ල

මෙම ස්වාධීන මඬුල්ල පහත සඳහන් සාමාජිකයන් දෙදෙනාගෙන් සමන්විත විය.

සී. එන්.පී. ද සිල්වා මහතා (වසර 40 කට වැඩි තේ රස පිරික්සුම් පළපුරුද්දක් ඇත.)

වී. ඒ. ඒ. පෙරේරා මහතා (වසර 30 කට වැඩි තේ රස පිරික්සුම් පළපුරුද්දක් ඇත.)

පහත සඳහන් සංගම්වල නියෝජිතයන්ගෙන් සමන්විත තේ පාර්ශවකාර නියෝජනයක් මෙම මඬුල්ල මගින් සිදුවේ.

- කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය (CTTA)
- කොළඹ තේ තැරැව්කරුවන්ගේ සංගමය (CBA)
- ලංකා වැවිලිකරුවන්ගේ සංගමය (CPA)
- ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය (SLFTSHDS)
- තේ අපනයනකරුවන්ගේ සංගමය (TEA)
- පෞද්ගලික තේ කම්මල් හිමියන්ගේ සංගමය (PTFOA)

### 3.4.3 තේ රස පිරික්සීමේ ඒකකය විසින් අනුගත තේ රස පිරික්සීමේ ක්‍රමවේදය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉන්ද්‍රිය සංවේදී පිරික්සුම්වලදී භාවිත තේ පිළියෙල කිරීමේ ISO 3102 ක්‍රමවේදය අනුගමනය කරයි. කළු තේ වල වාග්මාලාව සඳහා ISO 6078 තේ රස පිරික්සුම් පාරිභාෂිකය / ලංකා තේ නිෂ්පාදනය පිළිබඳ විෂය ග්‍රන්ථය අංක : 4 (Monograph on a Production in Ceylon - no: 4 - Tea Manufacture in Ceylon).

### 3.4.4 විශේෂඥ මඬුල්ල විසින් තේ රස පිරික්සුම් සැසි පැවැත්වීම

පහත සඳහන් ද, සම්බන්ධව ස්වාධීන ඇගයීමක් කිරීම විශේෂඥ මඬුල්ල ප්‍රධාන වශයෙන් සඳුදා සහ බ්‍රහස්පතින්දා වශයෙන් සතියකට දෙවරක් රැස්වේ.

- පූර්ව වෙන්දේසි තේ
- විශේෂ විමර්ශන තේ
- පූර්ව ආනයනික තේ
- සෘජු විකුණුම්
- නව අපනයන සමාගම් සඳහා තේ රස පිරික්සුම්කරුවන් ඇගයීම
- පූර්ව නැව්ගත කිරීම අධීක්ෂණය දෛනිකව ඇගයීම

අවශ්‍ය පියවර ගැනීම සඳහා, විශේෂඥ මඬුල්ල විසින් ගන්නා තීරණ අදාළ අංශ, තේ කොමසාරිස්ගේ අංශය සහ නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) වෙත ඉදිරිපත් කිරීම.

### 3.4.5 සිංහ ලාංඡන ඇසුරුම් ලියාපදිංචිය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පූර්ණ අධිකාරිත්වය දරණ, නිෂ්පාදිත රට සහ ගුණාත්මක බවේ සංකේතයක් වන සිංහ ලාංඡනය සිය සන්නම් පොදුවේ පාරිභෝගික ඇසුරුම් මත ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන අපනයනකරුවන් සිය අයදුම්පත සහ වෙළඳපොල අනුව තම නිෂ්පාදන ඇගයීම සඳහා ඉදිරිපත් කළ යුතුයි.

නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය නිකුත් කරන සහතිකය වසරක කාලයක් වලංගු වේ.

සිල්ලර ඇසුරුම්වල සිංහ ලාංඡනය යෙදීමේ අධිකාරි බලය ලබාදීම සඳහා 2017 වසරේ නව සන්නාම / දීර්ඝ කිරීම්, අතිරේක ඇසුරුම් සඳහා අයදුම්පත් 758 සම්බන්ධව කටයුතු කෙරුණි.

### 3.4.6 සිංහ ලාංඡන යොදන ඇසුරුම්වල ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීම (දේශීය, විදේශීය, තේ මණ්ඩල ඇසුරුම්)

#### 3.4.6.1 දේශීය

මේ යටතේ අහඹු ලෙස කොළඹ සුපිරි වෙළඳසැල් වලින් සහ සිල්ලර වෙළඳසැල්වලින් ලබාගත්, විශේෂයෙන්ම සිංහ ලාංඡනය යොදන සන්නාමවලින් ලබාගත් තේ නියැදි අධීක්ෂණය කරයි. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි, සැලකිය යුතු වෙළඳපොළ කොටසකට හිමිකම් කියන පිළිගත් ඇසුරුම්කරුවන් වෙත සිංහ ලාංඡනය භාවිතයට අවසර දෙන අතර අධීක්ෂණ කටයුතු ද සිදු කෙරේ.

#### 3.4.6.2 විදේශීය අධීක්ෂණය

විදේශීය අධීක්ෂණය යටතේ, සිංහ ලාංඡනය සහිතව නැව්ගත තොග බොහෝමයක් (80%) නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) විසින් පූර්ව නැව්ගත තොග අධීක්ෂණ ක්‍රියාවලිය යටතේ නියැදිගත කෙරෙන අතර නැව්ගත කිරීමට පෙර අධීක්ෂණ කටයුතු සඳහා තේ රස පිරික්සීම් ඒකකය වෙත ඉදිරිපත් කරනු ලබයි.

අපගේ විදේශීය කාර්යාංශ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාවල සිටින වානිජ උපදේශකයන් විසින් විදේශීය වෙළඳපොළවල්වලින් ලබාගන්නා සිංහ ලාංඡනය යොදා ඇති ඇසුරුම් ද ඇගයීම් කර වාර්තා කිරීම සඳහා තේ රස පිරික්සීම් ඒකකය වෙත ඉදිරිපත් කරනු ලබයි.

#### 3.4.6.3 තේ මණ්ඩල ඇසුරුම්

තේ මණ්ඩල ඇසුරුම් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩල අලෙවිසැලේ අලෙවි කරනු ලබන අතර විදේශ දූත මණ්ඩල, කාර්යාංශ සහ වෙළඳ සල්පිල් වෙතද යවනු ලබයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් තේ රස පිරික්සීම් ඒකකයේ අනුමැතිය ඇතිව නිල ඇසුරුම්කරුවන් විසින් වෙන්දේසි හෝ පෞද්ගලික විකුණුම් මාර්ගවලින් ලබා ගන්නා තේ වල නියැදි අවසන් ඇසුරුමට පෙර තේ රස පිරික්සීමේ ඒකකය විසින් පිරික්සීමට බඳුන් කර අනුමත කරයි.

එෆ්.එෆ්.සී.ටී. (ග්‍රෑ.500)
ප්ලාන්ටර්ස් පන්ච් (ග්‍රෑ.500 සහ ග්‍රෑ.250)
මිස්ටි හිල්ස් (ග්‍රෑ.200)
රෝයල් සිලෝන් (ලොහ කෑන් ග්‍රෑ.200)
ෆැමිලි පැක් (ග්‍රෑ.500 සහ ග්‍රෑ.250)
පොලි පැක් (ග්‍රෑ.250)
ග්‍රීන් ටී (ග්‍රෑ.5100)
ටී ජලකර් (ග්‍රෑ.250 සහ ග්‍රෑ.100)
ලක්සරි බ්ලෙනඩ් - දැව (ග්‍රෑ.1250)
ලක්සරි බ්ලෙන්ඩ් - කාර්ටන් (ග්‍රෑ.125)
කොනොයිෂර් (ග්‍රෑ.250, ග්‍රෑ.200, ග්‍රෑ.125, ග්‍රෑ.100)

### 3.4.7 වෙන්දේසියට පෙර තේ තත්ව පාලනය සඳහා තේ රස පිරික්සීම

තැරැව්කරුවන් අට දෙනෙකු විසින් ඔවුන්ගේ වෙන්දේසියට පෙර තේ නියැදි ඇගයීම සඳහා අලෙවියට සති දෙකකට පෙර ඉදිරිපත් කරනු ලබයි. තේ රස පිරික්සීමේ ඒකකය පළමුවෙන්ම ඕෆ් ග්‍රේඩ්, ඩස්ට්, ප්‍රිමියම් ෆ්ලවර්රි සහ බී.ඕ.පී1 ඒ, නියැදි දෘශ්‍ය පරීක්ෂාවට ලක් කරයි. ඊට අමතරව උඩරට, මධ්‍යම, ලිෆ් සහ ටිපී නියැදි අහඹු ලෙස ඇගයීමට ලක් කරයි. අනතුරුව ජෛවීය පරීක්ෂණය සිදු කරයි. ඇගයීමෙන් පසු තෝරාගත් නියැදි ඊළඟ වෙන්දේසියට ඉදිරිපත් කරන්නේද නැද්ද යන්න පිළිබඳ සාමූහික තීරණයක් ගැනීම සඳහා රස පිරික්සුම් මඬුල්ල වෙත ඉදිරිපත් කරයි. එම තීරණය නි.තේ.කො. (අපනයන) වෙත ඉදිරිපත් කරයි.

දෘශ්‍ය පරීක්ෂාවකට ලක් කරන ලද නියැදි- 181,344
ජෛව පරීක්ෂාව - 18,560
රස පිරික්සුම් මඬුල්ල විසින් ප්‍රතික්ෂේපිත වෙන්දේසියට පෙර තේ නියැදි
මධ්‍යසාර මිශ්‍රවී ඇතැයි සැක කරන - 650

### 3.4.8 නැව්ගත කිරීමට පෙර තේ තත්ව පාලනය සඳහා රස පිරික්සීම

තේ නැව්ගත කිරීමට පෙර සිංහ ලාංඡනය භාවිතය, පරාමිතීන් පිළිබඳව හෝ වෙනත් කිසියම් අපවිත්‍ර වීම් පිළිබඳව පරීක්ෂා කිරීම පිණිස නි.තේ.කො. (අපනයන) විසින් ඉහත අධීක්ෂණ ක්‍රමයේ සඳහන් තේ නියැදි, උපලේඛනයක් ද සහිතව ඉදිරිපත් කරනු ඇත.

නැව්ගත කිරීමට පෙර අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදය යටතේ පරීක්ෂාවට ලක් කළ නියැදි ප්‍රමාණය - 6,649

### 3.4.9 ආනයනය කිරීමට පෙර තේ තත්ව පාලනය සඳහා රස පිරික්සීම

ආනයනයට ඇති යෝග්‍යතාවය විමසා බැලීම සඳහා නි.තේ.කො. (අපනයන) විසින් ආකෘති පත්‍රයක් ද සමඟ ආනයනය කිරීමට පෙර තේ නියැදි ඉදිරිපත් කරනු ලැබේ.

ලෙස මෙම නියැදිවල විස්තර සටහන් කරනු ලබයි. රස පිරික්සුම් මඬුල්ල විසින් තේ ඇගයීම කරනු ලබන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩල චක්‍රලේඛ අංක OR/1/65 හා එහි සංශෝධන අනුවය.

තේ රස බැලීමේ ඒකකය පරීක්ෂා කළ නියැදි ප්‍රමාණය - 1,647

### 3.4.10 පශ්චාත් ආනයන තේ තත්ත්ව පාලනය සඳහා රස පිරික්සීම

ආනයන කරන ලද තේ තොග ලැබුණු පසු තේ අපනයන අංශය විසින් ඒවායේ නියැදි ලබාගෙන අනුමැතිය සඳහා මෙම අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

තේ රස පිරික්සුම් ඒකකය විසින් තමන් වෙත නියැදි ලැබෙන අවස්ථාවේදී මෙම නියැදි ඇගයීමට බඳුන් කරයි. තේ රස බැලීමේ ඒකකය පරීක්ෂා කළ නියැදි ප්‍රමාණය - 1,138

### 3.4.11 විශේෂ විමර්ශනයන් යටතේ වන තේ රස පිරික්සීම

තේ ශ්‍රේණිය, අපවිත්‍ර වීම්, ISO හෝ නොයෙකුත් විශේෂ කාරණා පිළිබඳව ඇගයීම සඳහා තේ කොමසාරිස්වරයා හෝ නි.තේ.කො. (අපනයන) විසින් තේ නියැදි අනුමත සැලැස්මක් ඇතිව බ්‍රහස්පතින්දා මඬුල්ලට ඉදිරිපත් කරනු ලබයි.

### 3.4.12 පෞද්ගලික විකුණුම් ඇගයීම් සහතික අනුමත කිරීම

ස්වාධීන තැරැව්කරුවන්ගේ අනුමැතිය ඇතිව අලෙවි තැරැව්කරු විසින් තේ නියැදි තේ රස බැලීමේ ඒකකය වෙත ඉදිරිපත් කරන අවස්ථාවලදී පෞද්ගලික විකුණුම් අනුමත කිරීම මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි. ඒ සඳහා අනුමත කිරීමේ ගාස්තුව වශයෙන් එක් කොටසකට රුපියල් 500/- + (VAT + NBT) ක් අය කරනු ලබයි. වර්තමානයේ දී ඉහත වැඩසටහන හරිත තේ, කාබනික තේ, විශේෂ තේ සහ කොළඹ වෙන්දේසිය හරහා විකුණනු නොලබන කුඩා කැබලි තේ වලට සීමා කර ඇත.

පිරික්සා අනුමත කළ පෞද්ගලික අලෙවි තේ තොග ප්‍රමාණය - 8,857

### 3.4.13 ඉදිරිපත් කළ කොන්ත්‍රාත්තු අනුමත කිරීම

මිලදී ගන්නන්ගේ අවශ්‍යතා මත තෝරාගත් කිහිපයක් සඳහා පමණක් කිසියම් කාලසීමාවක් සඳහා අනුමැතිය ලබා දී ඇත. වෙළෙන්ඳා, ගැනුම්කරු, තැරැව්කරු සහ තේ මණ්ඩල විකුණුම් කොන්ත්‍රාත්තුව අනුමත කර ඇත. අනුමත කිරීමේ ගාස්තුව වශයෙන් එක් කොටසකට රුපියල් 500+ NBT+VAT ක් අය කරනු ලබයි.
අනුමැතිය ලත් සියලු කොන්ත්‍රාත් ප්‍රමාණය - 36

### 3.4.14 සෘජු විකුණුම් අනුමැතිය

මෙම යෝජනා ක්‍රමය යටතේ අපනයනකරුට මෙන් නිෂ්පාදකයාට ද ඔවුන්ගේ නිෂ්පාදන සෘජුවම විදේශීය ගැනුම්කරුවන්ට අලෙවි කිරීමට අවසරය ලබා දේ. හරිත තේ, කාබනික තේ, විශේෂ තේ, දේශීය ගැනුම්කරුවන්ට අලෙවි කළ හැකි වේ. මෙම සෘජු විකුණුම් අනුමත කරනු ලබන්නේ බ්‍රහස්පතින්දා මඬුල්ල මගිනි.
අනුමත කළ පෞද්ගලික අලෙවි ප්‍රමාණය - 1,607

## 3.5 විශ්ලේෂණ රසායනාගාරය

### 3.5.1 විශ්ලේෂණ රසායනාගාරය - සහතිකරණ සේවා සඳහා ජාත්‍යන්තර පිළිගැනීම සහිත

1986 දී පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශේෂණ රසායනාගාරය 2017 වසර වන විට එහි 30 වැනි සංවත්සරය පසු කර ඇත. මේ වන විට ISO 17025:2005 ජාත්‍යන්තර ප්‍රමිතිය මත ජාත්‍යන්තර ප්‍රතිතන තත්වය ලබා සිව් වසරක් ගතවී තිබීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ රසායනාගාර සේවා සපයන ආයතන අතර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙන එකම ප්‍රමුඛ පෙළේ ප්‍රතිතන පරීක්ෂණ සහ සහතිකකරණ රසායනාගාරය වනුයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරයයි. 2014 මාර්තු මස සිට ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතිතන සහයෝගිතාවය (International Laboratory Accreditation Cooperation ) අන්‍යොන්‍ය පිළිගැනීම ඇතිව ප්‍රතිතනය සහතික කර ඇත. රසායනික, පළිබෝධ අවශේෂ, ක්ෂුද්‍රජීව විශ්ලේෂණය යන ශික්ෂණයන් ත්‍රිත්වය ආවරණය කළ හැකි ප්‍රතිතන තත්ත්වයේ අවිච්ඡින්න බව සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් 2017 වසරේ දී නැවතත් සහතික කර ඇත.

### 3.5.2 පරීක්ෂණ සේවාවන්හි සාර්ථකත්වය

2017 වසර තුළ දී පරීක්ෂණ සේවාවන්හි 15% පමණ වර්ධනයක් සිදු වී ඇත. කර්මාන්තයේ පරීක්ෂණ අවශ්‍යතාවයන් මාර්ග දෙකක් ඔස්සේ තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය වෙත ඉදිරිපත් වේ. ඒ අනුව තේ කොමසාරිස් අංශය ඇතුලු ආයතනයේ අභ්‍යන්තර අංශයන් මඟින් අභ්‍යන්තර අධීක්ෂණ සේවා (IMS) සහ තේ නිෂ්පාදකයින්, තේ තැරැව්කරුවන්, තේ අපනයනකරුවන් සහ තේ ආනයනකරුවන් ඇතුලු බාහිර සේවාලාභීන් සඳහා වන අවශ්‍යතා ලෙස බාහිර සහතිකකරණ සේවාව (ECS) හඳුනාගත හැකි වේ. ගාස්තු අයකිරීම් මත ලබාදෙන සේවාවක් වන බාහිර සහතිකකරණ සේවාව නිසා සිදුකර ඇති සමස්ත පරීක්ෂණවලින් 68.3% (පරීක්ෂණ 9603) පමණ රසායනාගාරයට ආදායම් උපයා දීමට හේතු වී ඇත. සමස්ත පරීක්ෂණවලින් ඉතිරිය 31.7% (පරීක්ෂණ 4467) පමණ තේ පාලන පනත යටතේ පැන නැගෙන නියාමන අවශ්‍යතාවයක් ලෙස සැලකෙන අභ්‍යන්තර අධීක්ෂණ සේවා ගණය යටතට ගැනේ. 2016 වසර සමඟ සසඳමින් 2017 වසර තුළ දී රසායනාගාරය මඟින් සිදුකල පරීක්ෂණ පිළිබඳ සාරාංශයක් පහතින් දැක්වේ.

3.16 වගුව : 2016/2017 වසරවල සිදුකල විශ්ලේෂණ රසායනාගාරය විසින් නිරත වූ පරීක්ෂණවල සාරාංශය

| පරීක්ෂණයේ නම | පරීක්ෂණ ගණන 2016 | 2017 |
|---|---|---|
| **රසායනික විශ්ලේෂණ ඒකකය** | | |
| 1. තේවල තෙතමනය නිර්ණය කිරීම | 342 | 349 |
| 2. තේවල ඇති සම්පූර්ණ අළු ප්‍රමාණය නිර්ණය කිරීම | 365 | 291 |
| 3. තේවල ජලයේ දියවන අළු ප්‍රමාණය නිර්ණය කිරීම | 355 | 291 |
| 4. තේවල ජලයේ දියනොවන ආම්ලික අළු ප්‍රමාණය නිර්ණය කිරීම | 355 | 291 |
| 5. තේවල ඇති ජල කොටස් නිර්ණය කිරීම | 365 | 293 |
| 6. තේවල අති ජලයේ දියවන අළු ප්‍රමාණයේ භාෂ්මිකතාව නිර්ණය කිරීම | 387 | 299 |
| 7. තේවල ඇති අපද්‍රව්‍ය කෙඳි ප්‍රමාණය නිර්ණය කිරීම | 858 | 396 |
| 8. මූලික විකිරණ නිර්ණය කිරීම | 116 | 164 |
| 9. වෙනත් පරීක්ෂන (එකතු කළ වර්ණ, සීනි, ජෙලි, මද්‍යසාර, වර්ණක, රසකාරක, රසායනික, රසායනික හඳුනාගැනීම්, බයිකාබනේට්) | 11 | 73 |
| 10. ශ්‍රේණි හඳුනා ගැනීමේ පරීක්ෂණ /පෙරහුම් විශ්ලේෂණය | 49 | 51 |
| **ක්ෂුද්‍ර ජීවි විද්‍යා විශ්ලේෂණ ඒකකය** | | |
| 1. මුළු ස්වායු ක්ෂුද්‍ර ජීවි ප්‍රමාණය නිර්ණය කිරීම | 780 | 629 |
| 2. ඊස්ට් සහ දිලීර ප්‍රමාණය නිර්ණය කිරීම | 783 | 631 |
| 3. තේවල අජීවි සහ ජීව කෘමීන් සහ වෙනත් අපවිත්‍ර කාරක බාහිර ද්‍රව්‍ය තිබේදැයි අන්වීක්ෂ පරීක්ෂණය | 40 | 51 |
| 4. තේවල ජානමය වශයෙන් වැඩි දියුණු කිරීම්වලින් සකසන ලද විශේෂ (GMO) පිළිබඳ නිර්ණය කිරීම. | 828 | 951 |
| 5. Faecal *Coliforms* සහ *Escherichia coli (E.coli)* අනාවරණය සහ ගණනය | 782 | 629 |
| 6. සමස්ත *Coliforms* ප්‍රමාණය අනාවරණය සහ ගණනය කිරීම | 789 | 633 |
| **පළිබෝධ අවශේෂ විශ්ලේෂණ ඒකකය** | | |
| 1. **Ethion** ඊතියන් | 668 | 1006 |
| 2. **Malathion** මැලතියන් | 668 | 1006 |
| 3. **Cypermethrin** සයිපමෙත්‍රින් | 668 | 1006 |
| 4. **β Endosulfan** බීටා එන්ඩොසල්ෆාන් | 668 | 1006 |
| 5. **Bifenthrin** බයිෆෙන්ත්‍රින් | 217 | 1006 |
| 6. **Bromopropylate** බ්‍රෝමෝප්‍රොපයිලේට් | 668 | 1006 |
| 7. **Tetradifon** ටෙට්‍රාඩයිෆෝන් | 668 | 1006 |
| 8. **Endo Sulphan sulphate** එන්ඩෝ සල්ෆාන් සල්ෆේට් | 668 | 1006 |
| 9. **Bitertanol** බයිටතැනෝල් | 90 | - |
| එකතුව | **12188** | **14070** |

එමෙන්ම විශ්ලේෂණ රසායනාගාරය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සමඟ ක්‍රියාත්මක රසායනාගාර ප්‍රතීතන තත්වයන්හි සංශෝධනය සහ තේ කර්මාන්තයේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා නව රසායනාගාර පරීක්ෂණ හඳුන්වා දීමට කටයුතු කර ඇත. ඒ අනුව ඊතියන් (Ethion), මැලතියන් (Malathion), සයිපමෙත්‍රින් (Cypermethrin), එන්ඩෝසල්ෆාන් සල්ෆේට් (Endosulfan sulphate) සහ බීටා එන්ඩොසල්ෆාන් (β endosulfan) පරීක්ෂණ පළිබෝධ අවශේෂ විශ්ලේෂණ ඒකකය මගින් හඳුන්වා දී ඇත. මෙය තේ ආනයනික රටවල්වල ස්ථාපිත කර ඇති උපරිම පළිබෝධ අවශේෂ මට්ටම් සඳහා වූ ප්‍රධාන අවශ්‍යතාවක් ඉටු කිරීමකි.

### 3.5.3 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආදායම් උපයාගැනීම සඳහා දායකත්වය

මෙහිදී බාහිර සහතිකකරණ සේවාව යටතේ වන රසායනාගාර සේවාලාභීන් ප්‍රධාන වන අතර ඇගයීම් කර වාර්තා නිකුත් කිරීම සඳහා තේ කොමසාරිස්වරයා විසින් නිල වශයෙන් ඉදිරිපත් කරන, පරීක්ෂණ ප්‍රතිඵලය අවම ගුණාත්මක තත්වයට අනුකූල නොවන බවට හඳුනාගත් නියදි වැදගත් වේ. 2016 සහ 2017 වසරවලදී විශ්ලේෂණ රසායනාගාරය මගින් උපයාගත් සමස්ත ආදායම පිළිබඳ සාරාංශයක් පහතින් දැක්වේ.

| | 2016 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| **සමස්ත ආදායම** | 20,143,500.00 | 23,192,100.00 |

පහත විස්තර වන පරිදි බාහිර සහතිකකරණ සේවාව යටතේ වන රසායනාගාර පරීක්ෂණය වැඩි වී ඇත. මේ සඳහා හේතු වී ඇත්තේ 2017 වසර තුළ දී ජාත්‍යන්තර ප්‍රතීතන තත්වය පවත්වාගෙන යාමට තේ මණ්ඩල රසායනාගාරය සමත් විමයි. උපයාගත් සමස්ත රසායනාගාරය ආදායම අභ්‍යන්තර අධීක්ෂණ සේවා සහ බාහිර සහතිකකරණ සේවාව යටතේ බෙදී යන ආකාරය පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

වගුව 3.17 : සමස්ත රසායනාගාර ආදායම අභ්‍යන්තර අධීක්ෂණ සේවා සහ බාහිර සහතිකකරණ සේවාව යටතේ බෙදී යන ආකාරය

| | 2016 (රු.) | % | 2017 (රු.) | % |
|---|---|---|---|---|
| අභ්‍යන්තර අධීක්ෂණ සේවා (IMS) | 8,404,000 | 41.72 | 6,391,500 | 27.55 |
| බාහිර සහතිකකරණ (ECS) සේවාව | 11,739,500 | 58.28 | 16,805,600 | 72.45 |
| සමස්ත ආදායම, රුපියල් | **20,143,500** | | **23,197,100** | |

### 3.5.4 තේ කර්මාන්තය වෙත පහසුකම් සැපයීම සඳහා දායක වීම.

නිල වශයෙන් ගෙන එන සැක සහිත තේ නියැදිවල ගුණාත්මක තත්වය පිළිබඳව තීරණ ගැනීමේ දී තේ කොමසාරිස් අංශය සහ තේ අපනයන අංශය යන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අභ්‍යන්තර අංශයන් සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීමට විශේෂණ රසායනාගාරයක කටයුතු කරයි.

පුහුණු නියැදිකරණ කණ්ඩායම (තේ පරීක්ෂක, ප්‍රාදේශීය තේ සංවර්ධන නිලධාරීන්) තේ කොමසාරිස්වරයාගේ මෙන්ම අපනයන, සංවර්ධන, නියාමන නියෝජ්‍ය තේ කොමසාරිස්වරුන්ගේ නියෝජනවලට අනුව නියැදි ලබා ගැනීම සිදුවේ. තේ කර්මාන්තශාලා තේ තැරැව්කරුවන්, තේ වෙන්දේසිය සහ තේ අපනයනකරුවන් වැනි කලින් තෝරාගත් තේ සම්බන්ධ ස්ථානවලට ගොස් නිල වශයෙන් ලබා ගන්නා නියැදි අතුරින් මායිම් රේඛාවේ සහ / හෝ ඉන් පහළ යැයි තේ රස බැලීමේ අංශයෙන් හඳුනා ගන්නා නියැදි විද්‍යාත්මක වාර්තාකරණය සඳහා විශ්ලෙෂණ රසායනාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ISO අවම ගුණාත්මක නිර්ණායක විශේෂයෙන්ම ISO 3720 කලු තේ අර්ථ දැක්වීම සහ මූලික අවශ්‍යතා සහ ISO 11287 : හරිත තේ අර්ථ දැක්වීම සහ මූලික අවශ්‍යතා යන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව තේ නියැදිවල අවම ගුණය පිළිබඳ පරීක්ෂණය සහ වාර්තාකරණය විශ්ලේෂණ රසායනාගාරයේ ප්‍රධාන කාර්යයන් අතුරින් එකක් ලෙස සැලකිය හැකිවේ.

විශ්ලේෂණ රසායනාගාරයේ රසායන විශ්ලේෂණ ඒකකය ISO ප්‍රමිති සඳහා වන ජාත්‍යන්තර ප්‍රතීතන රසායනාගාරයකි. ලැබෙන තේ නියැදි සඳහා සහතික නිකුත් කරන අතර නියාමන කාර්යයන් සඳහා තේවල අවම ගුණාත්මක තත්වය පිළිබඳව තේ කොමසාරිස්වරයාට නිර්දේශ ලබා දීම මෙම රසායන විශ්ලේෂණ ඒකකය මගින් සිදුවේ. 1957 අංක 57 දරණ තේ පාලන පනත මගින් පනවා ඇති නියාමන අවශ්‍යතා අනුගමනය කරන්නට තේ කොමසාරිස්වරයා නිල වශයෙන් පියවර ගනු ලබයි. මෙය නියෝග සහ තේ මණ්ඩල මග පෙන්වීම් / ප්‍රමිති - 2010 චක්‍රලේඛයට අදාළ වේ.

2017 වසර තුළ දී රසායන විශ්ලේෂණ ඒකකය සිදුකල සමස්ත පරීක්ෂණ 4467 අතුරින් ISO අවම ගුණාත්මක තත්වයට පහළින් වූ තේ නියැදි 1371 හඳුනාගෙන තිබුණි.

ඉහත කාණ්ඩය යටතේ ප්‍රතික්ෂේපිත තේ තොග පිළිබඳව මූලික අවබෝධයක් ලබාගැනීම සඳහා පහත සාරාංශ කර ඇති පරීක්ෂණ වර්ග තුන මගින් ප්‍රතික්ෂේපිත නියැදි ප්‍රමාණය දැක්වේ.

3.18 වගුව : ප්‍රතික්ෂේපිත තේ තොග

| විශ්ලේෂණ ඒකකය | ISO අවම ගුණාත්මක තත්ත්වයට පහළින් වූ නියැදි (පරීක්ෂණ ගණන) |
|---|---|
| ක්ෂුද්‍රජීවී | 1162 |
| රසායන | 209 |
| පළිබෝධනාශක අවශේෂ | 52 |

### 3.5.4.1 පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

1959 අංක 16 දරණ තේ (බදු සහ අපනයන පාලන) පනතට සහ ඒ යටතේ වන නියෝගවලට අනුව අගය එකතු කර ප්‍රති අපනයනය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට සැලසුම් කරන විදේශීය ප්‍රභවයක් සහිත සියළුම තේ ආනයනයට පෙර පළිබෝධනාශක වලින් තොර බවට සහතික කළ යුතුයි. 2017 වසර තුළදී පරීක්ෂණ 8048 ක ප්‍රමාණයක් (සිදුකළ සමස්ත පරීක්ෂණ වලින් 57.2%) සිදු කර ඇත. තේ කොමසාරිස්වරයා විසින් ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකය තේ ආනයනයට පෙර පරීක්ෂාව සහ සහතිකකරණ කටයුතුවල නිරත වේ. එමනිසා පූර්ව ආනයනික නියැදියක අපේක්ෂිත අවම අවශේෂ සීමාව ඉක්මවා කිසියම් අවශේෂයක් අණාවරණය වන්නේ නම් තේ කොමසාරිස්වරයා අදාළ ආනයනික බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරයි. කර්මාන්තයේ මෙම අවශ්‍යතාවය සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් දවසේ ඉලක්කයන් කලට වේලාවට ඉටුකිරීමට පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකය නවීන, ඉහළ තාක්ෂණයෙන් යුතු උපකරණවලින් සමන්විත වන අතර දක්ෂ තාක්ෂණික කාර්ය මණ්ඩලයකින් ද සමන්විත වේ. 2017 වසරේදි පරීක්ෂණ 8048 ක නිරතවෙමින් රුපියල් 15,094,100.00 ක් උපයාගනිමින් රසායනාගාර ආදායම සඳහා වැඩි දායකත්වයක් දක්වා ඇත්තේ මෙම ඒකකය විසින්ය. පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකය විසින් සිදුකළ පරීක්ෂණ සියල්ල අතුරින් ආනයනික නැව්තොග නියෝජනය කළ නියැදි 52 ක් පහත විස්තර කෙරෙන පරිදි ප්‍රතික්ෂේප කර ඇත.

වගුව 3.19 ආනයනික නැව්තොග නියෝජනය කළ ප්‍රතික්ෂේපිත නියැදි

| පළිබෝධනාශක පරීක්ෂණ වර්ගය | ප්‍රමිතියෙන් / මාර්ගෝපදේශයෙන් පහළ (පරීක්ෂණ සංඛ්‍යාව) |
|---|---|
| Ethion(ඒතියන්) | 10 |
| Cypermethrin(සයිපර්මෙත්‍රින්) | 28 |
| Endosulfan sulphate (එන්ඩො සල්ෆාන් සල්ෆේට්) | 10 |
| β endosulfan(බීටා එන්ඩොසල්ෆාන්) | 3 |
| Bifenthrin(බයිෆෙන්ත්‍රින්) | 1 |

### 3.5.4.2 ක්ෂුද්‍රජීව විද්‍යා විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රමිති / මග පෙන්වීම් (2010) චක්‍රලේඛය අනුව යමින් ක්ෂුද්‍රජීවීමය වශයෙන් හානියට පත්වී ඇතැයි සැකකෙරෙන තේ නියැදි ක්ෂුද්‍රජීව විද්‍යා විශ්ලේෂණ ඒකකය මගින් හඳුනාගනී. සිය උපරිම ධාරිතාවය සහිතව ක්‍රියා කරන මෙම ඒකකය ප්‍රතිතන සහිත පරීක්ෂණ සහතික නිකුත් කිරීම මගින් ශ්‍රී ලංකා තේ කර්මාන්තය සඳහා සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කරනු ලබයි. 2017 වසරේදි මෙම ඒකකයේ සේවය කරණ දක්ෂ කාර්ය මණ්ඩලය විසින් පරීක්ෂණ 3524 ක (25% පමණ) නිරත වී ඇත. ඒ අනුව විශ්ලේෂණ රසායනාගාරයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට පත්වෙමින් මෙම ඒකකය 2017 වසරේදි රුපියල් 6,449,500.00 මුදලක් උපයා දී ඇත. පරීක්ෂණ කළ මුළු නියැදි ප්‍රමාණයෙන් නියැදි 1162 ක් පහත විස්තර කෙරෙන පරිදි ක්ෂුද්‍රජීවීමය වශයෙන් හානියට පත්වී ඇතැයි හඳුනාගෙන ඇත.

වගුව 3.20. ක්ෂුද්‍රජීවීමය වශයෙන් හානියට පත්වී ඇති නියැදි

| ක්ෂුද්‍ර විද්‍යා පරීක්ෂණ වර්ගය | ප්‍රමිතියෙන් / මාර්ගෝපදේශයෙන් පහළ (පරීක්ෂණ සංඛ්‍යාව) |
|---|---|
| මුළු ස්වායු ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය (Total Plate Count) | 348 |
| ඊස්ට් සහ දිලීර ප්‍රමාණය (Yeast and Mould) | 451 |
| කොලිෆෝම් (Coliform) | 350 |
| ඉ - කොලි (E-coli) | 13 |

ඉහත සඳහන් පරිදි අභ්‍යන්තර සහතිකකරණ සේවාව මගින් ප්‍රමිතියෙන් පහළ යැයි හඳුනාගත් / පරිභෝජනය සඳහා නුසුදුසු නියැදි විනාශ කර දමන අතර තේ මණ්ඩල නියාමන ක්‍රියාපටිපාටියට අනුව පද්ධතියෙන් ඉවත් කරයි“

### 3.5.4.3 රසායන විශ්ලේෂණ ඒකකයේ කාර්ය සාධනය

කළු තේ සහ හරිත තේ සඳහා තිබෙන ප්‍රමිතිකරණ 3720 සහ 11287 ජාත්‍යන්තර ප්‍රමිති වලට අනුව තේ නියැදිවල අවම ගුණාත්මක තත්වය ඇගයීම සඳහා විශ්ලේෂණය කර වාර්තා කිරීම පිණිස අනිවාර්ය වූ රසායන පරීක්ෂණ 07 ක් ඇත. 2017 වසර තුළදී රසායන විශ්ලේෂණ ඒකකය පරීක්ෂණ 2498 ක (17.8% පමණ) නියැලී ඇත. ඒ අතුරින් නියැදි 209 ක් ප්‍රමිතියෙන් පහළ ලෙස වාර්තාවී ඇත. අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඒ පිළිබඳව ප්‍රතිඵල තේ කොමසාරිස්වරයා වෙත යවනු ලැබීය. පසුගිය කාලපරිච්ඡේදයේ දි රසායන විශ්ලේෂණ ඒකකය සිය පරීක්ෂණ මගින් රුපියල් 1,653,500.00 ක මුදලක් උපයාගෙන ඇත. අවම ගුණාත්මක තත්වයන් සමග නොගැලපීම නිසා විනාශ කළ නියැදි පිළිබඳ විස්තර පහත සාරාංශ කොට ඇත.

වගුව 3.21: අවම ගුණාත්මක තත්වයන් සමග නොගැලපීම නිසා විනාශ කළ නියැදි

| රසයාන විද්‍යා පරීක්ෂණ වර්ගය | ප්‍රමිතියෙන් / මාර්ගෝපදේශයෙන් පහළ (පරීක්ෂණ සංඛ්‍යාව) |
|---|---|
| තේවල ඇති අපද්‍රව්‍ය කෙඳි ප්‍රමාණය අනාවරණය කිරීම | 151 |
| තේවල ඇති ජලයේ දියවන අළු ප්‍රමාණයේ භාෂ්මිකතාවය අනාවරණය කිරීම | 34 |
| සිලිකාමය ද්‍රව්‍ය - අම්ලවල දිය නොවන | 10 |
| සංරචක වැනි සීනි | 10 |
| වෙනත් දූෂිත දෑ | 04 |

### 3.5.4.4 තත්ත්ව පරීක්ෂණ ඒකකයේ කාර්ය සාධනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ යහපත් නිෂ්පාදන සහතිකකරණ ක්‍රමය සඳහා නැවිගත කළ තොග සහ මිශ්‍ර කළ එකතු නියැදි යටතේ ප්‍රභේද කොට සැක සහිත තේ ලෙස හඳුනාගත් ඒවා ක්ෂේත්‍ර නියැදිකරණය සඳහා විශ්ලේෂණ රසායනාගාරයේ පුහුණු තාක්ෂණික කාර්ය මණ්ඩලය මැදිහත්වීම මත සිදුවේ. සුදුසු තාක්ෂණික කාර්ය මණ්ඩලයක් විසින් විද්‍යාත්මක නියැදිකරණයේ යෙදිය යුතුයි. නියැදි ගොඩනැගීමේ නිරවද්‍යතාවය මත සියළුම රසායනාගාර පරීක්ෂණ ප්‍රතිඵලවල නිවැරදිබව රඳා පවතී. තේ කොමසාරිස් අංශයේ තේ නියැදි සැකසීමේ නිරත වන නිලධාරීන් එනම් තේ පරීක්ෂක, ප්‍රාදේශීය තේ සංවර්ධන නිලධාරීන්, සහකාර තේ කොමසාරිස්වරු සහ නියෝජ්‍ය තේ කොමසාරිස්වරු නිරන්තරව විශ්ලේෂණ රසායනාගාරය විසින් නම් කරන තාක්ෂණික නිලධාරියා (එනම් විශේෂ උපකරණ භාවිතා කළහැකි සහ නියැදිකරණයේ නිපුණ විශ්ලේෂක, තත්ත්ව කළමනාකරණ නිලධාරී හෝ තාක්ෂණික නිලධාරී) සමග එක්ව කටයුතු කරයි. 2017 වසර තුළදී විශ්ලේෂණ රසායනාගාරයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය විද්‍යාත්මක නියැදිකරණ / පුණර් නියැදිකරණ 34 ක ප්‍රමාණයක් සාර්ථකව සිදුකර ඇත.

### 3.6 පරිපාලන අංශය

පරිපාලන අංශය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සියළුම මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය කිරීමේ කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම පිළිබඳවත් තොරතුරු තාක්ෂණ සේවාවන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, මණ්ඩලයේ සැලසුම්කරණ කටයුතු, අධීක්ෂණ කටයුතු හා ඇගයීම් කටයුතු සම්බන්ධීකරණය සහ පහසුකම් සැපයීම පිළිබඳවත් සංඛ්‍යාලේඛන තොරතුරු බෙදාහැරීම සහ ශ්‍රී ලංකා තේ මණ්ඩල පුස්තකාලය පවත්වාගෙන යමින් තේ කර්මාන්ත පාර්ශ්වකරුවන්ට අවශ්‍ය තොරතුරු සේවාවන් සැපයීම, මණ්ඩලයේ නඩත්තු කටයුතු, ප්‍රවාහන පහසුකම් සැපයීමේ කටයුතු, ප්‍රසම්පාදන කටයුතු, ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු අධීක්ෂණය පිළිබඳවත් වගකීම් දරයි.

### 3.6.1 ශ්‍රී ලංකා තේ මණ්ඩල කාර්ය මණ්ඩලය

වගුව : 3.22 ශ්‍රී ලංකා තේ මණ්ඩල කාර්ය මණ්ඩලය - 2017 දෙසැම්බර් 31 දිනට

| ප්‍රවර්ගය | සේවක සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 01 | 5(1.7%) |
| තෘතීය මට්ටම | 38 | 25 | 63(22.6%) |
| ද්විතීයික මට්ටම | 51 | 91 | 142(50.9%) |
| ප්‍රාථමික මට්ටම | 63 | 06 | 69 (24.8%) |
| එකතුව | **156 (55.9 %)** | **123 (44.1 %)** | **279(100%)** |

වගුව 3.23 මානව සම්පත් බැහැර ගලනය - 2017

| විස්තර | සේවක සංඛ්‍යාව |
|---|---|
| ඉල්ලා අස්වීම | 10 |
| විශ්‍රාම ගැනීම් | 07 |
| සේවය නතර කිරීම | 00 |
| සේවය අතහැර යාම | 00 |
| එකතුව | **17** |

### 3.6.2 මානව සම්පත් සංවර්ධනය

වගුව 3.24 දේශිය පුහුණු (තනි පුද්ගල)

| ප්‍රවර්ගය | පුහුණු වූ සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 00 |
| තෘතීය මට්ටම | 29 |
| ද්විතීයික මට්ටම | 27 |
| ප්‍රාථමික මට්ටම | 16 |
| එකතුව | **72** |

### 3.6.3 ගෘහස්ථ පුහුණු වැඩසටහන - 2017

1. රජයේ ප්‍රසම්පාදන පටිපාටිය සහ ලංසු ඇගයීම පිළිබඳ වැඩමුළුව

මෙම ගෘහස්ථ පුහුණු වැඩසටහනේ අරමුණ වුයේ සහභාගි වුවන් සඳහා රජයේ ප්‍රසම්පාදන පටිපාටිය සහ ලංසු ඇගයීම පිළිබඳව වැදගත් මූලිකාංග හඳුනාගැනීමට සහාය වීමයි. 2017 පෙබරවාරි මස 17 වැනි දින පැවැත්වූ මෙම වැඩසටහන සඳහා කළමනාකරණ තලයේ (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ, මධ්‍යම කළමනාකරණ සහ කණිෂ්ඨ කළමනාකරණ) නිලධාරීන් 75 දෙනෙකු සහභාගි විය.

2. කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රම පිළිබඳ වැඩමුළුව

මෙම ගෘහස්ථ පුහුණු වැඩසටහනේ අරමුණ වුයේ සහභාගි වුවන් සඳහා කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රම පිළිබඳව වැදගත් මූලිකාංග හඳුනාගැනීමට සහාය වීමයි. 2017 පෙබරවාරි මස 22 වැනි දින පැවැත්වූ මෙම වැඩසටහන සඳහා කළමනාකරණ සහායක (තාක්ෂණික නොවන) කාර්ය මණ්ඩල සාමාජිකයන් 15 දෙනෙකු සහභාගි විය.

**විදේශීය පුහුණු**

වගුව 3.25 : විදේශීය පුහුණු

| ප්‍රවර්ගය | පුහුණු වූ සේවක සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 |
| තෘතිය මට්ටම | 00 |
| ද්විතියික මට්ටම | 12 |
| ප්‍රාථමික මට්ම | 00 |
| එකතුව | **13** |

### 3.6.4 තේ මණ්ඩල දිනය (සාමූහිකත්වය ගොඩනැගීමේ වැඩසටහන)

මෙම සාමූහිකත්වය ගොඩනැගීමේ වාර්ෂික වැඩසටහනේ අරමුණ වූයේ සහභාගිවන්නන් තුළ ඔවුන්ගේ සාමූහිකත්ව ගුණය තව තවත් වර්ධනය කිරීමට සහාය වීමයි. 2017 මාර්තු 25 දින වාද්දුවේ විලා ඕෂන් හෝටලයේ මෙම වැඩසටහනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සමස්ත කාර්ය මණ්ඩලයම සහභාගි විය.



### 3.6.5 සමාජ සත්කාර සේවා

2017 මැයි මස ගංවතුර සහ නායයෑම් මගින් අසරණ වූ තේ කර්මාන්තයේ නියැලි පුද්ගලයන් සඳහා සහන සේවා. තේ මණ්ඩලයේ කළමනාකාරිත්වය 2017 වසරේ මැයි මස දිවයිනේ ව්‍යාප්තව පැවති ආපදා තත්වය සැලකිල්ලට ගනිමින් ගංවතුර සහ නායයෑම්වලට හසුවූවන්, විශේෂයෙන්ම ආපදාවට පත්වූ කළුතර, රත්නපුර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල තේ මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්, තේ කර්මාන්ශාලාවල සේවකයන් සහ කුඩා තේ වතු හිමියන් අතර වියළි ආහාර බෙදාහරින ලදි. මේ සඳහා රුපියල් 5,828,219 ක මුදලක් වැය වී ඇත.

### 3.7 අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීමේ ස්වාධීන ඇගයීමේ කාර්යයක නිරත වන අභ්‍යන්තර විගණන අංශය කළමනාකරණයේ සියලුම මට්ටම් සඳහා සේවාවන් සපයනු ලැබේ. එය ආයතනයේ සම්පත් මනා ලෙස කාර්යක්ෂමව උපයෝගි කරගැනීමට දායකත්වය ලබා දෙමින් මූල්‍ය හා මූල්‍ය නොවන අභ්‍යන්තර පාලනයන් පිළිබඳ මිනුම් කරන, ඇගයීම් කරන සහ වාර්තා කරන පාලන ක්‍රමයකි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විගණන කමිටුව මගින් 2017 වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කරන ලද අතර අභ්‍යන්තර විගණන කාර්යයන්හි ස්වාධීනත්වය, අරමුණු සහගත බව, කාර්යසාධනය සහ එහි පවත්නා සම්පත්වල ප්‍රමාණවත් බව පිළිබඳව සමාලෝචනය කරන ලදි. කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සහ එම වාර්තා මගින් ඉදිරිපත් කරන ලද විගණන අනාවරණයන් සඳහා අවධානම් මට්ටම් මත පදනම්ව ප්‍රමුඛතාව ලැබිණි. අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් 2015 සහ 2016 වසර සඳහා ගිණුම් පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාවෙහි අන්තර්ගතයන් සඳහා ලබා දුන් පිළිතුරු ද කමිටුව සමාලෝචනය කරන ලදි.

සමාලෝචිත වසර තුළදී විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලද අතර අවශ්‍යතාවය මත අදාළ අංශ ප්‍රධානීන් / නිලධාරීන් කමිටු රැස්වීම්වලට සහභාගි විය. එහිදී ගනු ලැබූ තීරණ, සාකච්ඡා සටහන් සහ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර යෝග්‍ය සුදුසු නිවැරදි පියවර ගන්නේ දැයි සහතික කරගැනීම සඳහා පසු විපරම්වලද යෙදුනි.

### 3.8 තොරතුරු තාක්ෂණ අංශය

ලංකා තේ වසර 150 සැමරීම සිදු කළ 2017 වසර ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අමතක නොවන වසරකි. මෙම සැමරීමට සමාන්තරව තොරතුරු තාක්ෂණ අංශය රංඳිය සේයා නමින් ඡායාරූප තරඟයක් සහ ප්‍රදර්ශනයක් නෙළුම් පොකුණ රංග ශාලාවේදී පැවැත්විය. විශේෂයෙන්ම තේ සඳහාම වෙන්වුණු මෙවැනි ඡායාරූප තරඟයක් සහ ප්‍රදර්ශනයක් පැවැත්වූයේ ඉතිහාසයේ පළමු වතාවටය. තවදුරටත් සමාජ මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරයක් ද සංවිධානය කළ අතර විශ්වාස කළ නොහැකි තරමින් ධනාත්මක අදහස් සහ ඇගයීම් ලැබූ යූ ටියුබ් වීඩියෝ සහ එෆ් බී පෝස්ට් සහිත ප්‍රධාන පෙළේ සමාජ මාධ්‍ය ආවරණය කරමින් ලංකා තේ වසර 150 සැමරීම ප්‍රචාරය විය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සේවකයින් සඳහා ස්ථාවර සහ අඛණ්ඩ අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයක් ලබාදීම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවය ඉහළ තත්වයට ගෙන එමින් අධිවේගී ෆයිබර් සම්බන්ධතාවයක් ඇති කරන ලදි. තවදුරටත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආරක්ෂක සහ අධීක්ෂණ කාර්යයන් දියුණු කිරීම සඳහා CCTV ප්‍රතිසම සංඥා කැමරා පද්ධතිය වෙනුවට CCTV IP කැමරා පද්ධතියක් ස්ථාපිත කරන ලදි.

2017 වසරේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් තේ ඇගයීම් දාම පද්ධතියේ ශක්‍යතා අධ්‍යයනය ඇරඹීම, තේ ඉඩම් ලියාපදිංචි පද්ධතිය, තේ පරීක්ෂක මොඩියුලය මාර්ග අපගත කිරීම සහ නව මානව සම්පත් පද්ධතියේ වැඩිදියුණුව සඳහා පියවර ගැනීම වැනි ව්‍යාපෘති බොහෝමයකට මුලපිරිය.

අභ්‍යන්තර තොරතුරු පද්ධතිය සඳහා ආරක්ෂිත සහ වේගවත් ධාරක වේදිකාවක් සැපයීම සඳහා අධි බලැති සර්වරයක් ස්ථාපිත කළ අතර සියළුම ප්‍රධාන තොරතුරු පද්ධති සංක්‍රමණය විය.

Sri Lanka Tea Board

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2017 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | F | 829,161,619 | 813,201,842 |
| ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම් | G | 9,862,034 | 23,113,785 |
| අස්පෘශ්‍ය වත්කම් | H | 16,981,727 | 12,347,345 |
| | | 856,005,379 | 848,662,972 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | I | 25,014,407 | 35,538,627 |
| වෙළඳ සහ අනෙකුත් ලැබියයුතු දෑ | J | 46,174,062 | 33,230,237 |
| තැන්පතු සහ පෙර ගෙවුම් | K | 61,388,571 | 53,015,712 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | L | 6,353,072,570 | 6,139,953,803 |
| ණය | M.(1) | 1,374,763,479 | 1,123,463,950 |
| මුදල් සහ මුදල් සමාන වස්තු | M | 290,531,715 | 65,406,603 |
| | | 8,150,944,804 | 7,450,608,932 |
| **මුළු වත්කම්** | | **9,006,950,183** | **8,299,271,903** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| දායක ප්‍රාග්ධනය | | 672,012,202 | 672,012,202 |
| රඳවා ගත් ඉපැයුම් | | (172,191,903) | (267,880,212) |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්ධ | N | 6,806,198,361 | 5,794,718,308 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 508,216,543 | 508,216,543 |
| **මුළු හිමිකම්** | | 7,814,235,203 | 6,707,066,841 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැඳීම් | O | 52,857,507 | 63,623,185 |
| බැංකු ණය | P | 344,669,271 | 676,300,000 |
| | | 397,526,778 | 739,923,185 |
| **ජංගම වගකීම්** | | | |
| දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් | Q | 156,397,653 | 110,361,032 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | R | 417,644,722 | 733,427,052 |
| බැංකු ණය | | 217,685,862 | - |
| බැංකු අයිරාව | S | 3,459,964 | 8,493,793 |
| | | 795,188,201 | 852,281,877 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **9,006,950,183** | **8,299,271,903** |

පිටු අංක 81 සිට 87 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 88 සිට 95 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,


.......................
අධ්‍යක්ෂක මුදල්


.......................
අධ්‍යක්ෂ ජෙනරාල්


.......................
සභාපති


.......................
අධ්‍යක්ෂක

Sri Lanka Tea Board

## ආදායම් සහ වියදම් ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| ආදායම | A | 554,825,938 | 444,769,549 |
| වියදම් | | | |
| තේ ක්ෂේත්‍ර සංවර්ධන පිරිවැය | B | (128,769,009) | (86,381,964) |
| පරිපාලන වියදම් | C | (351,504,928) | (364,205,491) |
| මෙහෙයුම් අතිරික්තය / (හිඟය) | | 74,552,001 | (5,817,906) |
| මූල්‍ය වියදම් | D | (80,863,240) | (35,223,182) |
| මූල්‍ය ආදායම් | E | 109,265,725 | 54,715,509 |
| බදුකරණයට පෙර අතිරික්තය / (හිගය) | | 102,954,486 | 13,674,421 |
| පොළී ආදායම මත ගෙවූ බදු | Q | (12,986,594) | (8,996,887) |
| බදුකරණයට පසු අතිරික්තය / (හිගය) | | 89,967,892 | 4,677,534 |

පිටු අංක 81 සිට 87 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 88 සිට 95 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

Sri Lanka Tea Board

## වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| කාලපරිච්ඡේදය තුළ මෙහෙයුම් අතිරික්තය / (හිඟය) | 89,967,892 | 4,677,534 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | 3,354,903 | - |
| කාලපරිච්ඡේදය තුළ බදු පසු, මුළු විස්තීර්ණ ආදායම් | **93,322,795** | **4,677,534** |

පිටු අංක 81 සිට 87 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 88 සිට 95 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

Sri Lanka Tea Board

## හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය රු. | ප්‍රවර්ධන හා අලෙවි බද්ධ රු. | ප්‍රත්‍යාගණක සංචිත රු. | සමුච්චිත ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | **672,012,202** | **5,512,853,782** | **481,933,543** | **(272,557,746)** | **6,394,238,781** |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන N) | - | 281,864,526 | - | - | 281,864,526 |
| රඳවාගත් ඉපැයුම් | - | - | 26,283,000 | - | 26,283,000 |
| 2016 වර්ෂය තුළ අතිරික්තය | - | - | - | 4,677,534 | 4,677,534 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | **672,012,201.85** | **5,794,718,308** | **508,216,543** | **(267,880,212)** | **6,707,066,841** |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | **672,012,201.85** | **5,794,718,308** | **508,216,543** | **(267,880,212)** | **6,707,066,841** |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන N) | - | 1,011,480,054 | | - | 1,011,480,054 |
| 2017 වර්ෂය තුළ අතිරික්තය | | | | 93,322,795 | 93,322,795 |
| ගැළපුම් | | | | 2,365,514 | 2,365,514 |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | **672,012,202** | **6,806,198,361** | **508,216,543** | **(172,191,903)** | **7,814,235,203** |

පිටු අංක 81 සිට 87 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 88 සිට 95 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

Sri Lanka Tea Board

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය** | **93,322,795** | **4,677,534** |
| ගැළපුම් | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම. | 33,208,490 | 31,770,939 |
| දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලද ලාභය හෝ පාඩුව | 6,175,510 | 220,158 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරිම. | 1,251,847 | 2,966,119 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරිම. | 822,109 | 900,611 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | (3,354,903) | 18,663,915 |
| මූල්‍යමය වියදම් | 80,863,240 | 35,223,182 |
| මූල්‍යමය ආදායම් | (109,265,725) | (54,715,509) |
| ගැළපුම් | 2,912,202 | - |
| බදුකරණය සඳහා ප්‍රතිපාදන | 279,688,477 | 191,743,401 |
| | 292,301,247 | 226,772,816 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **385,624,042** | **231,450,350** |
| භාණ්ඩ තොග අඩුවීම/ (වැඩිවීම) | 10,524,220 | (968,168) |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම/ (වැඩිවීම) | (12,943,825) | (2,720,851) |
| තැන්පතු සහ පෙරගෙවුම් අඩුවීම/ (වැඩිවීම) | (8,372,859) | 67,912,493 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ අඩුවීම/ (වැඩිවීම) | (315,782,330) | 467,473,492 |
| ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා ණය | (251,299,529) | (631,367,450) |
| | (577,874,324) | (99,670,484) |
| **මෙහෙයුම් කටයුතුවලින් ඉපැයූ මුදල්** | **(192,250,282)** | **131,779,866** |
| පාරිතෝෂික ගෙවීම් | (7,410,775) | (10,603,568) |
| බදුකරණය | (233,651,856) | (171,414,734) |
| **ප්‍රවර්ධන කටයුතු සඳහා ශුද්ධ වියදම්** | 1,011,480,054 | 281,867,527 |
| **මෙහෙයුම් කටයුතු වලින් ඉපැයූ ශුද්ධ මුදල** | **770,417,422** | **99,849,225** |
| **මෙහෙයුම් කටයුතු වලදි (භාවිත) මුදල් ප්‍රවාහය** | **578,167,141** | **231,629,091** |
| **ආයෝජන කටයුතු වලදි (භාවිත) මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලද මුදල | 8,490,954 | 39,890 |
| මූල්‍ය ආදායම් | 109,265,725 | 54,715,509 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනිම | (6,896,000) | (2,019,775.00) |
| දේපළ, පිරියත උපකරණ අත්පත් කරගැනිම | (50,942,005) | (122,463,412) |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ධ ඇතුළු ආයෝජන | (213,118,767) | (889,325,349) |
| ආයෝජන කටයුතු වලදි භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහය | **(153,200,093)** | **(959,053,137)** |
| මූල්‍ය කටයුතු වලදි භාවිත මුදල් ප්‍රවාහය | | |
| මූල්‍යමය වියදම් | (80,863,240) | (35,223,182) |
| බැංකු ණය | (113,944,867) | 676,300,000 |
| මුදල් කටයුතු වලදි (භාවිත) ශුද්ධ මුදල් ප්‍රවාහය | **(194,808,107)** | **641,076,818** |
| මුදල් හා මුදල් සමාන වස්තු වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | **230,158,941** | **(86,347,228)** |
| වර්ෂය ආරම්භයේ දි මුදල් හා මුදල් සමාන වස්තු | **56,912,810** | **143,260,038** |
| වර්ෂය අවසානයේ දි මුදල් හා මුදල් සමාන වස්තු | **287,071,751** | **56,912,810** |

පිටු අංක 81 සිට 87 දක්වා තිබෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 88 සිට 95 දක්වා තිබෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ වල අනුකලන අංගයකි.

**ශ්‍රී ලංකා තේ මණ්ඩල**
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

1. සංස්ථාපිත තොරතුරු
   සාමාන්‍ය කරුණු

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය ස්ථාපිත කරන ලදි. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 574, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස 12 ක කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන අතර මෙම මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.03.06 දින අනුමත කරනු ලැබීය.

**ප්‍රධාන කාර්යයන්**

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අභිමතාර්ථ වේ. තේ නිෂ්පාදනය, අලුත් ප්‍රදේශවල තේ වගාකිරීම සහ තේ නැවත වගා කිරීම, පැරණි තේ වතු පුනරුත්ථාපනය කිරීම, තේ කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් යන තේ කර්මාන්තය ආශ්‍රිත කටයුතු නියාමනය කිරීම පිළිබඳ වගකීම දරනුයේද ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. තවද තේ වෙන්දේසි පැවැත්වීම නියාමනය කිරීම, ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීම සහ විකුණුම් නියාමනය කිරීම, අපනයන තැරැව්කරුවන්, ගබඩා සහ තේ නැව්ගත කිරීම ආදි කටයුතු නියාමනය කිරීම ද එමගින් සිදුකරනු ලබයි. තේ වතු පාලනයේ සහ තේ නිෂ්පාදනයේ සහ අලෙවිකරණයේ නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීමද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

2. **පිළියෙල කිරීම සඳහා පදනම**

2.1 **පිළියෙල කිරීමේ පදනම** සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර.) අනුගමනය කිරීම 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අදාළ වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර. වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත.

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය ද ඇතුළුව ඒ දක්වා වූ සියලුම කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එහි මූල්‍ය වාර්තා 2011 දෙසැම්බර් 31 දින දක්වා බලපැවැත්වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට අනුකූලව පිළියෙල කොට ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පිළියෙල කරන ලද මෙම මූල්‍ය වාර්තා 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන කාලපරිච්ඡේදය සඳහා බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද පළමු වාර්තා වේ.

**2.2 ගණනය කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

3. **වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය**

3.1 **වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් භාවිත කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

**3.2 දේපළ, පිරියත සහ උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ කිසියම් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු වෙතොත් ඒවා හැර පිරිවැයට දක්වනු ලැබේ. එම පිරිවැය යන්නට දේපළ, පිරියත සහ උපකරණවල උපාංග කොටස් ප්‍රතිෂ්ඨාපනය කිරීම් සඳහා දරනු ලබන පිරිවැය සහ හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් දීර්ඝකාලීන ඉදිකිරීම් සඳහා අදාළ වන ණය පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් වරින්වර ප්‍රතිස්ථාපනය කිරීමට

අවශ්‍ය වන විටදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපිත උපාංග හඳුනා නොගන්නා අතර නව කොටස් ඒවායේ සඵල ආයු කාලය හා ක්ෂයවීම මත හඳුනාගනී. එසේම ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරන අවස්ථාවකදී එහි පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් ප්‍රතිෂ්ඨාපනයක් වශයෙන් පිරියත සහ උපකරණවල ධාරණ අගය මත හඳුනාගනී. අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශයෙහි දරන ලද පිරිවැයක් වශයෙන් හඳුනාගනී.

### 3.3 ක්ෂයවීම්

ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ සමානුපාතික පදනම මතය. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | අවුරුදු 50 |
| කාර්යාල උපකරණ | අවුරුදු 02 - 20 |
| ලිබඩු සහ සවිකුරු | අවුරුදු 01 - 20 |
| මෝටර් රථ | අවුරුදු 10 |
| පරිගණක උපාංග | අවුරුදු 05 |
| පුස්තකාල පොත් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 03 - 10 |

ඇතැම් වත්කම් මේ වනවිටත් සුන්බුන් අගයක තත්වයට පත්ව ඇත. නමුත් ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඒවා තවමත් භාවිතා කරයි. තක්සේරු දෙපාර්තමේන්තුව මෙම වත්කම් නැවත ඇගයීමට පියවර ගෙන ඇත.

### 3.4 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වර්ෂය තුළදී දරන ලද ශේෂ පත්‍ර දිනය වන විට ප්‍රාග්ධනිත කර නොමැති ප්‍රාග්ධන පිරිවැය කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වනු ලබන අතර වර්ෂය තුළදී ප්‍රාග්ධනිත කර භාවිතයට ගෙන ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණවලට මාරු කරනු ලැබේ.

### 3.5 බදු ඉඩම්

ආරම්භක දිනය වන විට ගිවිසුමෙහි සඳහන් කරුණු මත පදනම් වන බදු ගිවිසුමක් ද, ගිවිසුම සපුරාලීම නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කරන අයුරු මත රඳා පවතිද යන්න හා ගිවිසුමේ නිශ්චිතවම වත්කම් භාවිතය සඳහා වන අයිතිය පිළිබඳ සඳහන් කර නොමැති වුවද වත්කම් භාවිතය සඳහා ගිවිසුම මගින් අයිතිය පවරනු ලබයිද යන කරුණු නිශ්චය කෙරේ. බදු වත්කම්වල ඇස්තමේන්තුගත සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

බදු ඉඩම් - අවුරුදු 50යි

### 3.6 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේ පිරිවැය මත ගණනය කරනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව පිරිවැය අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂයට සහ කිසියම් සමුච්චිත හානි පාඩු වෙතොත් ඒ මත අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තර වශයෙන් උත්පාදිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර පිරිවැය දරනු ලබන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය තුළ පිරිවැය දක්වනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

පරිගණක මෘදුකාංග - අවුරුදු 15යි

### 3.7 මූල්‍ය නොවන වත්කම් හානිවීම්

සෑම වාර්තාකරණ දිනයක් වන විට වත්කමක් හානිවන බවට යම් සඳහනක් තිබේද යන්න පිළිබඳව ශ්‍රී ලංකා තේ මණ්ඩලය තක්සේරු කරයි. එබඳු කිසියම් සඳහනක් තිබේනම් හෝ කිසියම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානි පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය වේ නම් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමෙහි අයකරගත හැකි වටිනාකම තක්සේරු කරනු ලබයි. වත්කමක හෝ මූල්‍ය උත්පාදන ඒකකයක විකුණුමට පිරිවැය අඩුකළ සාධාරණ අගය සහ එහි භාවිත අගය වූ කලී වත්කමක අයකරගත හැකි ඉහළම අගය වන අතර වත්කමක් අනෙකුත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් විශාල වශයෙන් ස්වාධීනව මුදල් ප්‍රවාහයක් උත්පාදනය නොකරන්නේ නම් මිස එම වත්කම කේවල වත්කමක් ලෙසට තීරණය කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවා යනවිට වත්කම හානිවූවා සේ සලකනු ලබන අතර එහි අයකරගත හැකි අගයට අඩුකරනු ලැබේ. භාවිතයේ වටිනාකම තක්සේරු කිරීමේදී වත්කමේ නිශ්චිත අවධානම සහ මුදල්වල කාලීන වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළඳපොල තක්සේරුව පිළිබිඹු කරන බදු පූර්ව මට්ටම් අනුපාතයක් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහය වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකුණුමට පිරිවැය අඩුකළ සාධාරණ අගය නිශ්චය කිරීමේදී මෑතකාලීන වෙළඳපොල ගනුදෙනු වෙතොත් ඒවා සැලකිල්ලට ගනු ලබන අතර එවැනි ගනුදෙනු හඳුනාගැනීමට නොහැකි වුවහොත් යෝග්‍ය තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් භාවිත කරනු ලැබේ.

### 3.8 බදුකරණය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට සහ සංශෝධනවලට අනුව 28%ක අනුපාතයක පොළී ආදායම සඳහා පමණක් ආදායම් බදු ගෙවීමට බැඳී සිටියි. එමෙන්ම එම පනතේ 61 (ඇ) කොටසට අනුව ලාභාංශ බදු ගෙවීමට බැඳි ඇත.

බදු සහ බදු ගෙවීම් සඳහා ප්‍රතිපාදන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (O) වල සඳහන් වේ.

### 3.9 භාණ්ඩ තොග

පළමු ගැනුම් පළමු නිකුතු පදනම යටතේ යල්පැනගිය සහ අඩු චලනයක් සහිත අයිතම සඳහා නියමිත දීමනා ගෙවීමෙන් අනතුරුව භාණ්ඩ තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන් දෙකෙන් අඩු අගය මත හඳුනාගනී.

### 3.10 මුදල් සහ මුදල් සාමයයන්

මුදල් සහ මුදල් සාමයයන්, අතැති සහ බැංකුවේ ඇති මුදල් සහ අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ.

### 4. වගකීම් සහ ප්‍රතිපාදන

### 4.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### 4.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය බැඳී සිටි. සේවකයෙකුට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් වගකීමක් ඇති වන්නේ එකී සේවකයා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අඛණ්ඩව වසර පහක සේවා කාලයක් සපුරන්නේ නම් පමණි. මෙම වගකීම සපුරාලීම සඳහා ශේෂ පත්‍රය තුළ ප්‍රතිපාදන ඉදිරියට රැගෙන එනු ලැබේ. වර්ෂය ආරම්භයේදි ඉදිරියට රැගෙන ආ ප්‍රතිපාදනයේ සහ වර්ෂය අවසානයේදි ඉදිරියට රැගෙන ගිය ශේෂය අතර වෙනස සම්බන්ධයෙන් වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේදි කටයුතු කරනු ලැබේ.

ගණනයේදි භාවිත කරනු ලබන ප්‍රධාන උපකල්පන පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප් වර්ධක අනුපාතය | - | 1.01% සිට 1.03% |
| වට්ටම් අනුපාතය/ පොලි අනුපාතය | - | 12.16%කාර්ය මණ්ඩල |
| පිරිවැටුම් සාධකය | - | 6% |

මෙම වගකීම සඳහා බාහිරින් අරමුදල් සැපයීමක් සිදු නොවේ. මෙය ශේෂ පත්‍රය තුළ ජංගම නොවන වගකීම් යටතේ ඛාණ්ඩගත කරනු ලැබේ.

### 4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් සපයයි. සේවකයින් ආවරණය වන සැලසුම්වලට දායක මුදල් සැපයීමේ බැඳීම් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගනී.

**සේවක අර්ථසාධක අරමුදල**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා සේවකයින් විසින් සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 15% ක් හා 10%ක් අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

**සේවක භාරකාර අරමුදල**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සේවක දළ වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

### 5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා පිරිවැය ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වය සංස්ථාපිත කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනය වන පරිදි අනුගමනය කරනු ලැබේ.

**රජයේ ප්‍රදාන**

ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ පවත්නා රජයේ ප්‍රදාන සංවර්ධන සහනාධාර ගෙවීම සහ ගංවතුරෙන් හානියට පත් තේ කර්මාන්ත ශාලාවලට වන්දි ගෙවීම සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කෙරේ. පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ පවත්නා රජයේ ප්‍රදාන සේවකයින්ට වැටුප් ගෙවීම සඳහා භාවිත කෙරේ.

### 5.1 ආදායම් හඳුනාගැනීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා යා හැකි ප්‍රමාණයට සහ ගෙවීම් සිදුකිරීමේදී ඒ පිළිබඳ නොසලකා ආදායම විශ්වසනීය ලෙස ගණනය කළ ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ගිවිසුම්ගත නිශ්චිත ගෙවීම් පිළිබඳ නියමයන් සැලකිල්ලට ගෙන ලැබුණු හෝ ලැබිය යුතු මුදල්වල සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ“

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායකයන් ද සපුරාලිය යුතුය.

**භාණ්ඩ විකිණීම**

සාමාන්‍යයෙන් භාණ්ඩ සැපයීමේදී භාණ්ඩ හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ භාණ්ඩ ගැනුම්කරු වෙත හිමිවන අවස්ථාවේදී භාණ්ඩ විකිණීමෙන් ලබන ආදායම හඳුනාගනී.

**සේවා සැපයීම**

සේවය සැපයූ හෝ ඉටුකරනු ලැබූ කාලපරිච්ඡේදයේදී සේවා සැපයීමෙන් ලබන ආදායම හඳුනාගනී“

**වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත ළුනාගනී.

**පොලී ආදායම්**

සියලුම මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන අතර පොලී දරන මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. පොලී ආදායම හෝ වියදම මූල්‍ය වත්කමේ අපේක්ෂිත ආයුකාලය හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් උචිත පරිදි මූල්‍ය වත්කමේ හෝ ශුද්ධ ධාරණ අගයට වට්ටම් කරනු ලබන සැබෑ අනුපාතය වන ඵලදායී පොලී අනුපාතය භාවිත කරමින් වාර්තා කරනු ලැබේ. පොලී ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමක් ලෙස දක්වනු ලැබේ.

### 5.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආදායමට එක්කර ඇත. අලුත්වැඩියා සහ අලුත්කිරීම් එම වියදම දරන ලද වර්ෂය තුළදී ආදායමට හා වියදමට ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මොස්කව්, එක්සත් අරාබි එමිර් රාජ්‍ය සහ චීනයෙහි විදේශීය කාර්යාල තුනක් පවත්වාගෙන යනු ලබයි. ඒවායෙහි නිලධාරීන් තිදෙනාට වැටුප් ගෙවීම්වලට අමතරව සියළුම දීමනා 2017 වසරේ සිට එක් එක් ඒකකවල නඩත්තු වියදම් ලෙස ප්‍රවර්ධන හා අලෙවි බදු යටතේ පවත්වාගෙන යනු ලබයි.

### 6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසු ගණනය කිරීම්

### 6.1 මූල්‍ය වත්කම්

### 6.1.1 මූලික හඳුනා ගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභ හා පාඩු, ණය සහ ලැබිය යුතු, පරිනතිය සඳහා තබා ඇති ආයෝජන සහ විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම් වශයෙන් වර්ග කරනු ලබන අතර මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ.
සියලුම මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට නොමැති කල්හි සෘජුවම ගණුදෙනු පිරිවැයට හඳුනාගැනේ.
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය වත්කම් යන්නට මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සහ කාර්යමණ්ඩල ණය සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

### 6.1.2 පසු ගණනය කිරීම්

මූල්‍ය වත්කම්වල පසු ගණනය කිරීම් පහත සඳහන් පරිදි ඒවායේ වර්ගකිරීම් මත පදනම් වේ.

#### 6.1.2.1 මූල්‍ය වත්කම් අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට ගණනය කිරීම

අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් යන්නට වෙළඳාම සඳහා තබාගන්නා ලද මූල්‍ය වත්කම් සහ මූලික හඳුනාගැනීම මත අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් ලෙස තිරණය කරන ලද වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් විකිණීම සඳහා හෝ ආසන්න කාලයේදී නැවත මිලදී ගැනීම සඳහා ඇතුළත් කරගන්නේ නම් ඒවා වෙළඳාම සඳහා ලබාගන්නා ලද වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුව පරිනත වීම සඳහා තබා ගන්නා ලද ආයෝජන නොතිබුණි.

### 6.1.2.2 ආයෝජන පරිනතිය සඳහා තබා ගැනීම

ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර පරිනතයන් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පරිනත වීම සඳහා තබාගැනීම පිණිස සාධනීය අභිප්‍රායක් සහ ශක්‍යතාවක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වන විට පරිනතිය සඳහා තබාගන්නා ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව එවැනි මූල්‍ය වත්කම් පසුව ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් හානිවීම් අඩුකළ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. කිසියම් වට්ටමක් හෝ අත්පත් කරගැනීමක් මත වන වාරික සහ ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදයේ අවියෝජනීය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය වේ නම් ඒ පිළිබඳ සැලකිල්ල යොමුකොට ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය මත ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම්වල ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුළින් සිදුවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනී.

### 6.1.2.3 මූල්‍ය ආයෝජන විකිණීම සඳහා තැබීම

විකිණීම සඳහා තබන මූල්‍ය ආයෝජන යන්නට හිමිකම් සහ ණය සුරැකුම් ඇතුළත් වේ. විකිණීම සඳහා තබන ලදැයි වර්ගීකරණය කරන ලද හිමිකම් ආයෝජන යනු වෙළඳාම සඳහා තබන ලදැයි වර්ගීකරණය නොකරන ලද සහ අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට ගණනය නොකරන ලද ආයෝජනයන්ය. මෙම කාණ්ඩයේදී ණය සුරැකුම් යනු අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තබාගැනීමට අපේක්ෂා කරන ද්‍රවශීල අවශ්‍යතා හෝ වෙනස් වන වෙළඳපොල තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් විකිණිය හැකි දෑය.

මූලික ගණනය කිරීම්වලින් අනතුරුව විකිණීම සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන පසුව අනෙකුත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනාගනු ලබන උපලබ්ධි නොවූ ලාභ හා පාඩු සහිත සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. විකිණීම් සඳහා තබා ඇති ණය සුරැකුම් මත පොලී ගණනය කිරීම ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් සිදුකරනු ලබන අතර අතිරික්තය හා හිඟය තුළ හඳුනා ගැනේ. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂ තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුව විකිණීම සඳහා තබන ලද මූල්‍ය ආයෝජන නොතිබුණි.

### 6.1.2.4 හඳුනා නොගැනීම

මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ මූල්‍ය වත්කම්වලට සමාන බාණ්ඩයක කොටසක්) පහත සඳහන් අවස්ථාවලදී හඳුනා නොගැනේ.

I. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය අවසන් වී ඇතිවිට

ii. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය පවරනු ලැබ ඇතිවිට හෝ හුවමාරු ගිවිසුමක් යටතේ සැලකියයුතු තරමේ ප්‍රමාදයකින් තොරව ලැබී ඇති මුදල් ප්‍රවාහ තෙවන පාර්ශවයකට ගෙවීම සඳහා බැඳීමක් භාරගෙන ඇතිවිට සහ

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ ඇතිවිට හෝ

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ හෝ රඳවාගෙන නොමැති වුවත් වත්කමේ පාලනය පවරනු ලැබ ඇතිවිට.

### 6.1.2.5 මූල්‍ය වත්කම් හානිවීම්

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සෑම වාර්තාකරණ දිනයක් වනවිට මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් බාණ්ඩයක් හානිවී ඇති බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේද යන්න පිළිබඳ තක්සේරු කරයි. වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිදුවීමක් හෝ සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් හානිවීම සිදුවී ඇති බවට සහ විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවලට එකී පාඩු සිදුවීම බලපෑමක් එල්ල කර ඇති බවට වාස්තවික සාක්ෂියක් තිබේනම් පමණක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවූවා සේ සලකනු ලැබේ.

හානිවීමක් සිදුවී ඇති බවට වන සාක්ෂි යන්නට ණයගැතියන් හෝ ණයගැතියන් කණ්ඩායමක් මූල්‍ය දුෂ්කරතාවයකට, ගෙවීම් හෝ රාජකාරී පැහැරහැරීම්වලට ලක්වී ඇති බවට, ඔවුන් බංකොලොත් භාවයට පත්වීමට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයකට ලක්වීමට ඉඩ ඇති බවට සහ පැහැරහැරීම් හා සම්බන්ධ හිඟ මුදල් හෝ ආර්ථික තත්ත්වයන් වෙනස්වීම වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ ගණනය කළ හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත මඟින් පෙන්නුම් කරන කරුණු ඇතුළත් වේ.

### 6.1.2.6 මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කිරීම

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කිරීමේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය පළමුව කේවල වශයෙන් වැදගත්කමක් ගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හානිවීම් පිළිබඳ වෙනම සාක්ෂි පවතිද යන්න හෝ කේවල වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් වාස්තවික සාක්ෂි පවතිද යන්න පිළිබඳ තක්සේරු කරයි. කේවල වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිවීම් සම්බන්ධයෙන් වාස්තවික සාක්ෂි නොමැති බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය තිරණය කරනු ලැබුවහොත් වැදගත් වුවද නොවුවද එම වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ පවතින මූල්‍ය වත්කම් සමූහයක් තුළට ඇතුළත් කරනු ලබන අතර ඒවා හානිවීම් සඳහා සාමූහික වශයෙන් තක්සේරු කරයි.
හානි පාඩුවක් පවතින බවට හෝ අඛණ්ඩව පවතින බවට හඳුනාගන්නා ලද හානිවීම් සඳහා කේවල වශයෙන් තක්සේරු කරනු ලබන වත්කම් සාමූහික හානිවීම් තක්සේරුව සඳහා ඇතුළත් නොකරයි.
හානි පාඩුවක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂි පවතිනම් එම පාඩුවේ ප්‍රමාණය වත්කම්වලට ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ (මෙතෙක් සිදුවී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය පාඩු හැර) අතර වෙනස වශයෙන් ගණනය කරනු ලැබේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමේ මූලික ඵලදායී පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ.

### 6.2 මූල්‍ය වගකීම්

#### මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් උචිත පරිදි ලාභ හා පාඩු තුළින් සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වගකීම්, ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වගකීම් හෝ ඵලදායී ඉදිරි රැකුමක් තුළ ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය එහි මූල්‍ය වගකීම්ව වර්ගීකරණය ඒවායේ මූලික හඳුනාගැනීමේදී තිරණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර ණය සහ ණය ගැනීම් සම්බන්ධයෙන් වන කල්හි ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරයි. සෘජුව ආරෝපණය කළ හැකි ගණුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය වගකීම් යන්නට වෙළඳ සහ අනෙකුත් ගෙවීම් ඇතුළත් වේ.

#### පසු ගණනය කිරීම්

මූල්‍ය වගකීම්වල පසු ගණනය කිරීම් ක්‍රමක්ෂය පිරිවැයට සිදු කරනු ලැබේ.

#### හඳුනා නොගැනීම

වගකීම් යටතේ වන බැඳීම් ඉවත් වන, අවලංගු වන හෝ අවසන් වන විට මූල්‍ය වත්කමක් හඳුනා නොගනී.

## 7. බැරකම් සහ ප්‍රතිපාදන

1. වර්ෂය තුළදී බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් අසන ලද නඩුවකදී රු. 15,556,355 ක මුදලක් ගෙවන ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලයට එරෙහිව තීන්දුවක් ලබාදෙන ලදි. කෙසේ නමුත්, මෙම තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර නඩුව තවදුරටත් ක්‍රියාත්මක වේ.

2017 දෙසැම්බර් 31 දින වන විට ඉහත නඩුව ද ඇතුළුව ආයතනයට එරෙහිව ඇති නඩු සම්බන්ධයෙන් නීති සභාව ශ්‍රී ලංකා තේ මණ්ඩලයට උපදෙස් දී තිබුණේ බොහෝවිට එම නඩුවලින් තේ මණ්ඩලයට වාසිදායක විය හැකි බවයි. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශයේ ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැත.

2. ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් සහ වෙනත් පාර්ශවයන්ගෙන් එක්ව සහ හෝ වෙන් වෙන්ව රුපියල් 756,077.35 ක මුදලක් ඉල්ලා ඇත. ශේෂ පත්‍රයේ දිනට නඩු තීන්දුව ලැබී නොතිබුණි.

3. අවිධිමත් ලියාපදිංචිය නිසා රුපියල් 1,143,600ක අයකිරීමක් ඉල්ලා ඇත (බදු ඇතුළුව). ශේෂ පත්‍රයේ දිනට නඩුතීන්දුව ලැබී නොතිබුණි. අමතරව, මූල්‍යමය වගකීම සඳහා බලපෑමක් නොවිය හැකි නඩු 07 කට වඩා වූ ප්‍රමාණයක තීන්දු අවසන් වී නොමැත.

## 8. අදාළ පාර්ශව ගණුදෙනු

### 8.1 රාජ්‍ය සහ රාජ්‍ය පාලනය යටතේ පවතින ආයතන සමග ගණුදෙනු

ශ්‍රී ලංකා තේ මණ්ඩලය එහි සාමාන්‍ය මෙහෙයුම් කටයුතුවලදි අදාළ පාර්ශ්ව සමඟ ගණුදෙනුවලට එළඹේ. අදාළ පාර්ශව යන්නට ශ්‍රී ලංකා රජය (රාජ්‍යය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අත්‍යන්ත හිමිකරු වශයෙන්), රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ රජයේ පාලනය යටතේ පවතින ආයතන ඇතුළත් වේ. තනි තනි වශයෙන් වැදගත්කමක් ගන්නා වූ අනෙකුත් ගණුදෙනු සම්බන්ධයෙන් තනි තනි වශයෙන් නොව සාමූහික වශයෙන් වැදගත් වන්නාවූත් ගණුදෙනුවලට අදාළව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රාජ්‍ය සහ රාජ්‍ය පාලනය යටතේ පවතින ආයතන සමග එළඹි ගණුදෙනු සහ වැඩපිළිවෙලවල් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| ගණුදෙනුවේ ස්වභාවය | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| ගණුදෙනුව : | | |
| ආදායම | 277,962,237 | 217,500,000 |

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2001 වසරේ දී වසර 30 ක කාලයක් සඳහා ලංකා තේ කෞතුකාගාරය වෙනුවෙන් ජනවසම දේපළ භාවිතා කිරීම සඳහා ජනවසම සමග ගිවිසුමකට එළඹුණි. ඊට අමතරව 2003 වසරේදී ජනවසම සඳහා ලබාදුන් රු. මිලියන 25 ක ණය මුදල බොල්ණය ලෙස කපාහැර ඇත.

### 8.2 ප්‍රධාන කළමනාකරණ සංයුතිය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සමන්විත වේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් එස්.ඒ. සිරිවර්ධන මහතා සහ අධ්‍යක්ෂක (ප්‍රචාරණ) ප්‍රමිලා ශ්‍රී කාන්තා මහත්මිය ලංකා තේ කෞතුකාගාර අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරයි.

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| කෙටිකාලීන සේවා නියුක්ති ප්‍රතිලාභ | 1,920,821 | 2,196,150 |

## අමතර හෙළිදරව් කිරීම්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාණිජමය සහ වෙනත් කටයුතු සඳහා පරිශ්‍රයන් ලබාගැනීම සඳහා කුලි ගිවිසුම් ඇති කරගෙන ඇත.

| | කාල පරිච්ඡේදය | මාසික කුලිය (රු.) |
|---|---|---|
| i. අපනයන පහසුකම් මධ්‍යස්ථානය | 25.11.2015 සිට 25.11.2017 | 50,000.00 |
| ii. ගාල්ල ප්‍රාදේශිය කාර්යාලය | 09.06.2017 සිට 08.06.2018 | 115,000.00 |
| iii. මාතර ප්‍රාදේශිය කාර්යාලය | 01.11.2016 සිට 31.10.2017 | 62,000.00 |
| iv. ඌරුබොක්ක තේ පරීක්ෂක | 01.12.2017 සිට 30.11.2019 | 12,500.00 |
| v. අකුරුස්ස තේ පරීක්ෂක | 01.12.2017 සිට 30.11.2019 | 12,500.00 |
| vi. බදුරලිය ස.තේ.කො නිලනිවස | 01.07.2017 සිට 30.06.2018 | 13,000.00 |

## තාවකාලිකව වාහන නිදහස් කිරීම.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මාස 6 ක් සඳහා පහත සඳහන් ආයතන වලට රු. 100,000 ක මාසික කුලිය මත වාහන 4 ක් නිදහස් කර තිබේ.

(I) කලුබෝවිටියාන තේ කර්මාන්තශාලාව - වාහන 02

(ii) ජාතික වැවිලි කළමනාකරණ ආයතනය-වාහන 02

Sri Lanka Tea Board

## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| A ආදායම | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| භාණ්ඩාගාර ප්‍රධාන - පුනරාවර්තන | | 153,500,000 | 147,500,000 |
| - ප්‍රාග්ධන සහ සංවර්ධන කටයුතු | | 17,500,000 | 70,000,000 |
| - ගංවතුරෙන් හානි වූ තේ කර්මාන්තශාලා | | 106,962,237 | - |
| රාසායනාගාර ආදායම් | සටහන 1 | 21,914,941 | 16,862,340 |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්දෙන් පොළිය මාරුකිරීම | | 45,500,000 | 30,044,000 |
| ලියාපදිංචි සහ දීර්ඝ කිරීමේ ආදායම් | සටහන 2 | 183,316,794 | 140,807,434 |
| වෙනත් ආදායම් | සටහන 3 | 11,253,423 | 4,055,454 |
| වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය | සටහන A.1 | 14,878,542 | 21,332,077 |
| තේ දළු වෙළෙන්දන්ගේ තැන්පතු | | - | 14,168,243 |
| | | **554,825,938** | **444,769,549** |

| A.1 වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| තේ විකුණුම් | 23,997,124 | 26,950,893 |
| අපනයන ඇසුරුම් විකුණුම් මත කොමිස් | 10,921,369 | 10,446,272 |
| ස්වාධිකාර කුලිය | 1,715,003 | 1,926,665 |
| රෙදි බෑග් අලෙවිය | 119,255 | 48,080 |
| විදේශීය ව්‍යවහාර මුදලින් අලෙවි ආදායම | 4,937 | 5,657 |
| තේ සහ සෞඛ්‍ය පොත අලෙවිය | - | 4,750 |
| | 36,757,688 | 39,382,316 |
| අඩු කළා - විකුණුම් පිරිවැය | (21,041,774) | (17,144,036) |
| බැර පත්‍රිකා මත කොමිස් | (837,371) | (906,204) |
| වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය | **14,878,542** | **21,332,077** |

| B තේ ක්ෂේත්‍රය - සංවර්ධන වියදම් | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| තේ කර්මාන්තශාලා නවීකරණ සහනාධාරය | 7,834,287 | 25,424,904 |
| තේ නැවත වගාකිරීමේ සහනාධාරය | 9,658,854 | 44,575,096 |
| යහපත් නිෂ්පාදන පිළිවෙත් වැඩි දියුණු කිරීම | 1,287,472 | 3,147,541 |
| වෙළෙන්දන්ගේ තැන්පතු ආපසු දීම | 65,000 | 435,000 |
| තේ ඉඩම් සමීක්ෂණය | 2,961,159 | 12,799,424 |
| ගංවතුරෙන් හානි වූ තේ කර්මාන්තශාලා සඳහා වන්දි ගෙවීම | 106,962,237 | - |
| | **128,769,009** | **86,381,964** |

| C පරිපාලන වියදම් | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| පුද්ගල පඩිනඩි | සටහන 3.1 | 171,732,385 | 197,517,428 |
| වෙනත් පරිපාලනමය වියදම් | සටහන 3.2 | 43,338,652 | 44,191,462 |
| ගමන් වියදම් | සටහන 4 | 9,934,524 | 9,755,677 |
| සැපයුම් සහ ආවශ්‍යක | සටහන 5 | 11,096,088 | 10,493,525 |
| අලුත්වැඩියා සහ නඩත්තු | සටහන 6 | 22,209,827 | 25,501,185 |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම. | F . දේ.පි.උ | 29,436,922 | 28,072,677 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | F . දේ.පි.උ | 822,109 | 850,581 |
| කල්බදු දේපළ ක්‍රමක්ෂය | F .දේ.පි.උ | 76,386 | 76,386 |
| උපයෝගිතා සහ වෙනත් වියදම් | සටහන 7 | 62,858,036 | 47,746,571 |
| | | **351,504,928** | **364,205,491** |

Sri Lanka Tea Board

## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | | 2017 | 2016 |
|---|---|---|---|
| **D** | මූල්‍යමය වියදම් | රු. | රු. |
| | පොළී වියදම් | | |
| | -මහජන බැංකුව | 58,265,057 | 25,523,623 |
| | -ලංකා බැංකුව | 22,460,628 | 9,189,507 |
| | බැංකු ගාස්තු | 137,556 | 510,052 |
| | | **80,863,240** | **35,223,182** |
| **E** | මූල්‍යමය ආදායම් | | |
| | ආයොජනයෙන් ලැබූ පොළිය | 27,962,258 | 19,709,277 |
| | ප්‍රාදේශිය වැවිලි සමාගම් වැටුප් ණය මගින් ලැබූ පොළිය | 81,303,468 | 35,006,231 |
| | | **109,265,725** | **54,715,509** |

Sri Lanka Tea Board

## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**F** දේපළ, පිරියත සහ උපකරණ

| | 2017.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව රු. | එකතු කිරීම් රු. | අපහරණ/ පැවරීම් රු. | ගැලපුම් රු. | 2017.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව රු. |
|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 376,300,000 | - | - | - | **376,300,000** |
| ගොඩනැගිලි | 265,572,751 | 5,989,416 | - | - | **271,562,167** |
| කාර්යාල උපකරණ | 70,066,716 | 8,322,389 | 3,255,924 | - | **75,133,181** |
| ලි බඩු සහ සවිකුරු | 39,317,469 | 1,705,897 | 724,979 | - | **40,298,386** |
| මෝටර් රථ සහ වෙනත් වාහන | 54,370,892 | - | 6,250,000 | - | **48,120,892** |
| පුස්තකාල පොත් | 383,044 | - | - | - | **383,044** |
| පරිගණක උපාංග | 40,612,080 | 2,670,882 | 1,236,595 | - | **42,046,366** |
| රසායනාගාර උපකරණ | 99,773,417 | 265,656 | - | - | **100,039,072** |
| | 946,396,370 | 18,954,239 | 11,467,499 | - | **953,883,109** |
| කෙරිගෙන යන වැඩ | | | | | |
| ගොඩනැගිලි/වෙනත් | **108,044,005** | 38,999,291 | - | **6,657,914** | **140,385,382** |
| පරිගණක උපාංග | - | - | - | - | - |
| | **108,044,005** | **38,999,291** | - | **6,657,914** | **140,385,382** |
| | **1,054,440,375** | **57,953,530** | **11,467,499** | **6,657,914** | **1,094,268,491** |

| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | 2017.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම් රු. | වසර සඳහා අයකිරීම් රු. | අපහරණ රු. | ගැලපුම් රු. | 2017.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් රු. |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | **43,557,096** | 5,475,774 | - | - | **49,032,870** |
| කාර්යාල උපකරණ | **45,129,349** | 7,084,906 | 3,246,613 | - | **48,967,643** |
| ලි බඩු සහ සවිකුරු | **19,602,756** | 3,789,763 | 601,590 | - | **22,790,930** |
| මෝටර් රථ සහ වෙනත් වාහන | **28,004,386** | 5,009,547 | 4,273,570 | - | **28,740,364** |
| පුස්තකාල පොත් | **383,044** | - | - | - | **383,044** |
| පරිගණක උපාංග | **22,435,926** | 5,951,051 | 1,228,201 | 9,823 | **27,168,598** |
| රසායනාගාර උපකරණ | **82,125,975** | 5,897,449 | - | - | **88,023,424** |
| | **241,238,533** | **33,208,490** | **9,349,973** | **9,823** | **265,106,872** |
| ශුද්ධ පොත් අගය | **813,201,842** | | | | **829,161,619** |

## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්
2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

### G කල්බදු දේපල

| | 2017.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව රු. | එකතු කිරීම් රු. | අපහරණ/ පැවරීම් රු. | ගැලපුම් රු. | 2017.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව රු. |
|---|---|---|---|---|---|
| කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය | **3,819,280** | **-** | **-** | **-** | **3,819,280** |
| කල්බදු දේපල - ටී හවුස් | **28,897,335** | - | - | 17,142,720 | **11,754,615** |
| | **32,716,615** | **-** | **-** | **17,142,720** | **15,573,895** |

| ක්‍රමක්ෂය සඳහා ප්‍රතිපාදන | 2017.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම් රු. | වසර සඳහා අයකිරීම් රු. | අපහරණ රු. | ගැලපුම් රු. | 2017.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් රු. |
|---|---|---|---|---|---|
| කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය | **933,630** | 76,386 | **-** | **-** | **1,010,015** |
| කල්බදු දේපල - ටී හවුස් | **8,669,200** | 1,175,461 | **-** | **5,142,816** | **4,701,846** |
| | **9,602,830** | **1,251,847** | **-** | **5,142,816** | **5,711,861** |
| ශුද්ධ පොත් අගය | **23,113,785** | | | | **9,862,034** |

### H අස්පෘශ්‍ය වත්කම්

| | 2017.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව රු. | එකතු කිරීම් රු. | අපහරණ/ පැවරීම් රු. | ගැලපුම් රු. | 2017.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව රු. |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග - ප්‍රධාන කාර්යාලය | **13,609,698** | - | 1,120,548 | | 12,489,150 |
| පරිගණක මෘදුකාංග - ටී හවුස් | **670,484** | - | 670,484 | | - |
| | **-** | | | | - |
| කෙරීගෙන යන පරිගණක මෘදුකාංග | **1,200,000** | 6,896,000 | | - | 8,096,000 |
| | **15,480,182** | **6,896,000** | **1,791,032** | **-** | **20,585,150** |

| ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන | 2017.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම් රු. | වසර සඳහා අයකිරීම් රු. | අපහරණ රු. | ගැලපුම් රු. | 2017.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් රු. |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග - ප්‍රධාන කාර්යාලය | **2,986,915** | 822,109 | 205,601 | - | **3,603,423** |
| | | | | | **-** |
| පරිගණක මෘදුකාංග - ටී හවුස් | **145,921** | - | 145,921 | | **-** |
| | **3,132,837** | **822,109** | **351,522** | **-** | **3,603,423** |
| ශුද්ධ පොත් අගය | **12,347,345** | | | | **16,981,727** |

### G ඉඩම් සඳහා පෙරගෙවුම් කල්බදු හිමිකම්

| | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 23,113,785 | 23,113,785 |
| අඩුකළා - ගැලපුම්/අපහරණ | 11,999,904 | - |
| ක්‍රමක්ෂය | 1,251,847 | |
| **අවසාන ශේෂය** | **9,862,034** | **23,113,785** |

# මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**H අස්පෘශ්‍ය වත්කම්**

| | | රු. | රු. |
|---|---|---|---|
| ආරම්භක ශේෂය | | 12,347,345 | 12,347,345 |
| අඩුකළා - ගැලපුම්/අපහරණ | | 1,439,510 | - |
| ක්‍රමක්ෂය | | 822,109 | |
| කෙරීගෙන යන පරිගණක මෘදුකාංග | | 6,896,000 | |
| | | **16,981,727** | **12,347,345** |

**I භාණ්ඩ තොග**

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| රසායනාගාර පාරිභෝගික භාණ්ඩ | සටහන 8.1 | 5,738,092 | 5,858,067 |
| ප්‍රචාරණ ද්‍රව්‍ය හා වෙනත් | සටහන 8.2 | 4,094,832 | 5,966,928 |
| තේ සහ වෙනත් තොග | සටහන 8.3 | 7,105,908 | 9,080,599 |
| වෙනත් | සටහන 8.4 | 8,075,575 | 14,633,034 |
| | | **25,014,407** | **35,538,627** |

**J වෙළඳ සහ අනෙකුත් ලැබියයුතු දෑ**

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| වෙළඳ ලැබියයුතු දෑ | සටහන 9 | 11,377,352 | 2,925,163 |
| කාර්ය මණ්ඩල ලැබියයුතු දෑ හා වෙනත් අත්තිකාරම් | සටහන 10 | 34,796,710 | 30,305,074 |
| ලැබියයුතු දෑ - ජනවසම | | 25,000,000 | 25,000,000 |
| අඩුකළා - බොල් ණය සහ අඩමාන ණය වෙන්කිරීම ජනවසම | | (25,000,000) | (25,000,000) |
| | | **46,174,062** | **33,230,237** |

**K තැන්පතු සහ පෙරගෙවුම්**

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| තැන්පතු සහ පෙරගෙවුම් | සටහන 11 | 61,388,571 | 53,015,712 |
| | | **61,388,571** | **53,015,712** |

**L අනෙකුත් මූල්‍ය වත්කම්**

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| අයෝජන | සටහන 12 | 6,353,072,570 | 6,139,953,803 |
| | | **6,353,072,570** | **6,139,953,803** |

# මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්
2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**M** අතැති සහ බැංකුවේ ඇති මුදල්

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | සටහන 13 | **290,531,715** | **65,406,603** |

**M. (1)** ලැබියයුතු ණය

| | | **2017** | **2016** |
|---|---|---|---|
| | | **Rs.** | **Rs.** |
| ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා උත්සව අත්තිකාරම් ණය | | - | 427,163,950 |
| කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය සඳහා ණය (150 සැමරීම) | | 20,000,000 | 20,000,000 |
| ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා ආපදා ණය | සටහන 16 | 801,894,039 | - |
| ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා වැටුප් වර්ධක ණය | සටහන 15 | 552,869,440 | 676,300,000 |
| | | **1,374,763,479** | **1,123,463,950** |

**ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා උත්සව අත්තිකාරම් ණය**

ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා ප්‍රධානය කළ උත්සව අත්තිකාරම් ණය 2017 වසරේදී මුළුමනින්ම අයකරගනු ලැබීය.

**ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා ආපදා ණය**

2017 මාර්තු 21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2017 වසරේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලයට මධ්‍යම වාර ණය මුදලක් නිකුත් කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අරමුදලෙන් රු. බිලියනයක මුදලක් වෙන්කර තිබුණි. වසර 3ක කාලපරිච්ඡේදයක් සඳහා එක් එක් ප්‍රාදේශිය වැවිලි සමාගම් වල ලියාපදිංචි කම්කරුවන්ට වාර්ෂිකව 5%ක සහන පොළී අනුපාතයක් ඇතිව මාසිකව ගෙවීම සඳහා සමානුපාතිකව ණය මුදල් ලබාදී ඇත. මෙම ණය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පාලනය කරනු ලබයි.

**ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා වැටුප් වර්ධක ණය**

16/1234/726/034 අංක දරණ 2016 ජූලි 05 දිනැති කැබිනට් පත්‍රිකාව පදනම් කරගනිමින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේඛම් විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් ණය ලබාගන්නා ලෙස නියම කර ඇත. භාණ්ඩාගාරය මේ සම්බන්ධයෙන් මූල්‍ය තත්වය තහවුරු කරන ලිපියක් නිකුත් කළේය.
ඒ අනුව වැවිලි ක්ෂේත්‍රයේ කම්කරුවන්ට රු. 2500 ක වැටුප් වැඩි කිරීමේ අරමුණ ඇතිව ප්‍රාදේශිය වැවිල සමාගම්වලට ණය ලබාදීම පිණිස ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ණය මුදලක් ලබාගෙන ඇත.

Sri Lanka Tea Board

## මුල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**N** ප්‍රවර්ධන සහ අලෙවි බද්ද

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තේ අපනයනය සඳහා අවසර ලබා දෙමින් රේගු භාණ්ඩ ප්‍රකාශය (CUSDEC) සඳහා අනුමැතිය ලබාදුන් පසු සෑම ලියාපදිංචි තේ අපනයනකරුවෙකු විසින්ම සෑම තේ කිලෝග්‍රෑම් එකකට රු. 3.50 ක් බැගින් වූ බද්දක් ගෙවිය යුතුය. රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව එකතු කරනු ලබන සියලුම මුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමිත ගිණුමකට බැර කළ යුතු අතර එමගින් මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදලේ කොටසක් සකස් වේ.

මෙම රෙගුලාසි (2010 ඔක්තෝබර් 27 දිනැති අංක 167714 දරන ගැසට් පත්‍රය) ක්‍රියාවට නැංවීමේදී නියමිත ගිණුමේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බැර වී ඇති සියලුම මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුළ හා බැහැරව සිදුකරනු ලබන ප්‍රවර්ධන හා අලෙවි කටයුතුවලට අදාළ කාර්යයන් සඳහා පමණක් භාවිත කළ යුතුය.

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ආරම්භක ශේෂය | | 5,794,718,308 | 5,512,850,781.60 |
| පෙර වර්ෂය සහ වෙනත් ගැලපුම් | | 256,456,775 | (8,681,565) |
| අපනයනකරුවන්ගෙන් රැස්කරගත් මුදල | | 1,020,142,674 | 1,021,044,786 |
| අයෝජන මත පොළිය | 594,881,802.73 | | 417,952,898 |
| අඩුකළා- පොළී ආදායම මත ගෙවූ බදු | (266,845,495.40) | | (235,211,480) |
| ප්‍රධාන කාර්යාලයට මාරු කරන ලද පොළිය* | (45,500,000.00) | 282,536,307 | (30,044,000) |
| ක්‍රිකට් ටී ෂර්ට් විකිණීම | | 228,500 | 940,500 |
| භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම | | 12,440 | 17,683 |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් ආපදා ණය මත පොළිය | | 28,828,714 | - |
| සමරුකලාප වෙළඳදැන්වීම් මගින් ආදායම | | 425,000 | - |
| ප්‍රචාරන ද්‍රව්‍ය විකිණීම | | 5,400 | - |
| තේ පොත් විකිණීම | | 1,140,600 | - |
| අධ්‍යාපනික ප්‍රදර්ශන කුලී ආදායම් | | 75,000 | - |
| | | 7,384,569,717 | 6,678,869,604 |
| පරිත්‍යාග සහ විශේෂ ප්‍රචාරණ කටයුතු සඳහා තිළිණ තේ | | 3,522,597 | 5,892,207 |
| දේශීය ප්‍රදර්ශන සහ වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීම | | 290,287,045 | 13,924,198 |
| සන්නිවේදන ද්‍රව්‍ය (ATL/BTL) සඳහා නිෂ්පාදන වියදම් | | 666,878 | 133,462 |
| ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන වලට සහභාගී වීම | | 117,189,387 | 100,765,771 |
| උත්සව කටයුතු | | 17,254,678 | 5,093,279 |
| බුද්ධිමය දේපල කටයුතු, කවුන්සල සාමාජිකත්වය, බුද්ධිමය අනුග්‍රාහකත්වය | | 2,630,561 | 12,469,055 |
| වෙළඳපොළ පර්යේෂණ සහ වෙනත් අලෙවිකරන සහයක සේවා | | 3,573,270 | 4,380,401 |
| බැංකු ගාස්තු | | 88,369 | 86,980 |
| ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා අනුග්‍රාහකත්වය | | 1,179,250 | 86,413,625 |
| ටී හවුස් මෙහෙයුම් වියදම් | සටහන 1 | 18,169,120 | 9,799,269 |
| තේ කෞතුකාගාරය සඳහා ප්‍රතිපදාන | | 1,500,000 | 2,300,000 |
| විදේශීය කාර්යාල වල නඩත්ත කටයුතු | | 36,474,579 | 45,158,971 |
| වසරේ වාර්ෂික වතු තේ | | 180,011 | 355,091 |
| ගමන් වියදම් - විදේශීය | | 12,986,047 | 11,336,478 |
| අනෙකුත් ජාතික ආයතන සමඟ ඒකාබද්ධ ප්‍රවර්ධනය | | 1,086,730 | 552,160 |
| රූපවාහිනී/ ගුවන්විදුලි/ පුවත්පත් මගින් සිදුකළ ඉහළ මට්ටමේ ප්‍රචාරණය(ATL) | | 27,315,789 | 141,124,181 |
| එළිමහන් ප්‍රචාරණය (BTL) | | 20,864,581 | - |
| මහජන සම්බන්ධතා වැඩසටහන | | 7,049,660 | 1,228,240 |
| තානාපති කාර්යාල සමඟ වැඩසටහන | | 7,309,179 | 13,327,894 |
| විනිමය වෙනස | | 135,699 | 52,936 |
| ලැයිස්තුගත කිරීමේ ගාස්තු සහ සන්නාම අලෙවිකරණ සහනාධාර ලබාදීම | | - | 429,679,935 |
| වතුකම්කරුවන් සඳහා CSR ව්‍යාපෘතිය | | 5,774,624 | 77,164 |
| ITPF | | 2,024,864 | - |
| වර්ගීය ප්‍රචාරණය | | 1,108,439 | - |
| මුළු වියදම් | | **578,371,356** | **884,151,296** |
| 2017.12.31 දිනට ප්‍රවර්ධන සහ අලෙවි බදු අරමුදල් ශේෂය | | **6,806,198,361** | **5.794.718.308.00** |

<u>සටහන - සිලෝන් ටී හවුස් මෙහෙයම් නතර කිරීම</u>

ආමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි 2017.01.01 දින සිට සිලෝන් ටී හවුස් හි මෙහෙයුම් කටයුතු අවසන්කර ඇත.

බදු ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාරදුන් අතර රු.17,142,720 ක ආපසු නොගෙවන තැම්පතු මුදල 2017.12.31 දිනෙන් අවසන් වන මූල්‍ය ප්‍රකාශ වලින් ඉවත් කර ඇත.

# මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## O සේවක ප්‍රතිලාභ බැඳීම්

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| පාරිතෝෂික ආරම්භක ශේෂය | 63,623,185 | 55,562,838 |
| වසර සඳහා මිනුම් ගැලපුම් | (3,354,903) | 18,663,915 |
| වසර තුළ ගෙවන ලද/ගෙවියයුතු ප්‍රතිලාභ | (7,410,774) | (10,603,568) |
| | 52,857,507 | **63,623,185** |

## P බැංකු ණය

| | මහජන බැංකුව | ලංකා බැංකුව | එකතුව |
|---|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | 493,000,000 | 183,300,000 | **676,300,000** |
| 2017 වසරේ පංගු පියවීම | (35,000,000) | - | **(35,000,000)** |
| වාරික ගෙවීම් | (53,486,532) | (25,458,335) | **(78,944,867)** |
| 2017.12.31 දිනට ශේෂය | 404,513,468 | 157,841,665 | **562,355,133** |
| | | | |
| කෙටි කාලීන වගකීම් | 156,585,858 | 61,100,004 | **217,685,862** |
| දිගු කාලීන වගකීම් | 247,927,610 | 96,741,661 | **344,669,271** |
| | **404,513,468** | **157,841,665** | **562,355,133** |

## Q දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්

| | 2017 | 2016 |
|---|---|---|
| | ප්‍රවර්ධන සහ අලෙවි බදු | ශ්‍රී ලංකා තේ මණ්ඩලය |
| | රු. | රු. |
| ආදායම් බදු | | |
| 2017.01.01 දිනට ශේෂය | 35,063,980 | 2,556,557 |
| වසර සඳහා ප්‍රතිපාදන | 162,480,303 | 7,908,469 |
| අඩුකළා - බදු ගෙවීම් | 97,873,700 | 6,132,736 |
| රඳවාගැනීමේ බදු | 50,902,331 | 1,862,378 |
| මතිමාත්‍ර බදු | 3,788,329 | 495,499 |
| 2017.12.31 දිනට ශේෂය | 44,979,923 | 1,974,413 |
| ලාභාංශ බදු | | |
| 2017.01.01 දිනට ශේෂය | 69,877,159 | 2,863,336 |
| වසර සඳහා ප්‍රතිපාදන | 104,365,192 | 5,078,125 |
| අඩුකළා - බදු ගෙවීම් | 69,877,159 | 2,863,336 |
| 2017.12.31 දිනට ශේෂය | 104,365,192 | 5,078,125 |
| 2017.12.31 දිනට ගෙවියයුතු මුළු බදු | **149,345,115** | **7,052,538** |
| 2017 වසර සඳහා මුළු ආදායම් වියදම් | **266,845,495** | **12,986,594** |

## R වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| වෙළඳ ගෙවීම් | සටහන 14.1 | 136,765,965 | 147,743,125 |
| අනෙකුත් ගෙවීම් | සටහන 14.2 | 146,340,085 | 141,575,350 |
| උපචිත වියදම් | සටහන 14.3 | 134,538,671 | 444,108,577 |
| | | **417,644,722** | **733,427,052** |

Sri Lanka Tea Board

# මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්
## 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2017 | 2016 |
|---|---|---|
| | රු. | රු. |
| **S බැංකු ශේෂ** | | |
| ලංකා බැංකුව - තේ සහනාධාරය | - | 6,951,690 |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම ගාල්ල | - | 154,299 |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම මාතර | 180,714 | 120,200 |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම රත්නපුර | 1,195,022 | 942,436 |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම - මතුගම | 512,325 | 320,852 |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම - බණ්ඩාරවෙල | - | 4,316 |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම - ගම්පොළ | 1,564,002 | - |
| ලංකා බැංකුව - නිදහස් චතුරස්‍රය | 7,900 | - |
| | **3,459,964** | **8,493,793** |

**ප්‍රාග්ධන සහ සංචිත**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී අනුදත් ප්‍රාග්ධනයේ කිසිඳු වෙනසක් සිදුවී නොමැත.

**ප්‍රත්‍යාගණන සංචිත**

කොළඹ ප්‍රධාන කාර්යාලයේ ඉඩම ගොඩනැගිලි හා මෝටර් රථ සහ ගම්පොළ ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව මණ්ඩලය විසින් රු. 508,216,543 ක ප්‍රත්‍යාගණන සංචිතයක් ගොඩනගා ඇත.
තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය තක්සේරුකරුවෙකු විසින් 2016.07.25 දින ගම්පොළ ඉඩම ප්‍රත්‍යාගණනය සිදුකර ඇත.

**දායක ප්‍රාග්ධනය**

2017 දෙසැම්බර් 31 දින වනවිට රු.672,012,201.85 ක් වූ රජයේ ප්‍රදානවලින් දායක ප්‍රාග්ධනය සකස් වී ඇත.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල

**ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
574, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.
තැ.පෙ. 1750, කොළඹ, ශ්‍රී ලංකාව.
දු.ක. 011 2582121
ක්ෂණික ඇමතුම්: 011 2587814
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපැල:teaboard@pureceylonte.com
වෙබ් අඩවිය:www.pureceylontea.com

**සභාපති**
දු.ක. 011 2590968
ෆැක්ස්: 011 2585701
විද්‍යුත් තැපැල:chairman@pureceylontea.com

**අධ්‍යක්ෂ ජනරාල්**
දු.ක. 011 2508991
ෆැක්ස්:011 2582122
විද්‍යුත් තැපැල: dgsltb@pureceylontea.com

**තේ කොමසාරිස්ගේ අංශය**

තේ කොමසාරිස්
දු.ක. 011 2580182 / 011 2580152
ෆැක්ස්:011 2580161
විද්‍යුත් තැපැල: tcd@pureceylontea.com

**තේ ප්‍රවර්ධන අංශය**

අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)
දු.ක.011 2583343/ 011 2581418
ෆැක්ස්:011 2587341
විද්‍යුත් තැපැල: promotion@pureceylontea.com

**තේ අපනයන අංශය**

නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන)
දු.ක. 011 2504090
ෆැක්ස්:011 2584844
විද්‍යුත් තැපැල: exports@pureceylontea.com

**විශ්ලේෂණ රසායනාගාරය**

අධ්‍යක්ෂ (රසායනාගාර)
දු.ක. 011 2581576
ෆැක්ස්:011 2581576
විද්‍යුත් තැපැල: lab@pureceylontea.com

## ප්‍රාදේශිය කාර්යාල

**ගම්පොල**

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
140, අඹගමුව පාර, ගම්පොල
දු.ක. / ෆැක්ස් : 081-2352279
විද්‍යුත් තැපැල: atcgampola@pureceylontea.com

**මාතර**

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
46, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, කොටුව, මාතර
දු.ක. / ෆැක්ස් : 041-2222636
විද්‍යුත් තැපැල: atcmatara@pureceylontea.com

**බදුරලිය**

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
281, වතුරාන පාර, බදුරලිය
දු.ක. / ෆැක්ස් : 034-2247444
විද්‍යුත් තැපැල: atcmathugama@pureceylontea.com

**රත්නපුර**

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
61/1, නව නගරය, රත්නපුර
දු.ක. / ෆැක්ස් : 045-2222136
විද්‍යුත් තැපැල: atcrathnapura@pureceylontea.com

**බණ්ඩාරවෙල**

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
විශාඛා මාවත, නව බදුල්ල පාර, බණ්ඩාරවෙල
දු.ක. / ෆැක්ස් : 057-2222812
විද්‍යුත් තැපැල: atcbandarawela@pureceylontea.com

**ගාල්ල**

සහකාර තේ කොමසාරිස්
ප්‍රාදේශිය කාර්යාලය
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
20, පහළ ඩික්සන් පාර, ගාල්ල
දු.ක. / ෆැක්ස් : 091-2232052
විද්‍යුත් තැපැල: atcgalle@pureceylontea.com

# විදේශීය ශාඛා

| | |
|---|---|
| **සිලෝන් ටී ප්‍රවර්ධන ඒකකය** | අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන) - M.E./ ගල්ෆ්/N.A.<br>තේ ප්‍රවර්ධන ඒකකය |
| **එක්සත් අරාබි එමීර් රාජ්‍යය** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සාල් ජනරාල් කාර්යාලය<br>තැ.පෙ. 51528<br>ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය<br>දු.ක. 0097143987871<br>දු.ක. (සෘජු): 0097143989349 ෆැක්ස් : 0097143987872<br>විද්‍යුත් තැපෑල: ctbureau@emirates.nrt.ae / ceylonte@eim.ae |
| **සිලෝන් ටී ප්‍රවර්ධන ඒකකය** | තේ ප්‍රවර්ධන නිලධාරී<br>තේ ප්‍රවර්ධන ඒකකය |
| **රුසියාව/ CIS** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තානාපති කාර්යාලය<br>යුලිට්ස්සා ස්චෙප්කිනා - 24<br>මොස්කව් 129090<br>රුසියාව<br>දු.ක. 007 495 -688-1620<br>495-68811651/495-688-1463<br>ෆැක්ස් : 007-495-688-1757<br>විද්‍යුත් තැපෑල: tea@srilankaembassy.org |
| **සිලෝන් ටී ප්‍රවර්ධන ඒකකය**<br>**චීනය** | තේ ප්‍රවර්ධන නිලධාරී<br>තේ ප්‍රවර්ධන ඒකකය,<br>ශ්‍රී ලංකා තානාපති කාර්යාලය,<br>අංක 3, Jlan Hua Lu,<br>බීජිං - 100600,<br>චීන මහජන ජනරජය<br><br>දු.ක. 00-86-10-65322919<br>ෆැක්ස් :00-86-10-65325426<br>විද්‍යුත් තැපෑල: ceylontea@slemb.com |

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ඒ/බී/එස්එල්ටීබී/1/17/05 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ජුලි31 දින.

සභාපති,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

**ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 15(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී . මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 මැයි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් මණ්ඩලය විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට අදාලව අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.74,615,225 ක් වූ යන්ත්‍රෝපකරණ, රසායනාගාර උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් යනාදී වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතයේ 57 (ඩී) ඡේදය ප්‍රකාරව, සේවක පාරිතෝෂිත සම්බන්ධයෙන් ආයුගණක ලාභ හෝ අලාභ ගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට විදේශ තේ ප්‍රවර්ධන කාර්යාංශය සඳහා කරන ලද තැන්පත් හා කලින් ගෙවීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි රු.23,159,935 ක් දක්වා තිබුණද එදිනට අදාල විනිමය අනුපාතය අනුව එම වටිනාකම ගැලපීම්කර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විකුණන ලද වාහන 4 කට අදාලව ප්‍රත්‍යාගණන සංචිතයේ ඇතුලත්ව තිබූ රු.6,250,000 ක් වූ ප්‍රත්‍යාගණන ලාභය රඳවාගත් ලාභයට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල රැස්කිරීමේ බැංකු ගිණුම්වලට සෘජු තැන්පත් ලෙස ලැබී තිබුණු රු.363,624 ක් හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව, කලින් ලද ප්‍රචාරණ හා ප්‍රවර්ධන ගාස්තු වටිනාකම රු.28,441,373 ක් වුවද ඒ සඳහා පවත්වාගෙන ගිය ලේඛනය අනුව එම වටිනාකම රු.35,892,100 ක් වූයෙන් රු.7,450,727 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රවර්ධන කාර්යාංශයේ මුදල් හා බැංකු ශේෂය රු.4,499,717 ක් ලෙස දක්වා තිබූ නමුත් ශේෂ සනාථ කිරීම් ලිපිය අනුව එම ශේෂය රු. 2,470,416 ක් වූයෙන් රු.2,029,301 ක පැහැදිලි නොකල වෙනසක් නිරූපනය විය. තවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය මගින් මෙම වෙනස හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) තානාපති කාර්යාල 06 ක් වෙත ප්‍රේෂණය කර තිබූ මුදල | 1,175,374 | ශේෂ සනාථ කිරීම් |
| (ආ) රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය සඳහා කල්බදු පදනම මත මිලදීගෙන තිබූ ගොඩනැගිල්ල | 3,435,000 | ගෙවීම් තහවුරු කිරීමට අදාල සාක්ෂි |

### 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෝලන්තයේ විදේශ තේ ප්‍රවර්ධන ඒකකය පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ලෙහි ගිවිසුම 2010 වර්ෂයේදී අවසන්වී ඇතත් ඒ සඳහා ගෙවන ලද මූලික මුදල රු. 207,360 ක් මෙම වාර්තාවේ දින දක්වාම ආපසු අය කරගෙන නොතිබුණි.

(ආ) තුරහ තරග පිටියේ පවත්වාගෙන ගිය තේ අලෙවි හල පවත්වාගෙන යාම සඳහා ලබාගෙන තිබූ ගොඩනැගිල්ල වෙනුවෙන් 2014 වර්ෂයේ දී තැන්පත් කරන ලද රු.100,000 ක ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු රු.200,983ක් හා රඳවාගන්නා ලද මුදල් රු.2,191,499 ක් වසර තුනක් ඉක්මවා ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිරියාවේ පැවැත්වීමට සැලසුම්කර තිබූ "ෆුඩ්එක්ස් සිරියා " ප්‍රදර්ශණය සඳහා පුද්ගලික ආයතනයනයකට රු.629,261 ක ගෙවීම්කර තිබුණද එම ප්‍රදර්ශණය අවලංගුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට තේ කම්හල් හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර තිබූ වසර 1 සිට වසර 15 දක්වා කාල පරාසයකට අයත් රු. 6,698,817ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි

## 2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති | පනතේ විධිවිධාන අනුව සෙස් අරමුදල පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම මණ්ඩලය මගින් සිදුකලයුතු නමුත් වර්තමානයේ සෙස් බදු අයකිරීම මහා භාණ්ඩාගාරය මගින් සිදු කරන බැවින් ඒ අනුව පනත සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |
| (ආ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 හා 12 වගන්ති | පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා යටතේ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැති ටෙන්ඩර්කරුවන් සමග ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටුවල නිලධාරීන් කටයුතු නොකලයුතු නමුත් නුවරඑළියේ කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මණ්ඩලය විසින් මානව සම්පත් කලමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 ජනවාරි 11 දිනැති පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කිසියම් මූල්‍ය ප්‍රතිලාභයක් ගෙවීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාමලත් නිලධාරීන්ගේ ඉතිරි කරගත් විවේක නිවාඩු වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.542,548 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ප්‍රවර්ධන හා අලෙවිකරණ අරමුදලෙහි අරමුදල්, එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් යෙදවිය යුතු බව දක්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් එම අරමුදලෙහි පොලී ආදායමෙන් පිළිවෙලින් රු.45,500,000 ක් සහ ර.30,044,000 ක් මණ්ඩලයේ ආදායම් ලෙස හඳුනාගෙන වියදම් සඳහා යොදාගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.89,967,892 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,677,534 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.85,290,358 ක එනම් සියයට 1,823 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.55,594,152 කින් වැඩිවීමත් සංවර්ධන වියදම් සහ සහ පරිපාලන වියදම් රු.24,775,756 කින් අඩුවීමත් ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.19,071,236 ක්වූ මණ්ඩලයේ අතිරික්තය 2015 වර්ෂය අවසානය වනවිට රු.86,256,974 ක් දක්වා අඛණ්ඩව වැඩි වී තිබුණද 2016 වර්ෂයේදී රු.4,677,534 ක් දක්වා සියයට 85 කින් පිරිහී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී රු.89,967,892 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර 2016 වර්ෂයට සාපේක්ෂව එහි වර්ධනය සියයට 1823 ක් විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක

පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී රු.180,968,362 ක්වූ මණ්ඩලයේ දායකත්වය 2015 වර්ෂය වනවිට රු.332,983,533 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2016 වර්ෂයේදී රු.240,115,107 ක් දක්වා අඩුවී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු.304,945,902 ක් දක්වා දායකත්වයේ වර්ධනයක් ඇති වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පිළියෙල කර තිබූ උපායමාර්ග සැලැස්ම සඳහා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර යාවත්කාලීන කරන ලද උපාය මාර්ග සැලැස්මේ පිටපතක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව නියාමන ආයතන විසින් පනතේ නියමකර ඇති පරමාර්ථ ඉටුකිරීම සඳහා ක්‍රියාකාරකම් දිගුකාලීන දැක්මක් සහිතව ඇතුලත්කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. එහෙත් 2017 වර්ෂය සඳහා මණ්ඩලය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා චක්‍රලේඛය පරිදි රජයේ ප්‍රදාන, ඉපැයීම් හා සම්පූර්ණ වියදම් සහිත අයවැය, ඒ ඒ ක්‍රියාකාරම් තුලින් අපේක්ෂිත ප්‍රතිඵල, මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදනය කරනු ලබන අයවැය වෙන්කිරීම් තුලින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධ අග්‍රිම අවශ්‍යතා සැලැස්ම යන අංග ඇතුලත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය, තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය, පසු අස්වනු හානි අවම කිරීමේ වැඩසටහන, දැනුවත් කිරීමේ වැඩසටහන් හා තේ ඉඩම් ලියාපදිංචිය යන සංවර්ධන වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කිරීමට රු.104,000,000 ක් වෙන්කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ කම්හල් 70 ක් නවීකරණය සඳහා රු. 40,000,000 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.7,834,287 ක් වැය කර කම්හල් 13 ක් පමණක් නවීකරණය කර තිබුණි. එය සහනාධාර ලබාදීමට අපේක්ෂිතව තිබූ කම්හල් සංඛ්‍යාවෙන් සියයට 18 ක් පමණි.

(ii) තේ නැවත වගා සහනාධාර වැඩසටහන තුලින් සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හෙක්ටයාර් 250 ක් වගා කිරීමට රු. 40,000,000 ක් වෙන් කර තිබුණද මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව ඉඩම් හෙක්ටයාර් 177.64 ක් වගා කිරීමට රු.9,658,854 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව ලඟාකරගැනීමට හැකිව තිබූ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 24 ක් හා සියයට 71ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙකකට අදාලව දේශීය නිෂ්පාදිත තේ අපනයනය හා ප්‍රතිඅපනයනය සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | 2017 | 2016 | 2015 |
|---|---|---|---|
| | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. |
| තේ අපනයනය | | | |
| දේශීය තේ | 278,195,150 | 280,874,278 | 298,906,481 |
| ආනයනික තේ(ප්‍රති ) | 10,789,117 | 7,896,402 | 8,029,940 |
| සමස්ත තේ අපනයනය | 288,984,267 | 288,770,680 | 306,936,421 |
| තේ ආනයනය | 7,679,588 | 4,660,293 | 4,906,862 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ සමස්ත තේ අපනයනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණ ද දේශීය නිෂ්පාදිත තේ අපනයනය කිලෝග්‍රෑම් 2,679,128 කින් පහත වැටී තිබුණි. ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනය කරන ලද තේ ප්‍රමාණය පසුගිය වර්ෂයට වඩා සියයට 65 කින් ඉහල ගොස් තිබූ අතර ඒ අනුව ප්‍රති අපනයන තේ ප්‍රමාණය ද කිලෝග්‍රෑම් 2,892,715 කින් එනම් සියයට 43 කින් වර්ධනය වී තිබුණි.

(ii) මණ්ඩලය ක්‍රියාත්මක කර තිබූ සන්නාම ප්‍රවර්ධන වැඩසටහන සඳහා රු.177,315,426 ක් වැය කර තිබූ නමුත් දේශීය තේ අපනයනය පහල ගොස් ඇති බැවින් අපේක්ෂිතව තිබූ නව වෙළඳපොල හඳුනා ගැනීම් සහ අපනයන ප්‍රවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) තේ ප්‍රවර්ධනය සහ වෙළඳපොල උපාය මාර්ග සඳහා 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම ප්‍රකාරව තේ අපනයන කරුවන්ගෙන් 2018 දෙසැම්බර් 31 දක්වා එකතුවන බදු මුදලින් රු. බිලියන අටක් යොදවා "සිලෝන් තේ ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන" 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම ප්‍රවර්ධන වැඩසටහන 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු ,මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කටයුතු යන කාර්යයන් ඔස්සේ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණද ,එය අදාළ කාලපරිච්ඡේදය තුළ ඉටුකිරීමට නොහැකි වීම හේතුවෙන් 2018 වර්ෂය දක්වා දීර්ඝ කර තිබූණි.

තවද, නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් සමඟ මණ්ඩලය ඇ.ඩො 2,260,000ක (රු.328,423,200) එක් අවුරුදු ගිවිසුමකට 2015 නොවැම්බර් 06 දින එළඹ තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒ සඳහා රු.195,521,240 ක් ගෙවා තිබුණද මාධ්‍ය කටයුතු සඳහා ආයතනයක් මෙම කාර්යයට සමගාමීව පත්කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් අපේක්ෂිත කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

(ii) රූපවාහිනී වෙළඳ දැන්වීමේ නිර්මාණාත්මක කටයුතු 2016 අප්‍රේල් වනවිට අවසන් කර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මාස 18ක් ඉක්ම වී තිබුණද එම දැන්වීම ප්‍රචාරය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් එම දැන්වීම ආශ්‍රයෙන් ඉදිරි ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම තුල කාලීන වෙළඳපල තත්වයන්ට උචිත වන ආකාරයට නිර්මාණය එලදායී වීමට ඇති ඉඩකඩ අවම වන බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් ඇතිවූ ගංවතුර තත්ත්වය නිසා හානියට පත් කර්මාන්ත ශාලා සඳහා සහනාධාර ගෙවීම් කිරීමේ දී කර්මාන්තශාලා විසින් ඉදිරිපත් කරනු ලබන මාසික වාර්තාවල (ටී.සී.5) දැක්වෙන හානි වූ තොග ප්‍රමාණයට වඩා වැඩි තොග ප්‍රමාණයකට ගෙවීම් කිරීම හේතුවෙන් කර්මාන්තශාලා 2ක් සඳහා රු.819,567ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) නිෂ්පාදිත තේවල තත්ත්වය හා කීර්ති නාමය ආරක්ෂා කර ගැනීම සඳහා අපනයනය කරනු ලබන නිෂ්පාදිත තේවල ඇති පළිබෝධනාශක අවශේෂ පිළිබඳ පරීක්ෂාකිරීම කාලීන අවශ්‍යතාවයක් වුවද මණ්ඩලයේ රසායනාගාරය මගින් එම පරීක්ෂාවන් සිදුකරීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 ක අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස පෞද්ගලික කර්මාන්ත ශාලාවක් සඳහා ලබා දී තිබූ රු.3,489,773ක මුදල දළු සැපයුම්කරුවන් වෙත ලබාදී නොතිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මුදල ආපසු මණ්ඩලය වෙත අයකර ගෙන නොතිබුණි.

(ආ) 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ නියෝගය අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු රු.25,000,000 ක් වෙනුවෙන්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "සිලෝන් ටී මියුසියම්" හි අයිතිය අත්කර ගැනීම හා ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය තීරණයකට එළඹ තිබුණද 2018 මාර්තු 31 දක්වාම මෙම ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 ක අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.6,738,000,000 ක් වූ සහනාධාර මුදලින් ඉතිරි රු.18,005,828 ක් 2015 දෙසැම්බර් 31 දින සිට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ චීනයේ තේ කාර්යාංශයේ වියදම් සඳහා ලබාදෙන ලද අත්තිකාරම් රු.15,630,566 ක් වර්ෂය අවසානය වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2013 වර්ෂයේ දී රු.58,368,794 ක් වැයකර කොළඹ තුරඟ තරඟ පිටියේ ස්ථාපනය කල තේ අලෙවි මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු අත්හිටුවා වසා දැමීමට පියවර ගෙන තිබුණි. තේ ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ඉලක්ක ගත වෙළඳපළ සහ ඉදිරි උපනතීන් පිළිබඳ සැලකිල්ලට ගනිමින් වඩා ඵලදායී අයුරින් ක්‍රියාත්මක කල හැකි අනාගත වැඩ පිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබූ අතර ව්‍යාපෘතිය තුලින් රු. 42,994,720 ක මූල්‍ය අලාභයක් මණ්ඩලයට දැරීමට සිදු වී තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක්සත් අරාබි එමීර් රාජ්‍යය (ඩුබායි) හි පිහිටි විදේශ ප්‍රවර්ධන ඒකකයේ ජංගම ගිණුමේ, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සෑම මාසයකම රු.3,000,000 ක් ඉක්මවන ශේෂයක් පැවතියද එම මුදල ඵලදායී අයුරින් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලයට අයත් වටිනාකම රු.760,545 ක් වූ විදේශීය බැංකු ගිණුම් 05ක ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා වූ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී රු.32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පලිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය හා රු.5,592,421 ක් වැයකර මිලදී ගන්නා ලද CP-3800 GAS Chromatography යන්ත්‍රය සමාලෝචිත වර්ෂය දක්වා භාවිතයට ගෙන නොතිබුණි. මණ්ඩලයේ අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හා යන්ත්‍ර ක්‍රියාකිරීම පිළිබඳව පුහුණුවක් සැපයුම්කරුවන් විසින් ලබා දී නොමැති වීම ඊට හේතු වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.5,140,707ක් වටිනා කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් හා පරිගණක තේ අලෙවි මධ්‍යස්ථානය වසාදැමීම හේතුවෙන් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

## 4.6 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා 2013 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත අත්තිකාරම් ලෙස රු. 330,850 ක් ගෙවීම් කර තිබියදී සමාලෝචිත වර්ෂය අවසානය වනවිට මෙම කාර්යය අත්හැර දමා තිබුණි.

(ආ) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත, 1957 අංක 51 දරන තේ පාලන පනත හා 1959 අංක 16 දරන තේ (බදු හා පාලන) පනත යන පනත් ඒකාබද්ධ කර නව පනතක් ඇති කිරීම සඳහා 2015 වර්ෂයේදී උපදේශකයෙකු සමඟ ගිවිසුමකට එළඹ උපදේශක ගාස්තු ලෙස රු.105,000ක් දරා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනත් ඒකාබද්ධ කිරීම අවශ්‍ය නොවන බව තීරණය කර අදාළ කාර්යය අත්හැර දමා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් තුරඟ තරඟ පිටියේ පවත්වාගෙන ගිය තේ අලෙවි මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිට වසාදමා තිබූ නමුත් එය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල ආපසු භාරදීම ප්‍රමාදවීම හේතුවෙන් මාසික කුලිය වශයෙන් රු.1,140,544 ක් සමාලෝචිත වර්ෂයේ දරා තිබුණි.

**4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ දේපළ වල ව්‍යාපෘති ආරම්භ කිරීම.**

නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය ඉදිකරමින් පවතින සීමාසහිත කැළණිවැලි වැවිලි සමාගමට අයත් හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල පිහිටි වී අලෙවි මණ්ඩලයට අයත් ඉඩම්වල අයිතිය මෙම වාර්තාවේ දින දක්වා මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් කටයුතු සඳහා රු.114,335,962 ක් වැය කර තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 317 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 281 ක් විය. ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ නිලධාරීන්ගේ පිළිවෙලින් 03 දෙනෙකු, 04 දෙනෙකු හා 33 දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 09 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණු අතර අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති ජ්‍යෙෂ්ඨ තනතුරක්, තෘතීය මට්ටමේ තනතුරක් සහ ද්විතීය මට්ටමේ තනතුරු 05 ක් වෙනුවෙන් පිළිවෙලින් නිලධාරීන් 01 ක්, 01 ක් හා 11ක් සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරු නාම සහිතව කාර්ය පැවරුම් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු පත් කර තිබුණි.

**4.9 වාහන උපයෝජනය**

මණ්ඩලය සතු භාවිතයෙන් ඉවත්කරන ලද කැබ් රථ දෙකක, තක්සේරු වටිනාකම වාරික වශයෙන් මණ්ඩලයට ගෙවීමේ පදනම මත ජාතික වැවිලි කළමණාකරන ආයතනය වෙත, සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබූ නමුත් වාර්තාවේ දින දක්වා මේ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම ආයතනයෙන් වාරික ගෙවීම් සිදුකර නොතිබුණි.

**4.10 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තේ කොමසාරිස් අංශය විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ගොඩනැගිල්ලට වූ හානි වෙනුවෙන් හා ඒ හේතු කොටගෙන ගොඩනැගිල්ල වෙනත් පාර්ශවයකට කුලියට දීම සඳහා භූමිය ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමට නොහැකිවීම මත

රු.4,900,000 ක මුදලක් ඉල්ලා 2008 ඔක්තෝබර් මාසයේ දී මණ්ඩලයට එරෙහිව තීරකවරයෙක් පත්කර තිබුණි. ඒ අනුව තීරකවරයාගේ තීන්දුව ප්‍රකාරව 2012 නොවැම්බර් 14 දිනට ඉහත මුදල සහ ඊට සියයට 20ක වාර්ෂික ගාස්තුවක් ඇතුලත්ව එකතුව රු.13,828,600 ක් ගෙවිය යුතු බවට නියෝගයක් දී තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් මෙම තීරණයට එරෙහිව අභියාචනයක් ගොනු කර තිබුණි.

(ආ) බාහිර ආයතන 6ක් විසින් මණ්ඩලයට එරෙහිව අධිකරණවල නඩු 7 ක් සහ කාර්ය මණ්ඩලය විසින් විවිධ අධිකරණ වල නඩු 3 ක් ගොනු කර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා තේ මණ්ඩය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතන විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂිකව අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක් පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 6.1 අභ්‍යන්තර විගණනය

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද එම අංශය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි.

## 6.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛයේ 4.2 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්ම, වර්ෂයේ අයවැය අනුව ප්‍රාග්ධන වියදම් දැරීමට අපේක්ෂිත වටිනාකමට සමගාමීව පිළියෙල කළයුතු වුවද, ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම වෙනුවෙන් අයවැය ප්‍රතිපාදනය රු.මිලියන 379.381 ක් වුවද රු.මිලියන 401.694 කින් යුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි.

(ඇ) තේ කොමසාරිස් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන පරිගණකගත කිරීම වෙනුවෙන් මෘදුකාංගයක් පිළියෙල කිරීම සඳහා 2017 ඔක්තෝබර් 09 දින රු.8,620,000 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබූ නමුත් එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඈ) මණ්ඩලය විසින් ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තොරව පෞද්ගලික ප්‍රවාහන සමාගමක සේවය ලබාගෙන තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,813,578 ක වියදමක් දරා තිබුණි.

## 6.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 12 සිට 58 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

1957 අංක 51 දරන තේ පාලන පනතේ 49 වගන්තිය හා 1975 අංක 14 දරන තේ මණ්ඩල පනතේ 25(3) වගන්ති අනුව ලියාපදිංචි ගාස්තු, ලියාපදිංචි අලුත්කිරීමේ ගාස්තු හා බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීමේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකිරීම කලයුතුය. එහෙත් 2010 ජූලි 29 දින සිට ගාස්තු සංශෝධනය කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබූ බව 2014 වර්ෂයේ සිට විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී තිබුණද ,සමාලෝචිත වර්ෂය දක්වා නිවැරදි කිරීමට කටයුතු කරනොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පාලනය | දීර්ඝ කාලීනව පවතින ශේෂ අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් පාලනය | වත්කම් විධිමත් ලෙස පවරා නොගැනීම හා නිශ්කාර්යව පවතින වත්කම් උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. |
| (ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය | අනුමත කාර්ය මණ්ඩලයට අන්තර්ගත නොවන තනතුරු සඳහා බඳවා ගැනීම |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)